# සැළලිහිණි සඳෙශ

# සාරාර්ථ වර්ණනාව.

විද්‍යොදය පරිවෙණාධිපති

කහවේ ශ්‍රී සුමඞ්ගල රතනසාරාභිධාන

කොළඹ නවකෝරළේ ප්‍රධාන නායක

ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින්

ලියනලදී.

වෛද්‍ය-නොතාරිස් ශිෂ්‍ය

කදුරුපොකුණේ ඞී. ඇන්. ඩබ්ලිව්. කුමාරසිංහ විසින්

කොළඹ ජිනාලඞ්කාර යන්ත්‍රාලයේ

මුද්‍රණය කරවනලදී.

2477. 1. 1.

# සංඥාපනය.

**සැළලිහිණි සන්දේශය.**

ශ්‍රී රාහුල සඞ්ඝරාජ තොටගමුවේ මාහිමියානන් විසින් කරණ ලද සිංහල පද්‍යරචනාවන් අතුරෙන් සැළලිහිණි සන්දේශය කාව්‍යමධුරතාදිගුණයෙන් සියලුදෙනාගේ ම සිත් ගන්නා සුලු විශිෂ්ට ග්‍රන්‍ථරත්නයක් බව පොත කියවූ කවුරුත් දනිති. එබැවින් මේ පොත අඳුන්වා ලීම සම්බන්‍ධයෙන් වැඩි වර්‍ණනාදිය කිරිම වුවමනා නැතැයි සිතමු. මෙය මනාසේ ඉගෙණීමෙන් සිංහල ව්‍යාකරණ විධිවිෂයෙහි උසස් දැනීමක් ද, මට සිලිටු ලෙස සිංහල පද්‍ය රචනා විෂයෙහි මනා පරිචයක් ද, ඉතා පැරණි ද නුවූ ඉතා අභිනව ද නුවූ සිංහල පද්‍ය භාෂාවිෂයෙහි තතු දැනීම ද ඇති වන්නේ මය. එබැවින් ම විද්‍යෝදය පිරිවෙණ පිහිටුවා වදාළ ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන අපේ නායක මාහිමියන් වහන්සේ තමන්වහන්සේගේ පිරිවෙණේ සිංහල භාෂාව ඉගැන්වීමෙහි ලා කාව්පොත් අතුරෙන් සැළලිහිණිසන්දේශයත්, ගීපොත් අතුරෙන් මුවදෙව්දාවත්, විශේෂයෙන් ඉගැන්විය යුතු පොත් දෙකක් කොට යෙදූහ. එතැන් පටන් මේ දක්වා ම විද්‍යෝදය පිරිවෙන්හි හා ඉන් පසු පටන්ගත් සෙසු පිරිවෙන්වල ද මේ පොත් දෙක විශේෂයෙන් ම උගන්වනු ලැබේ.

**මේ පොත කළ කාලය.**

මේ සන්දේශය සවෙනි පරාක්‍රමබාහු මහරජතුමන් රජබවට පැමිණීමෙන් පන්තිස්වන වසෙහි, එනම්– ශ්‍රී බුද්ධ වර්‍ෂයෙන් 1993 වැන්නෙහි නවම් මසෙහි - හෙවත් ක්‍රිස්තු වර්‍ෂයෙන් 1450 වැන්නෙහි ජනවාරි මස අන්තිම භාගයේදී කරණලද බව නිශ්චය කරගත හැකිය.

**සැළලිහිණි සන්දේශ සන්න ආදිය.**

මේ පොතට පෞරාණික ග්‍රන්‍ථකර්තෘවරයෙකු විසින් ලියනලද සන්නයක් ද ඇත්තේය. එය සවිස්තර සන්නයක් නොවේ. බෙහෙවින් ඒ සන්නයෙන් ඉගෙණිය හැක්කේ කව්වල පදාර්‍ථයන් දැනගැණීම පමණෙකි. නමුත් ඒ සන්නයද ඒ ඒ අයගේ. අවබොධය පරිද්දෙන් සවිස්තර සන්න විවරණාදිය ඇතිකර ගැණීමට ඉවහල් වේ. එහෙයින් අභිනව වශයෙන් ලියන ලද සවිස්තර සන්න විවරණ කිපයක් ද විද්‍යමාන ය. එහි ඉගෙණ

ගන්නවුන්ට වුවමනා බොහෝ දේ ඇතත් ඔවුන්ගේ ඥනය වඩ වඩා දියුණුවීමට ඉවහල් විශිෂ්ට ව්‍යාකරණ විධි ආදිය ඌන බව පෙනේ. පිරිවෙන් පාඨශාලාවන්හි උගන්වන ආචාර්‍ය්‍යවරයන්ට ද කවියක් පාසා ඒ වුවමනා සියලු වියරණ විදි ආදිය කියා දෙමින් උගන්වන්නට කාලයක් නො ලැබෙන බව දනිමු. එබැවින් අපගේ මේ සන්නයෙහි ශිෂ්‍යයෙකුගේ ඥනය දියුණුවීමට විශෙෂයෙන්ම ඉගැන්විය යුතු සැහෙන වියරණ විදි ආදිය සඞ්ග්‍රහ කොළෙමු. ඒ මේ මේ යයි විස්තර නොකළත් අප විසින් සන්නයට මුලින් ලියන ලද වාර්‍තාවෙන් හා සන්නය බැලීමෙන් දතහැකි වේ. සමහර කවි වල අරුත් පැවසීම මීට පෙර මුද්‍රිත සන්න වලට වඩා වෙනස්කරන්නට ද සිදුවිය. ඉන් කවි කීපයක් නම් 2, 5, 20, 22, 48, 56– මේ අඞ්කවලින් යුත් කවි ය.

**මේ සන්නය ලිවීමේ අදහස.**

සැළලිහිණිසන්දෙශ සන්න විවරණ කීපයක් මුද්‍රණය කරවා තිබෙද්දී තවත් මේ සන්නයක් කුමට දැයි ඒ ඒ අයට සිතිය හැකි වේ. මේ පොත විශෙෂයෙන් ලක්දිව සියලු ම පිරිවෙන්වල සැමදම උගන්වනු ලබන පොතකි. ඉගෙණ ගන්නා ශිෂ්‍යයන්ගේ ඥනය දියුණු වීමට ඉගැන්විය යුතු දේ මේ මේ යයි අපි දනිමු. ඒ ඒ දේ ඉගැන්විය යුතු පිළිවෙළ ද දනිමු. එබැවින් ශිෂ්‍යයන්ගේ ප්‍රයොජනය සඳහා මෙය මෙසේ ලියා පළ කරවන්නට අදහස් කොළෙමු.

**මේ පොත ඉගෙණීමේදී විශෙෂයෙන් ම දත යුතු කරුණු කීපයක්.**

මේ පොත ඉගෙණගන්නවුන් විසින් තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියෝ, සවෙනි පරාක්‍රමබාහු මහ රජතුමා, උලකුඩයදේවි, විභීෂණ දිව්‍ය රාජයා යන මේ සතරදෙනා ගැන සංක්‍ෂිප්ත තොරතුරුවත් විශෙෂයෙන් දැනගත යුතු වේ.

**ශ්‍රීරාහුල මාහිමියෝ.**

මූන්වහන්සේගේ උත්පත්තිකාලය සවෙනි පරාක්‍රමබාහු මහරජතුමාගේ රාජ්‍යකාලය විය යුතුයි. මූන්වහන්සේගේ වංශය සූර්‍ය්‍යවංශයට අයත් කඳවුරුකුල යයි කියයුතුය. උපන් ගම දෙමටාන නම් ගම යයි කියනු ලැබේ. නමුත් දැන් ලක්දිව තිබෙන ගම් අතුරෙන් ඒ කවරගමෙක් දැයි තවම නිශ්චයකට නොපැමිණ තිබේ. ඒ ඒ අය-

කුලග මිණි පිළිතු රු
**දෙමටාන** ගම **කඳවු** රු
තොටගමු වැසි සොඳු රු
උතුරුමූල මහතෙරිඳු මුනුබු රු

යන මේ කවෙහි උපන් ගම **දෙමටාන** ගම යයි **දැක්වෙන** බැවින් 'දෙමට' යන්න මුල්කොට ඇති, කොළඹ **දෙමටගොඩ,** දඹදෙණිය අසල වූ **දෙමටවත්ත,** සීතාවක අසල වූ **දෙමටාන,** ජයවර්ධන පුරය අසල වූ **දෙමටලන්ද,** යන මේ ගම් මුන්වහන්සේගේ උත්පත්තිග්‍රාම යයි කියති. නමුත් මුන්වහන්සේ එක්ගමෙක ඉපදිය යුතුය, මුන් වහන්සේ කොනෙකුගේ අත එල්බගෙණ යන තරම් බාලවියෙහි රජු වෙත පැමිණි සේකැයි ද, රජුගේ පුත්‍රස්ථානයෙහි වැඩුනු සේකැයි ද පළ හෙයින් රජු විසූ ජයවර්ධනපුරයට ආසන්න ග්‍රාමයක් මුන්වහන් සේගේ උත්පත්තිග්‍රාමය වීම යුක්තසඟගතයයි සිතමු. මුන්වහන් සේගේ ආචාර්‍ය්‍යවරයා මහ වීදගම මාහිමියන්වහන්සේ ය. පස ළොස් හැවිරිදි කාලයේදී ම මුන්වහන්සේ මහාප්‍රාඥ වූසේක් කඳ කුමරුගෙන් වරප්‍රසාද ලැබූ සේක් ල. තියුණු නුවණින් යුත් මුන් වහන්සේ **සංස්කෘත, ප්‍රාකෘත, මාගධී, පෛශාචී, ශෞරසෙනී, අපභ්‍රංශ**- යන ෂඩ්භාෂාවන්හි ද, ත්‍රිපිටක බුද්ධවචනයෙහි ද, විශාර දත්වයට පැමිණියෝ **ෂඩ්භාෂාපරමෙශ්වර ත්‍රිපිටකවාගීශ්වර** යන අන්වර්ථානුගත උපාධිය ලැබගත්හ. ඉක්බිති මුන්වහන්සේ තොට ගමුවේ විජයබාහුපරිවෙණාධිපති භාවයට ද, ශ්‍රී රාජගුරු වනරතන සඞ්ඝරාජ මාහිමියන්ගේ ඇවෑමෙන් සඞ්ඝරාජ පදවියට ද පත්වී වදාළ සේක. **පඤ්චිකාප්‍රදීපය, බුද්ධිප්‍රසාදනීටීකාව, පරෙවිසන්දෙශය, කාව්‍යශෙඛරය** යන මේ ග්‍රන්ථයෝ ද මුන්වහන්සේගේ කෘතීහු වෙත්.

මේ රජතුමාගේ රාජ්‍යකාලය ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 1953 වැන්නයයි මහාවංශයෙහි දක්වනලදී. නමුත් -

**පරාක්‍රමබාහු මහරජතුමා.**

"බුදුවසිනෙක් දහ ස
නවසිය අට පණස් ව ස
රිවිසඳ තෙද යස ස
පතළ නිරිදෙක් වීය ලෝ කු ස

යන මේ රහල් හිමියන්ගේ නිගමනයෙන් දක්වෙන්නේ බුදු වසින් 1958 වැන්න මේ රජතුමාගේ රාජ්‍යප්‍රාප්ති කාලය බව යි. එබැවින් මෙතුමා ලඞ්කාවේ මහරජෙකු මෙන් පළ වූයේ 1958 වැන්නෙහි යයි සිතිය යුතු යි. මේ රජතුමාගේ පියානෝ දඹදිව පාටලිපුත්‍රනගරයෙහි ආඥාචක්‍රවර්ත්ති වූ ධර්මාශොක පරම්පරානුගත **ජයමාල** නම් මහීපාලයෝය. මෑනියෝ කාලිඞ්ග රාජපරම්පරානුගත **සුනෙත්‍රා** නම් වූහ.

**උලකුඩය දේවි.**

මෝ නොමෝ සවෙනි පරාක්‍රමබාහු මහරජතුමාගේ දුහිතෘ වූවාය. මේ රජදුවනියන්ගේ ස්වාමිපුරුෂයා 'තන්නූර්තුනෙයියාර්' නම් ද්‍රාවිඩ කුමාරයෙකි. මේ රජදුවගේ තත්ත්වය 96 වෙනි කවෙන් දතහැකි බැවින් මෙහි නොලියමු.

**විභීෂණ දිව්‍යරාජයා.**

මෙතෙම පුලස්ති සෘෂිහුගේ පුත්‍ර විශ්‍රාවස්හුගේ පුත්‍රයා ය. මොහුගේ මව නිකෂා නොමෝ ය. රාවණ තෙමේ මොහුගේ සහෝදරයෙකි. මෙතෙම රාමයාගේ ඉටුමිතුරෙකි. එසේ වූයේ රාමරාවණ යුද්ධයේදී මොහු රාමගේ පක්ෂය ගත් බැවිනි. විභීෂණගේ තත්ත්වය මේ පොතේ 77 වන කවෙහි පටන් 92 වන කව තෙක් බැලීමෙන් දතහැකි වේ.

මීලඟට සැළලිහිණියාගේ ගමන මාර්ගය හා ඒ අතර කටයුතු පිළිවෙළ ද දැනගත යුතු වේ.

1 පුරඅටවක් දා සවස ජයවඩ්නපුරයෙන් පිටත්වීම.
2 එදා ම දළදා මැදුරට පැමිණ දළදා වැඳීම.
3 පැරකුම් රජවිමන් වැද රජු දැක වැඳ අවසර ගැණීම.
4 කොන්තගම්තොටින් පියාසර කිරීම.
5 එදා රෑ ඉසුරුකෝවිල ලැගුම් ගැණීම.
6 පසුදින උදෑසන නැගිට තිලඹර යාම.
7 තිලඹරේදී- සමනතකුටය, මහසෙන්දෙව්රදපාය, මහමුද දැකීම.

8 ගිරවුන්ගෙන් මග තොරතුරු අසා දැනගැණීම.
9 තම අභිමුඛයට එන සපුකුමරු දැකීම.
10 වැලිනලා මාර්ගයේ ගමන් කිරීම.
11 කසිකාවිල සෙබළුන් දැක යාම.
12 වනදෙවිලියන් දැක ලසල්රුකොක සැතපීම.

13 වල්අම්බලම දක යාම.
14 ඉර මුදුන් වේලෙහි සුමුටාන වත මැද දඹපදුරුවල විඩාහැරීම.
15 ගුරුබැවිලෙ යාම.
16 සිගිල්දිය හෙබ දැකීම.
17 ගුරුළුකොත දැකීම.
18 වෙළුඳගොඩ දැකීම.
19 වෙරලාත මහවෙල මැද යාම.
20 එදා සවස කිත්සිරිමේ වෙහෙරට යාම.
21 එහි දාගැබ් මහබෝ පිළිම වැඳීම.
22 සාලණ්ගහබඩ මඳසාලක් සැප ගැණීම.
23 ඉන්පසු සාලණිගහබඩින් පිටත්ව ගොස් මස්කෙළිය දැකීම.
24 සාලණියේ යන විට එහි වීපියේ පහන් බැලීම.
25 එහි රණලිය වැනි සත්‍රීන් දැකීම.
26 සාලණිවෙහෙරට වැද, එහි 1 ලක්තිලකගෙහි මහ පිළිමය, 2 සලපිළිමය, 3 පස්මහල්පායෙහි මිණිකිරණ, 4 වටදාගෙහි දාගැබ, 5 පැළදිගපාය ඔත් පිළිමය, 6 මහදාගැබ, 7 නාපිළිම ගෙහි පිළිමය, 8 සමාදිපිළිමය, 9 බොධින්වහන්සේ, 10 තිවංක දෙපිළිමය, 11 සිවුරුදාගැබ, 12 හුණුතෙල්සැළ තැබූ තැන සළ පිළිමය, යන මේ වන්‍දනීය ස්ථානයන් වැඳ පිදීම.
27 ඉන්පසු විභීෂණ දෙවාලයට පැමිණ දෙවියන් දක වැඳ ගිය සාටයුතු සැලකිරීම.

අපගේ මේ සන්තය ද සර්වතොභද්‍රයයි නොසිතමු, නොකියමු, නමුත් මෙය ශිෂ්‍ය ජනයාගේ ඥානවර්ධයට ඉවහල් වේය යි සිතමු. එබැවින් මෙය ශිෂ්‍යජනයාගේ ඥානවර්ධනයෙන් ඉෂ්ටාර්ථසිද්ධිය සම්පාදනය කෙරේවා.

K. Ratanasara
**විද්‍යෝදය පරිවෙණාධිපති.**

2477/1933 මැයි 10 දිනදීය.


සැළලිහිණි සන්දේශයේ
ගමන මාර්ගය.
(අඟලකට හැතැක්ම දෙකයි.)
උ
බ
නැ
දැ
කැලණිගඟ
මෝදර
වෙලඳගොඩ (බැලගම)
ගුරුල්ලකොත
දියහෙබ
වල්ලම්බලම
සුමුටාන
ඉසුරුකෝවිල (ගණේතැන්න)
දලදමාලිගාව
(ඇතුල්කෝට්ටේ)
සොත්තගම්තොට
මිහසෙන්දෙව්රදපාය
පිටකෝට්ටේ
සාගිකාවල
(සාවස්සන්වෙල)

### සැළලිහිණිසන්දෙශ

# සාරාර්ථ වර්ණනාව.

**නමො බුද්ධාය.**

භාෂාව ඉගෙණ ගන්නවුන් විසින් භාෂාවෙහි වියරණවිදි ආදිය ද ඉගෙණ ගතයුතුයි. එයින් තොර වූ ඉගෙණීම උසස් ඉගෙණීමක් වශයෙන් නො සැලකේ. වියරණ පොතෙන් ඉගෙණ ගත් වියරණ විදි පිළිබඳ මනා අවබොධයක් ඇති වන්නේ මෙබඳු පොත්වල විද්‍යමාන ඒ ඒ වියරණවිදි ආදිය ඉගෙණීමෙනි. එබැවින් අපගේ මේ වර්ණනාවෙහි ලා-

**විභක්තිවිධිය, පදාර්ථය, භාවය, ක්‍රියාකාරකසම්බන්ධය හා එහි උක්තානුක්තවිධිය, අර්ථක්‍රියා හා එහි කාරකභෙදාදිය, විශෙෂණවිශෙෂ්‍ය සම්බන්ධය, සමාසපද හා එහි විග්‍රහාදිය පූර්ව කොට ඇති විශෙෂ විභාගයන් ද** පවසන්නෙමු.

**විභක්තිවිධිය** නාමවිභක්ති ආඛ්‍යාතවිභක්ති වශයෙන් විභක්තිවිධිය දෙපරිදි වේ. නාමප්‍රකෘතියක් කර්ම කර්තෘ ආදි අර්ථ විශෙෂයන්ට බෙදෙන්නේ නාම විභක්ති විධියෙනි. ධාතුප්‍රකෘතියක් අතීත වර්තමානාදි අර්ථ විශෙෂයන්ට බෙදෙන්නේ ආඛ්‍යාත විභක්ති විධියෙනි. ඉන් ආඛ්‍යාත විභක්ති විශෙෂයෝ ඒ ඒ තන්හි යොදනු ලබන ක්‍රියාකාරක සම්බන්ධවල දී පැවසෙත්. සිංහල කාව්‍ය භාෂාවෙහි නාම විභක්ති හැදිනීම දුෂ්කර ය; බොහෝ සෙයින් ඒ ඒ නාමයන්ගේ ප්‍රකෘතිය වෙනස් නො ව සියලු විභක්තිවල ම ස්වරූපයෙන් සිටින බැවිනි. නමුත් නාමපදයන්ගේ අර්ථය පැවසිය හැකි වන්නේ විභක්තිය හැදිනීමෙනි. එබැවින් විභක්ති හැදිනීම ඉගෙණීමේ ප්‍රධාන අඞ්ගයක් වශයෙන් සැලකිය යුතුයි. එහෙයින් මෙහි පළමු කොට ඒ ඒ කවිවලට ඇතුළත් නාමපදයන්ගේ විභක්තිරූප අඞ්ක වලින් හඳුන්වන්නෙමු. ඒ මෙසේයි:-

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| පෙර | විබත | 1. | කරණ | විබත | 4. | සබඳ | විබත | 7. |
| කම් | ,, | 2. | සපදන් | ,, | 5. | අදර | ,, | 8. |
| කතු | ,, | 3. | අවදි | ,, | 6. | අලප් | ,, | 9. |

**නාමපද අග යෙදෙන මේ අඞ්කවලින් ඒ ඒ විභක්ති හැදිනගත යුතුයි.**

**පදාර්ථය** නම් ඒ ඒ පදයන්ගේ අර්ථ කීමයි.

**භාවය** නම් කවියක් බැඳීමේ දී ඒ පිළිබඳ ව කාව්‍යකර්තෘගේසිතේ පහළ වූ උත්‍ප්‍රෙක්‍ෂාදි අලඞ්කාරාදියෙන් තොර වූ අදහසයි. ඇතැම් අය පදාර්ථ කීමට යෙදෙන ඒ ඒ පදයන් හැර ඔවුන්ගේ අර්ථ පමණක් එකතු කොට භාවයයි කියතත් ඒ භාවය නොවන බවත් ඒ පදාර්ථ කීම ම බවත් සැලකිය යුතුයි.

**ක්‍රියාකාරකසම්බන්ධය** නම් වාක්‍යයක් අවසන් කරණ ආඛ්‍යාත ක්‍රියා පදය හා ඊට අයත් කාරක පදයන් ද සම්බන්ධ කොට යෙදියයුතු වාක්‍යය යි. එසිනුදු විවක්‍ෂිතාර්ථය (කියනු කැමැති අර්ථය) පැවසේ. ක්‍රියාකාරකසම්බන්ධය යොදන කල්හි ඒ ක්‍රියාව හා එක් සම්බන්ධයෙන් යෙදෙන කාරකපද සියල්ල ම යෙදිය යුතු යි. විවක්‍ෂිතාර්ථය පැවසෙන්නේ එසේ යෙදීමෙනි. ඒ යෙදෙන කාරකවලින් එක් කාරකයක් උක්ත ද සෙසු කාරකයෝ අනුක්ත ද වෙත්. එහි උක්තකාරකය පෙරවිබතින් ද, සෙසු කාරකයෝ ඒ ඒ විබත් වලින් ද යෙදෙත්.

**අර්ථක්‍රියා**- ක්‍රියාවාචක නාම විශෙෂයෝ අර්ථක්‍රියා නම් වෙත්. ඔවුන්ට කෘදන්ත යයි ද කියනු ලැබේ. ඔවුන්ගේ ක්‍රියාර්ථය සමග යම් කිසි කාරකාර්ථයකුදු උක්ත වේ (=කියවේ.) ඒ කාරකාර්ථය වනාහි එහි වූ ක්‍රියාර්ථය (ධාත්වර්ථය) සිද්ධ කරණ කර්තෘ කෙනෙකු හෝ, ක්‍රියාර්ථය ලබන කර්මයක් හෝ, ක්‍රියාර්ථයට ඉවහල් වූ කරණයක් හෝ, ක්‍රියාර්ථය පිළිගැණීමට සුදුසු සම්ප්‍රදානයක් හෝ, ක්‍රියාර්ථයට ඉම් වූ අවධියක් හෝ, ක්‍රියාර්ථය පිහිටන ආධාරයක් හෝ වියයුතුයි. ඒ ඒ අර්ථක්‍රියාවන්ගේ ප්‍රකෘතිප්‍රත්‍යය හා එසින් උක්ත වන කාර කාර්ථපදය ද දැන ඉගෙණීම උසස් ඉගෙණීමකි.

අර්ථක්‍රියා සිද්ධ විය යුත්තේ ධාතුවලිනි. එහෙත් සිංහලෙහි වූ සමහර අර්ථක්‍රියාවන්ගේ ධාතුරූපයෝ ව්‍යවහාරානුකූල ව වෙන් කොට කියහැකි නො වෙත්. එබඳු අර්ථක්‍රියාවෝ පාලිසංස්කෘතාදි අර්ථක්‍රියාවන් ප්‍රභව කොට ඇත්තාහු ය.

**විශෙෂණ විශෙෂ්‍ය**- භාෂාවෙහි අර්ථවශයෙන් එකිනෙකට සම්බන්ධ වන්නා වූ කවර පද දෙකකින් වුවත් එකක් විශෙෂණ ද අනික විශෙෂ්‍ය ද විය යුතුයි. විශෙෂණ විශෙෂ්‍ය නො වන්නාවූ කිසිත් පද දෙකක් අර්ථ වශයෙන් සම්බන්ධ නො වේ.

බහුසාධාරණ වූ යමක් ඒ බහුසාධාරණත්වයෙන් වෙන් කිරීමට යෙදෙන පදය විශේෂණ යි. ඒ වෙන් කිරීම ලබන පදය විශේෂ්‍යයි. එහි දු විශේෂණ පදයෙන් ප්‍රකාශ වන ගුණය විශේෂ්‍යය හා එක්ව ම පවතී නම් ඒ විශේෂණය තුල්‍යාධිකරණ යයි ද, එසේ නැත්නම් භින්නාධිකරණය යි ද කියනු ලැබේ. 'මල්' යන ද්‍රව්‍යය සුදු-නිල්-රතු ආදි නොයෙක් ගුණවලට සාධාරණ ය. නමුත් "සුදු මල" යයි කී කල්හි එය ඒ බහුසාධාරණත්වයෙන් වෙන් වේ. ඒ වෙන් කිරීමට යෙදුනු 'සුදු' යන්න විශේෂණ යි. ඒ වෙනස ලැබූ මල විශේෂ්‍යයි. එහි සුදත් මලත් දෙක ම එකතන්හි ම පවතින බැවින් 'සුදු' යනු තුල්‍යාධිකරණ විශේෂණයි. "කැපීම" යනු පිහියා පොරෝ කියත් ආදි බොහෝ ආයුධයන්ට සාධාරණ බැවින් බහුසාධාරණ වේ. නමුත් "පිහියෙන් කැපීම" යි කී කල්හි එය ඒ බහුසාධාරණත්වයෙන් වෙන් වේ. පිහියත් කැපීමත් දෙක එකක් ව නො පවතින බැවින් 'පිහියෙන්' යන්න භින්නාධිකරණ විශේෂණයි. 'රජුගේ මිනිසා' යන තන්හි 'රජුගේ' යන්න ද එබඳු ය. මේවිශේෂණ විශේෂ්‍ය විධිය ඉතා සියුම් වූවකි. එබැවින් එය මෙහි කව්වල දක්වන පරිද්දෙන් අවබොධ කරගත යුතු යි. නමුත් පොතේ සියලු කව්වල ම විශේෂණ විශේෂ්‍ය සම්බන්ධය කියත් හොත් පොත මහත් වන බැවින් කවි විස්සක පමණ විශේෂණ විශේෂ්‍ය පවසන්නෙමු. සෙස්ස ඒ අනුසාරයෙන් දත යුතුයි.

විශේෂණ විශේෂ්‍ය සම්බන්ධයෙහි දු නාමපදයන්ගේ වෙනස පවසන පද නාම විශේෂණ යයි ද, ක්‍රියාපදයන්ගේ වෙනස පවසන පද ක්‍රියා විශේෂණයයි ද සැලකිය යුතුයි.

**සමාස**– විභක්ත්‍යන්ත පද දෙකක් හෝ කිපයක් එකතු කොට එක් විභක්ත්‍යන්ත පදයක් කිරීම සමාසයි. සමාස ව තිබෙන පද යන්ගේ අර්ථය දුරවබොධ බැවින් සුඛාවබොධය පිණිස යොදන වාක්‍යය සමාසවිග්‍රහයි. සිංහල භාෂාවෙහි වූ නාමපද බොහෝ තන්හි විභක්ති රහිත ව සිටින බැවින් සමාස වශයෙන් පෙණෙතත් සමාස වියයුතුවූ ම පද හැර එලෙසින් පෙණෙන සියල්ල ම මෙහි සමාසත්වයෙන් දක්වනු නො ලැබේ.

**විශෙෂ විභාග** යන්නෙන් අදහස් කරන්නේ ඒ ඒ කවි පිළිබඳ ව හෝ පදයන් පිළිබඳ ව විශෙෂයෙන් කියයුතු යම් යම් දේ ඇති වූ තන්හි එබඳු දේ කීමයි.

තවද මේ වර්ණනාවෙහි මුලින් කියනලද වියරණ විදි ආදිය නැවත නැවත නො කියනු ලැබේ.

## ග්‍රන්ථාරම්භය.

---

ශ්‍රී පරාක්‍රමබාහු මහරජතුමන්ගේ දුහිතෘ වූ "උලකුඩය දේවියට තිසිලෙස සොඳ පුත්රුවනක් දුන මැනවි" යන ආයාචනයෙන් කැලණිවිහාරයෙහි වූ විභීෂණ දෙව්රජහට සන්දේශයක් යවන්නා වූ තොටගමුවේ ෂඩ්භාෂාපරමේශ්වර ශ්‍රී රාහුල මහා ස්වාමිපාදයෝ සැළලිහිණියකු ඒ පිළිබඳ දූතක්‍රියාවෙහි යොදා පළමුකොට ඔහුට ආශිර්වාද කරන්නාහු "සැරද" යනාදි යහගීය කිහු:-

**1 සැරද සුලකළ කුරු-මියුරු තෙපුලෙන් රඳනා,**
**රජකුල රහසැ මැතිනිය-සියනිහි සැළලිහිණි සඳ.**

විභක්ති- සුලකළකුරු මියුරු තෙපුලෙන් 4. රඳනා 9. රජකුලරහසැ 8. මැතිනිය 9. සියන් 3. සැළලිහිණිසඳ 9.

පදාර්ථ- සුලකළ අකුරු, මනා කොට හොබවනලද අකුරු, ඇත්තා වූ; මියුරු තෙපුලෙන්, මධුර වචනයෙන්; රඳනා, ජනරජනය කරන්නා වූ; රජකුල, රාජකුලයන් පිළිබඳ වූ; රහසැ, රහස්‍ය විෂයෙහි; මැතිනිය, මන්ත්‍රීන්ගේ ඥානයට සමාන ඥානයක් ඇත්තා වූ; සැළලිහිණිසඳ, ශාරිකාපක්ෂිරාජය; සියන් ඉහි, ස්වකීයයන් (බන්ධූන්) සමග; සැරද, චිරාත් කාලයක් ජීවත් වෙහිවා.

භාවය- සැළලිහිණිය යුෂ්මතා අක්ෂරශුද්ධියෙන් යුත් මිහිරි වචනයෙන් ජනයා සිත් සතුටු කරන්නෙහි. රජකුලයන් පිළිබඳ රහස් කටයුතුවල දී නුවණින් මැතිවරයෙකු වැනිය. ඒ යුෂ්මතා ඥාතිපක්ෂයන් සමග බොහෝකල් පැවතෙහිවා.

**ක්‍රි: ය:- සැළලිහිණිසඳ (තෝ) සියන් ඉහි සැරද.**

**සැරද** යන ආශිර්වාදාර්ථ විධික්‍රියා පදයා විසින් කථිත හෙයින් **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි. **සැළලිහිණිසඳ** යනු සම්බොධනයයි. **සියන්** යනු ඉහි යන සහාර්ථ නිපාතයොගයෙහි කර්තෘ විභක්තියි.

**අඞ්ගක්‍රියා- ලකළ රඳනා.**

**ලකළ** යනු "අලඞ්කෘත" යන කෘදන්තයෙන් ආ කර්මකාරක අඞ්ගක්‍රියා යි. **අකුරු** යනු කාරකාර්ථවශයෙන් ඉන් උක්ත කර්ම යි. **රඳනා** යනුරඳ (රැඳුම්හි) යන ධාතුවෙන් සිද්ධ යි. කර්තෘකාරක යි. **සැළලිහිණිසඳ** යනු කාරකාර්ථවශයෙන් ඉන් උක්ත කර්තෘයි.

විශේෂණ විශේෂ්‍ය- සැළලිහිණිසඳ යනු විශේෂ්‍යයි. **රඳනා** යනු ද **මැතිනිය** යනු ද තත්තුල්‍යාධිකරණ විශේෂණයි. **රඳනා** යනු විශේෂ්‍යයි. **සුලකළකුරු මියුරු තෙපුලෙන්** යනු තද්භින්නාධිකරණ විශේෂණයි. **මැතිනිය:** විශේෂ්‍යයි. **රජකුලරහසැ:** හි: විශේෂණයි. **ඥාගි:** විශේෂ්‍ය යි. **ඕඝන්:** හි: විශේෂණයි.

සමාස- 1 සුලකළකුරු මියුරු තෙපුලෙන්. 2 රජකුලරහසැ. 3 මැතිනිය. 4 සැළලිහිණිසඳ.

විග්‍රහ- 1 සු (මොනවට) ලකළ=සුලකළ. (අවිය සමස්). සුලකළ වූ අකුරු යමෙක්හි ද ඒ=සුලකළකුරු. (අදර අරුත අනරුත්සමස්) මියුරුවූයේ ද එම තෙපල වූයේ ද=මියුරුතෙපල (වෙසෙසුන් සමස්) සුලකළකුරු වූයේ ද එම මියුරු තෙපල වූයේ ද=සුලකළකුරු මියුරු තෙපල. (වෙසෙසුන් සමස්) එයින්-සුලකළකුරු මියුරු තෙපුලෙන්. 2 රජුන්ගේ කුල=රජකුල (සබඳ විබත් සමස්), රජකුලේ රහස්=රජකුලරහස් (සබඳ විබත් සමස්) එහි-රජකුල රහසැ. 3 මැතින්ගේ තිය එව් තිය යමෙකුට ද ඒ=මැතිතිය (සබඳ අරුත අනරුත් සමස්) 4 සැළ වූයේ ද එම ලිහිණි වූයේ ද=සැළලිහිණි. සැළලිහිණි වූයේ ද එම සඳ වූයේ ද=සැළලිහිණිසඳ (වෙසෙසුන් සමස්)

විශේෂ විභාග- රජවරුන්ගේ අමාත්‍ය විශේෂයෝ බොහෝ ය. ඔවුනතුරෙන් යමෙකු සමග රජවරු ඒ ඒ කටයුතු රහස් වශයෙන් නිශ්චය කර ගණිත් නම් ඒ අමාත්‍යයා මන්ත්‍රියෙකි. ඔහුට "ධීසචිව" යයි ද කියනු ලැබේ. නැණවත් අමාත්‍යයා යනු එහි අර්ථයි. මේ සන්දේශය ද රජකුලයක් පිළිබඳ වූවකි. එබැවින් මේ ගැණ කරණ කථාබස් ආදිය ද රහස් වශයෙන් කටයුතුයි. ඊට මේ සැළලිහිණියා මැතියෙකු මෙන් යෝග්‍ය බව මෙහි පවසත්. රහස් රැකුමෙහි සැළලිහිණියාගේ සමර්ථභාවය උමන්දාවෙන් ද ප්‍රකාශ වේ.

මෙහි වූ "සැරද" යන විධික්‍රියාව 'සැර' යන නිපාතය පූර්වකොට ඇති දෙ- (පණදූරිමෙහි) යන ධාතුවෙන් පරව'අ'ප්‍රත්‍යය යෙදීමෙන් සිඬයි. 'එ' ප්‍රත්‍යය ද විධික්‍රියාවට යෙදෙන ප්‍රත්‍යයක් බැවින් ''සැරදෙ'' කියාද යෙදේ. "සැළලිහිණි සඳ" යන තන්හි 'සඳ' ශබ්දය උත්තමාර්ථයි. එය "සැළලිහිණි" ශබ්දයට විශේෂණ වුවත් විශේෂ්‍යයෙන් පරව යෙදීම ශබ්දස්වභාවයයි. උත්තමාර්ථවාචක "උතුම්, වර, සි" යනාදි ශබ්දයෝ ද එසේයි. ''මුනිතුම, සුරවර, නරසී'' යනාදි වශයෙනි.

මෙසේ ආශීර්වාද කොට ඉක්බිති සැළලිහිණියා පුෂ්පරූපයක් ලෙස නිරූපණය කිරීමෙන් කුශලප්‍රශ්නාදිය කරන්නානු "පුල්මල්" යනාදි දසපද සැහැල්ල කීහු:-

2 පුල්මල් කෙසුරු මෙන්-රන්වණී තෙලෙ සරණයුග
සපු මල් කැලෙව් තුඩ මද රතිනි මනහ ර
නිලුපුල් දෙලෙව් සම්වණී පිය පියපත ර
මලින් කළ රූඑව්-එබැවින් නුබින් එනවර
නි ලූ ද ලද සිඳුබුවො දිගුවරල නි ලූ
නි ලූ ද වට බිඟුපෙළ අද තඹර නි ලූ
ව න දෙව්ලියෝ නොකොළො ද සවණ අබර ණ
එ න මග දුකෙක් නො වී ද සබඳිනි කල ණ
ස න හස බැඳුනු තැන නොහරිණ කර දියු ණ
වෙ න සැප කුමට තොප දකිනා එ ම පම ණ

විභක්ති- පුල්මල් කෙසුරු 2. රන්වන් 1. තෙලෙ 1. සරණයුග 1. සපු මල්කැලි 2. තුඩ 1. මදරතිනි 4. මනහර 1. නිලුපුල්දල 2. සම්වන් 1. පිය 1. පියපතර 1. මලින් 4. කළ 2. රූ 2. එබැවින් 4. නුබින් 6. එන 8. වර 8. ලදසිඳුබුවො 1. දිගුවරල 8. නිලු 8. වට 2. බිඟුපෙළ 1. තඹරනිලූ 1. වනදෙව්ලියෝ 1. සවණ අබරණ 2. එන 8. මග 8. දුකෙක් 1. සබඳිනි 9. කලණ 9. සනහස 2. බැඳුනු 8. තැන 8. නොහරිණ 2. දියුණ 2. වෙන 1. සැප 1. කුමට 5. තොප 2. දකිනා 7. එ 1. පමණ 1.

පදාර්ථ- කලණ සබඳිනි, කල්‍යාණ මිත්‍රයානෙනි; තෙලෙ සරණ යුග, (තොපගේ) ඔය චරණයුගමය; පුල්මල් කෙසුරු මෙන්, පිපියාවූ මල්රෙණු මෙන්; රන්වණී, සවණී වණී ය; තුඩ, තුණ්ඩය; සපුමල් කැලි එව්, චම්පක පුෂ්පකලිකාවක් මෙන්; මදරතිනි, මඳ රක්ත වර්ණයෙන්; මනහර, මනොඥය. පිය, ප්‍රියවූ; පිය පතර, පක්ෂපත්‍ර දෙක; නිලුපුල්දල එව්, නිල්මහනෙල් පත්දෙකක් මෙන්; සම්වණී, ශ්‍යාම වර්ණ ය; එබැවින්, ඒ භාවයෙන් (ඒ ආකාරයෙන්); මලින් කළ රූ එව්, පුෂ්පමය රූපයක් මෙන්; නුබින්, ආකාශයෙන්; එනවර, එන්නාවූ කාලයෙහි; ලදසිඳුබුවො, තරුණ සිඬාඞ්ගනාවෝ; නිලූ, නීල වර්ණ වූ; දිගුවරල, දික් වූ කෙශකලාපයන්හි; නිලූ ද, (තා) ලා නො ගත්තෝ ද?; තඹරනිලූ, තාම්රස වාසස්ථාන කොට ඇත්තා වූ; බිඟු පෙළ, භෘඞ්ගපඞ්ක්තිහු; අද, අවුන්; වටනිලූද, වටලා නොගත්තෝද?; වනදෙව්ලියෝ, වනදෙවතාස්ත්‍රීහු; සවණ අබරණ නොකොළොද, (තා) කර්ණාභරණයක් නොකොළෝ ද?; එන මග, එන්නාවූ මාර්ගයේදී; දුකෙක් නොවීද, (ඇති විය හැකි යම්කිසි) දුකෙක් නුවූයේ ද? බැඳුනු තැන, සිත බැඳුනු ස්ථානයෙහි; දියුණකර, (ඒ බන්ධනය) විගුණ කොට; සනහස, සෙනහය; නොහරිණ, අත් නො හරින්නාවූ; තොප, යුෂ්මත්හු; දකිනා, දර්ශනය කරන්නාවූ (අපට); එ ම, ඒ දර්ශ

නය ම; (නොහොත්) තොප, යුෂ්මත්හුගේ; දකිනා, දැකිමක් වේ නම්; එම, ඒ දර්‍ශනය ම; පමණ,ප්‍රමාණ වේ; වෙන සැප, අන්‍යවූ සැප යක්; කුමට, කිමර්ථ ද? (කුමකටද);

<u>භාවය</u>– නා මල්මුවා රුවස් වැනි හෙයින් පුෂ්ප ලොල වූ සිඬාඞගනාදීන් ගෙන් මග දී තොපට කිසි හිරිහැරයක් නොවූ යේ ද? සුව පහසු කෙසේ ද? නුඹගේ දැක්ම ම අපට පරමතර සුඛයෙකි.

<u>ක්‍රි: ස:</u>– මේ දසපදයෙහි ක්‍රියාකාරක සම්බන්ධ නවයෙකි. ඒ මෙසේයි:– 1 **සරණයුග පුල්මල් කොසුරු මෙන් රන්වන් වේ. 2 තුඩ සපුමල් කැලෙව් මදරතිනි මනහර වේ. 3 පියපතර නිලුපුල් දෙලෙව් සම්වන් වේ. 4 ලදසිදඹුවො (නා) දිගුවරල නිලූ ද? 5 බිහුපෙළ අද (නා) වට නිලූ ද? 6 වනදෙව්ලියෝ (නා) සවණ අබරණ නො කොළො ද? 7 දුකෙක් නොවී ද? 8 වෙන සැප කුමට වේ. 9 එම පමණ වේ.**

<u>උක්තානුක්ත</u>– මෙහි–1, 2, 3, 8, 9 යන තන්හි වූ වේ යන ක්‍රියාව වර්‍තමාන කර්‍තෘකාරක ප්‍රථම පුරුෂ එකවචන යි. එහි–1 වැන්නෙන් **සරණයුග:** උක්තප්‍රකෘති කර්‍තෘ යි. **රන්වන්:** විකෘතිකර්‍තෘයි. **පුල්මල් කොසුරු:** තදුපමානයි. **මෙන්:** උපමාද්‍යෝතක නිපාතයි. 2 **තුඩ:** උක්තප්‍රකෘති කර්‍තෘ යි. **මනහර:** විකෘති කර්‍තෘයි. **සපුමල් කැලි:** තදුපමානයි. **එව්:** උපමාද්‍යෝතක නිපාතයි. **මදරතිනි:** අනුක්ත කරණ යි. 3 **පියපතර;** උක්තප්‍රකෘති කර්‍තෘ යි. **සම්වන්:** විකෘති කර්‍තෘයි. **නිලුපුල්දල:** තදුපමානයි. **එව්:** උපමාද්‍යෝතක නිපාතයි. 8 (වෙන) **සැප:** උක්තකර්‍තෘයි. **කුමට:** පිණිස යන අර්ථයෙහි අනුක්ත සම්ප්‍රදානයි. 9 **එ:** උක්තප්‍රකෘති කර්‍තෘයි. **පමණ:** විකෘති කර්‍තෘයි. **ම:** අවධාරණාර්ථයෙහි නිපාතයි.

4, 5, යන තන්හි වූ **නිලූ** (=තොලූ) යන ක්‍රියාව අතීත කර්‍තෘකාරක ප්‍රථමපුරුෂ බහුවචනයි. එහි–4 **ලදසිදඹුවො:** උක්තකර්‍තෘයි. **නා:** අනුක්ත කර්මයි. **දිගුවරල:** අනුක්තාධාරයි. 5 **බිහුපෙළ:** උක්ත කර්‍තෘයි. **නා:** අනුක්ත කර්මයි. **වට:** ක්‍රියා විශෙෂණයි.

6 වැන්නෙහි **නො–කොළො:** යන ක්‍රියාව අතීත කර්‍තෘකාරක බහුවචනයි. **වනදෙව්ලියෝ;** උක්තකර්‍තෘයි. **නා:** අනුක්තප්‍රකෘති කර්මයි. **සවණ අබරණ:** අනුක්ත විකෘතිකර්මයි.

7 වැන්නෙහි **නො–වී:** යන ක්‍රියාව අතීත කර්‍තෘකාරක ප්‍රථම පුරුෂ එකවචනයි. **දුකෙක්:** උක්තකර්‍තෘයි. මේ සිවුතන්හි ම 'ද' යන්න ප්‍රශනාර්ථයෙහි නිපාතයි.

අඤ්ඤක්‍රියා- පුල්, සාළ, එන, බැඳුනු, (නො) හරිණ, දකින. පුල්: "ඵුල්ල" යන ශබ්දයෙන් ආයේ වේ. කර්තෘකාරකයි. මල්: කාරකාඛ්‍යවශයෙන් උක්තකර්තෘයි. සාළ: සර- (කිරිමෙහි) යන ධාතුයි. කර්මකාරකයි. රූ: කාරකාඛ්‍යවශයෙන් උක්තකර්මයි. එන: එ (ගමන්හි): ධාතුයි. ආධාරකාරකයි. වර-මග: කාරකාඛ්‍යවශයෙන් උක්තාධාරයි. බැඳුනු: බඳ- (බැඳුම්හි.) යන ධාතුයි. ආධාර කාරකයි. තැන: කාරකාඛ්‍යවශයෙන් උක්තාධාරයි. නොහරිණ: නො-නිපාත පූර්ව, හර-(හැරිමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. කොප: කාරකාඛ්‍යවශයෙන් උක්තකර්තෘයි. දකින: දක්-(දැකිමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. අප: කාරකාඛ්‍යවශයෙන් උක්තකර්තෘයි. ("දකින" යන්න භාව වශයෙන් ද ගත හැකිය. එකල්හි "දැකිම" යන අර්ථයි.)

විශෙෂණවිශෙෂ්‍ය- සරණයුග: විශෙෂ්‍යයි; කොලෙ-රන්වන්: තු: විශෙෂණයි; පුල්මල් කොසුරු: උපමා විශෙෂණයි; මෙන්: විශෙෂ්‍යයි. පුල්මල් කොසුරු: හි: විශෙෂණයි; තුඩ: විශෙෂ්‍යයි; මනහර: තු: විශෙෂණයි. මනහර: විශෙෂ්‍යයි. මදරතිනි: හි: විශෙෂණයි; පියපතර: විශෙෂ්‍යයි; පිය-සම්වන්: තු: විශෙෂණයි; රූ: විශෙෂ්‍යයි; සාළ: තු: විශෙෂණයි. සාළ: විශෙෂ්‍යයි; මලින්: හි: විශෙෂණයි; එන: විශෙෂ්‍යයි; නුබින්: හි: විශෙෂණයි; වර: විශෙෂ්‍යයි; එන: තු: විශෙෂණයි; වරල: විශෙෂ්‍යයි, දිගු-නිලු: තු: විශෙෂණයි; තිනුපෙළ: විශෙෂ්‍යයි; තඹරනිලු: තු: විශෙෂණයි; මග: විශෙෂ්‍යයි; එන: තු: විශෙෂණයි; දුකොක්: විශෙෂ්‍යයි; මග: හි: විශෙෂණයි; සබඳිනි: විශෙෂ්‍යයි; සාලුණ: තු: විශෙෂණයි; සාර: විශෙෂ්‍යයි; දිළුණ: හි: විශෙෂණයි; කොප: විශෙෂ්‍යයි; නොහරිණ: තු: විශෙෂණයි; නොහරිණ: විශෙෂ්‍යයි; සනහස: හි: විශෙෂණයි; තැන: විශෙෂ්‍යයි; බැඳුනු තු: විශෙෂණයි; ඒ: විශෙෂ්‍යයි; පමණ: තු: විශෙෂණයි; සැප: විශෙෂ්‍යයි; ලබන: තු: විශෙෂණයි; සැප: විශෙෂ්‍යයි; කුමට: හි: විශෙෂණයි.

සමාස- 1 පුල්මල්කොසුරු. 2 රන්වන්. 3 සරණයුග. 4 සපුමල් කැලි. 5 මදරතිනි. 6 මනහර. 7 නිලුපුල්දල. 8 සම්වන්. 9 පියපතර. 10 ලදසිඳඹුවො. 11. තිනුපෙළ. 12 තඹරනිලු. 13 වනදෙව්ලියෝ. 14 සවණ අබරණ.

විග්‍රහ- (විග්‍රහයෙන් සමාසවල නම් ආදිය දතහැකි තන්හි ඒ නම් ආදිය නො කියමු). 1 පුල් වූයේ ද එ ම මල් වූයේ ද=පුල්මල්. පුල්මලේ කොසුරු=පුල්මල් කොසුරු. 2 රණේ වන් වැනි වන් යමක ද

ඒ=රන්වන් (සබඳ අරුත අනරුත් සමස්). 3 සරණවල යුග=සරණ යුග. 4 සපු වූයේ ද එම මල් වූයේ ද=සපුමල්, සපුමලේ කැලි=සපු මල් කැලි. 5 මඳ වූයේ ද එම රත් වූයේ ද=මඳරත්, ඉන්-මඳරතිනි. 6 මන හරිනුයි=මනහර. (කම්විබත් සමස්). 7 නිල් වූයේ ද එම උපුල් වූයේ ද=නිලුපුල්, නිලුපුලේ දල=නිලුපුල්දල. 8 සම් වූ වන් යමෙක ද ඒ=සම්වන්. (සබඳ අරුත අනරුත් සමස්). 9 පිය ම පතර=පිය පතර. 10 ලද වූවෝ ද ඔහු සිදඹු වූවෝ ද=ලදසිදඹුවො. 11 බිඟුන්ගේ පෙළ=බිඟුපෙළ. 12 තඹර නිල වූයේ යමෙකට ද ඒ=තඹරනිලූ. 13 වෙනෙහි දෙව්=වනදෙව්. වනදෙවියන්ගේ ලියෝ=වනදෙව්ලියෝ. 14. සවණේ අබරණ=සවණ අබරණ.

<u>විශෙෂ විභාග</u>– "රන්වණ්-සම්වණ්" යන දෙතන්හි පදන්ත ඉයන්න නිපාතයෙකි. එය සිංහලෙහි සමහර තන්හි වාක්‍යය අවසන් වූ බව ඇඟවීමට යොදති. මෙහි "නුබිත්" යනු කරණවිබති. පක්ෂි ආදීන්ගේ ගමනට අභස ද කරණ වන බැවිනි. පාලියෙහි ද මෙබඳු තන්හි "ආකාසෙන" යි තෘතියා (කරණ) විභක්තිරූපයෙන් දක්නා ලැබේ. "තඹරනිලූ" යන තන්හි "නිලූ" යන්නේ ප්‍රකෘතිය "නිල" යනුයි. එය ශෘඞ්ගාරවාචක "නිලය" ශබ්දයෙන් ආ ශබ්දයෙකි. මෙහි වර්ණාලඞ්කාරය සඳහා පෙරළි කොට "නිලූ" යි යෙදිනි. "සනහස" යන්න ප්‍රත්‍යයාර්ථ නාමයෙකි. "සනහ ම=සනහස" යනු එහි විග්‍රහයි. සවාර්ථයෙහි 'අස' ප්‍රත්‍යයයි. පාලියෙහි "අත්තවස" යන තන්හි වූ 'වස' ප්‍රත්‍යයෙන් සිංහලට 'අස' කියා ආයේය යි සිතිය හැකිය. 'වස' ප්‍රත්‍යය ද සවාර්ථයි. අර්ථයටම (කාර ණයට ම) 'අත්තවස' යි කියනු ලැබේ. සිංහලෙහි වූ "මුනුලස, වරලස" යනාදිය ද මෙස්යි, "සවණබරණ"යි කියයුතු තන්හි ඡන්දස පිණිස මිත් වැඩුම් විදියෙන් හා අවිදුමත් විදියෙන් "සවණ අබරණ" යි යෙදිනි.

මේ පද්‍යයෙහි පාද (පද්‍ලි) දහයෙකි. එහි–1, 4, පාදදෙක ගිලකුණෙන් ද සෙසු අටපාදය සිවුපද ලකුණෙන් ද යුක්ත ය. ඒ දසපද හැල්ලේ ලක්ෂණයි.

3 ල ප නොමවන් සඳ මෙන් සොමිගුණ ගිහි ණි<br>
 ඔ ප වැඩි ගන හෙල්මැලි සියුමැලි පැමි ණි<br>
 සැ ප රිසි දෙන වැනි රසබසැති සිතුම් ණි<br>
 නොප දුකුමෙන් අප පින් කළ බව දනු ණි

<u>විභක්ති</u>– ලප 2. (නොම) වන් 2. සඳ 2. සොම්ගුණ 4. ගිහිණි 2. ඔප වැඩි 2. ගන 2. හෙල්මැලි සියුමැලි 2. පැමිණි 2. සැප 2. රිසි 2. දෙන 2. රසබස් 3. ඇති 2. සිතුම්ණි 2. නොප 2. දුකුමෙන් 4 අප 7. පින්කළබව 1.

<u>පදාර්ථ</u>– ලප, ශශලාඤ්ඡනයට; නොම වන්, නො වැදුනා වූ; සඳ මෙන්, චන්ද්‍රයා මෙන්; සොමිගුණ, සෞම්‍ය ගුණයෙන්; ගිහිණි, ගහ නවූ; හෙල්මැලි, කාහලාර මෙන්; සියුමැලි පැමිණි, සුකුමාර භාවයට

පැමිණියා වූ; ඔපවැඩි, කාන්තියෙන් අධික වූ; ගත, ශරීරයුක්ත වූ; රිසි සැප, අභිමත සම්පත්; දෙන, දානය කරන්නා වූ; සිතුමිණි වැනි, චින්තාමාණික්‍යයක් බඳු වූ; රස බස් ඇති, මධුර වචන ඇත්තා වූ; නොප, යුෂ්මත්හු; දැකුමෙන්, දකීයෙන්; අප, අස්මත්හුගේ පින්කළ බව, කෘතපුණ්‍යභාවය; දැනුනි, දැනුනේය.

**භාවය**- මිතුර, සොම්ගුණෙන් හා සියුමැලි කමින් දිලියෙන සිරුරෙන් ද, මිහිරි වදනින් ද ශ්‍රෙෂ්ඨ වූ යුෂ්මතා දකින්නට ලැබීම මා පෙර පින් කළ කෙනෙකු බවට සාක්‍ෂ්‍යයෙකි.

**ක්‍රි: ස:- නොප දැකුමෙන් අප පින් කළ බව (අපට) දැනුනි.**

**උ: ක:- දැනුනි** යන අතීත කර්මකාරක ප්‍රථමපුරුෂ එකවචන ක්‍රියාපදයා විසින් කථිත හෙයින් **පින්කළබව:** උක්ත කර්මයි. ඔහු විසින් අකථිත හෙයින් **අපට** යනු අධ්‍යාහෘත අනුක්ත කර්තෘ අර්ථයෙහි සම්බන්ධයි. **දැකුමෙන්:** අනුක්තකරණයි. **නොප:** දැකුමෙන් යන්නෙහි කර්මයි. **අප:** 'පින් කළ බව' යන්නෙහි සම්බන්ධ යි.

**අප්‍රධානක්‍රියා- (නොම) වන්, ගිහිණි, පැමිණි, දෙන, කළ.**

**වන්:** වද-(වැදුම්හි) ධාතුයි. කර්තෘකාරකයි. **සඳ:** කාරකාර්ථවශයෙන් උක්තකර්තෘයි. **ලප:** අනුක්ත කර්මයි. **ගිහිණි:** 'ගහන' යන්නෙන් ආයේ වේ. ආධාරකාරකයි. **ගත්:** කා: උක්තාධාරයි. **පැමිණි:** පමුණ-(පැමිණීමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. **ගත්:** කා: උක්තකර්තෘයි. **දෙන:** දා-(දීමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. **සිතුමිණ:** කා: උක්ත කර්තෘයි. (**සැප:** අනුක්තකර්මයි). **කළ:** කර-(කිරීමෙහි) ධාතුයි. කර්ම කාරකයි. **පින්:** කා: උක්තකර්මයි.

**වි: ස්‍ය- නොප:** විශෙෂ්‍යයි; **ගත-(රස බස් ඇති:** තු: විශෙෂණයි; **ගත:** විශෙෂ්‍යයි; **ඔපවැඩි-ගිහිණි-පැමිණි:** තු: විශෙෂණයි; **සඳ:** විශෙෂ්‍යයි; **(නොම) වන්:** තු: විශෙෂණයි; **(නොම) වන්:** විශෙෂ්‍යයි; **ලප:** භි: විශෙෂණයි; **සැප:** විශෙෂ්‍යයි; **රිසි:** තු: විශෙෂණයි; **දෙන:** විශෙෂ්‍යයි; **සැප:** භි: විශෙෂණයි; **සිතුමිණි:** විශෙෂ්‍යයි; **දෙන:** තු: විශෙෂණයි; **ඇති:** විශෙෂ්‍යයි; **රසබස්:** භි: විශෙෂණයි; **දැකුමෙන්:** විශෙෂ්‍යයි; **නොප:** භි: විශෙෂණයි; **පින් කළ බව:** විශෙෂ්‍යයි; **අප:** භි: විශෙෂණයි.

**සමාස**- 1 සොම්ගුණ. 2 ඔපවැඩි. 3 හෙල්මැලිසියුමැලි. 4 රස බස්. 5 සිතුමිණි. 6 පින් කළ බව.

**විග්‍රහ**- 1 සොම් වූයේ ද එම ගුණ වූයේ ද=සොම්ගුණ. ඉන්. 2 ඔපෙන් වැඩි=ඔපවැඩි. (කරණ වි: සමස්). 3 හෙල්මැලි එව් සියුමැලි=හෙල්මැලි සියුමැලි. (වෙසසුන් සමස්). 4 රස වූයේ ද එම බස්

වූයේ ද=රසබස්. 5 සිතු (දේ) දෙන මිණි=සිතුමිණි. (සාම් ව: සමස්). 6 කළා වූ පින් යමෙකු විසින් ද ඒ=කළපින්-පින්කළ, පින් කළ හුගේ බව=පින්කළබව.

<u>විශෙෂ විභාග</u>– මෙහි සැළලිහිණියාගේ සොම්ගුණය ලප නැති සඳට සම කළ නමුත් ලප නැති සඳක් නැති බැවින් අභූතොපමායි. රසබස (මධුරවචනය) සිතුමිණට සම කිරිමෙන් මධුරවචනය ද සිතු සම්පත් දෙන බව පැවසෙස්. ඒ එසේ මැයි, මධුරවචනතාව ලාභයන්ගෙන් අගහා ලාභයක් බවත් එයින් මනත් ලාභ ලැබෙන බවත්, බුදුවදන්හි ද දක්නා ලැබේ. තවද මධුර වචනය දෙව් මිනිස් ආදි සියලුදෙනාහට ම ප්‍රිය ය. එහෙයින් ම මධුරවචනයෙන් කරණ ආයාචනය ද ඉෂ්ටවන සුලු ය.

"රස බස් ඇති" යන තන්හි 'ඇති' යන්න "ඇත්" යන නිපාතයෙන් ආයේ වේ. එය ක්‍රියාවාචක බැවින් එයිනුදු කාරකාර්ථයක් උගත විය යුතුයි. මෙබඳු තන්හි ඉන් උගත වනුයේ ආධාරාර්ථයෙකි. මෙහි ඉන් උගත වූ ආධාරය 'තොප' යන් තෙක වාච්‍ය වූ සැළලිහිණියායි. සැළලිහිණියා රසබස පිහිටීමට ආධාරස්ථාන යක් වූ බැවිනි. 'රස බස්' යනු එහි අනුකත කර්තෘයි. මෙබඳු සෙසු තැන් ද මෙසේ දතයුතුයි.

මෙහි වූ 'දුනුනි' යන ක්‍රියාව කර්මකාරක යු. බොහෝ අය සිංහලෙහි කර්මකා රක රූපයෙන් පෙනෙන බොහෝ ක්‍රියා පදයන්ට අවිශෙෂයෙන් "තෙම කතු තෙම කම් කිරිය" කියා හෝ 'නිරූතසාහ ක්‍රියා' කියා හෝ පවසති. නමුත් සියල් ලට ම එසේ පැවසීම ශාස්ත්‍රානුකූල නො වේ.

භාෂාවෙහි වූ ධාත්වර්ථයෝ ඇතැම් කෙනෙස් කර්මස්ථවූවෝ ද (කර්මය කෙරෙහි පිහිටියෝ ද) ඇතැම් කෙනෙක් කර්තෘස්ථවූවෝ ද (කර්තෘ කෙරෙහි පිහිටියෝ ද) වෙත්. ඔවුනතුරෙන් යම් ධාතුවක අර්ථය කර්මය කෙරෙහි පිහිටා නම් එබඳු ධාතුව කින් කර්මකාරකයෙහි සිද්ධ වූ ක්‍රියා පමණක් තෙම්කතු තෙමකම් යුයි කියහැකි වේ. පිසීම, බිඳීම, පැලීම ආදි අර්ථයෝ කර්මය කෙරෙහි පිහිටයි, කර්තෘ කෙරෙහි නොපිහිටයි. පිසීම නම් ද්‍රව්‍යයක් මෙලෙක් වීමයි. ඒ ක්‍රියාර්ථය වනාහි කර්තෘ කෙරෙහි පිහිටිය හැකි නොවේ. බිඳීම පැළීම ආදීය ද එසේයි. එබැවින් ඒ ක්‍රියා වෝ "බත පැසේ, කලය බිඳේ, ලීය පැලේ" යනාදි වශයෙන් තෙම කතු තෙම කම් අරුත්හි ද යෙදෙත්. "දූනිම බැලීම" යනාදි ධාත්වර්ථ ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ බැවින් ඒ අර්ථ ඇති ධාතුවලින් සිද්ධ ක්‍රියාවෝ තෙමකතු තෙමකම් නො වෙත්.

මිලඟට උතුම් මිතුරන්ගේ ;තත්වය පවසා තමාගේ වචනය ,ඇසීමට ආඥ කරන්නානු "මිතුරුතුමෝ" යනාදි කව කීහු:-

4 මි තු රු තු මෝ දුක් සැප දෙකෙහි ම පැව ති
බි තු සි තු වම් රූ මෙන් පිටු නොපාවි ති
යු තු ම තු වැඩ ම කෙපල එවැනි ගුණ ඇ ති
හි තු න තු සාර අස යහළුව වඩනු රූ ති

**විභක්ති**- මිතුරුතුමෝ 1. දුක් සැප දෙකෙහි 8. පැවති 8. බිතුසිතුවම් රූ 2. පිටු 2. යුතු 2. මතු වැඩ 4. ම 7. තෙපල 2. එ 2. ගුණ 3. ඇති 9. සිතු 2. නතු 2. යහළුව 9. වඩන 9. රුති 2.

**පදාර්ථ**- මිතුරුතුමෝ, මිත්‍රොත්තමයෝ; පැවති, ප්‍රවෘත්තවූ; දුක් සැප දෙකෙහි ම, දුඃඛසෞඛ්‍යයෙහි ම; බිතු සිතුවම් රූ මෙන්, භිත්තියෙහි අඳිනලද චිත්‍ර කර්ම රූප මෙන්; පිටු නොපාවිති, පරාඞ්මුඛ නො වෙති; එවැනි ගුණ ඇති, ඒ උතුම් මිතුරන්ට සමාන ගුණ ඇත්තා වූ; රුති වඩන, රුචිය වර්ධනය කරන්නා වූ; යහළුව, මිත්‍රය; මතු වැඩ යුතු, අනාගතාභිවෘද්ධියෙන් යුක්ත වූ; ම තෙපල, මාගේ වචනය; සිතු නතු කර, චිත්තය අවනත කොට; අස, ශ්‍රවණය කරව.

**භාවය**- යහළුව! දුක් සැප දෙකේ දී ම ඒ මේ අත නො හැරී බිත්තියෙහි ඇඳි රූප මෙන් එක හැටියට සිටීම උතුම් මිතුරන්ගේ ස්වභාවය යි. නුඹ ද එබඳු උතුම් මිතුරෙකි. ඒ නුඹ සිත් නමා මාගේ වචනය අසාපන්.

**ක්‍රි: ස:**- මෙහි ක්‍රියාකාරක සම්බන්ධ දෙකකි. ඒ මෙසේයි:-

**1 මිතුරුතුමෝ පිටු නොපාවිති.**

**2 යහළුව (තෝ) සිතු නතු කර ම තෙපල අස.**

**උ: ක:**- **නොපාවිති:** වර්තමානයි. කර්තෘකාරකයි. ප්‍රථමපුරුෂ බහුවචනයි. **මිතුරුතුමෝ:** උක්තකර්තෘයි. **පිටු:** අනුක්ත කර්මයි. **2. අස:** විධික්‍රියා යි. **තෝ:** අධ්‍යාහෘත උක්ත කර්තෘ යි. **(ම) තෙපල:** අනුක්තකර්මයි. **කර:** පෙර කිරියයි. **තෝ:** යනුම එහි කර්තෘයි. **සිතු:** අනුක්තප්‍රකෘති කර්මයි. **නතු:** විකෘති කර්මයි. **යහළුව:** සම්බොධනයයි.

**අර්ථක්‍රියා**- **පැවති, යුතු, නතු, වඩන.**

**පැවති:** පවත් (පැවතුම්හි) ධාතුයි. කර්තෘකාරකයි. **දුක් සැප දෙක:** කා: උක්ත කර්තෘ යි. **යුතු:** යොද (යෙදුම්හි) ධාතු යි. කර්තෘකාරකයි. **තෙපල:** කා: උක්තකර්තෘයි. **නතු:** නම (නැමුම්හි) ධාතුයි. කර්ම කාරකයි. **සිතු:** කා: උක්තකර්මයි. **වඩන:** වඩ (වැඩුම්හි) ධාතුයි. කර්තෘ කාරකයි. **යහළු:** කා: උක්තකර්තෘයි.

**වි: ස:**- **මිතුරුතුමෝ:** විශෙෂ්‍යයි. **බිතුසිතුවම් රූ:** උපමා විශෙෂණයි. **දුක් සැප දෙකෙහි:** විශෙෂ්‍යයි. **පැවති:** තු: විශෙෂණයි. **තෙපල:** විශෙෂ්‍යයි. **යුතු:** තු: විශෙෂණයි. **ම:** හි: විශෙෂණයි. **යුතු:** විශෙෂ්‍යයි. **මතුවැඩ:** හි: විශෙෂණයි. **ඇති:** විශෙෂ්‍යයි. **ගුණ:** හි: විශෙෂණයි. **සිතු:** විශෙෂ්‍යයි. **නතු:** තු: විශෙෂණයි. **වඩන:** විශෙෂ්‍යයි. **රුති:** හි: විශෙෂණයි.

**සමාස**– 1 මිතුරුතුමෝ. 2 දුක් සැප දෙසෙහි. 3 බිතු සිතුවම් රූ. 4 මතු වැඩ.

**විග්‍රහ**– 1 මිතුරු වූවෝ ද ඔහු උතුමෝ වූවෝ ද=මිතුරුතුමෝ. 2 දුක් ද සැප ද=දුක් සැප. (ද අරුත් සමස්) දුක් සැපවල දෙසා=දුක් සැප දෙසා. එහි. 3 සිතු වූයේ ද එ ම සාම් වූයේ ද=සිතුවම්. සිතුවම් ම රූ=සිතුවම් රූ. බිත්හි (ඇඳි) සිතුවම් රූ=බිතුසිතුවම් රූ. (අදර වි: සමස්) 4 මතුයෙහි වැඩ=මතුවැඩ.

**විශෙෂ විභාග**– මෙහි සාමාන්‍ය නිර්දෙශයෙන් "සිතුවම්රූ" සි නො කියා "බිතු සිතුවම් රූ" යි වෙනස් කොට කීයේ විශෙෂාර්ථයක් හඟවනු සඳහා වියයුතුයි. වස්ත්‍රාදියෙහි ඇඳි රූප චඤ්චල ය. එහෙයින් ඒ රූප පිටුපාන සුලුය. බිත්තියෙහි ඇඳි රූපයෝ නිශ්චල වෙති. එමෙන් උතුම් මිතුරෝ ද සැප දුක් දෙක්හි ම නිශ්චල වෙති.

මෙහි "ම නොපල" යන්නෙන් ගැණෙන්නේ මේ සන්දෙශයෙහි දක්වෙන ආයාචන වාක්‍යයයි. ඉන් අනාගතයෙහි පින්වත් කුමරුවෙකුගේ ලාභය බලා පොරත්තු වන බැවින් එය මතු වැඩ යුතු වාක්‍යයෙකි. "නොපාම්හි" යන්නෙහි ධාතුව 'පා-(පෑමෙහි)' යනුයි. මෙහි ක්‍රියා රූපය "නොපාති"යි යෙදූයේ නම් වෘත්ත භේදය වන බැවින් ව්‍යාරාගම විධියෙන් "නොපාම්හි"යි යෙදිනි. එපමණ කුදු නොව සිංහල භාෂාවෙහි සමහර තන්හි ප්‍රයෝජ්‍ය 'ව' ප්‍රත්‍යය ස්වාර්ථයෙහි ද යෙදේ. "පොත කියයි" යන්න "පොත කියවයි" කියාද වහර යෙදීම ඊට සාධකයි. එබැවින් "නොපාම්හි" යන තන්හි 'ව' යන්න ඒ 'ව' ප්‍රත්‍යය ද විය හැකිය. පාලි සංස්කෘතයන්හි ද චුරාදි ගණයෙහි ප්‍රයෝජ්‍ය ප්‍රත්‍යය ස්වාර්ථයෙහි යෙදෙන්නාක් මෙනි.

මේ කවියෙන් උතුම් මිතුරන්ගේ මහඟු ගුණයක් පැවසේ. මේ ගැණ ප්‍රාකෘත සූක්තිමඤ්ජරියෙහි:-

> තං මිත්තං කා අබ්බං ජං කිර වසණම්මි දෙශ ආලම්මී,
> ආලිහි අ භිත්තිච්ච උලල අං ව ණ පරම්මුහං ඨා ඉ.

ජං කිර, යමෙක් වනාහි; වසණම්මි, ව්‍යසනයෙහි ද; දෙශ ආලම්මි, දෙශ කාල දෙක්හි ද; ආලිහි අභිත්තිච්ච උලල අං ව, අඳිනලද බිතුසිතුවම් රුවක් මෙන්; පරම්මුහං, පරාඞ්මුඛව; ණ ඨා ඉ, නො සිටී ද; තං, හෙතෙමේ; මිත්තං, මිතුරෙක්; කාඅබ්බ ං, කටයුතුයි (යනු කීහු).

> **5 ප වි රදසඳ නාලෝමුල් දිගතු බ ර**
> **ලෙවි තුර සුසැදු යස මිණි මුතු මල්පත ර**
> **ස වි සිරි පිරි සුර පුර වන් කැලණිපු ර**
> **දෙ වි මෙ හසුන් විබිසණ සුරිඳුට පව ර**

**විභක්ති**– පව්රදසඳ 2. නාලෝ මුල් 2. දිගතුබර 2. ලෙව්තුර 2. සුසැදු 5. යස මණිමුතු මල් පතර 4. සව්සිරිපිරි 8. සුරපුර 2. කැලණිපුර 3. මෙ 2. හසුන් 2. විබිසණ සුරිඳුට 5. පවර 5.

**පදයු**- පච්රදසාඳ, මහාමෙරුපර්ත නමැති සාඳක් ඇත්තා වූ; නාලෝ මුල්, නාගලොක නමැති මුල් ඇත්තා වූ; දිගතුබර, දිශා නමැති ශාඛාභාරයක් ඇත්තා වූ; ලෙව්තුර, ලොක නමැති වෘක්ෂය; යස, කීර්ති නමැති; මිණිමුතු, ප්‍රබුඩ වූ; මල් පතර, පුෂ්ප සමූහයෙන්; සුසැදු, මනා කොට සැරසූ; සුරපුරවන්, දෙව්පුරය මෙන්; සව් සිරි පිරි, සකලෛශ්වර්‍ය්‍යයෙන් පිරුණා වූ; සැලළිහිණිපුර, කල්‍යාණි පුර යෙහි වූ; පවර, උතුම් වූ; විබිසණසුරිඳුට, විභීෂණ සුරෙන්ද්‍රයාට; මෙ හසුන්, මේ සන්දෙශය; දෙව, දෙනය කරව.

**භාවය**- විතුර මුළු ලෙව්හි කීර්තිය පතුරුවා ගෙණ සුරපුර වැනි කැලණි පුර වැඩවසන විබිසණ සුරිඳුට මේ සන්දෙශය දීපන්.

**ක්‍රි: ය:**- (තෝ) මෙ හසුන් විබිසණසුරිඳුට දෙව.

**උ: ක:**- **දෙව්:** විධික්‍රියායි. **තෝ:** අධ්‍යාහෘත උක්තකර්තෘයි. (මෙ) **හසුන්:** අනුක්ත කර්මයි. **විබිසණසුරිඳුට:** අනුක්ත සම්ප්‍රදානයි.

**අඤ්ක්‍රියා**- **සුසැදු, පිරි.**

(සු) **සැදු:** සද-(සැදුම්හි) ධාතුයි. කර්තෘකාරකයි. **විබිසණසුරිඳු:** කා: උක්ත කර්තෘ යි. (**ලෙව්තුර:** අනුක්තකර්මයි. **යසමිණිමුතු මල් පතර:** අනුක්තකරණයි). **පිරි:** පුර-(පිරීමෙහි) ධාතුයි. කර්තෘ කාර කයි. **කැලණිපුර:** කා: උක්ත කර්තෘයි. **සව්සිරි:** අනුක්තකරණයි.

**වි: ෂ්‍ය:**- **ලෙව්තුර:** විශෙෂ්‍යයි. **පච්රදසාඳ-නාලෝමුල්-දිගතුබර:** තු: විශෙෂණයි. **විබිසණසුරිඳුට:** විශෙෂ්‍යයි. **සුසැදු-පවර:** තු: විශෙෂණයි. **සුසැදු:** විශෙෂ්‍යයි. **ලෙව්තුර-යසමිණිමුතු මල් පතර:** භි: විශෙෂණයි. **කැලණිපුර:** විශෙෂ්‍යයි. **සව්සිරිපිරි:** තු: විශෙෂණයි. **විබිසණසුරිඳුට:** විශෙෂ්‍යයි. **කැලණිපුර;** භි: විශෙෂණයි.

**සමාස**- 1 පච්රදසාඳ. 2 නාලෝමුල්. 3 දිගතුබර. 4 ලෙව්තුර. 5 සුසැදු. 6 යසමිණිමුතු මල්පතර. 7 සව්සිරිපිරි. 8 සුරපුර. 9 කැලණි පුර. 10 විබිසණසුරිඳුට.

**විග්‍රහ**- 1 පච්වලට රඳ=පච්රද. පච්රද ම සාඳ වූයේ යමක්හට ද ඒ=පච්රදසාඳ. 2 නයින්ගේ ලොව=නාලොව. නාලොව ම මූල් වූයේ යමක්හට ද ඒ=නාලෝ මුල්. 3 අතුවල බර=අතුබර. දික් ම අතුබර වූයේ යමක්හට ද ඒ=දිගතුබර. 4 ලෙව් ම තුරු=ලෙව්තුරු. එය ලෙව්තුර.

5 සු (මොනවට) සැදු=සුසැදු. 6 මිණියෙන් මුතු=මිණිමුතු. (අවදි වි: සමස්): මල්වල පතර=මල්පතර. මිණි මුතු වූයේ ද එම මල්පතර වූයේ ද=මිණිමුතු මල්පතර. යස ම මිණිමුතු මල්පතර=යසමිණිමුතු මල්පතර. 7 සව් වූයේ ද එම සිරි වූයේ ද=සව්සිරි. සව්සිරින් පිරි=සව්සිරි පිරි. (කරණ වි: සමස්). 8 සුරන්ගේ පුර=සුරපුර. 9 කැලණි වූයේ ද එම පුර වූයේ ද=කැලණිපුර; 10 සුර වූයේ ද එම ඉඳු වූයේ ද=සුරිඳු. (බහුව).

<u>විශේෂ විභාග</u>– මෙහි "පව්රද" යනාදි පද තුන අවයව වශයෙන් ද "ලෙවතුර" යන්න අවයවී (අවයව ඇත්තෙක්) වශයෙන් ද නිරූපණය කෙළෙන් ඒ පද චතුෂ්කය සමස්තරූපක යි.

"දෙව්" යන විධික්‍රියා රූපය 'දෙව' කියා තිබියයුතුයි. එය අලඞ්කාරය සඳහා අකුරු සමකිරීමට අකාර ලොපයෙන් "දෙව්" යයි සෙදින. තවද බොහෝ සන්න පොත්වල "ලෙව්තුරු" කියාද ඊට "ලොක නමැති වෘක්ෂයෙහි" කියා ආධාරත්වයෙන් ද "යස මිණිමුතු මල්පතර" යන්නට "කීර්ති නමැති ප්‍රබුද්ධ මල්සමූහය" කියා සම්බන්ධයෙන් ද අරුත් පවසා තිබේ.

මිලඟට යථොක්ත සන්දේශය කියන කාලය පවසනුවස් "ගනවන්" යනාදි කව කීහු:-

6 ග න ව න් මියුරු නද දෙන ගුවන වන් වි ට
වි ල සි න් මෙමා කරවන මිතුර මන් තු ට
එ හ සු න් පැසුළු පවසමි රස නුසුන් කො ට
අ ස දැ න් ත යන මග සලකුණු මෙතැන්සි ට

<u>විභක්ති</u>– ගන 2. මියුරු 5. නද 2. දෙන 2. ගුවන 2. වන් 8. විට 8. විලසින් 4. මෙ 7. මා 7. කරවන 2. මිතුර 9. මන් 2. තුට 2. එ 2. හසුන් 2. රස 2. නුසුන් 2. ත 3. යන 8. මග 8. සලකුණු 2. මෙ 8. තැන් 8.

<u>පදාර්ථ</u>– ගුවන වන් විට, අහසට පිවිසි කල්හි; මියුරු, මධුර යන්ට; නද දෙන, සන්තොෂ ගෙණ දෙන්නා වූ; ගනවන්, මෙඝයක් මෙන්; විලසින්, ශරීරවිලාසයෙන්; මෙ මා, මේ මාගේ; මන්, චිත්තය; තුට කරවන, සතුටු කරවන්නා වූ; මිතුර, මිත්‍රය; එහසුන්, ඒ සන්දේශය; රස නුසුන් කොට, රසය සුන් නො කොට; පැසුළු, පසු ව; පවසමි, ප්‍රකාශ කරමි; දැන්, මේ කාලයෙහි; මෙතැන් සිට, මේ ස්ථානයේ පටන්; ත යන, තා ගමන් කරන්නා වූ; මග, මාර්ගයෙහි; සලකුණු, සඞ්කෙතයන්; අස, ශ්‍රවණය කරව.

<u>භාවය</u>– අහස්ගත මෙඝය මොනරුන් සතුටු කෙරේ. එලෙසින් අහස්ගත නුඹ ද ශරීරවිලාසයෙන් මා සිත් සතුටු කරන්නෙහි ය. මිතුර, මා කී ඒ සන්දේශය පසු ව පවසමි. දැන් ඉහින් මෙතැන් පටන් නුඹට යන්නට තිබෙන මාර්ගයෙහි තොරතුරු අසා දැනගන්.

ක්‍රි: ය– 1 මිතුර (මම) රස නුසුන් කොට එහසුන් පැසුළු පවසමි. 2 (තෝ) මෙතැන් සිට මග සලකුණු අස.

උ: ක- පවසමි: අනාගතයි. කර්තෘ කාරකයි. උ: එකවචනයි. මම: අධ්‍යාහෘත උක්ත කර්තෘයි. (එ) හසුන්: අනුක්ත කර්මයි. පැසැළු: ක්‍රියා විශෙෂණයි. කොට: පෙරකිරියයි. රස: අනුක්තප්‍රකෘති කර්මයි. නුසුන්: විකෘතිකර්මයි. මිතුර: සම්බොධනයි. අස: විදිකිරියට තෝ: අධ්‍යාහෘත උක්ත කර්තෘයි. මගසලකුණු: අනුක්ත කර්මයි. සිට: පෙර කිරියට මෙතැන්: අනුක්තාධාරයි.

අඞ්ගක්‍රියා– දෙන, වන්, කරවන, නුසුන්, යන.

දෙන: කර්තෘකාරකයි. ගන: උක්තකර්තෘයි. වන්: වද–(වැදුම්හි) ධාතුයි. කර්තෘකාරකයි. ගන–නුබ: කා: උක්තකර්තෘයි. කරවන: කර්තෘ කාරකයි. මිතුර: කා: උක්තකර්තෘයි. මන්–තුට: අනුක්තකර්මයි. (නු) සුන්: සිද–(සිඳුම්හි) ධාතුයි. කර්මකාරකයි. රස: කා: උක්තකර්මයි. යන: ආධාරකාරකයි. මග: කා: උක්තාධාරයි.

වි: ෂ්‍ය– මිතුර: විශෙෂ්‍යයි. කරවන: තු: විශෙෂණයි. ගන: විශෙෂ්‍යයි. දෙන; තු: විශෙෂණයි. දෙන: විශෙෂ්‍යයි. මිහුරු–නද: හි: විශෙෂණයි. වන්: විශෙෂ්‍යයි. ගුවන: හි: විශෙෂණයි. විට: විශෙෂ්‍යයි. වන්; තු: විශෙෂණයි. කරවන: විශෙෂ්‍යයි. විලසින්: හි: විශෙෂණයි. මන්: විශෙෂ්‍යයි. තුට: තු: විශෙෂණයි. මන්: විශෙෂ්‍යයි. මා: හි: විශෙෂණයි. මා: විශෙෂ්‍යයි. මෙ: තු: විශෙෂණයි. රස: විශෙෂ්‍යයි. නුසුන්; තු: විශෙෂණයි. කොට: විශෙෂ්‍යයි. නුසුන්: හි: විශෙෂණයි. මග: විශෙෂ්‍යයි. යන: තු: විශෙෂණයි. යන: විශෙෂ්‍යයි. න: හි: විශෙෂණයි. සලකුණු: විශෙෂ්‍යයි. මග: හි: විශෙෂණයි. සිට: විශෙෂ්‍යයි. මෙතැන්: හි: විශෙෂණයි.

මෙහි සමාස වශයෙන් කියයුත්තක් නො පෙනේ.

විශෙෂ විභාග– මෙහි සැළලිහිණියා මෙහෙයකාට ද, නාමා මොනරෙකුට ද සම කරෙන්. "පැසුළු" යන්න නිපාතයි. "රස නුසුන් කොට පවසමි" යන්නෙන් පැවසෙන්නේ ඒ සන්දෙශය වඩා පමා නො කොට පවසන බවයි. කාල්ගත විමෙන් වන්නේ කටයුතු ආදියේ රසවත් බව සුන්වීම සවභාවයෙකි.

මෙහි කී පරිදි මග සලකුණු පවසන්නාහු පළමුකොට පිටත්වීමට ඉම් වූ ජය වර්ධනපුරය වණන්නාහු මේ දැක්වෙන කව් සත කීහු:-

7 පොහොසද්දන ඇති තුණුරුවනැ බැතිපෙ මා
මු ලු ව ද්දන සුරපුර පිරි සිරින් හැ මා
ජ ය ව ද්දන කොරුමෙන් සුසැදු නම න මා
ජ ය ව ද්දන පුරවර දනු මිතුරු තු මා

විභාගයි– පොහොසද්දන 3. ඇති 2. තුණුරුවනැ 8. බැතිපෙමා 3. මුලු 2. වද්දන 2. සුරපුර 2. පිරි 4. සිරින් 4. හැමා 4. ජය 7. වද්දන 2. කොරුමෙන් 4. සුසැදු 2· නම 7. නමා 2. ජයවද්දන පුරවර 2. මිතුරුතුමා 9.

පදාර්ථ– තුණුරුවනැ, බුද්ධාදිරත්නත්‍රයෙහි; බැතිපෙමා, භක්ති ප්‍රෙම ඇත්තාවූ; පොහොසද් දන ඇති, ප්‍රභූජනයා ඇත්තාවූ; පිරි, සම්පූර්ණවූ; හැමා සිරින්, සකලසම්පත්තියෙන්; සුරපුර, දෙව්පුරය; මුලු වද්දන; මුලු ගන්වන්නාවූ; ජය වද්දන කොරුමෙන්, ජයවර්ධනය කිරීමෙන්; නම නමා, ස්වකීය නාමය; සුසැදු, මනාකොට සැදුවාවූ; ජයවද්දනපුරවර, ජයවර්ධනපුරවරය; මිතුරුතුමා, මිත්‍රොත්තමය; දනු, දැනගණුව.

භාවය– මිතුර බුඹ බොඹ ප්‍රභූන් ඇති, ඉසුරෙන් දෙව්පුරයටත් වඩා ශ්‍රෙෂ්ඨවූ, ජය වැඩුමෙන් ස්වකීය නාමය හොඳට සැදූ ජයවර්ධනපුරය දැනගත්.

ක්‍රි: ය– මිතුරුතුමා (තෝ) ජයවද්දනපුරවර දනු.

උ: ක– දනු: විධික්‍රියායි. තෝ: උක්තකර්තෘයි. ජයවද්දන පුරවර: අනුක්තකර්මයි. මිතුරුතුමා: සම්බොධනයි.

අර්ථක්‍රියා– වද්දන, පිරි, සුසැදු.

වද්දන: වද (වැදුම්හි) ධාතුයි. කර්තෘකාරකයි. ජයවද්දනපුර වර: කා: උක්තකර්තෘයි. මුලු: අනුක්තකර්මයි. සුරපුර: ප්‍රයොජ්‍ය කර්මයි. (පිරි–සිරින්: අනුක්තකරණයි.) පිරි: පුර (පිරීමෙහි): ධතුයි. කර්තෘ කාරකයි. සිරි: කා: උක්තකර්තෘයි. සුසැදු: කර්තෘකාරකයි. ජය වද්දනපුරවර: කා: උක්තකර්තෘයි. (නමා: අනුක්තකර්මයි. කොරු මෙන්: අනුක්තකරණයි.)

වි: ශ්‍ය– ජයවද්දනපුරවර: විශෙෂ්‍යයි; ඇති–වද්දන–සුසැදු: තු: විශෙෂණයි. ඇති: විශෙෂ්‍යයි. පොහොසද්දන: හි: විශෙෂ ණයි. පොහොසද්දන: විශෙෂ්‍යයි. බැතිපෙමා: තු: විශෙෂණයි. බැතිපෙමා: විශෙෂ්‍යයි. තුණුරුවනැ: හි: විශෙෂණයි. වද්දන: විශෙෂ්‍යයි. සුරපුර– මුලු: හි: විශෙෂණයි. සිරින්: විශෙෂ්‍යයි.

පිරි: පු: විශෙෂණයි. සුසැදු: විශෙෂ්‍යයි. සොරුමෙන්: හි: විශෙෂණයි. සොරුමෙන්: විශෙෂ්‍යයි. වද්දනා: හි: විශෙෂණයි. වද්දනා: විශෙෂ්‍යයි. ජය: හි: විශෙෂණයි. සුසැදු: විශෙෂ්‍යයි. නමා: හි: විශෙෂණයි.

සමාස- 1 පොහොසද්දන. 2 තුණුරුවන. 3 බැතිපෙමා. 4 ජයවද්දනපුරවර.

විග්‍රහ- 1 පොහොසත් වූයේ ද එම දන වූයේ ද=පොහොසද්දන. 2 රුවන් තුණක් එක්කොට සලකනලද්දේ=තුණුරුවන් (එහි) 3 බැතිද පෙම්ද=බැතිපෙම්, (බැතිපෙම් ඇතියේ=බැතිපෙමා.) 4 පුර වූයේ ද එම වර වූයේ ද=පුරවර. ජයවද්දන ම පුරවර=ජයවද්දනපුරවර.

විශෙෂවිභාග- 'තුන්රුවන්' යන තන්හි 'උ' ආගමයෙන් "තුණුරුවන්" යි සිඬ යි. "වද්දන" යන්න ප්‍රයොජ්‍ය සහිත අකර්මක්‍රියාවකි. "වද්වනා" යි සිටි තන්හි පූර්වරූපවිධියෙන් "වද්දන" යි සිඬයි. ප්‍රයොජ්‍ය රහිතකල්හි "වදින" යනු වේ. එකල්හි "සුරපුර" යනු කතෘ යි. ප්‍රයොජ්‍ය වීමෙන් ඒ කතෘ කර්ම විය. සුරපුරය මුලුවැද්දීමෙන් අගවන්නේ ජයවර්ධනපුරය විසින් සුරපුරය පැරද්දූ බවයි.

8 සැදි රන තඹර පෙළ රණ තිසරුන් රුවැ ති
විදි දිය දහර ලෙල දෙන දිගු නරු පටැ ති
රැදි රල රැලැති හොය දියවන්නා නමැ ති
ඇදි පුර අගන පටසළු සිරි රැපැසි නි ති

විභක්ති- සැදි 1. රනතඹරපෙළ 4. රණතිසරුන් 7. රු 3. ඇති 1. විදි 3. දියදහර 3. ලෙලදෙන 3. දිගු 3. තරුපට 3. ඇති 1. රැදි 3. රලරැලි 3. ඇති 1. හොය 1. දියවන්නා නම් 3. ඇති. 1. ඇදි 1. පුරඅගන 3. පටසළු 1. සිරි 2.

පදාර්ථ- රනතඹරපෙළ, රක්තතාමරසපඞ්ක්තියෙන්; සැදි, සජ්ජිතවූ; රණතිසරුන්, ස්වර්ණහංසයන්ගේ; රුඇති, රූපයන් ඇත්තාවූ; විදි, විකීර්ණවූ (විසුරුණාවූ); දියදහර, ජලධාරා නමැති; ලෙලදෙන, ලීලොපෙතවූ; දිගු, දීර්ඝවූ; නරුපට ඇති, නිවීපට්ටයක් ඇත්තාවූ; රැදි, රඤ්ජිතවූ; රල, තරඞ්ග නමැති; රැලිඇති, රැලිඇත්තාවූ; දියවන්නා නමැති, දියවන්නා යන නමක් ඇත්තාවූ; හොය, ඔය (ඇළ); පුරඅගන, පුරනමැති ස්ත්‍රිය විසින්; ඇඳි, අඳිනලද්දාවූ; පට සළු, පට්ටවස්ත්‍රය; සිරි, ශොභාව; ඇරැපැසි, ගෙණහැර දැක්විය.

භාවය- ජයවර්ධනපුරයෙහි වූ දියවන්නා (දුවන්නා) ඇළ පුරස්ත්‍රිය ඇඳගත් පටසළුවක් වැනිය.

ක්‍රි: ස:- හොය සිරි නිති ඇරැපෑ.

ආ: ක:- **ඇරුපෑ:** අතීත කතෘකාරක ප්‍රථමපුරුෂ ඒකවචනයි. **හොය:** උක්ත කතෘයි. **සිසි;** අනුක්තකම්යි. **නිති:** ක්‍රියා විශෙෂණයි.

අඛ්‍යාක්‍රියා- **සැදි, විදි, ලෙලදෙන, රැඳි, ඇඳි.**

**සැදි:** කම්කාරකයි. **හොය:** කා: උක්තකම්යි. **විදි:** විද (විසිරි මෙහි) ධාතුයි. කතෘකාරකයි. **දියදහර:** කා: උක්තකතෘයි. **ලෙල දෙන:** ලෙල පූර්ව 'ද' ධාතුයි. කතෘකාරකයි. **තරුපට;** කා: උක්ත කතෘයි. රැඳි: රඳ (රැඳුම්හි) ධාතුයි. කතෘකාරකයි. **රලරැළි;** කා: උක්තකතෘයි. **ඇඳි;** අඳ (ඇඳුම්හි) ධාතුයි. කම්කාරකයි. **පටසළු:** කා: උක්තකම්යි.

වි: ෂ්‍ය:- **හොය:** විශෙෂ්‍යයි. **සැදි-ඇති:** (සතරම) තු: විශෙෂණයි. **සැදි:** විශෙෂ්‍යයි. **රතතඹරපෙළ:** හි: විශෙෂණයි. **රූ:** විශෙෂ්‍යයි. **රණතිසරුන්;** හි: විශෙෂණයි. **තරුපට:** විශෙෂ්‍යයි. **විදිදියදහර-ලෙලදෙන-දිගු:** තු: විශෙෂණයි. **ඇඳි:** විශෙෂ්‍යයි. **පුරඅඟන:** හි: විශෙෂණයි.

සමාස- 1 රතතඹරපෙළ. 2 රණතිසරුන්. 3 දියදහර. 5 තරුපට. 6 රලරැළි. 7 පුරඅඟන. 8 පටසළු.

විග්‍රහ- 1 රත් වූයේ ද එම තඹර වූයේ ද=රත්තඹර. රත්තඹරන්ගේ පෙළ=රත්තඹරපෙළ- රතතඹරපෙළ. 2 රන් වූවෝ ද ඔහු තිසර වූවෝ ද=රන්තිසර. (ඔවුන්). 3 දියේ දහර=දියදහර, දිය දහර එවි=දියදහර. 4 තරුවේ පට=තරුපට. 5 රල ම රැළි=රල රැළි. 6 පුර ම අඟන=පුරඅඟන. පට ම සළු=පටසළු.

විශෙෂවිභාග- මෙහි පුරය සත්‍රිරූපයෙන් ද, හොය පටාවසත්‍රරූපයෙන් ද නිරූපිත ය. හොය හා පටසළුව යන දෙක ම පියුම්වලින් හා හංස රූපවලින් යුක්ත ය. හොය දියදහරින්ද, පටසළුව ලෙලදෙන දිගු තරුපටින් ද, හොය රලවලින් ද පටසළුව රැළිවලින් ද යුක්ත ය. "ඇරුපෑ" යන්න "ඇරු" යන පෙරකිරිය පූර්ව 'පා' (පෑමෙහි) යන් ධාතුවෙන් සිද්ධ යි. 'යි' යනු නිපාතයි. 'ඇරු' යන්නෙහි'ඇ'යන්න බොහෝ සේ ලොප්වන සුලුයි. "ඇරගෙණ-රුගෙණ" යනාදී වශයෙනි. සිංහලෙහි සමහරතන්හි පෙරකිරියෙන් පරව 'ද' ධාතුව යෙදී මෙන් ද ක්‍රියාපදයන්ගේ සිද්ධිය වේ. එබඳු තැන්හි 'ද' ධාතුවේ විශෙෂාර්ථයක් නො ලැබේ. මෙහි වූ "ලෙලදෙන" යන්න ද එසේ සිද්ධ විය හැකි ය. "ලෙලෙන" යන්න වැනිය. "රතතඹරපෙළ-රණතිසරුන්" යන පදක්හි මත්වැඩීමද, "පුර අඟන" යන තන්හි අවිදුමින් විදියද දක්නාලැබේ.

9 සමනොල   මුහුළ මහසමුදුර මෙවුල්බ   ර
සුළකළ   පුවළ ලකගන සිරියොවුන් ව   ර
තරකළ   විසල් වාසල් යතුරු මෙ නුව   ර
බැඳහළ   රුවන් තනපට කියලිය පවු   ර

විභක්ති– සමනොළමුහුළ 3. මහසමුදුර මෙවුල්බර 3. සුළකළ 3. පුවළ 3. ලකගන 3. සිරි 4. යොවුන්වර 8. තරකළ විසල් වාසල් යතුරු 2. මෙනුවර 7. හළ 2. රුවන්තනපට 2. පවුර 1.

පදාර්ථ– මෙනුවර පවුර, මේ නගරයෙහි ප්‍රාකාරය තෙමේ; සමනොළ මුහුළ, සමනකූට පර්වත නමැති ධම්මිල්ලයක් (කොන්ඩයක්) ඇත්තාවූ; මහසමුදුර, මහා සමුද්‍ර නමැති; මෙවුල්බර, මෙඛලාභාරයක් ඇත්තාවූ; සුළකළ, මොනවට අලඞ්කෘතවූ; පුවළ, ප්‍රෞඪවූ; ලකගන, ලඞ්කාඞ්ගනාව විසින්; සිරි, ඓශ්වර්‍ය්‍යයෙන්; යොවුන්වර, යෞවනකාලයෙහි; බැඳහළ, බන්ධනය කොට හරිණලද්දවූ; තරකළ, ස්ථිරීකෘතවූ (ස්ථිරවූවක් කරණලද්දවූ); විසල්, විශාලවූ; වාසල්, ගොපුරද්වාර නමැති; යතුරු, යතුරු ඇත්තාවූ; රුවන්තනපට, රත්නමය පයොධරපට්ට ශොභාවක්; කියලිය, ප්‍රකාශ කොළේය.

භාවය– ජයවර්ධනපුරයෙහි ප්‍රාකාරය ලඞ්කාඞ්ගනාව තරුණකාලයේදී බැඳගෙණ සිට තලතුන් කාලයෙහි හැරදමාපු රුවන් තනපට වැනිය.

ක්‍රි: ය– පවුර රුවන්තනපට කියලිය.

උ: ත– කියලිය: අතීත කාලීනාරක ප්‍රථම පුරුෂ ඒකවචනයි. පවුර: උක්තකර්තෘ යි. රුවන්තනපට: අනුක්තකර්මයි.

අ ප්‍රධාන ක්‍රියා– (තර) කළ, (බැඳ) හළ.

කළ: කර්මකාරකයි. විසල්වාසල්යතුරු: කා: උක්තකර්මයි. හළ: හර (හැරීමෙහි): ධාතුයි. කර්මකාරකයි. රුවන්තනපට: කා: උක්තකර්මයි.

වි: ෂ්‍ය– පවුර: විශෙෂ්‍යයි; මෙනුවර: නි: විශෙෂණයි; ලකගන: විශෙෂ්‍යයි; සමනොළමුහුළ–මහසමුදුරමෙවුල්බර–සුළකළ–පුවළ: ප්‍ර: විශෙෂණයි; යොවුන්වර: විශෙෂ්‍යයි; සිරි: නි: විශෙෂණයි; හළ: විශෙෂ්‍යයි; බැඳ: නි: විශෙෂණයි. රුවන්තනපට: විශෙෂ්‍යයි; තරකළ විසල්වාසල්යතුරු–හළ: ප්‍ර: විශෙෂණයි.

**සමාස**– 1 තරකළවිසල්වාසල්යතුරු. 2 සමතොළමුහුළ. 3 මහ සමුදුරමෙවුල්බර. 4 ලකහන. 5 යොවුන්වර. 6 රුවන්තනපට.

**විග්‍රහ**– 1 තර නුවූවක් තරවූවක් කෙළේ නුයි=තරකළ. විසල් වූයේ ද එම වාසල් වූයේ ද=විසල්වාසල්. විසල් වාසල්ම යතුරු= විසල් වාසල් යතුරු. තරකළාවූ විසල් වාසල් යතුරු යම්කද ඒ=තර කළ විසල් වාසල් යතුරු. 2 සමතොළ ම මුහුළ වූයේ යම්කට ද ඒ=සම තොළ මුහුළ. 3 මහ වූයේ ද එම සමුදුර වූයේ ද=මහසමුදුර, මහ සමුදුර ම මෙවුල්බර වූයේ යම්කට ද ඒ=මහසමුදුර මෙවුල්බර. 4 ලක ම අහන=ලකහන. 5 යොවුනෝ වර=යොවුන්වර. 6 තන බඳින පට= තනපට (කම් වි: සමස්) රුවනින් කළ තනපට=රුවන්තනපට. (කරණ වි: සමස්)

**විශෙෂවිභාග**– තරුණකාලයෙහි අඳින පලඳින බොහෝ ඇඳුම් පැල ඳුම් තරුණ කාලය ඉක්ම ගිය පසු අත්හැරීම සවභාවය යි. ලකහන ද එසේ කළ බව මෙහි දක්වේ. මේ කාලයෙහි ලංකාව ඉසුරුමත්කමින් ඉතා වැඩි තුබුනු බවක් මෙයින් පැවසේ. මෙහි ලංකාව ස්ත්‍රීරූපයෙන් ද, සමනතකූටය ධම්මිල්ල රූපයෙන් ද මහාසමුද්‍රය මෙබලාරූපයෙන් ද නිරූපිත යි.

"තරකළ" යන්න "සපිරිකෘත" යන්නෙන් සිංහල වූයේ යයි ද ගතහැකිය. එය සංස්කෘතයෙහි අභූතතද්භාවාර්ථවශයෙන් සිඬ යි. එහෙයින් තර නුවූ වක් තර වූවක් කෙළේ යන අර්ථය ගැණේ.

10 දු ව න බඳ කිකිණි හයකුර පහර න ද
ස ව න තල නිනද ගිජිඳුන් සෙමෙර බ ඳ
ර ව න නොයෙක තුරු ජයසක් හඬ නොම ඳ
දෙව න මුහුද මෙන් ගුම් ගණි පුර නිබ ඳ

**විභක්ති**– දුවන 7. බඳකිකිණි 7. හය 7. කුරපහරනද 4. සවනතල නිනද 4. ගිජිඳුන් 7. සෙමෙරබඳ 7. රවන 4. නොයෙකතුරු 4. ජයසක්හඬ 4. නොමඳ 4. දෙවන 2. මුහුද 2. ගුම් 2. පුර 1. නිබඳ 2.

**පදාර්ථ**– දුවන, දුවන්නාවූ; බඳකිකිණි, බඳිනලද කිකිණි ඇත් තාවූ; හය, අශ්වයන්ගේ; කුරපහරනද, කුරපහරින් හටගත් නාද යෙන්ද; සෙමෙරබඳ, බඳිනලද චාමර ඇත්තාවූ; ගිජිඳුන්, ගජේන්ද්‍ර යන්ගේ; සවණතල නිනද, කණ්තාල ශබ්දයෙන් ද; රවන, ශබ්ද කරවනු ලබන්නාවූ; නොයෙකතුරු, නොයෙක් තූර්‍ය්‍යයෙන් ද; නො මඳ, බොහොවූ; ජයසක්හඬ, ජයශඞ්ඛනාදයෙන් ද; පුර, පුරය; නිබඳ, නිරන්තරයෙන්; දෙවනමුහුද මෙන්, විතීය සමුද්‍රයක් මෙන්; ගුම් ගණි, ඝොෂග්‍රහණය කොටේ.

<u>භාවය</u>- නිරතුරු දුවන අසුන්ගේ ඛුරප්‍රහාරනාද, ඇතුන්ගේ කණ්තාල නාද, භූෂණනාද, ශඞ්ඛනාද, යන මෙයින් ගැවසිගත් ජයවර්ධනපුරය දෙවන මුහුදක් වැනි වේ.

**<u>ක්‍රි: ය</u>- පුර නිබඳ දෙවන මුහුද මෙන් ගුම් ගණී.**

**<u>උ: න</u>- ගණී:** වර්තමාන කර්තෘකාරක ප්‍රථමපුරුෂ එකවචනයි. **පුර:** උක්ත කර්තෘයි. **ගුම්:** අනුක්ත කර්මයි. **නිබඳ:** ක්‍රියා විශෙෂණයි. **දෙවනමුහුද:** 'පුර' යන්නේ උපමා යි.

**<u>අඤ්ඤක්‍රියා</u>- දුවන, බඳ, රවන.**

**දුවන:** දුව (දිවීමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. **හය:** කා: උක්ත කර්තෘ යි. **බඳ:** බඳ (බැඳුම්හි)ධාතුයි. කර්මකාරකයි. **කිකිණි-සෙමෙර:** කා: උක්ත කර්මයි. **රවන:** රා (නදකිරීමෙහි) ධාතුයි. කර්මකාරකයි. **තුරු:** කා: උක්ත කර්ම යි.

**<u>වි: ෂ්‍ය</u>:- ගුම්:** විශෙෂ්‍යයි. **කුරපහරනද-සවණතල නිනද-නොයෙකතුරු-ජයසක්හඬ:** හි: විශෙෂණයි. **හය:** විශෙෂ්‍යයි. **දුවන-බඳකිකිණි:** තු: විශෙෂණයි. **කුරපහරනද:** විශෙෂ්‍යයි. **හය:** හි: විශෙෂණයි. **ගිජිඳුන්:** විශෙෂ්‍යයි. **සෙමෙරබඳ:** තු: විශෙෂණයි. **සවණතල නිනද:** විශෙෂ්‍යයි. **ගිජිඳුන්:** හි: විශෙෂණයි. **නොයෙකතුරු:** විශෙෂ්‍යයි. **රවන:** තු: විශෙෂණයි. **ජය සක්හඬ:** විශෙෂ්‍යයි. **නොමඳ:** තු: විශෙෂණයි.

**<u>සමාස</u>**- 1 බඳ කිකිණි. 2 කුරපහරනද. 3 සවණතල නිනද. 4 ගිජිඳුන්. 5 සෙමෙරබඳ. 6 නොයෙකතුරු. 7 ජයසක්හඬ. 8 නොමඳ.

<u>විග්‍රහ</u>- 1 බඳ කිකිණි යමෙකුන්ට ද ඔහු-බඳකිකිණි. 2 කුරේ පහර=කුරපහර. කුරපහරේ නද=කුරපහරනද. 3 සවණේ තල= සවන් තල-සවණතල. සවණතලේ නිනද=සවණතල නිනද. 4 ගජ වූවෝ ද ඔහු ඉඳු වූවෝ ද-ගිජිඳු (ඔවුන්). 5 බඳ වූ සෙමෙර යමෙකුන් හට ද ඔහු=බඳසෙමෙර-සෙමෙරබඳ. 6 එකක් නොවනුයේ=නොයෙක්. නොයෙක් වූවෝ ද ඔහු තුරු වූවෝ ද=නොයෙක්තුරු-නොයෙකතුරු. 7 ජය පිණිස පිඹින සක්=ජයසක් (සපදන් වි: සමස්) ජයසකේ හඬ=ජයසක්හඬ. 8 මඳ නුවූයේ=නොමඳ (අව්‍යය සමස්.)

විශෙෂ විභාග– නිතොරව පවත්නා අශ්වඛුරනාදදිය නිසා සමුද්‍ර ඝොෂය මෙන් ඇසෙන ජයවර්ධනපුරය දෙවන මුහුදක් වැනි යයි කී නමුත් දෙවනා මුහුදක් නැති බැවින් මේ අභූතොපමාවකි.

'බඳසෙමෙර' යන්න "සෙමෙරබඳ"යි වූයේ පදපෙරළි වශයෙනි. "ජයසක්" යනු මධ්‍යපද ලොපසමාසයි. "ජය පිණිස පිඹින සක්" යන වාක්‍යයෙහි මැද පදය වූ 'පිඹින' යන්නේ ලොපයයි.

11 සි හි ල් සපු සුවඳ ගෙණ එන උයන්ව ල
සි හි ල් නෙලෙන් හඬවන මිණිකිකිණි සැ ල
වි පු ල් රත්සෙමෙරබඳ රත්දද සස ල
ල ක ල් මෙපුර තුළ වළහා රිවිතැවු ල

විභක්ති– සිහිල් සපු සුවඳ 2. එන 4. උයන්වල 8. සිහිල් නෙලෙන් 4. හඬවන 1. මිණිකිකිණිසැල 2. විපුල් 2. රත්සෙමෙර 2. බඳ 1. රත්දද 1. සසල 1. ලකල් 8. මෙ 8. පුරතුළ 8. රිවිතැවුල 2.

පදාර්ථ– උයන්වල, උද්‍යානයන්හි; සිහිල් සපුසුවඳ, සඳුන් මල් සුවඳ හා සපුමල් සුවඳ; ගෙණ එන, ග්‍රහණය කොට එන්නාවූ; සිහිල් නෙලෙන්, ශීත වාතයෙන්; මිණිකිකිණි සැල, මිණියෙද්ද කිකිණි සමූහය; හඬවන, ශබ්දකරවන්නාවූ; විපුල්, මහත්වූ; රත් සෙමෙර, රක්ත චාමරයන්; බඳ, බැන්දාවූ; සසල, චචලවූ; රත්දද, රක්ත (පට්ට) ධවජ සමූහය; ලකල්, මනොඥවූ; මෙපුරතුළ; මේ නගරාභ්‍යන්තරයෙහි වූ; රිවිතැවුල, සූර්‍ය්‍යතාපය; වළහා, වළක්වයි.

භාවය– සඳුන්මල් සපුමල් සුවඳින් යුත් සිහිල් වාතයෙන් මිණිකිකිණි හඬවන්නාවූ ද රත්සෙමෙරෙන් යුක්තවූ ද, රතු රෙදිවලින් කළ ධවජ මෙ නුවර තුළ හිරුරැස් දුරුකෙරේ.

ක්‍රි: ය:– රත්දද රිවිතැවුල වළහා.

ක්‍රි: කා:- වළහා: වර්තමාන කර්තෘකාරක ප්‍රථම පුරුෂ එකවචනයි. රත්දද: උක්තකර්තෘයි. රිවිතැවුල: අනුක්තකර්මයි.

අර්ධක්‍රියා:- එන, හඬවන, බඳ.

එන: කර්තෘකාරකයි. සිහිල්නල: කා: උක්තකර්තෘයි. හඬවන: හඬ (හැඬීම්හි): ධාතුයි. කර්තෘකාරකයි.: රත්දද: කා: උක්තකර්තෘයි. බඳ: ආධාරකාරකයි. රත්දද: කා: උක්තාධාරයි.

<u>වි: පද:</u>- **සිහිල්සපුසුවඳ:** විශෙෂ්‍යයි. **උයන්වල:** හි: විශෙෂණයි. **එනා:** විශෙෂ්‍යයි. **ගෙණ:** හි: විශෙෂණයි. **සිහිල්තෙලෙන්:** විශෙෂ්‍යයි. **එන:** තු: විශෙෂණයි. **හඬවන:** විශෙෂ්‍යයි. **සිහිල් තෙලෙන්:** හි: විශෙෂණයි. **හඬවන:** විශෙෂ්‍යයි. **මිණිකිකිණි සැල:** හි: විශෙෂණයි. **රත්දද:** විශෙෂ්‍යයි. **බඳ:** තු: විශෙෂණයි. **බඳ:** විශෙෂ්‍යයි. **විපුල්-රත් සෙමෙර** හි: විශෙෂණයි. **රත්දද:** විශෙෂ්‍යයි. **හඬවන-සසල:** තු: විශෙෂණයි. **පුරතුළ:** විශෙෂ්‍යයි **ලකල්-මෙ:** තු: විශෙෂණයි. **රිවිතැවුල:** විශෙෂ්‍යයි. **පුරතුළ:** හි: විශෙෂණයි.

<u>සමාස</u>- 1 සිහිල්සපුසුවඳ. 2 සිහිල්තෙලෙන්. 3 මිණිකිකිණි සැල. 4 රත්සෙමෙර. 5 රත්දද. 6 ලකල්. 7 පුරතුළ. 9 රිවිතැවුල.

<u>විග්‍රහ</u>- 1 සිහිල් ද සපු ද=සිහිල්සපු. සිහිල් සපුවල සුවඳ=සිහිල් සපුසුවඳ. 2 සිහිල් වූයේ ද එම තල වූයේ ද=සිහිල්තල-එයින්- 3 මිණි යොදූ සැළ කිකිණි=මිණිකිකිණි. මිණිකිකිණිවල සැල=මිණි කිකිණිසැල. 4 රත් වූයේ ද එම සෙමෙර වූයේ ද=රත්සෙමෙර. 5 රත් වූයේ ද එම දද වූයේ ද=රත්දද. 6 ලයට කල්=ලකල් (සබඳ වි: සමස්) 7 පුරේ තුළ=පුරතුළ. 8 රිවිගේ තැවුල=රිවිතැවුල.

<u>විශෙෂවිභාග</u>- පුරාණසන්නයෙහි, "මෙහි සඳුන්මල් සපුමල් සුවඳින් මිශ්‍රවූ මාරුතයෙන් හා රත්නචාමර රත්නපතාකා චඤ්චනා කිරීමෙන් ද වසන්ත කාලයෙහි එනුවර පවත්නා වූ මකරධ්වජොත්සව දක්වූහ" යනු පැවසේ. මේ පොත නවම් මසෙහි කරණලද බව පොත අවසන සඳහන් කොට තිබේ. නමුත් එක්ක්‍රමයකින් නවම් මස වසන්තයට ඇතුළත් නොවේ, එබැවින් මෙහි පරස්පර විරොධයක් ඇතැයි සිතන්නට ද ඉඩ තිබේ. එහෙත් එක් ක්‍රමයකින් බක් වෙසක් දෙක වසන්ත යයි ද, එක් ක්‍රමයකින් මැදින් බක් දෙක වසන්ත යයි ද පවසාතිබෙන බැවින්- මේ සන්දෙශයේ පටන්ගැණීම නවම් මස අග ද, මෙ කාව්‍ය බැඳීම මැදින් මස මුලද වූයේ නම් විරොධයක් නැත්තේ ය. වසන්තොත්සවයට ඵාල්ගුණොත්සව යයි ද නමෙකි. ඵාල්ගුන කියන්නේ මැදින්මසයි.

මෙහි "මිණිකිකිණි" යන්නට සන්නවල තිබෙන පරිද්දෙන් අරුත් පැවසූ නමුත් "මිණිගෙඩි හා කිකිණි" කියා ද අරුත් පැවසියහැකිය. තවද සමහර සන්න වල "රත්දද" යන්න "රත් දද" යි ගෙණ ස්වර්ණධ්වජයයි අරුත් පවසා තිබේ. මකර ධ්වජොත්සවයට ගැණෙන චාමර ද රත්නචාමරය. ධ්වජ ද රත්නධ්වජය. රත්න වර්ණයට හිරුරැස් ඇදීම ස්වභාවයෙකි. එසේ වීම පුරතුළ සූර්‍ය්‍යාතාපය මැලැක්මට හෙතුයි.

12 ත ර  සර හිවි මහල් මෙහි පහපෙළ නිතො  ර
සු ර  සිදු විදුදරන් සැදි සඳලු මනහ  ර
කා ර  වන මඟුල් කෙළියෙන් නොමැති අවස  ර
පු ර  සිරි බලන ලෙස බට සුර විමන්පු  ර

<u>විභක්ති</u>– තරසර හිවිමහල් 8. මෙහි 8. පහපෙළ 8. නිතොර 2. සුරසිදු විදුදරන් 3. සැදි 1. සඳලු 1. මනහර 1. කරවන 4. මඟුල් කෙළියෙන් 4. නොමැති 8. අවසර 3. පුර 8. සිරි 2. බලන 7. ලෙස 4. බට 7. සුර 7. විමන්පුර 1.

<u>පදාර්ථ</u>– මෙහි, මේ නගරයෙහි; තර, ස්ථිර වූ; සර, සාර වූ; හිවි, උස් වූ; මහල්, (ත්‍රිභූමකාදි) මහලින් යුක්ත වූ; පහපෙළ, ප්‍රාසාද පඞ්ක්තියෙහි; නිතොර, තොර නැතිව (නිරන්තරයෙන්); සුරසිදුවිදු දරන්, දෙව සිඬවිද්‍යාධර රූපයන් ගෙන්; සැදි, සජ්ජිත වූ; මනහර, මනොහර වූ; සඳලු, චන්ද්‍රශාලාවෝ; කරවන, කරවනු ලබන්නා වූ; මඟුල්කෙළියෙන්, මඞ්ගල ක්‍රීඩාවෙන්; අවසර නොමැති, අවකාශ රහිත වූ; පුර, පුරයෙහි; සිරි, ශොභාව; බලනලෙස, නිරීක්ෂණය කරණ පරිද්දෙන්; බට, බැස්සා වූ; සුර, දෙවියන්ගේ; විමන්පුර, විමාන වැනි වෙත්.

<u>භාවය</u>– මෙනුවර ඉතා උස් පහමතුයෙහි වූ සඳලු දෙව්ඹමත් වැනි වෙත්.

<u>ක්‍රි: ය</u>– **සඳලු සුර විමන් පුර වේ.**

<u>උ: ක</u>– **වේ:** ක්‍රියායි. **සඳලු:** උක්තප්‍රකෘති කර්තෘයි. **විමන්පුර;** විකෘති කර්තෘ යි.

<u>අර්ථක්‍රියා</u>– **සැදි, කරවන, බලන, බට.**

**සැදි:** කර්මකාරකයි. **සඳලු:** කා: උක්තකර්මයි. **කරවන:** කර්මකාරකයි. **මඟුල්කෙළි:** කා: උක්තකර්මයි. **බලන:** බල–(බැලුම්හි) ධාතුයි. කර්තෘකාරකයි. **සුර:** කා: උක්ත කර්තෘයි. **බට:** බස–(බැසීමෙහි) ධාතුයි. **සුර:** කා: උක්ත කර්තෘයි.

<u>වි: ෂ්‍ය</u>– **පහපෙළ:** විශෙෂ්‍යයි. **තරසරහිවිමහල්:** තු: විශෙෂණයි. **මෙහි:** හි: විශෙෂණයි. **සැදි:** විශෙෂ්‍යයි, **නිතොර–සුරසිදු විදුදරන්:** හි: විශෙෂණයි. **සඳලු:** විශෙෂ්‍යයි. **සැදි–මනහර:** තු: විශෙෂණයි. **මඟුල් කෙළියෙන්:** විශෙෂ්‍යයි. **කරවන:** තු: විශෙෂණයි. (නොම) **ඇති:** විශෙෂ්‍යයි. **අවසර(නැති):** විශෙෂණයි. **පුර:** විශෙෂ්‍යයි. (නොම) **ඇති:** තු: විශෙෂණයි. **සිරි:** විශෙෂ්‍යයි. **පුර:** හි: විශෙෂණයි. **බලන:** විශෙෂ්‍යයි. **සිරි:** හි: විශෙෂණයි. **ලෙස:** විශෙෂ්‍යයි. **බලන:** හි: විශෙෂණයි. **සුර:** විශෙෂ්‍යයි. **බට:** තු: විශෙෂණයි.

**සමාස**- 1 හරසර හිමිමහල්. 2 පහපෙළ. 3 තිහොර. 4 සුරසිදු විදුදරන්. 5 සඳලු. 6 මඟුල්සොළියෙන්. 7. විමන්සුර.

**විග්‍රහ**- හර සර හිමි මහල් යමෙක්හි ද ඒ=හරසර හිමි මහල්. (අදර අරූත අනරූත් සමස්). 3 හොර නැත්තේ=තිහොර (අවිය සමස්). 5 සඳේ අලු යමෙක්හි ද ඒ=සඳලු. 6 මඟුල් පිණිස වූ සොළි= මඟුල්සොළි. (සපදන් වි: සමස්). 7 විමන්වල අසුරු යමෙකුන්ට ද ඔහු=විමන්සුර.

**විශෙෂ විභාග**- සඳලුව නම් අනාවරණ බැවින් චන්ද්‍රාලොකයෙන් පිරි චක්ෂුෂා ප්‍රීත් ආහ්ලාද උපදවන ශාලාවකි. මේ වර්ණනාවෙන් ජයවඩනපුරයේ ප්‍රාසාදයන්ගේ උස්බව අඟවයි. මෙහි සඳලු වර්ණනාකිරීමේදී පුරශ්‍රිය බැලීම සඳහා බිම්බසින්නට අවුත් බිම පවත්නා මඞ්ගල ක්‍රීඩාවන් නිසා අනවකාශ භාවයෙන් නො බැස උඩ නැවතී සිටින සුරවිමන් වැනියයි කීහු, ඒ අභූතයෙකි. එබැවින් මෙ අභූතොපමායි ගතයුතුයි. තවද "සුරසිදුවිදුදරන්" යන තන්හි සතු විඛන සරණාඩිසි. මිලඟට පුරඟනන් වැණුමට "සිසිවන" යනාදි කව කීහු.

13 සි සි වන වුවන ඉඟසුග ගතහැකි මිටි න
නි සි පුළුලුකුල රියසකසුරු තිසර ත න
දි සි රණ ලියෙව් රූසිරි යුත් මෙපුරඟ න
ඇසි පිය හෙළන පමණින් නො වෙති දෙවඟන

**විභක්ති**- සිසි 2. වුවන 4. ඉඟ 4. සුග 4. ගතහැකි 4. මිටින 4. නිසිපුළුලු කුල 4. රියසකසුරු 4. තිසරතන 4. දිසි 1. රණලිය 2. රූසිරියුත් 1. මෙ 3. පුර 8. අඟන 1. ඇසිපිය 2. හෙළන 7. පමණින් 4. දෙවඟන 1.

**පදාර්ථ**- සිසිවන, චන්ද්‍රයාට සමාන වූ; වුවන, මුහුණු වලින් ද; මිටින ගතහැකි, මිටින් ගත හැක්කා වූ; ඉඟසුග, කෘශ වූ මධ්‍යප්‍රදෙශ වලින් ද; රියසකසුරු, රථචක්‍රාකාර වූ; නිසි, යොග්‍ය වූ; පුළුල් උකුල, පලල් උකුලු වලින් ද; තිසරතන, හංසයන් වැනි පයොධර වලින් ද (යුක්තාව); රණලිය එව්, ස්වර්ණලතාවන් මෙන්; දිසි, දකිනු ලබන්නා වූ; රූසිරියුත්, රූපශ්‍රියෙන් යුක්ත වූ; මෙපුරඟන, මේ පුර යෙහි ස්ත්‍රීහු; ඇසිපිය හෙළන පමණින්, ඇස්පිය හෙළීම් මාත්‍රයෙන්; දෙවඟන නොවෙති, දිව්‍යස්ත්‍රීහු නොවෙත්.

**භාවය**- චන්ද්‍රාකාර මුහුණු ආදියෙන් යුක්ත ම ස්වර්ණලතාවන් මෙන් පෙනෙන ජයවඩනපුරඟනන්හු ඇසිපිය හෙළීමෙන් පමණක් දෙවඟනෝ නො වෙති. ඇසිපිය නො හෙළතොත් දෙවඟනෝ ම ය.

ක්‍රි: ශ- පුරගන (ඇසිපිය හෙළන) පමණින් දෙව්ගන නො වෙති.

උ: කා- වෙති: ක්‍රියා යි. පුරගන: උක්තප්‍රකෘති කර්තෘයි. දෙව ගන: විකෘතිකර්තෘයි. (ඇසිපිය හෙළන) පමණින්: අනුක්තකරණයි.

අඞ්ගක්‍රියා- දිසී.

දිසී: දිස් (දැක්මෙහි) ධාතුයි. සාමිකාරකයි. පුරගන: උක්තසාමියි.

වි: ෂ- අගන: විශෙෂ්‍යයි. දිසි-රූසිරියුත්: තු: විශෙෂණයි. තිසරතන-නිසිපුළුලුකුල-ඉගසුග-මුවන: නි: විශෙෂණයි. අගන: විශෙෂ්‍යයි. පුර: නි: විශෙෂණයි. පුර: විශෙෂ්‍යයි. මෙ: තු: විශෙෂණයි. ඉග: විශෙෂ්‍යයි. සුග-ගතහැකි: තු: විශෙෂණයි. ගත හැකි: විශෙෂ්‍යයි. මිඹින: නි: විශෙෂණයි. නිසිපුළුලුකුල: විශෙෂ්‍යයි. රියසසාසුරු: තු: විශෙෂණයි. දිසී: විශෙෂ්‍යයි. (රණලිය) එව්: නි: විශෙෂණයි. පමණින්: විශෙෂ්‍යයි. හෙළන: නි: විශෙෂණයි. හෙළන: විශෙෂ්‍යයි. ඇසිපිය: නි: විශෙෂණයි.

සමාස- 1 නිසිපුළුලුකුල. 2 රියසසාසුරු. 3 තිසරතන. 4 රණලිය. 5 රූසිරියුත්. 6 ඇසිපිය.

විග්‍රහ- 1 පුළුල් වූයේ ද එ ම උකුල් වූයේ ද=පුළුලුකුල්. නිසි වූයේ ද එ ම පුළුලුකුල් වූයේ ද=නිසිපුළුලුකුල්-නිසිපුළුලුකුල. 2 රියේ සසා=රියසසා. රියසසකේ අසුරු යමෙකුන්ට ද ඔහු=රියසසාසුරු. 3 තිසරන් වැනි තන=තිසරතන. 4 රන් එව් ලිය=රන්ලිය-රණලිය. 5 රූවේ සිරි=රූසිරි. රූ සිරින් යුත්=රූසිරියුත්. 6 ඇස්වල පිය=ඇස් පිය-ඇසිපිය.

විශෙෂ විභාග- "රණලිය" නම් රන්වන් කාන්තිය ඇති වැල්ජාති යකි. මේ පුරයෙහි ස්ත්‍රීහු එබඳු වෙත්. මේ ස්ත්‍රීහු ඇසිපිය හෙළන පමණින් දෙව ගනෝ නො වෙත් යයි කීමෙන් ගැණෙන්නේ දෙවගනන් ඇසිපිය නො හෙළන බව සහ ඒ ලකුණ පමණක් මොවුන්ගෙන් ප්‍රතිෂෙධ කොට අනික් ලකුණුවලින් දෙවගනන්ට සම කිරීමයි. එබැවින් මේ ප්‍රතිෂෙධොපමාවකි. ඉක්බිති පුරයෙහි අගය පවසනුවෝ "සොඳුරු" යනාදි කව කීහු.

11 සොඳුරු සිය නඳුන් අනුතුරු දෙසූ සිටි න
කිතුරු නිසසරන් සාදහස වෙන නොව න
ඉසුරු දනද සිඝ නිසොලෙජ් කැන රඳ න
උතුරු දියිඳු පුර දිනි මෙපුර වැජඹෙ න

**විභක්ති**- සොඳුරු සියනඳන් 1. අනුහුරු දෙසැ 7. සිටින 1. කිනුරු නිස සරන් 3. සඳහස 7. වෙන 2. නොවන 1. ඉසුරුදනඳ සිය 1. නිකෙලෙස් තැන 7. රඳන 1. උතුරුදිගිඳුපුර 2. මෙ 1. පුර 1. වැජඹෙන 1.

**පදාර්ථ**- සොඳුරු, සුන්දර වූ; සියනඳන්, සිය ගණන් නිධාන ඇත්තා වූ; අනුහුරු දෙසැ, අනුත්තර දිශාවෙහි (අති ශ්‍රේෂ්ඨ දිශාවෙහි); සිටින, සිටින්නා වූ; කිනුරු, කින්නරයන් හා; නිසසරන්, නිශාචරයන්; සඳහස, කිසිකලෙක; වෙන නො වන, සමීප නොවන්නා වූ; නිකෙලෙස් තැන, නිකෙලශස්ථානයෙහි (සරදර රහිත තන්හි); රඳන, සිත්අලවන්නා වූ; ඉසුරුදනඳ සිය, සියගණන් අධිපතීන් හා ධනදයන් (ධනදෙන්නවුන්) ඇත්තා වූ; මෙපුර, මේ පුරය, උතුරුදිගිඳුපුර, උත්තරදිශාධිපතිහුගේ පුරය; දිනි, (පරයා) ජයගත්තේ ය.

**භාවය**- ජයවර්ධනපුරය වනාහි අලකාපුරයටත් වඩා අතිශ්‍රේෂ්ඨ ය.

**ක්‍රි: ය**- (මෙ) පුර උතුරු දිගිඳු පුර දිනි.

**උ: න**- **දිනි:** අතීත කාලීකාරක ප්‍රථම පුරුෂ එකවචනයි. **මෙ පුර:** උක්තකර්තෘයි. **උතුරුදිගිඳුපුර:** අනුක්තකර්මයි.

**අර්ථක්‍රියා**- **සිටින, නොවන, රඳන, වැජඹෙන.**

**සිටින:** සිට-(සිටිමෙහි) ධාතුයි. කාලීකාරකයි. **පුර:** කා: උක්තකර්තෘයි. **නොවන:** ආධාරකාරකයි. **පුර:** කා: උක්තාධාරයි. **රඳන:** ආධාරකාරකයි. **පුර:** කා: උක්තාධාරයි. **වැජඹෙන:** වජඹ (වැජඹිමෙහි) ධාතුයි. කාලීකාරකයි. **පුර:** කා: උක්තකර්තෘ යි.

**වි: ෂ්‍ය**- **පුර:** විශෙෂ්‍යයි. **මෙ-වැජඹෙන-නොවන-සිටින-සොඳුරු සියනඳන්-රඳන:** තු: විශෙෂණයි. **රඳන:** විශෙෂ්‍යයි. **නිකෙලෙස් තැන:** නි: විශෙෂණයි. **ඉසුරුදනඳසිය:** විශෙෂ්‍යයි. **රඳන:** නි: විශෙෂණයි. **නොවන:** විශෙෂ්‍යයි. **කිනුරුනිසසරන්-සඳහස-වෙන:** නි: විශෙෂණයි. **සිටින:** විශෙෂ්‍යයි. **අනුතුරුදෙසැ:** නි: විශෙෂණයි.

**සමාස**- 1 සොඳුරු සියනඳන්. 2 අනුතුරු දෙසැ. 3 කිනුරුනිස සරන්. 4 ඉසුරුදනඳ සිය. 5 නිකෙලෙස් තැන. 6 උතුරුදිගිඳුපුර.

**විග්‍රහ**- 1 නඳන් සියයක් එක්කොට සලකන ලද්දහු=සියනඳන්. සොඳුරු වූ සියනඳන් යමෙක්හි ද ඒ=සොඳුරු සියනඳන්. 2 උතුරු නැත්තේ යමකට ද ඒ=අනුතුරු. (සබඳ අරුත අනරුත් සමස්). අනු

තුරු වූයේ ද එ ම දෙස වූයේ ද=අනුතුරු දෙස-එහි. 3 කිනුරුහු ද තිස සරහු ද=කිනුරුතිසසරහු-(ඔවුන්). 4 ඉසුරුහු ද දනඳෙ ද=ඉසුරුදන ඳේ. සිය (ගණන්) ඉසුරු දනඳේ යමෙක්හි ද ඒ=සිය ඉසුරු දනද-ඉසු රුදනද සිය. 5 කොලෙස් නැත්තෝ=නිකොලෙස්. නිකොලෙස් වූයේ ද එ ම තැන වූයේ ද=නිකොලෙස් තැන. 6 උතුරු ම දිග=උතුරුදිග. උතුරුදිගට ඉදු=උතුරුදිගිදු. උතුරුදිගිඳුගේ පුර= උතුරුදිගිදුපුර.

විශෙෂවිභාග– "උතුරුදිගිඳු" වූයේ කුවෙර යි. ඔහුට කුවෙර යන නාමය ඇතිවූයේ කුත්සිත වූ (නැතවූ) වෙරයක් (ශරීරයක්) ඇත්තෙකු වූ හෙයිනි. මෙතෙ මේ යක්ෂාධිපතියි. "කිනුරු" නම් කින්නර යි. මේ දෙවියන්ට ගායනාකරණ දෙව විශෙෂයෙකි. කින්නරයෝ අශවශරීරයෙන් හා මනුෂ්‍ය මුඛයෙන් ද, මනුෂ්‍යශරීර යෙන් හා අශවමුඛයෙන් ද යුතු වූවෝ වෙත්. මේ විකාරය නිසා මොවුනු කුත් සිතනර වූවානු 'කින්නර' යි ප්‍රසිඬ වූහ.

ජයවඩීනපුරය අලකාපුරියට වඩා ශ්‍රෙෂ්ඨ වූයේ කෙසේද යත්- අලකාව ලොකාර්ඩදයි නොවනහෙයින් අසුඳර වූ නිධානභවයකින් යුක්ත ය. ජයවඩීන පුරය ලොකාර්ඩදයි හෙයින් සුඳර වූ සියගණන් නිධානයන්ගෙන් යුක්ත ය. අල කාව පිහිටියේ මඞ්ගලසම්මත නුවූ උතුරු දිග ය. ජයවඩීනපුරය පිහිටියේ මඞ්ගල සම්මත දකුණුදිග ය. අලකාව කින්නරයන්ගෙන් හා නිශාචරයන්ගෙන් ගහන ය. ජයවඩීනපුරය ඔවුන් විසින් ලංවිය හැකි ද නොවේ. අලකාව එක් අධිපතියෙකු ගෙන් හා එක් ධනදයෙකුගෙන් යුක්ත ය. ඔවුහු ද දුක්සහිත තත්හි ඇලෙති. ජයවඩීනපුරය නිදුක්තත්හි ඇලෙන සියගණන් අධිපතීන්ගෙන් හා ධනදයන් ගෙන් යුක්තයි. මේ කරුණු නිසා ජයවඩීනපුරය ශ්‍රෙෂ්ඨ විය. මෙසේ ජයවඩීනපුර වර්ණනාව කොට ඉක්බිති ජයවඩීනපුරයෙන් සැලලිහිණියාගේ පිටත්වීමට සුදුසු ශුභමුහුර්තියක් පවසන්නානු "උදේ සැපත්" යනාදි කව කීහු:-

15 උ දේ සැපත් සුරගුරු අලුසාර අව ට
ස දේ මුදුන් වන අස්විද නැකත සි ට
න දේ සිතින් නම කුලදෙවිය සිහි කො ට
යෙ දේ ගමන් යහළුව මෙපුරෙන් නොප ට

විභක්ති– උදේ 2. සුරගුරු 2. අලු 2. අවට 3. සදේ 2. මුදුන් 2. අස්විද නැකත 8. නදේ සිතින් 4. නම 7. කුලදෙවිය 2. ගමන් 1. යහළුව 9. මෙපුරෙන් 6. නොපට 7.

පදාර්ථ:- සුරගුරු, වෘහස්පතිහු; අවට, හාත්පස; අලුසාර, ආලොක කොට; උදේ සැපත්, උදාවීමට පැමිණීකල්හි; සදේ, චන්ද්‍රයා; අස්විද නැකත සිට, අශ්විනී නක්ෂත්‍රයෙහි සිට; මුදුන් වන, නභො මධ්‍යයට පැමිණීකල්හි; නදේසිතින්, සන්තොෂ චිත්තයෙන්; නම, තමාගේ; කුලදෙවිය, කුලදෙවතාවා; සිහිකොට, සමරණය කොට; යහළුව, මිත්‍රය; නොපට, යුෂමත්හට; මෙපුරෙන්, මේ පුරයෙන්; ගමන්, ගමන; යෙදේ, යුතුයි.

<u>භාවය</u>- මිතුර අද ඉරබටු තාරකා කාලයෙහි මේ ගමන යාම පිණිස කුල දෙවතාවා සිහිකොට මෙපුරෙන් පිටත් විය යුතුයි.

**<u>ක්‍රි: ය</u>- සහළුව මෙපුරෙන් නොපමා ගමන් යෙදේ.**

<u>උ: න</u>- **යෙදේ:** යනු කර්තෘකාරක විධික්‍රියායි. **ගමන්:** උක්ත කර්මයි. **නොපමා:** අනුක්ත කර්තෘ අර්ථයෙහි සම්බන්ධයි. **මෙපුරෙන්:** අවධියි. **සහළුව:** සම්බොධනයි.

**<u>අර්ථක්‍රියා</u>- සැපත්, වත.**

**සැපත්:** "සම්පත්ත" ශබ්දයෙන් නිපන්නයි. කර්තෘකාරකයි. **සුරගුරු:** කා: උක්තකර්තෘයි. **වත:** වූ-(පැමිණීමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. **සඳේ;** කා: උක්තකර්තෘ යි.

<u>වි: ෂ්‍ය</u>- **ගමන්:** විශෙෂ්‍යයි. **මෙපුරෙන්-නොපමා:** නි: විශෙෂණයි. **කොට:** විශෙෂ්‍යයි. **සිහි-කුලදෙවිය-නදේසිතින්:** නි: විශෙෂණයි. **කුලදෙවිය:** විශෙෂ්‍යයි. **නම:** නි: විශෙෂණයි. **සිට:** විශෙෂ්‍යයි. **අස්විද නැකත:** නි: විශෙෂණයි. **වත:** විශෙෂ්‍යයි. **මුදුන්-සඳේ:** නි: විශෙෂණයි. **කර:** විශෙෂ්‍යයි. **අලු-අවට:** නි: විශෙෂණයි. **සැපත්:** විශෙෂ්‍යයි. **සුරගුරු-උදේ;** නි: විශෙෂණයි.

<u>සමාස</u>- 1 සුරගුරු. 2 අස්විදනැකත. 3 නදේසිතින්. 4 කුලදෙවිය.

<u>විග්‍රහ</u>- 1 සුරනට ගුරු=සුරගුරු. 2 අස්විද වූයේ ද එම නැකත වූයේ ද=අස්විදනැකත. 3 නදින් යුත් සිත=නදසිත-නදේසිත, එසින්. 4 කුලෙහි දෙවි=කුලදෙවි-ඔහු.

<u>විශෙෂ විභාග</u>- "උදේ" යන්න "උදය" ශබ්දයෙන් ආයේ වේ. පාලි සංස්කෘතයන්හි වූ "උදය" ශබ්දය සිංහලෙහි ද තත්සම වශයෙන් "උදය" කියා ම ද, තද්භව වශයෙන් "උදේ" කියා හෝ "උද" කියා ද යෙදේ. 'උද්-අය' දෙක එකතුවීමෙන් "උදය" ශබ්දයාගේ පද සිද්ධිය වේ. මෙහි 'අය' ශබ්දය ගමනාර්ථය. සිංහලෙහි වූ 'උදේ-උද' යන දෙක ම "උදය" ශබ්දයට සම වේ. "සඳ, නද"යි යෙදිය යුතු තන්හි අකුරු සමකිරීම සඳහා පිළි පෙරළීමෙන් "සදේ, නදේ"යි යෙදිනා.

මෙහි වූ "සැපත්-වත" යන දෙක කාලාර්ථයි. සිදතෙස "කල් අරුත් කිරිය විසා හි අදර අරුත කම්විබත් රුසි" යනුවෙන් කල් අරුත් කිරිය සමග යෙදෙන පදය අදර අරුත කම්විබතින් යෙදෙන බව කීහු. සමහරු "සැපය්" යන්න

"සැපත" කියා ද යොදති. නමුත් 'ත' ප්‍රත්‍යය හලන්තව ද යෙදෙන බැවින් මෙහි "සැපත්" යනු ම යොග්‍යයි. "වත" යන්න සමහර පොත්වල "පත" කියා ද දක්නා ලැබේ. නමුත් 'වූ' ධාතුව පැමිණීම් අර්ථයෙහි ද යෙදෙන බැවින් මෙහි "වත" යනු ම යොග්‍යයි.

මෙහි "කුලදෙවි" යන්නෙන් ගැණෙන්නේ බුදුරජාණන්වහන්සේ යි. එහි කම් විබත-"කුලදෙවියා" කියා යෙදේ. මෙහි ජනක පිණිස මාත්‍රාභාති යයි. මෙය තිරිසනෙකුට කී කීමක් බැවින් මෙහි කුලදෙවියා බුදුරජාණන් වහන්සේ නො වේ ය යි සමහරුන්ට හැඟෙතත්, මෙහි කියනු ලබන බොහෝ කීම් මනුෂ්‍ය යෙකුට කියනලද බැවී ඒ ඒ කීම් වලින් සඵුට වේ. "සිහිකර නවගුණමතුරු" යනාදිය ඊට නිදසුනයි.

මීලඟට ජයවර්ධන පුරයෙන් පිටත්වීමට යෙදූ නැකැත් යෝගය ගැණ සලකනා කටයුතුයි. මේ වේලාව ඉරබටු තාරකා වේලාව යි. මේ වනාහි අන්කිසි ශුභයොගා දියක් නැතත් සියලුදේට ම ශුභය යි සම්මත ශ්‍රෙෂ්ඨ යෝගයෙකි. එබව:-

සංඛ්‍යකාල මතික්‍රම්‍ය කිඤ්චිද්ද්‍රක්ෂ්‍යන්ති තාරකාඃ,
සොංගොයං විජයො නාම සර්වකාමීසු පූජිතඃ.

යන මෙහින් පවසනු ලැබේ.

මෙදින පුරඅටවක් තිථිය යෙදීම ද, අස්විද නැකත යෙදීම ද, මෙලෙහි ගුරුට උච්ච වූ කටක ලග්නය යෙදීම ද, මිත්‍ර වූ ගුරු රවි දෙදෙනා සප්තම දෘෂ්ටියෙන් සිටීම ද, සඳු කර්මස්ථානයේ සිටීම ද මේ වේලාව අතිශ්‍රෙෂ්ඨ වීමට හෙතුයි. "වෘහස්පතිවාරෙ ශුක්ලාෂ්ටමී අක්ෂයා"යි ශාස්ත්‍රොක්ත බැවින් මෙදින ද ගුරුදිනක් විය හැකිය. තවද මේ වේලාව පක්ෂීන් ගමන් නොකරණ වේලාවක් යයි සමහරුන්ගේ මතයෙකි. නමුත් මේ වේලාව සමහර පක්ෂීන්ට මදක් දුර යා නො හැකි වේලාවක් නො වේ. ඒ හැරත් ශුභමුහූර්තිවලින් ඒ ඒ කටයුතු පටන් ගන්නා අය රාත්‍රිකාලයේ වුවත් නැකත පැමිණෙන තෙක් නිදිවරා සිට කටයුතු පටන් ගැණීම ද සවභාවයෙකි. මීලඟට පෙරමග නිමිති කියන්යනාහු "තලමුදු" යනාදි කව කීහු.

16 තල මුදු සුවඳ පිරිකුඹු මියුරු අඹගෙ ඩි
පුල හෙල කුසුම ලිය පිය තොපල රන්කො ඩි
සල සුදු සෙමෙර සේසත් ගිජිඳුනොදවැ ඩි
බල සුබ නිමිති පෙර මග නැකතටත් වැ ඩි

විභක්ති- තල 2. මුදු 2. සුවඳ 2. පිරිකුඹු 2. මියුරු 2. අඹගෙඩි 2. පුල 2. හෙලකුසුම 2. ලිය 2.පිය තොපල 2. රන්කොඩි 2. සල 2. සුදු සෙමෙර 2. සේසත් 2. ගිජිඳුන් 2. ඔදවැඩි 2. සුබනිමිති 2. පෙරමග 8. නැකතට 7. වැඩි 2.

**පදාර්ථ**- සුවඳ, සුගන්ධවත් වූ; මුදු, මෘදු වූ; තල, මාරුතය ද; පිරිකුඹු, පූර්ණකුම්භ යන් ද; මියුරු, මධුර වූ; අඹගෙඩි; ආම්‍රඵල ද; පුල, පිපුනා වූ; හෙල කුසුම, සුදු මල් ද; පියතොපල, ප්‍රිය වචන ඇත්තා වූ; ලිය, ස්ත්‍රීන් ද; රන්කොඩි, සවර්ණකුණ්ඩිකා ද; සල,

සැලෙන්නා වූ; සුදුසෙමෙර, ශ්වෙතචාමර ද; සේසත්, ශ්වෙතච්ඡත්‍ර ද; ඔදවැඩි, ඔජෝගුණයෙන් අධික වූ (ප්‍රීතියෙන් මත් වූ); ගිජිඳුන්, ගජේන්ද්‍රයන් ද (යන); පෙරමග, ප්‍රතිපථයෙහි දී ලැබෙන්නා වූ; නැකතටත් වැඩි, නක්‍ෂත්‍රයොගයටත් වඩා විශිෂ්ට වූ; සුබනිමිති, ශුභ නිමිත්තයන්; බල, අවලොකනය කරව.

<u>භාවය</u>– ගමනක් පිටත්ව යනවිට පෙරමග දක්නට ලැබෙන සුබනිමිති නැකතටත් වඩා ශ්‍රෙෂ්ඨ යි. නුඹ 'නලමුදු සුවඳ' යනාදි ඒ සුබනිමිති බලාපන්.

**<u>ක්‍රි: ය</u>– තෝ සුබනිමිති බල.**

<u>උ: ක</u>– **බල:** විධික්‍රියායි. **තෝ:** උක්තකර්තෘයි. **සුබනිමිති:** අනුක්තකර්මයි.

<u>වි: ෂ්‍ය</u>– **සුබනිමිති:** විශෙෂ්‍යයි. **වැඩි;** තු: විශෙෂණයි. **පෙරමග;** හි: විශෙෂණයි. **වැඩි:** විශෙෂ්‍යයි. **නැකතට;** හි: විශෙෂණයි. **ගිජිඳුන්:** විශෙෂ්‍යයි. **ඔදවැඩි;** තු: විශෙෂණයි. **ළිය:** විශෙෂ්‍යයි. **පියතෙපල:** තු: විශෙෂණයි. **නල:** විශෙෂ්‍යයි. **මුදු-සුවඳ:** තු: විශෙෂණයි. **අඹගෙඩි:** විශෙෂ්‍යයි. **මියුරු:** තු: විශෙෂණයි. **කුසුම:** විශෙෂ්‍යයි. **පුල-හෙල:** තු: විශෙෂණයි. **සෙමෙර:** විශෙෂ්‍යයි. **සල-සුදු:** තු: විශෙෂණයි. **නිමිති:** විශෙෂ්‍යයි. **නල-පිරිකුඹු-අඹගෙඩි-කුසුම ළිය-රන්කොඩි-සෙමෙර-සේසත්-ගිජිඳුන්:** තු: විශෙෂණයි.

<u>සමාස</u> - 1 සුවඳ. 2 පිරිකුඹු. 3 අඹගෙඩි. 4 පියතෙපල. 5 රන්කොඩි. 6 සේසත්. 7 ගිජිඳුන්. 8 ඔදවැඩි. 9 සුබනිමිති. 10 පෙරමග.

<u>විග්‍රහ</u>- 3 අඹ වූයේ ද එම ගෙඩි වූයේ ද=අඹගෙඩි. 4 පිය වූ තෙපල යම්කෙගේ ද ඕ=පියතෙපල. 10 මගෙහි පෙර=පෙරමග. (සෙසු විග්‍රහ සුගමයි).

<u>විශෙෂ විභාග</u>– "නැකතට" යනු අවධි අර්ථයෙහි සම්බන්ධයි. "ත්" යනු අව්‍යය සම්භාවනාර්ථ යි. "නක්‍ෂත්‍රාච්ඡකුනං ශුභං " යනු හෙයින් නැකතට වඩා නිමිත්ත ශුභයයි සම්මත වේ.

මීලඟට සුබශොභනකින් පිටත් වී ජයවර්ධන පුරයෙහි.ම වැදියයුතු යා යුතු තැන් පවසන්නානු "ලොව එහිද" යනාදිය කීහු:-

**17 ලො වැ වි හි ද සුදුසැහැ සඳරැසෙව් සැ දි**
**දෙ න නො ම ද සිරි යගමොක් සැප නිසැ දි**
**ළ ද මු නි ද දම්සඳ පහස මන බැ දි**
**ව දු ද ළ ද හිමි නෙවහල් පහයැ රැ දි**

**විභක්ති**– ලොවැ 8. සුදුපැහැ 2. සඳරැස් 2. සැදි 2. දෙන 2. නොමඳ 2. සිරි 2. සග 8. මොක්සැප 2. නිසැදි 2. ලද 2. මුනිඳ 7. දම්සඳ 7. පහස 2. මන 8. බැඳි 7. දළඳ හිමි 2. තෙමහල් පහය 8. රැඳි 2.

**පදාර්ථ**– සඳරැස් එව්, චන්ද්‍රරශ්මිය මෙන්; සැදි, සජ්ජිතවූ; සුදු පැහැ, ශුභ්‍රරශ්මිය; ලොවැ, ලෝකයෙහි; විහිඳ, ව්‍යාප්ත කොට; නිසැදි, නිරන්තරයෙන්; නොමඳ, අනල්පවූ; සග සිරි, ස්වර්ගශ්‍රීය ද; මොක්සැප, මොක්‍ෂසුඛය ද; දෙන, දානයකරන්නාවූ; මුනිඳ, මුනීන්ද්‍ර යන්ගේ; මනබැඳි, මනොබද්ධ වූ; දම්සඳ, ධර්මස්කන්ධයාගේ; පහස, ස්පර්ශය; ලද, ලද්දාවූ; තෙමහල් පහය රැඳි, ත්‍රෛභූමකප්‍රාසාදයෙහි පිහිටියා වූ; දළඳහිමි, දන්තධාතු ස්වාමින්වහන්සේ; වඳු, වන්දනය කරව.

**භාවය**– සඳරැස් වැනි සුදු බුදුරැස් ලොව විහිදුවා නිරතුරු සගමොක් සැප ගෙණදෙන්නාවූ බුදුරජානන්වහන්සේගේ ධර්මස්පර්ශය ලැබූ තුන්මහල් පායෙහි වැඩවසන දළඳහාමුදුරුවන් වැඳපන්.

**ක්‍රි: ශ**– තෝ දළඳහිමි වඳු.

**උ: න**– වඳු: විධික්‍රියායි. තෝ: උක්ත කර්තෘ යි. දළඳහිමි: අනුක්ත කර්මයි.

**අර්ථක්‍රියා**– සැදි, දෙන, ලද, බැඳි. රැඳි.

**සැදි:** කර්මකාරකයි. **සුදුපැහැ:** කා: උක්ත කර්ම හා කර්තෘ යි. **දෙන:** කර්තෘ කාරක යි. **දළඳහිමි:** කා: උක්තකර්තෘයි. (**සිරි-මොක් සැප:** අනුක්ත කර්මයි). **ලද:** ලබ (ලැබුම්හි) ධාතුයි. කර්තෘකාරක යි. **දළඳහිමි:** උක්තකර්තෘ යි. (**දම්සඳපහස:** අනුක්ත කර්මයි). **බැඳි:** කර්ම කාරක යි. **දම්සඳ:** කා: උක්ත කර්ම හා කර්තෘ යි. **රැඳි**; කර්තෘ කාරකයි. **දළඳහිමි:** කා: උක්ත කර්තෘයි.

**වි: ෂ්‍ය**– **විහිඳ:** විශෙෂ්‍යයි. **ලොවැ–සුදුපැහැ:** හි: විශෙෂණයි; **සුදුපැහැ:** විශෙෂ්‍යයි; **සැදි:** තු: විශෙෂණයි; **දළඳහිමි:** විශෙෂ්‍යයි; **දෙන:** තු: විශෙෂණයි; **සිරි-මොක්සැප:** විශෙෂ්‍යයි; **නොමඳ:** තු: විශෙෂණයි; **සිරි:** විශෙෂ්‍යයි; **සග:** හි: විශෙෂණයි; **දෙන:** විශෙෂ්‍යයි; **නිසැදි:** හි: විශෙෂණයි; **ලද:** විශෙෂ්‍යයි; **දළඳහිමි:** තු: විශෙෂණයි; **පහස:** හි: විශෙෂණයි; **දම්සඳ:** විශෙෂ්‍යයි; **මුනිඳ:** හි: විශෙෂණයි; **පහස:** විශෙෂ්‍යයි; **දම්සඳ:** හි: විශෙෂණයි; **දම්සඳ:** විශෙෂ්‍යයි; **බැඳි:** තු: විශෙෂණයි; **බැඳි:** විශෙෂ්‍යයි; **මන:** හි: විශෙෂණයි; **දළඳහිමි:** විශෙෂ්‍යයි; **රැඳි:** තු: විශෙෂණයි; **රැඳි:** විශෙෂ්‍යයි; **තෙමහල්පහය:** හි: විශෙෂණයි.

**සමාස**- 1 සුදුපැහැ. 2 සඳරැස්. 3 හොමදු. 4 මොක්සැප. 5 මුතිදු. 6 දම්සඳ. 7 දළදාහිමි. 8 තෙමහල්පහය.

**විග්‍රහ**- 4 මොක්හි සැප=මොක්සැප. 6 දම්හි සඳ=දම්සඳ. 7 දළ ම දා=දළදා, දළදා ම හිමි=දළදාහිමි. 8 මහල්තුණක් යමෙක්හි ද ඒ=තෙමහල්. තෙමහල් වූයේ ද එම පහ වූයේ ද=තෙමහල්පහ. එහි (සෙසු විග්‍රහ සුගමයි.)

**විශෙෂ විභාග**- මේ තෙමහල් පහය නම් ඒ කාලයෙහි ජයවර්ධන පුරයේ තුබූ දළදාමැදුරයි. දළදා ස්වාමීන්ද්‍රයන්වහන්සේගේ සුදුබුදුරැස් දක පැහැදී වැඳපුද ගැනීම වැනි පින්කම් සම්භාව්‍යවශයෙන් සගසැප ලැබීමට හෙතු වන බවත්, සිත පිරිණැමීමෙන් මොක්සැප ලැබීමට ද හෙතුවන බවත් ආගම නියමය යි. දළදා වැඳීමෙන් පසු රජවිමනට යායුතු බව කියන්නාහු "ගනරන්" යනාදි කව් කීහු.

18 ගනරන් සොතින් දිලිහෙන මිණිරැස් විහිදූ
පවනින් ලෙලෙන පලඅග මුතුලැල් සිනිදූ
සඳකැන් මිණෙන් බඳ යුතු බිතු පෙළින් රුදූ
එතනින් ගොසින් සැණෙකින් රජ විමන් වදූ

**විභක්ති**-ගනරන්සොතින් 4. දිලිහෙන 2. මිණිරැස් 2. විහිදු 4. පවනින් 4. ලෙලෙන 2. පලඅග 8. මුතුලැල් 3. සිනිදු 3. සඳකැන්මිණෙන් 4. බඳ 4. යුතු 2. බිතුපෙළින් 4. රුදු 4. එතනින් 6. සැණෙකින් 4. රජ විමන් 2.

**පදාර්ථ**- මිණිරැස්, මාණික්‍ය රශ්මිය; විහිදූ, විස්තීර්ණ කළා වූ; ගනරන් සොතින්, ඝන කනක ඛණ්ඩයෙන්; දිලිහෙන, බබලන්නාවූ; පලඅග, ඡදනාග්‍රයෙහි; සිනිදූ, ස්නිග්ධ වූ; මුතුලැල්, මුක්තාලතිකාවන්; පවනින්, මාරුතයෙන්; ලෙලෙන, ලෙලදෙන්නාවූ; සඳකැන් මිණෙන්, චන්ද්‍රකාන්තපාෂාණයෙන්; බඳ, බඳනාලද්දා වූ; රුදූ, මහත්වූ; බිතු පෙළින් යුතු, භිත්තිපඞ්ක්තියෙන් යුක්තවූ; රජවිමන්, රාජවිමාන යට; එතනින් ගොසින්, ඒ දළදාමන්දිරයෙන් ගොස්; සැණෙකින්, ක්ෂණයෙකින්; වදූ, ප්‍රවිෂ්ට වෙව.

**භාවය:**- තුමූ දළදා මැදුරෙන් ගොස් ගනරන් සොන් ආදියෙන් දිලිහෙන රජවිමනට පලයන්.

**කි: ය**- **තෝ එතනින් ගොසින් සැණෙකින් රජවිමන්වදූ.**

**උ: න**- **වදූ:** විධික්‍රියායි. **තෝ:** උක්ත කර්තෘ යි. **රජවිමන්:** අනුක්ත කර්ම යි. **සැණෙකින්:** ක්‍රියා විශෙෂණයි. **ගොසින්:** පූර්ව ක්‍රියා යි. **තෝ:** යනු ම උක්තකර්තෘ යි. **එතනින්:** අනුක්ත අවධියි.

<u>අර්ථක්‍රියා</u>– දිලිහෙන, විහිදු, ලෙලෙන, බඳ, සුතු·

**දිලිහෙන;** දිලියන පූර්වක්‍රියා පූර්-හි (හීමෙහි) ධාතුයි. කර්තෘකාර කයි. **රජවිමන්;** උක්තකර්තෘ යි. **විහිදු:** විහිද– (විහිදීමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. **ගනරන්සොතින්:** කා: උක්තකර්තෘයි. **ලෙලෙන:** ලෙල (සැලීමෙහි): ධාතුයි. ආධාරකාරක යි. **රජවිමන්:** උක්තාධාර යි. **බඳ:** කර්මකාරකයි. **බිතුපෙළ:** කා: උක්තකර්ම යි. **සුතු:** කර්තෘ කාරකයි. **රජවිමන්:** කා: උක්තකර්තෘ යි.

<u>වි: ෂ්‍ය</u>– **ගනරන්සොතින්:** විශෙෂ්‍යයි; **විහිදු:** තු: විශෙෂණයි; **විහිදු:** විශෙෂ්‍යයි; **මිණිරුස්:** හි: විශෙෂණයි; **දිලිහෙන:** විශෙෂ්‍යයි; **පලඅග:** හි: විශෙෂණයි; **දිලිහෙන:** විශෙෂ්‍යයි; **ගනරන් සොතින්:** හි: විශෙෂණයි; **රජවිමන්:** විශෙෂ්‍යයි; **දිලිහෙන:** **ලෙලෙන:** තු: විශෙෂණයි; **ලෙලෙන:** විශෙෂ්‍යයි; **පවනින්-මුතු ලැල්–පලඅග:** හි: විශෙෂණයි; **මුතුලැල්:** විශෙෂ්‍යයි; **සිනිදු:** තු: විශෙෂණයි; **බිතුපෙළින්:** විශෙෂ්‍යයි; **බඳ–රුදු:** තු: විශෙෂණයි; **බඳ:** විශෙෂ්‍යයි; **සඳකැන්මිණෙන්:** හි: විශෙෂණයි; **සුතු:** විශෙෂ්‍ය යි; **බිතුපෙළින්:** හි: විශෙෂණයි; **රජවිමන්:** විශෙෂ්‍යයි; **සුතු:** තු: විශෙෂණයි; **ගොසින්:** විශෙෂ්‍යයි; **එතනින්:** හි: විශෙෂණයි.

<u>සමාස</u>– 1 ගනරන්සොතින්. 2 මිණිරුස්. 3 පලඅග. 4 මුතු ලැල්. 5 සඳකැන්මිණෙන්. 6 බිතුපෙළින්. 7 රජවිමන්.

<u>විග්‍රහ</u>– 1 ගන වූයේ ද එම රන් වූයේ ද=ගනරන්. ගනරණින් කළ සොත්=ගනරන්සොත්–එයින්. 2 මිණිවල රුස්=මිණිරුස්. 3 පලෙහි අග=පලඅග. 4 මුතුවලින් කළ ලැල්=මුතුලැල්. 5 සඳවැනි කැන්යමකද–නොහොත් සඳ කැන් (කැමැති දෙව්) වූයේ යමකට ද ඒ=සඳකැන්. සඳකැන් වූයේ ද එම මිණ වූයේ ද=සඳකැන්මිණ–ඉන්. 6 බිතුවල පෙළ=බිතුපෙළ. 7 රජහුගේ විමන්=රජවිමන්.

<u>විශෙෂවිභාග</u>- ගනරන් නම් අතිකාන් හා මිශ්‍ර නුවූ සවර්ණය යි. සඳකැන් මිණි නම් සාකෘතියෙන් සඳවැනි හෝ ප්‍රියභාවයෙන් සඳ දෙව්කොට ඇති මිණි වෙසෙසෙකි· ඊට අධිපති වූයේ සඳ යි. සඳරුස් වැදීමෙන් ඒ මිණි වෙසෙසින් දිය වැගිරීම චන්ද්‍ර එහෙයිනි. ඊට දිය තරිප්පුයයි ද කියනු ලැබේ.

19 ගිවිබිම්බා යුරු රිවිකුල කමල ක ර
සිසුමම්බා නිතොර ව රැඳි උරමැඳු ර
ලමන රම්බා හිමි රූසිරිනි මනහ ර
පැර කුම්බා නරනිඳු සඳ දකු මිතු ර

<u>විශෙෂ්‍ය</u>- රිවිබිම්බායුරු 2. රිවිකුලකමලකර 7. පියුම්බා 3. නිතොර 3. රුදි 2. උරමැදුර 8. රම්බාහිමි 2. රුසිරිනි 4. මනහර 2. පැරකුම්බා නර නිදුසඳ 2. මිතුර 9.

<u>පදාර්ථ</u>- රිවිකුල, සූර්‍ය්‍යවංශ නමැති; කමලාකර, පද්මාකරයට; රිවිබිම්බායුරු, සූර්‍ය්‍යමණ්ඩලය හා සමාන වූ; උරමැදුර, වක්‍ෂඃස්ථල නමැති මන්දිරයෙහි; පියුමම්බා, ශ්‍රීකාන්තාව; නිතොරව, නිරන්තරව; රුදි, රුදුනා වූ; රම්බාහිමි මෙන, රම්භාවගේ ස්වාමි වූ නලකූබරයා මෙන්; රුසිරිනි, රූපශ්‍රියෙන්; මනහර, මනොඥ වූ; පැරකුම්බා නරනිදුසඳ, පරාක්‍රමබාහු මහරජතුමානන්; මිතුර, මිත්‍රය; දකු, දර්ශනය කරව.

<u>භාවය</u>- මිතුර, පූර්වොක්ත රජවිමන්හි වැඩවසන පැරකුම්බා මහරජතුමා රිවිකුල නමැති පියුම්විල පොබයාලීමට හිරු වැනි ය. සිරිකත නිරතුරු ඇලුම් කරණ උරමැදුරකින් යුක්ත ය. රුසිරින් නලකූබරයා වැනිය. තුඹ ඒ රජතුමන් දැක ගණින්.

<u>ක්‍රි: ස</u>- මිතුර තෝ පැරකුම්බා නරනිඳු සඳ දකු.

<u>උ: න</u>- දකු: විධික්‍රියායි. තෝ: උක්තකර්තෘයි. පැරකුම්බා නර නිඳුසඳ: අනුක්තකර්මයි. මිතුර: සම්බොධන යි.

අ<u>ර්ථක්‍රියා</u>:- රුදි: ආධාරකාරක යි. පැරකුම්බා නරනිඳුසඳ: කා: උක්තාධාර යි.

<u>වි; ස්‍ය</u>- පැරකුම්බා නරනිඳුසඳ: විශෙෂ්‍යයි; රිවිබිම්බායුරු-රුදි-මනහර: තු: විශෙෂණයි; රිවිබිම්බායුරු: විශෙෂ්‍යයි; රිවිකුල කමලකර: හි: විශෙෂණයි; රුදි: විශෙෂ්‍යයි; උරමැදුර: හි: විශෙෂණයි; රුදි: විශෙෂ්‍යයි; නිතොර-පියුමම්බා: හි: විශෙෂණයි; වි: විශෙෂ්‍යයි; නිතොර: හි: විශෙෂණයි; පියුමම්බා: විශෙෂ්‍යයි; නිතොර: තු: විශෙෂණයි; මනහර; විශෙෂ්‍යයි; රුසිරිනි: හි: විශෙෂණයි; මෙන: විශෙෂ්‍යයි; රම්බාහිමි: හි: විශෙෂණයි.

<u>සමාස</u>- 1 රිවිබිම්බායුරු. 2. රිවිකුලකමලකර. 3 පියුමම්බා. 4 නිතොර. 5 උරමැදුර. 6 රම්බාහිමි. 7 රුසිරිනි. 8 මනහර. 9 පැර කුම්බා නරනිදුසඳ.

<u>විග්‍රහ</u>- 1 රිවිගේ බිම්බ=රිවිබිම්බ. රිවිබිම්බේ අයුරු යමෙකුගේ ද ඒ=රිවිබිම්බායුරු. රිවිහුගේ කුල=රිවිකුල. කමලවලට අකර= කමලකර. රිවිකුල ම කමලකර=රිවිකුල කමලකර. 3 පියුමේ (වසන) අම්බා=පියුමම්බා. (අදරවිබත් සමස්.) 4 තොර නැත්තේ=නිතොර.

5 උරම මැඳුර=උරමැඳුර. 6 රම්බාවගේ හිමි=රම්බාහිමි. රුවේසිරි= රුසිරි. 8 පැරකුමෙන් (යුත්) බා යමෙකුට ද ඒ=පැරකුම්බා. නර නට ඉඳු=නරනිඳු. පැරකුම්බා වූයේ ද එම නරනිඳු වූයේ ද=පැර කුම්බානරනිඳු ("සඳ" යෙදීම පෙරමෙනි).

**විශෙෂවිභාග**- "රිවිබිම්බා" යන තත්හි "බිම්බ" යන්න ශබ්දයෙන් තත්සම වේ. 'පයුමම්බා' යන තත්ස වූ "අම්බා" ශබ්දය ද එසේ යි. මෙහි 'අම්බා' ශබ්දය කාන්තා වාචක ය. පියුමේ වසන කාන්තාව ශ්‍රීකාන්තාව යි. රිවිකුල නම් මනුරාජවංශය යි. මනු සූර්යයාගෙන් පැවත ආ බැවින් ඒ කුලය රිවිකුල විය.

සිරිකාන ශොභාසම්පන්න තැනට පැමිණෙන දෙවතාවකි. විෂ්ණුගේ වක්ෂස අතිශය ශොභාසම්පන්න බැවින් ඒ සිරිකානගේ ප්‍රධානවාසස්ථානය විය. මේ රජු ගේ වක්ෂස ද සිරිකතගේ වාසයට ඉතා යොග්‍යවූවක් බව මේ කවියෙන් පැවසේ. 'රම්බාහිමි' නම් කුවෙරයාගේ පුත්‍ර වූ නලකුබර යි, හෙද රූපශ්‍රි යෙන් ශ්‍රෙෂ්ඨයෙකි.

20 උනු නොව බරණ සිවුසැට වොටුනුත් පැල ඳ
වෙනු මෙන් පසක් උන්සඳ සිහසුන් මැ ද
මනු රජ කුලෙන් පැවතෙන පිළිවෙළ නොසි ඳ
ගනු අවසර එනිරිඳු සිරිපතුල් වැ ඳ

**විභක්ති**- උනු 3. බරණ 2. සිවුසැට 2. වොටුනුත් 2. වෙනු 2. පසක් 2. උන් 8. සඳ 8. සිහසුන්මැද 8. මනුරජකුලෙන් 6. එන 7. පිළිවෙළ 2. අවසර 2. එ 7. නිරිඳු 7. සිරිපතුල් 2.

**පදාර්ථ**- වොටුනුත්, වොටුන්න කොළවරකොට ඇත්තාවූ; සිවු සැටබරණ, චතුඃෂෂ්ටිආභරණයන්; උනු නොව, අඩු නැතිව; පැලඳ, ප්‍රසාධනය කොට; පසක් වෙනු මෙන්, ප්‍රත්‍යක්ෂ විෂ්ණු මෙන්; සිහසුන් මැද, සිංහාසන මධ්‍යයෙහි; උන්සඳ, උන්නාවූ කාලයෙහි; මනුරජ කුලෙන්, මනුරාජවංශයෙන්; පිළිවෙළ නොසිඳ, පරිපාටිය සුන් නොකොට; පැවතෙන, පැවත එන්නා වූ; එනිරිඳු, ඒ නරෙන්ද්‍රයාගේ; සිරිපතුල් වැඳ, ශ්‍රීපාදවන්දනය කොට; අවසර ගනු, අනුඥ ග්‍රහණය කරව.

**භාවය**- මනුරාජපරම්පරාපිළිවෙළින් පැවත එන්නා වූ එරජතුමා සිවු සැට අබරණ පැලඳගෙණ සිංහාසනාරූඪ වූ කල්හි ඇස්හමුවට පැමිණි විෂ්ණු වැනි ය. නුඹ ඒ රජතුමාගේ සිරිපතුල් වැඳ අවසර ගණින්.

**ක්‍රි: ය**- **නෝ එනිරිඳු සිරිපතුල් වැඳ අවසර ගණු.**

**උ: ක**- ගණු; විධික්‍රියා යි. **නෝ**: උක්ත කර්තෘ යි. **අවසර**: අනුක්ත කර්ම යි. **වැඳ**: පෙරකිරියට ද **නෝ** යනු ම කර්තෘ යි. **සිරිපතුල්**: අනුක්ත කර්මයි. **එනිරිඳු**: එහි සම්බන්ධ යි.

<u>අඤ්ඤක්‍රියා</u> - උන්, එන.

**උන්:** හිඳ (හිඳීමෙහි) ධාතුයි. ආධාර කාරකයි. **සඳ:** කා: උක්තා ධාරයි. **එන:** කර්තෘ කාරකයි. **නිරිඳු:** කා: උක්ත කර්තෘ යි.

<u>වි: ණ</u>-**නොව:** විශෙෂ්‍ය යි; **උතු:** නි: විශෙෂණ යි. **බරණ:** විශෙෂ්‍ය යි; **සිවුසැට -වොටුනුත්:** ක්‍රි: විශෙෂණ යි; **සැලඳ:** විශෙෂ්‍ය යි; **බරණ:** නි: විශෙෂණ යි; **මෙන්:** විශෙෂ්‍ය යි; **මෙණු:** නි: විශෙෂණ යි; **මෙණු:** විශෙෂ්‍ය යි; **පසක්:** ක්‍රි: විශෙෂණ යි; **උන්:** විශෙෂ්‍ය යි; **සිහසුන්මැද:** නි: විශෙෂණ යි; **(පැවත) එන:** විශෙෂ්‍ය යි; **මනුරජකුලෙන්:** නි: විශෙෂණ යි; **නොසිඳ;** විශෙෂ්‍ය යි; **පිළිවෙල:** නි: විශෙෂණ යි; **නිරිඳු:** විශෙෂ්‍ය යි; **එ:** ක්‍රි: විශෙෂණ යි; **සිරිපතුල්:** විශෙෂ්‍ය යි, **නිරිඳු:** නි: විශෙෂණ යි.

<u>සමාස</u>- 1 සිවුසැට. 2 වොටුනුත්. 3 පසක්. 4 සිහසුන්මැද. 5 මනුරජකුලෙන්. 6 නිරිඳු. 7 සිරිපතුල්.

<u>විග්‍රහ</u>- 1 සිවු ද සැට ද=සිවුසැට. 2 වොටුන්හ අත් (අනත) වූයේ යමෙකුන්ට ද ඔහු=වොටුනුත්. 3 අක් (ඇසට) පස් (පිළිරූ) වනුයේ=පසක්. 4 සිහ මතුයෙහි වූ අසුන්=සිහසුන්, සිහසුනේ මැද= සිහසුන්මැද. 5 මනු වූයේ ද එම රජ වූයේ ද=මනුරජ, මනුරජුගේ කුල=මනුරජකුල. ඉන්. 7 පයේ තල=පතුල්, සිරියෙන් යුත් පතුල්= සිරිපතුල්.

<u>විශෙෂ විභාග</u>- පෙර රජවරුන්ගේ සිවුසැට අබරණ දක්වා තිබෙන්නේ මෙසේයි. එනම්- "රත්පට, රුවන්තෝඩු, නාගවඩම්, කාදුකාප්පු, මුතුවැට, කච්චෝඩම්, බාහු දණ්ඩ, මිණිකටිවඩම්, ගිගිරිවලලු, හස්තමුද්‍රිකා, හස්තාඞ්ගුලි, කසිපෝච්චු, අඞ්ගදාභරණ, එකාවැල, කර්ණාවතංස, ග්‍රීවාලඞ්කාර, පදක්කම්, කණ්ඨසූත්‍ර, මිණිබාඳී, ගල්මුතුමාල, ගෙලමුතුමාල, මිණිමුතුමාල, දඟිත මාල, නිල්මිණිමාල, රන්මුතුමාල, රන්පෙතිමාල, ලියරන්මාල, වටරන්මාල, රුවන්මාල, රන්මිණිමාල, කුන්කොත්මාල, සිවුකොත්මාල, හස්තපෝච්චු, මෙඛලා දම්, පස්රැස් පස්පෙරහර, පස්රුවන්වැල, රන්සවඩි, රිදීසවඩි, මුතුසවඩි, සත් රුවන්සවඩි, රන්මිණිසවඩි, නිල්මිණිසවඩි, කෙයූරාභරණ, ඌරුජාලා, ඉනසැළුම, ඌරුබන්ධන, මකර පට, තළල්පට, පාදසඞ්බලා, පාදාභරණ, පාදජාලා කිඞ්කිණිකාජාලා, පාදාඞ්ගුලි, පාදජංඝාවලලු, පතුවලලු, රන්දම්, මුතුදම්, සක්දම්, රිදීදම්, මිණිදම්, මුතුහර, අඟුල්හර, වොටුනු" යන මොහු යි.

මේ සුසැට වොටුන්න කොළුවරකොට ඇතිබැවින් 'වොටුනු-අත්' යන තත්යි පරසවරලොපවිධියෙන් 'වොටුනුත්' යි යෙදීත. මනුරජකුල නම් මහාසම්මත රාජ වංශයයි. වෛවස්වත මනුරාජ මහාජනයාගේ සම්මතයෙන් රජ වූ බැවින් මහා සම්මත නාම විය.

**21 පෙරව සඳකිරණ පිපි කුමුදු මල් වපි න්**
**පරව තඹරපෙති ගිලි දියතලා පිපි න්**
**තරව සිහි ඇතිව පරතෙරට යන අපි න්**
**කරව පියාසර සකි කොන්ත ගම් තොපි න්**

විභක්ති– සඳකිරණ 2. පිපි 7. කුමුදුමල් 3. වපින් 6. පර 3. තඹරපෙති 3. දියතලා 7. පිපින් 6. තර 3. සිහි 3. ඇති 1. පරතෙරට 2. යන 7. අපින් 4. පියාසර 2. සකි 9. කොන්තගම්තොපින් 6.

පදාර්ථ–සඳකිරණ, චන්ද්‍රරශ්මිය; පෙරව, පොරවාගෙණ; වපින්, හාත්පසින්; කුමුදුමල්, කුමුදපුෂ්පයන්; පිපි, පිපුනා වූ; තඹරපෙති, පද්ම පත්‍රයන්; පර ව, මැලවී; ගිලි, ගලිත වූ (වැටුනාවූ); දියතලා පිපින්, ජලතලාමතුයෙන්; පරතෙරට යන අපින්, පරතීරයට (එගොඩට) යනු කැමැත්තෙන්; තර ව, සපිර ව; සිහිඇති ව, සිහියෙන් යුක්ත ව; සකි, මිත්‍රය; කොන්තගම්තොපින්, කොන්තගම නම් වූ තොටුපලෙන්; පියාසර කරව, පක්ෂප්‍රසාරණය කරව, (පිහාඹව).

භාවය– මිත්‍රය නුඹ සඳරැස් වැදීමෙන් පිපුනු කුමුදු හා පරවී පෙති වැටුනු පියුම් ඇති දිය මතුපිටින් පරතෙරට යනු කැමැත්තෙන් කොන්තගම් තොටුපලෙන් පියාසර කරපන්.

**ක්‍රි: ය- සකි නෝ කොන්තගම්තොපින් පියාසර කරව.**

උ: ක– **කරව:** විධික්‍රියා යි. **නෝ:** උක්ත කර්තෘ යි. **පියාසර** අනුක්ත කර්ම යි. **කොන්තගම්තොපින්:** අනුක්ත අවධි යි. **සකි:** සම්බෝධන යි.

**අර්ථක්‍රියා- පිපි, ගිලි.**

**පිපි;** පුප (පිපීමෙහි) ධාතු යි. ආධාරකාරකයි. **දියතලා:** කා: උක්තාධාර යි. **ගිලි;** ගල (ගිලිහීමෙහි) ධාතුයි. ආධාරකාරකයි. **දියතලා:** කා: උක්තාධාරයි.

සමාස– 1 සඳකිරණ 2. කුමුදුමල් 3. තඹරපෙති 4. දියතලා 5. පරතෙරට. 6 පියාසර. 7 කොන්තගම්තොපින්.

විග්‍රහ– 1 සඳේ කිරණ=සඳකිරණ. 2 කුමුදු වූයේ ද එම මල් වූයේ ද=කුමුදුමල්. 3 තඹරවල පෙති=තඹරපෙති. 4 දියේ තලා=දියතලා. 5 පර වූයේ ද එම තෙර වූයේ ද=පරතෙර (ට). 6 පියවල සර=පියාසර. 7 කොන්තයන්ගේ (කොන්තනම් අවි දරන්න වුන්ගේ) ගම=කොන්තගම. කොන්තගමේ තොට=කොන්තගම් තොට. ඉන්.

විශෙෂවිභාග- "පෙරව" යනු පූර්වක්‍රියා යි. පොරව (පෙරවීමෙහි) ධාතුයි. 'පර ව-තර ව' යනා දෙතන්හි 'ව' යන්න පෙරකිරිය වශයෙන් ද 'පර-තර' යනු එහි විකාරාන්තනිපාත වශයෙන් ද යෙදේ. සඳරැසින් කුමුදුවල පිපීම ද, පියුම්වල පරවීම ද මෙහි පළ වීය.

22 කළු වැල් කපුරු දුමතුළ ලෙලෙන දද පෙළ
සු වි ස ල් මිහිඟු සක්සන් මිණිහඬ වත ළ
කර ලොල් සතන් පවසන තිසු ගී දෙම ළ
ම න ක ල් ඉසුරු කෝවිල ලගිනේ ලක ළ

විග්‍රහ- කළුවැල්කපුරුදුමතුළ 8. ලෙලෙන 8. දදපෙළ 3. සුවිසල් 3. මිහිඟුසක්සන් මිණිහඬ 3. වතළ 8. ලොල් 2. සතන් 3. පවසන 8. තිසුගී 2. දෙමළ 2. මනකල් 8. ඉසුරුකෝවිල 8. ලකළ.

පදාර්ථ- කළුවැල්කපුරදුමතුළ, කාලාගුරුකර්පූරධූමයාගේ අභ්‍යන්තරයෙහි; දදපෙළ, ධ්වජපඞ්ක්තීන්; ලෙලෙන, ලෙලදෙන්නා වූ; සුවිසල්, ඉතාමහත් වූ; මිහිඟු, මෘදඞ්ගය; සක්, ශඞ්ඛය; සන්, 'සින්නම්' නම් වාද්‍යය; මිණි, මිණිගෙඩිය (යන මොවුන්ගේ); හඬ, නාදය; වතළ, ව්‍යාප්ත වූ; ලොල්කර, ලොල කොට; සතන්, මිනිසුන් විසින්; දෙමළ තිසු ගී, ද්‍රවිඩභාෂාමය ස්තුතිගීතිකාවන්; පවසන, ප්‍රකාශකරන්නා වූ; මනකල්, මනොඥ වූ; ලකළ, අලඞ්කෘත වූ; ඉසුරු කෝවිල, ශිවදෙවාලයෙහි; ලගිනේ, ලැගුම් ගණුව.

භාවය- (නුඹ කොත්තගම්තොටින් පියාසර කොට) කළුඅගිල් ආදී සුවඳ දුම් ඇළුන වූ ධවජ ද, මිහිඟු සක් සින්නම් ආදී හඬ ද, දෙමළ ස්තුති ගීතිකා ද, යන මෙයින් ගහන වූ ඉසුරු කෝවිල්හි ලැගුම් ගණීත්.

කි: ය- තෝ ඉසුරුකෝවිල ලගිනේ.

උ: න- ලගිනේ: යනු විධික්‍රියා යි. තෝ: උක්ත කර්තෘ යි. ඉසුරුකෝවිල: අනුක්තාධාරයි.

අජ්ඣක්‍රියා- ලෙලෙන, වතළ, පවසන, ලකළ,
ලෙලෙන, වතළ, පවසන: තුණ ආධාර කාරක යි. ඒ තුණෙන් උක්ත වූ ආධාරය ඉසුරුකෝවිල යි. "වතළ" පතර (පැතිරීමෙහි): ධාතුවෙන් ද, "පවසන" පවස - (පැවසීමෙහි) ධාතුවෙන් ද සිඩ යි.

සමාස- 1 කළුවැල්කපුරුදුමතුළ. 2 දදපෙළ. 3 මිහිඟුසක්සන් මිණිහඬ. 4 තිසුගී. 5 ඉසුරුකෝවිල.

විග්‍රහ–1 කළුවැල් ද කපුරු ද=කළුවැල්කපුරු. කළුවැල්කපුරු වල දුම්=කළුවැල් කපුරුදුම්. කළුවැල් කපුරුදුමේ ඇතුළ=කළුවැල් කපුරු දුමතුළ. 3. මිහිඟු ද සක් ද සත් ද මිණි ද=මිහිඟු සක්සත් මිණි, මිහිඟු සක්සත් මිණිවල හඬ=මිහිඟු සක්සත් මිණිහඬ. 4. තියු පිණිස වූ ගී=තියුගී. (සපදන් වි: සමස්)

විශෙෂ විභාග="මිහිඟු සක්සත් මිණිහඬ" යන තන්හි වූ 'සත්"යන්න නාදය යන අර්ථයෙහි යෙදුනත් ඊට සත්තවල "සක්සත්=ශඞ්ඛනාදය" කියා අරුත් පවසා ඇතත්, එහිවූ දකාරාර්ථ සමාසාන්තයෙහි නාදවාචක "හඬ" යන්න ඇති බැවින් සමාස මධ්‍යයෙහි ද නවත් නාදවාචක ශබ්දයක් යෙදීම වුවමනා නො වේ. දෙමළෙන් "සින්නම්" යි නළා වෙසෙසකට නමෙකි. එයින් කාව්‍යභාෂාවේ සිංහලට 'සින්' කියා හෝ "සත්" කියා හෝ ආහැකි ය. හෙද කෝවිල්වල පූජාවිධි පවත්වනවිට පිඹින වාද්‍යයෙකි. "මිහිඟු" නම් දූන් "දෙමළබෙර" නමින් ව්‍යවහාර බෙරවෙසෙසෙකි.

**23 වෙස ගන තුඟු තනයුග රොන් කොකුමග ර**
**පිස එන මද පවන් හැද විල්ලිහිණි ස ර**
**ගොස අලුයම් පසතුරු සවණතෙහි කා ර**
**ඇස නිදිගැට හැර නැගි සිටු උදු හි ර**

විභක්ති – වෙසඟන 7. තුඟු 8. තනයුග 8. රොන් 2. කොකුමඟර 2. මද පවන් 2. විල්ලිහිණිසර 2. ගොස 2. අලුයම් 8. පසතුරු 7. සවණතෙහි 8. ඇස 8. නිදිගැට 2. උදුහිර 8.

පදර්ථ–වෙසඟන, වෙශ්‍යාස්ත්‍රීන්ගේ; තුඟු, උස්වූ; තනයුග, පයොධරයුග්මයන්හි වූ; කොකුමඟරරොන්කුඞ්කුමාඞ්ගරාගරේණූන් පිස, පිසදමා; විල්ලිහිණිසර, සාරසපක්ෂීන්ගේ නාදය;හැද, ආකර්ෂණය කොට; මදපවන්, මන්දමාරුතය; එන, එනකල්හි; අලුයම්, අලුයම් කාලයෙහි වූ; පසතුරු, පංචතූර්යයන්ගේ; ගොස, ඝොෂය; සවණතෙහි කර, ශ්‍රවණයෙහි කොට(අසා); උදුහිර, සූර්යෝදය කාලයෙහි; ඇස, අක්ෂියෙහි; නිදිගැට හැර, නිද්‍රාග්‍රන්ථි දුරු කොට; නැගිසිටු, නැගීසිටුව.

භාවය–නුඹ අලුයම මද පවන් හමන කල්හි එහි පවත්වන පංචතූර්යයන් අසා අවදි වෙසන්.

ක්‍රි: ය– කෝ පසතුරු ගොස සවණතෙහි කර ඇස නිදි ගැට හැර නැගිසිටු.

උ: ක-නැගිසිවු: පූර්වක්‍රියාපූර්වකාවිධික්‍රියාසි. තෝ: උක්තකර්තෘසි කර: පෙරකිරියට ද තෝ: යනු ම කර්තෘ සි. ගොස: අනුක්ත කර්මයි. පසතුරු: තත්සම්බන්ධයි. සවණතෙහි: අනුක්තාධාර සි. හැර; පෙරකිරියට ද තෝ යනු ම කර්තෘ සි. නිදිගැට: අනුක්ත කර්මයි. ඇස: අනුක්තාධාරයි.

සමාස– 1 වෙසහන. 2 තනයුග. 3 සොකුමහර. 4 මද පවන්. 5 විල්ලිහිණිසර. 6 අලුයම්. 7 පසතුරු. 8 නිදිගැට. 9 උදුහිර.

විග්‍රහ.– 1 වෙස් වූවා ද ඔම අඟන වූවා ද=වෙසඟන. 2 තනවල යුග=තනයුග. 3 අඟ රඳ නුසි=අහර (කර්මවිබත් සමස්) සොකුම් ම අහර=සොකුමහර. 5 විල්හි ලිහිණි=විල්ලිහිණි. විල්ලිහිණීන්ගේ සර=විල්ලිහිණිසර. 6 අලු (යුත්) යම්=අලුයම්. 7 තුරු පසක් එක් කොට සලකනලද්දහු=පසතුරු. 8 තින්දෙහි ගැට=නිදිගැට. 9 හිර උදුවනුයේ යම් කලෙක්හි ද ඒ=උදුහිර.

විශෙෂ විභාග–මෙහි පංචතූර්‍ය්‍ය නාදය පවත්වන කලායක් සැළලිහිණි යාට අවදිවීමට විධානකළ කාලයක් ගැණ සැලකිය යුතුයි. දවසට යාම අටකි. යාමයකට සිංහල පැ ගණනින් හත් පැ හමාරක්ද, ඉංග්‍රිසි ගණනින් පැ තුණක්ද වේ. මේ යාම් අටෙන් අන්තිම යාමය දෙවාලයාදියෙහි පංචතූර්‍ය්‍ය නාදයක් පවත් වන කාලයයි. රැ සූර්‍ය්‍යා අස්තවසිට මේ යාමයේදී ආලෝක කරන්නට පටන්ගන් නා බැවින් මේ යාමයට "අලුයම්"යි කියනු ලැබේ. මේ යාමයෙන් සිංහල පැ තුණ හමාරක් ගත වූ කල්හි සූර්‍ය්‍යෝදය ලැබේ. සැළලිහිණියාට අවදි වීමට විධාන කළ කාලය එය යි. ඒ කාලයේ අවදිවීම මිනිසුන්ගේ සිරිතයි. ඒ කාලයේ අවදිවීමෙන් ශරීර සුඛය ද ඥානවෘද්ධිය ද ලැබේ. "සවන්"-අත් -සවණත්, මෙහි 'අත්'යන්න සවාර්ථයි.

මෙහි කී පංචතූර්‍ය්‍ය නම්="ආතත, විතත, ආතතවිතත, ඝන, සුසිර" යන මේයි: සොකුම් ආදිය ඇඟ හැමෙන් ඇඟ වඩ්ඩවන් වන බැවින් ඊට"අඞ්ගරාග" යයි කියනු ලැබේ. අඞ්ගරාග ශබ්දයෙන් සිංහලට "අඟර" යි ආයේ වේ. ඇඟ රැඳි මට (වර්ණවත්වීමට) ඉවහල් දේ "අඞ්ගරාග-අඟර" යි දත යුතුයි.

24 උ ද ගිරි කසුන් පිරිවැට හිස බැබ ළි
එ ද සහසකර පහනෙව් කරණ හෙ ළි
යො ද තුවන් ඉසුරුම කරණ පුද සො ළි
වි ද පියා නිලඹර යන් නොවි මැ ළි

විහකනි– උදුගිරිකසුන් පිරිවැට 7. හිස 8. බැබලි 2. එද 8. සහසකර 2. පහන් 2. හෙලි 2. තුවන් 8. ඉසුරුම 5. කරණ 2. පුදසොලි 2. පියා 2. නිල ඹර 2. මැලි 1.

පදාර්ථ-උදගිරි, උදය පර්වත නමැති; කසුන්රිවිවැට, කාචනප්‍රදීප යෂ්ටිහුගේ; හිස, මූදුනෙහි; බැබලි, භ්‍රාජිත වූ; සහසකර, සූර්යයා; පහනෙව්, ප්‍රදීපයක් මෙන්; එදා, ඒ දිනයෙහි; හෙළිකරත, ආලොක කරණ කල්හි; ඉසුරුට, ඊශ්වරයාහට; කරණ, කරණු ලබන්නාවූ; පුදකෙලි, පූජෝත්සවයන්; නුවන්යොදා, නෙත්‍රයෙහි යොජිතකොට (බලා); මැලිනොවී, අලස නොවී; පියා විදා, පියාපත් දිගහැර; නිලඹර, නීලවර්ණවූ ආකාශයට; යන්, ගමන් කරව.

භාවය- තුඹ එද උදේ ඉර පායන විට ඉසුරුට කරණු ලබන පූජොත්සව යන් බලා අලස නොවී නිල්වන් අහසට නැගපන්.

ක්‍රි: ය-නෝ පුදකෙලි නුවන් යොදා මැලි නොවි පියා විදා නිලඹර යන්.

උ: ක- යන්: විධික්‍රියා යි. නෝ: උක්තකර්තෘ යි. නිලඹර: අනුක්ත කර්ම යි. විදා: පෙර කිරියට ද නෝ යනු ම කර්තෘ යි. පියා: අනුක්ත කර්ම යි. වී: පෙරකිරියට නෝ: උක්ත ප්‍රකෘති කර්තෘ යි. මැලි: විකෘති කර්තෘ යි. යොදා: පෙරකිරියට නෝ: උක්ත කර්තෘයි. පුදකෙලි: අනුක්ත කර්ම යි. නුවන්: අනුක්තාධාරයි.

අර්ථක්‍රියා-බැබලි, කරණ.

බැබලි: බබල (බැබලීමෙහි) ධාතුයි. කර්තෘ කාරකයි. සහසකර-පහන්: උක්ත කර්තෘ යි කරණ: කර්ම කාරකයි. පුදකෙලි: උක්ත කර්මයි.

සමාස · 1 උදගිරි කසුන්රිවිවැට. 2 සහසකර. 3 පුදකෙලි. 4 නිලඹර.

විග්‍රහ- 1 (හිර) උදා වනුයේ යම් ගිරකින් ද ඒ=උදගිරි (අවද්‍ය අරුත අන රුත් සමස්) කසුනෙන් කළ රිවි=කසුන්රිවි, වැට පිණිස වූ කසුන්රිවි=කසුන්රිවිවැට (සපදන් විබත් සමස්). උදගිරිම කසුන්රිවිවැට=උදගිරි කසුන්රිවිවැට. 2 සහසක් කර යමෙකුට ද ඒ= සහස්කර=සහසකර (සබඳ අරුත අනරුත් සමස්). 3 පුද පිණිස වූ කෙලි=පුදකෙලි. නිල් වූයේ ද එම අඹර වූයේ ද=නිලඹර.

විශෙෂ විභාග-යම් තැනකින් ඉර උදවේ නම් ඒ "උදගිරි"ය යි ද, යම් තැනකින් ඉර බසී නම් ඒ "අවරගිරි" යයි ද කියති. "කසුන් රිවිවැට" යන තන්හි "රිවි" යනු යෂ්ටියට (කණුවට) ද "වැට" යනු ප්‍රදීපයටද නම්. 'වැට' යන්න, එහි 'වර්ති' ශබ්දයෙන් ආ "වැටි" යන්නෙන් සිඳයි. වැටි නම් පහන් වැටියයි. "වැටි"

යන්නෙහත් අසාත්‍යර්ථයෙහි 'අ' ප්‍රත්‍යය යෙදීමෙන් 'වැට'යි පහතට නම් විය. වැටි ඇත්තේ=වැටයනු විග්‍රහයි. "සහස්සකර" යන තැන්හි "කර" යනු රශ්මියට නම්. දහසක් යන්තොත් ගැණෙන්නේත් (බොහෝ) යන අර්ථයයි. තිලඹර යාමට අණ කිරීමෙන් අගවත්නේත් අහසෙහි බොහෝ ඉහල නැගින්ට කී බවයි. තිල්වත් වන්නේ අහසෙහි බොහෝ ඉහල ය.

මෙහි උදය පර්වතය රන් චූවා පහන් කණුවකට ද, උදයපර්වතය මුදුනෙන් පායා සූර්යයා පහන් කණුව මුදුනේ බබලන පහනකට ද සම කොට නිරූපිතයි.

**25 සු ර ර ද සමන් සමගින් සුරගන එව ර**
**පැහැනද මදුරා පරසතු මල්පත ර**
**කා ර පු ද වඳින රැඳි මුනි සිරිපා තඹ ර**
**ස කි ස ද පෙනේ සමනොළ ගල නැගෙන හි ර**

<u>විභක්ති</u>-සුරරද 3. සමන් 3. සුරගන 3. එවර 8. පැහැනද 4. මදුරා පරසතු මල්පතර 4. පුද 2. වඳින 7. මුනි 7. සිරිපා තඹර 3. සකිසඳ 9. සමනොළගල 1. නැගෙනහිර 8.

<u>පදාර්ථ</u>-සකිසඳ, මිත්‍රෝත්තමය; එවර, ඒ අහසට නැගි කාල යෙහි; සමන් සුරරද, සුමන දිව්‍යරාජයා; සුරගන සමගින්, දෙවඟනන් හා එක්ව; පැහැනද, ප්‍රභාවෙන් ආර්ද්‍රවූ (තෙමී ගියා වූ); මදුරා පරසතු මල්පතර, මන්‍දාර පාරිජාත පුෂ්පසමූහයෙන්; පුද කර,පූජා කොට; වඳින, වඳිනු ලබන්නාවූ; මුනි, බුදුන්ගේ; සිරිපා තඹර, ශ්‍රී පාද පද්මය; රැඳි, පිහිටියාවූ; සමනොළ ගල, සමන්තකූට පර්වතය; නැගෙනහිර, පෙරදික්හි; පෙනේ, දක්නා ලැබේ.

<u>භාවය</u>-මිත්‍රය අහසට නැගිකල්හි තුඹට ශ්‍රී පාද කන්ද නැගෙනහිර දිශාවෙහි පෙනේවි. එනම් සමන්දෙවියන් දෙවගනන් සමග පැමිණ මදුරා පරසතු මල් ආදියෙන් පුද කරණු ලබන බුදු සිරිපතුල පිහිටි සමන්තකූට පර්වතයයි.

**<u>ක්‍රි: ය</u>-සකිසඳ තට සමනොළ ගල නැගෙනහිර පෙනේ.**

<u>ඓ: ක</u>-**පෙනේ:** අනාගත කාමීකාරක ප්‍රථම පුරුෂ ඒක වචන ක්‍රියා යි. **සමනොළගල:** උක්ත කාමීයි. **තට:** ජාතීෘ අර්ථයෙහි සම්බන්ධයි. **නැගෙනහිර:** අනුක්ත විෂයාධාරයි. **සකිසඳ:** සම්බෝධනයි.

<u>අර්ධක්‍රියා</u>-**වඳින, රැඳි.**

**වඳින:** වඳ (වැඳීමෙහි) ධාතුයි. කාමීකාරකයි. **සිරිපාතඹර:** උක්ත කාමීයි. **රැඳි:** ආධාර කාරකයි. **සමනොළ ගල:** උක්තාධාරයි.

<u>සමාස</u>– 1 සුරරද. 2 සුරඝන. 3 පැහැනද. 4 මදුරා පරසතු මල් පතර. 5 සිරිපාතඹර. 6 සකිසඳ. 7 සමනොළගල. 8 නැගෙනහිර.

<u>විග්‍රහ</u>– 1 සුර ද එම රද ද=සුරරද 3 පැහැයෙන් අද=පැහැඅද–පැහැනද. 4 මදුරා ද පරසතු ද=මදුරා පරසතු. මදුරාපරසතුම මල්= මදුරාපරසතුමල්. මදුරා පරසතු මල්වල පතර=මදුරාපරසතුමල් පතර. 5 පා ම තඹර=පාතඹර. සිරියෙන් යුත් පා තඹර=සිරිපාතඹර 6 සකි ද එම සඳ ද=සකිසඳ. සමනොළ ම ගල=සමනොළගල. හිර නැගෙනුයේ යම් දිගෙක්හි ද ඒ=නැගෙනහිර. (අවදි අරුත අන රුත් සමස්)

<u>විශෙෂ විභාග</u>– 'සමන්' යනු සමනොළ සාන්දෙහි වූ දෙව්රජයි. එනම් ලඞකාවට අරක්ගත් දෙවිවරු සතරදෙනා අතුරෙන් සුමන දෙවරාජයි. සෙසු තුන්දෙනා නම්–උත්පලවණී, කාර්තිකෙය, විභීෂණ යන මොහුයි. 'සමගින්' යන්න සමග යන අර්ථයෙහි ම පවත්නා නිපාතයෙකි. 'පැහැනද' යනු තන්හි න යන්න ආගම වශයෙනි. මදුරා පරසතු දෙවගස දෙව්ලොව වූ වෘක්ෂ පසෙන් දෙකෙකි. 'මදුරා පරසතුමල්පතර' යන තන්හි විභක්ති කරණයෙ විය යුතුයි. පූජාර්ථ ධාතුයොගයේදී පූජා ද්‍රව්‍යය කරණයෙන් යෙදීම පාලි සංස්කෘත යන්හි ද රීතියයි. සිංහලෙහිද "පරසතු මලින් පුද" යනාදියෙහි කරණය ප්‍රකටව පෙනේ. පූජාව ලබන්නා සම්ප්‍රදාන වූ තන්හි පූජාද්‍රව්‍යය කර්ම විය යුතුයි. 'බුදුන්ට මල් පුදමි" යනාදි වශයෙනි.

26 ග නේ මිණි බැබලි කිරණෙව් සත පා ය
ර නේ යටග සැවුලිඳු දද ගළ පා ය
අ නේ ලසර සාල පුර අප නර පා ය
පෙ නේ දකුණ මහසෙන් දෙව්රද පා ය

<u>විභක්ති</u>–ගනේ 4. මිණි 4. බැබලි 8. කිරණ 2. සතපාය 7. රණේ යටග 8, සැවුලිඳු දද 2. අනේලසර 4. සාළ 1. පුර 8. අප 7. නරපාය 7. දකුණ 8, මහසෙන් දෙව්රදපාය 1.

<u>පදාර්ථ</u>–සතපාය, සූය්‍ර්‍යයාගේ; කිරණඑව්, රශ්මිය මෙන්; ගනේ, සනවූ, (ගැවසිගත්තාවූ); මිණි, මාණික්‍යයෙන්; බැබලි, භ්‍රාජිතවූ; රණේ යටග, සවර්ණයෂ්ට්‍යග්‍රයන්හි; සැවුලිඳුදද, කුක්කුට රූපයුත් ධ්වජයන්; ගළපාය, සටනාසොට (බැඳ); අනේ ලසර, නොයෙක් අලඞකාරයෙන් (යුක්ත සොට);සාළ, සාරණ ලද්දාවූ; මහසෙන් දෙව් රදපාය, මහාසෙන දෙවරාජයාගේ ප්‍රාසාදය; අප, අපගේ; නරපාය, රජහුගේ; පුර, පුරයෙහි; දකුණ, දක්ෂිණ දිශායෙහි; පෙනේ, දක්නාලැබේ.

<u>භාවය</u>-අහසට නැඟී බැලුවිට නුඹට ජයවඩන පුරයේ මහාසෙන දෙවාලය පෙනෙන්මි. ඒ වනාහි රත්මිණිමුවා කෝටු අග බඳිනලද කුකුළු රූ යුත් කොඩි ආදියෙන් සරසන ලද්දකි.

<u>ක්‍රි: ය</u>- නට මහසෙන් දෙව්රදපාය දකුණ පෙනේ.

<u>උ: න</u>-පෙනේ: ක්‍රියායි. මහසෙන්දෙව්රදපාය: උක්ත කර්මයි. දකුණ: අනුක්තාධාරයි. නට: කර්තෘ අර්ථයෙහි සම්බන්ධයි.

<u>අර්ථක්‍රියා</u>- බැබලි, කළ.

බැබලි: බබල (බැබලීමෙහි) ධාතුයි. කර්තෘ කාරකයි. රණේයටි: උක්ත කර්තෘ යි. කළ: කර්මකාරකයි. මහසෙන් දෙව්රදපාය: උක්ත කර්මයි.

<u>සමාස</u>- 1 සතපා. 2 රණේයටග. 3 සැවුලිඳුදද. 4 අනේලකර. 5 මහසෙන්දෙව්රදපාය.

<u>විග්‍රහ- 1</u> සතයක් (බොහෝ) පා (රැස්)යමෙකුට ද ඒ= සතපා (සබඳ අරුත අනරුත් සමස්). 2 රණින් කළ යටි=රන්යටි. රන් යටියේ අග=රන්යටග-රණේ යටග. 3 සැවුල් ද එ ම ඉඳුද=සැවුලිඳු. සැවුලිඳු (රුයුත්) දද=සැවුලිඳුදද. 4 එකක් නොවනුයේ= අනේ අනේ ද එ ම ලකර ද=අනේලකර. 5 මහවූ සෙන් යමෙකුටද ඒ= මහසෙන්. මහසෙන් වූයේ ද එම දෙව් වූයේ ද=මහසෙන්දෙව්.මහ සෙන් දෙව් වූයේ ද එ ම රද වූයේ ද=මහසෙන්දෙව්රද. මහසෙන් දෙව්රදගේ පාය=මහසෙන්දෙව්රදපාය.

<u>විශෙෂ විභාග</u>-මෙහි "ගන මිණි' රන්යටග"යි කිය යුතු තන්හි අකුරු සම කිරීම සඳහා "ගනේ මිණි-රනේ යටග" යි යෙදින. 'සතපා ගළපා නරපා යි' කියයුතු තන්හි ඡන්දස පිණිසත් එලිසම කිරීම පිණිසත් "සතපාය ගළපාය, නරපාය" යි යෙදින. මෙහිවූ "නරපා" ශබ්දය "නෘප" ශබ්දයෙන් ආයේ ය. මිනිසුන් රකින්නා යන අර්ථයි. එනම් රජයි.

මෙහිවූ මහසෙන් දෙව්රද නම් ඊශ්වර පුත්‍රවූ කඳකුමරුය, මොහුට මුහුණු සයක් හා අත් දොළොසක් ඇත්තේය. වාහනය මයුරයි. මහසෙන් දෙව්රදපාය නම් ජයවඩන පුරයෙහිවූ ෂණ්මුඛදෙවාලයයි. විහාර අස්නයෙනුදු එය සඳුටයි. එය ඉතා උස්බැවින් අහස්ගත සැළලිහිණියාගේ ඇසට ගොදුරුවේ.

27 ව ල දින අදහසින් මෙන් සුරගඟ අග න
න ල බල සසල දළ රළපෙළ නුබ නැගෙ න
වෙල ලස ගැවසි මුතු සක් පබළු බබල න
බ ල මහ මුහුද එම සඳ උතුරෙන් පෙනෙ න

**විශෙෂණ**– වලඳින 7. අඳහසින් 4. සුරගඟ අහන 2. නලබලසසල 3. දළ රල පෙළ 3, නුබ 2. නැගෙන 2. වෙලළස 8. ගැවසි 4. මුතුසක් පබලු 4. බබලන 2. මහ මුහුද 2. එ 3. සඳ 3. උතුරෙන් 6. පෙනෙන 2.

**පදාර්ථ**–එම සඳ, ඒ (අහසට නැගි) කාලයෙහි; සුරගඟ අහන, ආකාශ ගඞ්ගා නමැති සත්‍රිය; වලඳිනඅඳහසින්මෙන්, වැලඳගැනීමේ අදහසින් මෙන්; නල බල, වාතවෙගයෙන්; සසල, චංචලවූ; දළ, මහත්වූ; රලපෙළ, රළ පඞ්ක්තිය; නුබ නැගෙන, අහසට නැගෙන් නාවූ; වෙලළස, වෙරළ සමීපයෙහි; ගැවසි, ගැවසුනාවූ; මුතුසක් පබලු, මුක්තා ශඞ්ඛප්‍රවාලයෙන්; බබලන, බබලන්නාවූ; උතුරෙන්, උත්තර දිශායෙහි; පෙනෙන, පෙනෙන්නාවූ; මහ මුහුද, මහා සමුද්‍රය; බල, බලව.

**භාවය**– අහසට නැඟුනුවිට උතුරුදෙස. පෙනෙන්නේ මහ මුහුදයි, එය ද බලාපන්.

**ක්‍රි: ය**–නෝ මහමුහුද බල.

**උ: ක**-**බල**: විධික්‍රියායි. **නෝ**: උක්ත කර්තෘයි. **මහමුහුද**: අනුක්ත කර්මයි.

**අර්ථක්‍රියා**–**සසල, නැගෙන, ගැවසි, බබලන, පෙනෙන.**

**සසල**: 'චචල' ශබ්දයෙන් භිත්තයි. කර්තෘකාරකයි. **දළරල පෙළ**: කාඃ උක්ත කර්තෘයි. **නැගෙන**: නග (නැගීමෙහි) ධාතුයි. අවධි කාරකයි. **මහ මුහුද**: කාඃ උක්ත අවධියි. **ගැවසි**: ගවස (ගැවසීමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. **මුතු සක් පබලු**: කාඃ උක්ත කර්තෘයි. **බබලන**: බබල (බැබලීමෙහි) ධාතුයි. කර්තෘ කාරකයි. **මහ මුහුද**: කාඃ උක්ත කර්තෘයි. **පෙනෙන**: පෙන් (පෙනීමෙහි) ධාතුයි. කර්මකාරකයි. **මහ මුහුද**: කාඃ උක්ත කර්මයි.

**සමාස**– 1 සුරගඟ අහන. 2 නලබලසසල. 3දළරලපෙළ. 4 වෙල ළස. 5 මුතුසක්පබලු. 6 මහමුහුද.

**විග්‍රහ**– 1 සුරන්ගේ ගඟ=සුරගඟ. සුරගඟ ම අහන=සුරගඟ අහන. 2 නලේ බල=නලබල. නලබලෙන් සසල=නලබලසසල. 3 දළ වූයේ ද එ ම රල වූයේ ද=දළරල. දළ රල වල පෙළ=දළරලපෙළ. වෙලලේ අස=වෙලළස. 5 මුතු ද සක් ද පබලු ද=මුතුසක්පබලු. මහ වූයේ ද එ ම මුහුද වූයේ ද=මහ මුහුද.

විශෙෂ විභාග-කවිසමයෙහි සමුද්‍රය ස්වාමි ස්වරූපයෙන්ද ගඞ්ගාවෝ නානා ස්වරූපයෙන් ද දක්වෙත්. ආකාශ ගඞ්ගාව ගඞ්ගා අතුරෙහි වූ ප්‍රධාන ගඞ්ගාවයි. එහි දෙවිවරු ජලක්‍රීඩාදිය ද කෙරෙති. එය අහසෙහි ගලාබසින් හෙයින් ආකාශ ගඞ්ගාවයි ද කියනු ලැබේ. මුහුදේ රළනැගීම ප්‍රකෘතියෙකි. කවීන් මෙසේ කියනලද්දේ සුරගඟ නමැති අඞ්ගනාව වැළඳගැනීමේ අදහසින් මෙන් වූ සිඹියකැයි කියායි. එසේ කීයේ උත්ප්‍රෙක්ෂා වශයෙනි. 'උතුරෙන්' යනු අදර අරුත අමදිසි.

28 සත් නත් සිහින්ගෙඩි සෙවනලු වැලිතෙලෙ න
තැන්තැන් වල ම සැනපි සියුමැලි බැවි න
රන් වන් කරල් ගෙණ එන ගිරවුන් අති න
යන් මන් තොසින් මග තොරතුරු නියම දූ න

විභක්ති- සත් 8. නත් සිහිත්ගෙඩි 7. සෙවනලු 4. වැලිතෙලෙන 4.තැන් තැන්වල 8. සියුමැලිබැවින 4. රන්වත් කරල් 2. එන 7. ගිරවුන් 7. අතින 6. මන් තොසින් 4. මග 7. තොරතුරු නියම 2. .

පදාර්ථ-නත් සිහින්ගෙඩි, නොයෙක්හීන්ගෙන්ද වෘක්ෂයන්ගේ; සෙවනලු, ඡායාවෙන් යුක්තවූ; නොහොත් ඡායාව හෙලූ; වැලිතෙලෙන, වැලිතලාවලින්; සත්, ජනනවූ (ගැවසිගත්තාවූ;) තැන් තැන් වලම්, ඒ ඒ ස්ථානයන්හි ම; සියුමැලි බැවින, සියුමැලි බැවින් යුත් හෙයින්; සැනපී, විඩාහැර; රන්වන්, ස්වර්ණවර්ණවූ; කරල්, ශස්‍යමඤ්ජරීන්; ගෙණ එන, රැගෙන එන්නාවූ; ගිරවුන් අතින, ගිරවුන්ගෙන්; මග, මාර්ගය පිළිබඳ වූ; තොරතුරු නියම, විශෙෂ විභාගයන්හි නිශ්චය; දූන,අසාදූන; මන්තොසින්, චිත්ත සන්තොෂයෙන්; යන්, ගමන් කරව.

භාවය- නුඹ සියුමැලි බැවින් හින්ගෙන්ද ගස්වල සෙවන වැටී තිබෙන වැලිතලාවල සැතපි රන්වන් වී කරල් ගෙණ එන ගිරවුන්ගෙන් මාර්ගයේ තොරතුරු දූනගෙන සතුටින් පලයන්.

ක්‍රි: ය- තෝ මග තොරතුරු නියම දූන මන්තොසින් යන්.

ද: න- යන්: විධික්‍රියායි. තෝ: කර්තෘයි. මන්තොසින්: ක්‍රියා විශෙෂණාර්ථයෙහි කරණයි. දූන: පෙර කිරියයි. තෝ: යනුම කර්තෘයි. තොරතුරු නියම: අනුක්ත කර්මයි. මග: තත් සම්බන්ධයි.

අඞ්ගක්‍රියා- සත්, එන.

**සත්:** 'ජනත' ශබ්දයෙන් භින්නයි. සාමිකාරකයි. **තැන්තැන්:** උක්ත සාමියි. **එක:** සාතීඃසාරකයි. **ගිරා:** උක්ත කත්‍ෂයි.

<u>**සමාස**</u>- 1 තන්සිහින්ගෙදි. 2 සෙවතලු. 3 වැලිතෙලෙත. 4 තැන්තැන්වල. 5 සියුමැලිබැව්න. 6 රන්වන්කරල්. 7 මන්තොසින්. 8 තොරතුරු නියම.

<u>**විග්‍රහ**</u>- 1 තන් වූවාහු ද ඔහු සිහින්ගෙදි වූවාහු ද=තන් සිහින් ගෙදි. 3 වැල්ලේ තල=වැලිතල. ඉන්. 4 තැන් ද තැන් ද=තැන් තැන්. එහි-තැන්තැන්වල. 5 සියුමැලිහුගේ බව=සියුමැලි බව. ඉන්. 6 රණේ වන් යමෙක්හි ද ඒ=රන්වන්, රන්වන් වූයේ ද එම කරල් වූයේ ද=රන්වන් කරල්. 7 මනෝ තොස=මන්තොස-ඉන්. 8 තොර තුරුවල නියම=තොරතුරුනියම.

<u>**විශෙෂ විභාග**</u>- 'සෙවතලු' යන තන්හි වූ 'සෙවන' යන්න ජායාවාචක භිඥ 'ශිපාතා' ශබ්දයෙන් ආයේ වේ. ඉන් පරව ඇති යන අර්ථයෙහි 'ලු' ප්‍රත්‍යය යෙදීමෙන් "සෙවතලු" යි සිඛ යි. "සෙවන ඇත්තේ=සෙවතලු" යනු විග්‍රහ යි. ඒ හැර "සෙවන-ලු" යි පද දෙකක් වශයෙන් ද ගත හැකි වේ. එකල්හි 'ලු' යන්න 'ලා- ලැමෙහි, යන ධාතුවෙන් සිඛ ආධාරකාරක අර්ථක්‍රියා යි. 'වැලි තල' ඉන් උක්ත වූ ආධාර යි. "සෙවන" අනුක්ත කර්ම යි. ජායාවාචක "සෙවනැලි" ශබ්දය මින් අනෙකකි. "ගිරවුන් අතින" යනු ගිරවුන්ගේ කෙරෙන් යනු වැනි ය. මෙහි-වෙත ;පක්ෂීන් හැර ගිරවුන් අතින් ම මග තොරතුරු දැන ගැණීමට නියම කෙළේ කුමක් හෙයින්දැයි සිතිය යුතුයි. ගිරා සැළලිහිණීන්ගේ විශෙෂ සම්බන්ධයක් ඇතිබව කාදම්බරියෙහි "සසාරිකොඃ පඤ්ජර වර්ත්තිභිඃ ශුකෛඃ" යනාදි වශයෙන් කුවෙර නම් බ්‍රාහ්මණයාගේ ගෙදර කූඩුවල සැළලිහිණීන්' සමග ගිරවුන් එකට උන් බව කීමෙන් පැවසේ.

29 නි ල තුරඟුට නැගෙමින් රිවි දෙව් සිරි න
දු ල සාර සේසත් මිණි බරණ කිරණි න
බ ල පිරිසෙන් සහ යාපා පටුන් ගෙ න
බ ල සේනා නායක සපු කුමරු එ න

<u>**විභක්ති**</u>-නිල 2. තුරඟුට 2. රිවිදෙව්සිරින 4. දුල 2. සේසත් 2. මිණිබරණ කිරණින 4. බලපිරිසෙන් 3. යාපා පටුන් 2. සේනානායක සපුකුමරු 2. එන 2.

<u>**පදාර්ථ**</u>- රිවිදෙව් සිරින, සූර්‍ය්‍යදෙවයාගේ ආකාරයෙන්; නිල, කාලවර්ණවූ; තුරඟුට, අශ්ව වාහනයට; නැගෙමින්, ආරූඪ ව; මිණි බරණ කිරණින, මාණික්‍යාභරණ කාන්තියෙන්; සේසත්, ශ්වෙතච්ඡත්‍රය; දුලසාර, ජ්වලිත කොට; යාපාපටුන් ගෙණ, යාපාපට්ටනය දිනා

ගෙණ; බලපිරිසෙන් සහ, බලපුණ් සෙනාව සමග; එන, ඉදිරියට එන්නාවූ; සේනානායක, සෙනාධිපතිවූ; සපුකුමරු, සපුමල්කුමාරයා; බලූ, බලව.

<u>භාවය</u>- නුඹ යාපාපටුන දිනාගෙණ පලාවත් අසෙකුපිට නැගී සේසත් නංවාගෙණ බලවත් සිවුරඟ සෙනගත් සමඟ එන සේනානායක සපුමල්කුමරු බලාපන්.

**<u>ක්‍රි: ය</u>- නෝ රිවිදෙව්සිරිත නිල තුරඟුට නැඟෙමින් මිණි බරණ කිරණින සේසත් දුල සාර යාපාපටුන් ගෙණ බලපිරි සෙන් සහ එන සේනානායක සපුකුමරු බල.**

<u>උ: ක</u>-**බල**: විධික්‍රියායි. **නෝ**: උක්ත කර්තෘයි. **සේනානායකසපුකුමරු**: අනුක්ත කර්මයි. **එන** යන අරුත්කිරියට **සේනානායක සපුකුමරු**: අභිවශයෙන් උක්ත කර්තෘයි. **බලපිරිසෙන්**: **සහ** යොගයෙහි කර්තෘයි. **ගෙණ** යන පෙරකිරියට ද **සේනානායක සපුකුමරු** යනු ම උක්ත කර්තෘයි. **යාපාපටුන්**: අනුක්ත කර්මයි. **සාර** යන පෙර කිරියට ද **සේනානායකසපුකුමරු** යනු ම උක්ත කර්තෘ යි. **සේසත්**: අනුක්ත ප්‍රකෘති කර්මයි. **දුල**: විකෘති කර්මයි. **මිණිබරණකිරණින**: අනුක්ත කරණයි. **නැඟෙමින්** යන පෙර කිරිය අරුත් මුසු කිරියට ද **සේනානායකසපුකුමරු**: යනු ම උක්ත කර්තෘයි. **නිලතුරඟුට**: අනුක්ත කර්මයි. **රිවිදෙව්සිරිත**: උපලක්ෂණ අරුත්හි කරණයි.

<u>සමාස</u>- 1 රිවිදෙව්සිරිත. 2 සේසත්. 3 මිණිබරණකිරණින· 4 බලපිරිසෙන්. 5 යාපාපටුන්. 6 සේනානායකසපුකුමරු.

<u>විග්‍රහ</u>- 1 රිවි ද එම දෙව් ද=රිවිදෙව්, රිවිදෙව්හුගේ සිරි=රිවිදෙව්සිරි. ඉත්. 2 සේ වූයේ ද එම සත් වූයේ ද=සේසත්. 3 මිණියෙන් යුත් බරණ=මිණිබරණ, මිණිබරණේ කිරණ=මිණිබරණකිරණ-ඉත්. 4 බෙලෙන් පිරි=බලපිරි. (කරණ වි: සමස්) බලපිරි වූයේ ද එම සෙන් වූයේ ද=බලපිරිසෙන්. 5 යාපායේ පටුන්=යාපාපටුන්. 6 සේනාවේ නායක=සේනානායක, සේනානායක වූයේද එම සපුකුමර වූයේ ද=සේනානායකසපුකුමර. බහු.

<u>විශෙෂවිභාග</u>- "නිලතුරඟුට" යන තන්හි "නිල" යන්නෙන් කාල වර්ණය වාච්‍ය වේ. නිඝණ්ටු ආදියෙහි කාලවර්ණයට "නිල" කියා ද දක්වේ. සූර්‍ය්‍යයාගේ අශ්වයා හරිද්වර්ණ ය, හරිද්වර්ණය නම් නිලපීත මිශ්‍ර වර්ණය යි. "නැඟෙ

මින්" යනු පූර්වක්‍රියාර්ථයෙහි මිශ්‍රක්‍රියා යි. "සේසත්" යනු සුදුකුඩයි. එය අසු පිටින් එන කුමරුගේ අව්ව වැළැක්ම පිණිස යි. ඒ වනාහි කුමරුගේ විණීබරණ කිරණින් ජ්වලිත යි. "බලපිරිසෙත්" යන්නෙන්- ඇත්, අස්, රිය, පාබළ, යන සිවුරඟ සෙනඟ ගැනේ.

පරාක්‍රමබාහු රජතුමාගේ පුත්‍රතනතුරෙහි වැඩුනු සෙම්බගප්පෙරුමාල් නමින් ප්‍රකට සපුමල් කුමරු යාපාපටුනට පැමිණ යුධ කොට දිනා ජයවර්ධන පුරයට ලඟාවන දිනය සැළලිහිණියා පිටත් වූ දිනයට පසු දිනය බව මේ කීමෙන් හැගේ.

**30 අ ග පිපිමල් මලිගිය ලිය සෑ ලේ යා**
**ව ග බැඳ හෙන රජහස පුල් වි ලේ යා**
**ල ග තුරු මල් ගිලිහුනු රොණවු ලේ යා**
**ම ග බැස යව පළ හෙල වැලිතෙ ලේ යා**

විභක්ති- අගපිපිමල්මලිගියලියසෑලේ 8. වග 2. හෙනරජහසපුල් විලේ 8. ලග 8. තුරු 7. මල් 6. ගිලිහුනු 4. රොණ් 4. අවුලේ 8. මග 2. පළ 8. හෙල 8. වැලිතෙලේ 8.

පදාර්ථ- අග, අග්‍රයෙහි; පිපිමල්, පිපුනු මලින් යුක්ත වූ; මලිගියලියසෑලේයා, ඉද්දවැල්ගාල් ඇත්තාවූ; වගබැඳ, වර්ගබන්ධනය කොට (පේළිගැසී); හෙන, බසින්නා වූ; රජහස, රාජහංසයන්ගෙන් යුක්තවූ; පුල්විලේයා, ප්‍රබුද්ධ පියුම්විල් ඇත්තා වූ; ලඟ, සමීපයෙහි වූ; තුරු, වෘක්ෂයන්ගේ; මල්, පුෂ්පයෙන්; ගිලිහුනු, ගලිතවූ(වැටුනාවූ); රොන්, රේණුයෙන්; අවුලේයා, ආකූලවූ (ගැවසීගත්තා වූ); පළ, ප්‍රකටවූ(පැතුරුණාවූ); හෙල, ධවලවූ; වැලිතෙලේයා, වැලිතලාවෙහි වූ; මග, මාර්ගයට; බැස, අවතීර්ණ ව; යව, ගමන් කරව.

භාවය- නුඹ මල් පිපි දුසමන්වැල්ගාල්වලින් හා රාජහංසයන් බසින පියුම්විල්වලින් ද, මල්ගස්වලින් වැටෙන මල්රොන්වලින් ද ගැවසීගත් වැලිතලා වෙහි වූ මාර්ගයට බැස පලයන්.

ක්‍රි: ය- **තෝ මග බැස යව.**

උ: න- **යව**: විධික්‍රියා යි. **තෝ**; උක්ත කර්තෘ යි. **බැස**: පෙරකිරියට ද **තෝ** යනු ම උක්ත කර්තෘ යි. **මග**: අනුක්ත කර්ම යි.

අර්ථක්‍රියා- **හෙන, ගිලිහුනු.**

**හෙන**: හි (හීමෙහි) ධාතු යි. කර්තෘකාරකයි. **රජහස**: කා: උක්තකර්තෘ යි. **ගිලිහුනු**: 'ගිලි' යන පෙරකිරිය පූර්ව-හි (හීමෙහි): ධාතු යි. කර්තෘකාරක යි. **රොන්**: උක්ත කර්තෘ යි.

<u>සමාස</u>– 1 අගපිපිමල් මලිගියලියසැලේ. 2 හෙනරජහසපුල් විලේ. 3 වැලිතෙලේ.

<u>විග්‍රහ</u>– අගෙහි පිපියා වූ මල් යමෙක්හි ද ඒ=අගපිපිමල්. මලිගිය ද එම ලිය ද=මලිගියලිය. අගපිපිමල් වූයේ ද එ ම මලිගිය ලිය වූයේ ද=අගපිපිමල් මලිගියලිය. අගපිපිමල් මලිගිය ලියන්ගේ සැල යමෙක්හි ද ඒ=අගපිපි මල් මලිගියලියසැල–එහි. 2 හෙන්නා වූ රජහස යමෙක්හි ද ඒ=හෙනරජහස. හෙන රජහස වූ පුල් විල් යමෙක්හි ද ඒ=හෙනරජහස පුල්විල්. එහි. 3 වැල්ලේ තල=වැලිතල–එහි.

<u>විශෙෂවිභාග</u>– මේ කවෙහි සතරපෙදෙහි ම වූ පාදන්ත 'යා' යන්න ඡන්‍දස රැකගැණීම පිණිසයි. "රජහස" නම් ඵලහෙවන් හොටයෙන් හා පාවලින් යුත් ශ්වෙතහංසයෝ යි.

31 අ සි රවණ වුවත් නවතන රිසින් එ න
අ සි ර දහස් දිලිදුනු කොත් සිපත් ගෙ න
කසි කාවලෙහි දක සෙබළුන් රැකා සිටි න
ව සි යා සරන් මල්තුරුගන වනහිසි න

<u>විභාග</u>– අයිරාවණ 2. නවතන 7. රිසින් 4. එන 2. අයිරාදහස් 2. දිලි 2. දුනුකොත්සිපත් 2. කසිකාවලෙහි 8. සෙබළුන් 2. සිටින 2. යා 2. මල්තුරුගන 6. වනහිසින 6.

<u>පදර්ථ</u>:– එන, (අභිමුඛයට) එන්නාවූ; අයිරාවණ වුවත්, ඓරාවණහස්තිරාජයා නමුදු; නවතනරිසින්, නැවැත්වීමේ අභිලාෂයෙන්; අයිරාදහස්, දහසින් අධිකවූ; දිලි, ජ්වලිතවූ; දුනු කොත්සිපත්, ධනුස් කුන්ත අසිපත්‍රයන්; ගෙණ, ග්‍රහණය කොට; කසිකාවලෙහි, කසිකාවල නම් වූ මුරපලෙහි; රැකාසිටින, රැකවල්ගෙණ සිටින්නාවූ; සෙබළුන්, සෙවකභටයන්; දක, දර්ශනය කොට; මල්තුරුගන, මල් ගස්වලින් ගැවසුනාවූ; වනහිසින, වනමස්තකයෙහි (වනමස්තකය විෂයකොට); වසි, වහා; යා සරන්, ගමන් කරව.

<u>භාවය</u>– නුඹ, දුනු ආදිය ගෙණ කසිකාවල රැකසිටින භටසමූහයා දක මල්ගස් මුදුන් උඩින් වහා පියාඹා පලයන්.

<u>ක්‍රි: ය</u>– තෝ මල්තුරුගනවනහිසින වසි යා කරන්.

<u>උ: ක</u>– කරන්: විධික්‍රියා යි. තෝ: උක්ත කර්තෘ යි. යා: අනුක්ත කර්ම යි. වසි: ක්‍රියා විශෙෂණ යි. මල්තුරුගනවනහිසින: අනුක්ත විෂයාධාරාර්ථයෙහි අවදියි.

<u>අසමාප්තක්‍රියා</u>– එන, දිලි, සිටින.

**එන**: කර්තෘකාරකයි. **අසිරවණ**: කා: උක්තකර්තෘයි. **දිලි**: දල (දිලිසීමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. **දුනුකොත්සිපත්**: කා: උක්ත කර්තෘ යි. **සිටින**; සිට (සිටීමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. **සෙබළ**: කා: උක්තකර්තෘයි.

<u>සමාස</u>– 1 අසිරුදහස්. 2 දුනුකොත්සිපත්. 3 සෙබළුන්. 4 මල් තුරුගනවනහිසින.

<u>විග්‍රහ</u>– 1 දහසින් අසිරු=අසිරුදහස් (අවියසමස්). 2 දුනු ද කොත් ද අසිපත් ද=දුනුකොත්සිපත්. 3 සේ වූවාහු ද ඔහු බළ වූවාහු ද=සෙබළහු-ඔවුන්. 4 මලින් යුත් තුරු=මල්තුරු, මල්තුරු වලින් ගන=මල්තුරුගන, මල්තුරුගන වූයේ ද එම වන වූයේ ද=මල් තුරුගනවන, මල්තුරුගනවනෝ හිස=මල්තුරුගනවනහිස. එසින්.

<u>විශෙෂවිභාග</u>– "අසිරාවණ" යනු ශක්‍රයාගේ හස්තියා යි. ඔහුගේ ජාත භූමිය සමුද්‍රය යි. සංස්කෘතශබ්දය "ඓරාවණ" යනු යි. "අසිරාදහස්" යන තන්හි "අසිරා" යනු අධිකාර්ථයෙහි නිපාතයෙකි. "කොත්" යනු අතීත ආයුධ යෙකි. "අසි" යනු කඩුව යි. එය පත්‍රාකාර බැවින් "අසිපත්" යයි ද කියනු ලැබේ. මෙහි අකාරලොපයෙන් 'සිපත්' යි යෙදින. 'වයි' යනු ශීඝ්‍රාර්ථයෙහි නිපාතයෙකි, සංස්කෘතයෙහි "වෛ" යනු වේ. "සෙවකභට" ශබ්දයෙන් 'සෙබළ' ශබ්දය ආයේ වේ. හේවා භටසමූහයා යන අර්ථ යි. "අසිරාවණ වුවත් කවතන රිසින් එන" යනු කීමෙන් ඔවුන්ගේ දක්ෂභාවය ස්ඵුට වේ.

32 නිමල් සඳපහන් වැනි වැලිපිට උදු ල
සුපුල් මල්යහන් ලියමඬු ලියගෙපෙ ල
එකල් කෙළින වනදෙව්ලිය දූක කොම ල
ලසල් රුකොක සැතපෙව ලපලුසිහිල ල

<u>විභක්ති</u>– නිමල් 2. සඳපහන් 2. වැලිපිට 8. උදුල 8. සුපුල්මල්යහන් 8. ලියමඬු ං. ලයගෙපෙළ 8. එ 8. කල් 8. කෙළින 2. වනදෙව්ලිය 2. කොමල 2. ලසල්රුකෙක 8. ලපලු 4. සිහිල් 2. අළු 8.

<u>පදාර්ථ</u>– නිමල්, නිර්මලවූ; සඳපහන් වැනි, චන්ද්‍රකාන්තිය මෙන්; උදුල, බබලන්නාවූ; වැලිපිට, වැලිතලායෙහි වූ; සුපුල්මල්යහන්, මොනවට පිපුනු මලින් යුත් යහන්හි ද; ලියමඬු, ලතාමණ්ඩපයෙහිද; ලියගෙපෙල, ලතාගෘහපඞ්ක්තියෙහි ද; කෙළින, ක්‍රීඩා කරන්නාවූ; කොමල, මෘදුවූ; වනදෙව්ලිය, වනදිව්‍යස්ත්‍රීන්; දූක, දර්ශනය කොට; එකල්, ඒ කාලයෙහි; ලපලු, ලපලුවලින්; සිහිල්, ශීතභාවය; අළු, එළුවූ; ලසල්රුකොක, තරුණශාලවෘක්ෂයෙක්හි; සැතපෙව, විශ්‍රාමය කරව.

භාවය– නුඹ නිමල්සඳපහන මෙන් දිලිසෙන වැලිපිට වූ පුෂ්පශයන-ලතාමණ්ඩප-ලතාගෘහ-යන මේ ස්ථානයන්හි ක්‍රීඩා කරණ වනදෙව්ලියන් දුක ඒ කාලයෙහි ලදලු නිසා ශීතභාවය ගෙණදෙන ලසල්රුකොක සැනපියන්.

ක්‍රි: ය– නෝ ලසල්රුකොක සැනපෙව.

සැනපෙව: විධික්‍රියායි. නෝ: උක්තකර්තෘයි. ලසල්රුකොක: අනුක්තාධාරයි.

අ ණ්ඩක්‍රියා– උදුල, කෙළින, අළ.

උදුල: උ පූර්‍ව-දුල් (දිලිසීමෙහි): ධාතු යි. කර්තෘකාරකයි. වැලි පිට: කා උක්තකර්තෘ යි. කෙළින: කෙළ (කෙළීමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. වනදෙව්ලිය: කා: උක්ත කර්තෘයි. අළ: එළ (එළවීමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. ලසල්රුක: කා: උක්තකර්තෘයි.

සමාස– 1 නිමල්. 2 සඳපහන්. 3 වැලිපිට. 4 සුපුල් මල්යහන්. 5. ලියමඬු. 6. ලියගෙපෙළ. 7 වනදෙව්ලිය. 8. ලසල්රුකොක. 9. ලපලු.

විග්‍රහ– 1 මල නැත්තේ=නිමල්. 2 සඳේ පහන්=සඳපහන්. 3 වැලිවල පිට=වැලිපිට. 4 මොනවට පුල්=සුපුල්. සුපුල් ද එම මල් ද= සුපුල්මල්. සුපුල්මලින් යුත් යහන්=සුපුල්මල්යහන්. 5 ලියෙන් සැදි මඬු=ලියමඬු. 6 ලියෙන් සැදි ගේ=ලියගේ. ලියගේවල පෙළ= ලියගෙපෙළ. 7 සල් වූයේ ද එම රුකොක් වූයේ ද= සල්රුකොක්, ලා වූයේ ද එම සල්රුකොක් වූයේ ද=ලසල් රුකොක්-එහි. 9 ලා වූයේ ද එම පලු වූයේ ද=ලපලු.

විශෙෂවිභාග– 'නිමල්සඳපහන් වැනි' යයි කීමෙන් මෙකී වැලිතලයේ වැලිවල අතිශය නිර්මල ශුභ්‍රභාවයක් අඟවයි. "රුකොක" යන තන්හි 'එක්' ප්‍රත්‍යය අනියමාර්ථ යි. ලසල්රුක් අතුරෙන් කිසියම් රුකොක යන අර්ථ යි. "ලපලුසිසිලළ" යන්නෙන් ඒ කාලය සල්ගස්වල දලු ලන කාලය බව දක්වේ.

33 මල් දම් සුවඳ දුම් දුන් සොඳ වරල සිනි
හල් ගිම් නිවා සැනහෙන සිහිලස ර සිනි
කොල් ලම් ගසින් නිල් ඉවුරැති පොකුණ සිනි
වල් අම් බලම දැක යා ගන් සහනො සිනි

විගහනි– මල්දම් 2. සුවඳදුම් 2. දුන් 4. සොඳ 3. වරලසිනි 4. හල් 3. ගිම් 2. සැනහෙන 4. සිහිලසරසිනි 6. කොල්ලම්ගසින් 4. නිල් 3. ඉවුරැ 3. ඇති 6. පොකුණසිනි 6. වල්අම්බලම 2. තොසිනි 4.

**පදාර්ථ**– මල්දම්, පුෂ්පදාමයන් ද; සුවඳදුම්, සුගන්ධධූමයන් ද; දුන්, දෙන ලද්දාවූ; වරලසිනි, කේශකලාපයෙන්; සොඳ, සුන්දරවූ; සාල්, සාන්තාවන්; ගිම් නිවා; ග්‍රීෂ්මනිර්වාපණය කොට; සැනහෙන, සනාතය කරන්නාවූ; සිහිලසරසිනි, සිහිල්දියෙන් යුක්ත වූ; කොල් ලම්ගසින්, කොල්ලම්ගස් කාරණකොටගෙණ; නිල්, නිලවණ්වූ; ඉවුරු ඇති, ඉවුරු ඇත්තාවූ; පොකුණසිනි, පොකුණ ලඟින්; වල්අම්බලම, එනම් විශ්‍රාම ශාලාව; දක, දර්ශනය කොට; සහතොසිනි, සන්තොෂ සහිතව; යා ගන්, ගමන් කරව.

**භාවය**– නුඹ මල්දම් ආදියෙන් යුත් කෙශකලාපයෙන් සොඳුරු කාන්තාවන්, ස්නානයට ඉවහල් සිහිල්දිය ඇත්තාවූද, කොල්ලම්ගස් නිසා නිල් වන් ඉවුරු ඇත්තාවූද පොකුණු අසල සිට වල්අම්බලම් දක සන්තොෂයෙන් පලයන්.

**ක්‍රි: ය**– **නෝ වල්අම්බලම දක සහතොසිනි යාගන්.**

**උ: ක**–**යාගන්**; විධික්‍රියා යි. **නෝ**; උක්තකර්තෘ යි. **සහතොසිනි:** ක්‍රියාවිශෙෂණ යි. **දක:** පෙරකිරියට **නෝ:** උක්තකර්තෘ යි. **වල්අම්බලම:** අනුක්තකර්ම යි.

**අර්ථක්‍රියා**– **දුන්, සැනහෙන.**

**දුන්:** සම්ප්‍රදාන කාරකයි. **වරලස:** කා: උක්තසම්ප්‍රදානයි. **සැන හෙන:** කරණකාරකයි. **සිහිලසරස:** උක්තකරණයි.

**සමාස**– 1 මල්දම්. 2 සුවඳදුම්. 3 සිහිලසරසිනි. 4 කොල්ලම් ගසින්. 5 පොකුණසිනි. 6 වල්අම්බලම.

**විග්‍රහ**– 1 මලින් කළ දම්=මල්දම්. 2 සුවඳ වූයේ ද එම දුම් වූයේ ද=සුවඳදුම්. 3 (සිහිල් ම=සිහිලස.) සිහිලස වූ රස යමෙක්හි ද ඒ=සිහිලසරස–ඉන්. 4 කොල්ලම් වූයේ ද එම ගස් වූයේ ද=කොල්ලම් ගස්. ඉන්– 5 පොකුණේ අස=පොකුණස. ඉන්– 6 වල්හි වූ අම්බලම= වල්අම්බලම.

**විශෙෂ විභාග**– මෙහිදු 'වරලස-සිහිලස, යන දෙතන්හි "අස" ප්‍රත්‍යය 2 වන කාවෙහි කී නියා යි. "පොකුණසිනි" යන තන්හි පූර්වක්‍රියා ලොපයෙන් යෙදෙන අදර අරුත අවදි විබත යි. පූර්වක්‍රියා යොගය ඇතිකල්හි "පොකුණසැ සිට වල්අම්බලම දක" යනු වේ. මෙහි සිට යන පූර්වක්‍රියාව ලොප් වූ කල්හි "පොකුණසැ" යන ආධාරය "පොකුණසින" ගි අවදි විය.

34 කස්තුරි තිලක සැදි නලළත සුමු ටාන
පුල්මහනෙල් මල්දම් හිස දව ටාන
සළෙළුන් යනෙන නිති කරළ කෙළි කාව ටාන
රිවිමුදුනත වනමැද වදු සුමු ටාන

විශෙෂ්‍ය– කස්තුරිතිලක 4. සැදි 3. නලළත 8. සුමුටාන 8. පුල්මහනෙල් මල්දම් 2. හිස 8. සළෙළුන්. 3. යන 2. එන 2. කෙළිකවටාන 2. රිවිමුදුනත 8. වන 7. මැද 2. සුමුටාන 7.

පදඅර්ථ– සුමුටාන, ඉතා මට සිලුටු වූ; නලළත, නලළෙහි; කස්තුරිතිලක, කස්තුරි තිලකයෙන්; සැදි, සැරසුනා වූ; සළෙළුන්, තරුණයන්; පුල්, පිපුනාවූ; මහනෙල්මල්දම්, රතුපුල්මල්දම්; හිස, ශිෂ්‍යෙයහි; දවටාන, දවටාගෙණ; කෙළිකවටාන කරළ, කෙළිකාවටකම් කරමින්; නිති, නිරන්තරයෙන්; යන එන, ගමනාගමනය කරන්නාවූ; සුමුටාන, සුමුටාන නම් වූ; වනමැද, වනයේ මැදට; රිවිමුදුනත, ඉරමුදුන් වේලෙහි; වදු, ප්‍රවිෂ්ට වෙව.

භාවය– නුඹ ඉරමුදුන්වේලෙහි කසතුරිතිලකාදියෙන් සැරසුනු තරුණයන් කෙළිසෙල්ලම් කරමින් නිරතුරු ඔබමොබ යන සුමුටාන වනමැදට පැමිණියත්.

ක්‍රි: ය– නෝ සුමුටාන වනමැද වදු.

උ: න– වදු: විධික්‍රියායි. නෝ: උක්තකර්තෘ යි. මැද: අනුක්ත කර්මයි. වන: තත්සම්බන්ධ යි. සුමුටාන: තද්විශෙෂණයි.

අප්‍රධානක්‍රියා– සැදි, යන, එන.

සැදි: සද (සැදුම්හි): ධාතුයි. කර්මකාරකයි. සළෙළු: කා උක්තකර්මයි. යන: යා (යාමෙහි) ධාතුයි. එන: එ (ඊමෙහි) ධාතුයි. (දෙකම) ආධාරකාරකයි. වන: උක්තාධාරයි.

සමාස– 1 කස්තුරිතිලක. 2 පුල්මහනෙල්මල්දම්. 3 කෙළිකාවටාන. 4 රිවිමුදුනත.

විග්‍රහ– 1 කස්තුරියෙන් කළ තිලක=කස්තුරිතිලක. 2 මහනෙල් වූයේ ද එම මල් වූයේ ද=මහනෙල්මල්. පුල් වූයේ ද එම මහනෙල්මල් වූයේ ද=පුල්මහනෙල්මල්. පුල්මහනෙල්මලින් කළ දම්=පුල්මහනෙල් මල්දම්. 3 කෙළි ද කාවට ද=කෙළිකාවට. කෙළිකාවට ම=කෙළිකාවටාන. 4 මුදුනතෙහි රිවිවූයේ යම් කාලෙක්හි ද ඒ=රිවිමුදුනත.

<u>විශෙෂ විභාග</u>– "තිලක" නම් විශෙෂයක් ඇඟවීම සඳහා කස්තුරි ආදියෙන් තලලෙහි හා නාසයෙහි තල ඇට ආකාරයෙන් කරණ ලකුණකි. "විශෙෂක" යනු ද ඊට නමෙකි. "මුද්‍රනත" යන තන්හි "අත්" යන්න සවාර්ථ යෙහි ය. එබඳු තන්හි 'අත්' ශබ්දයාගේ අර්ථවිශෙෂයක් නො ලැබේ. මුද්‍රනම් මුද්‍රනත යනු වේ. පාලියෙහි "සුතන්තන්ත, වනන්ත" යනාදියෙහි යෙදෙන "අන්ත" ශබ්දය මෙනි. "සුමුටාංත" යනු දූත් 'හිඹුටාංත' යන නමින් ප්‍රසිද්ධ ප්‍රදෙශය යි. "සුමුටාංත" යන තන්හි "ආංත" යන්න වන වාචක 'කාන්තන' ශබ්දයෙන් ආයේ යයි කියයුතු ය. "කවටාංත" යන තන්හි 'ආංත' යන්න අකුරු සම්කිරීම් වශයෙනි. "දවටාංත" යන තන්හි "ආංත" යන්න පූර්වක්‍රියාර්ථ ප්‍රත්‍යයෙකි. පාලියෙහි පූර්වක්‍රියාර්ථ "ත්වාන" ප්‍රත්‍යය සිංහලට "ආංත" කියා ආයේ යයි සිතිය හැකි වේ. මේ කවෙහි වූ "කරු" යන පූර්වක්‍රියාව මිශ්‍රක්‍රියාර්ථ වශයෙන් ගතයුතුයි.

**35 ම ග නි ල මි න් සිටි නා දෙඹ නි පිය ල**
**පි ය ස ල මි න් මලගෙහි සොලෑ රෙණිනව ල**
**න තු ඩ ල මි න් බිද විළිකුන් මියුරුප ල**
**ඉ සු ඹු ල මි න් යා සැළි දඹපඳුරුව ල**

<u>විභක්ති</u>– මග 8. සිටි 8. නා දෙඹ නි පියල 8. පිය 2. මලගෙහි 8. රොණින් 4. අවල 8. න 7. තුඩ 2. විළිකුන් 2. මියුරුපල 2. ඉසුඹු 2. සැළ 9. දඹපඳුරුවල 8.

<u>පදාර්ථ</u>– සැළ, ශාරිකාපක්ෂිය (නුඹ); මග, මාර්ගයෙහි; නිලමින්, නීලවර්ණ වෙමින්; සිටි, සිටියාවූ; නා, නාගය; දෙඹ, පුන්නාගය; නී, නීපය (බක්මිය); පියල, පියාලය (මොරය) යන මේ වෘක්ෂයන්හි; රොණින් අවල, රේණුයෙන් ආකුල වූ; මලගෙහි, පුෂ්පාග්‍රයෙහි; පිය සලමින්, පක්ෂචාලනය කොරෙමින් (පියාපත් ගසමින්); සොලෑ, ක්‍රීඩා කොට; නතුඩ, නාගේ හොටය; ලමින්, ප්‍රක්ෂෙප කොට; විළිකුන්, මනාව පැසුනාවූ; මියුරුපල, මධුර ඵලයන්; බිද, අනුභව කොට; දඹපඳුරුවල, ජම්බුස්තම්බයන්හි; ඉසුඹු ලමින්, විශ්‍රාමය කොට; යා, ගමනය කරව.

<u>භාවය</u>– නුඹ මගදෙපස නිල්වන්ව තිබෙන නාගස් ආදියෙහි වූ මල්වල පිය සලමින් ක්‍රීඩා ද කොට පැසුනු මියුරු පලතුරු අනුභව ද කොට දඹපඳුරුවල විඩාහරිමින් පලයන්.

**<u>ක්‍රි: ශ</u>– සැළ නෝ මලගෙහි පිය සලමින් සොලෑ තුඩ ලමින් මියුරුපල බිද දඹපඳුරුවල ඉසුඹු ලමින් යා.**

<u>ව: ක</u>– **යා**: විධික්‍රියා යි. **නෝ**: උක්තාඛ්‍යාතිය යි. **සැළ**: සම්බොධන යි. **සලමින්** යන මූසුකිරියට ද **නෝ** යනු ම උක්තාඛ්‍යාතිය යි. **පිය**: අනුක්තකාමී යි. **සොලෑ** යන පෙරකිරියට ද **නෝ** යනු ම කර්තෘ යි.

**මලගෙහි:** අනුක්‍තාධාර යි. **ලමින්** යන මුසුකිරියට ද **නෝ** යනු ම සාත්‍ය යි. **තුඩ:** අනුක්‍තකර්මයි. බිඳ යන පෙරකිරියට ද **නෝ** යනු ම උක්‍ත සාත්‍ය යි. **මියුරුපල:** අනුක්‍තකර්මයි. **ලමින්** යන දෙවන මුසුකිරියට ද **නෝ** යනු ම උක්‍ත සාත්‍ය යි. **ඉසුඹු:** අනුක්‍තකර්ම යි. **දඹපඳුරුවල:** අනුක්‍තාධාරයි.

**සිටි:** අප්‍රධානක්‍රියායි. සාත්‍යකාරකයි. **නාදෙඹනිපියල:** උක්‍ත සාත්‍යයි.

<u>සමාස</u>– 1 නාදෙඹනිපියල. 2 මලගෙහි. 3 මියුරුපල. 4 දඹ පඳුරුවල.

<u>විග්‍රහ</u>– 1 නා ද දෙඹ ද නි ද පියල ද=නාදෙඹනීපියල. 2 මලේ අග=මලග–එහි. 3 මියුරු වූයේ ද එම පල වූයේ ද=මියුරුපල. 4 දඹ වල පඳුරු=දඹපඳුරු–එහි.

<u>විශෙෂවිභාග</u>– "නිලමින්" යන මිශ්‍රක්‍රියාව 'නිල්' යන නාමයෙන් සිඬ යි. 'නිල්' යන්නෙන් පරව 'අ' ප්‍රත්‍යය වූ කල්හි 'නිල' යනු වේ. එය ධාතුවක් වශයෙන් සැලකේ. පාලිසංස්කෘතයන්හි එබඳු ශබ්දරූපයන්ට 'නාමධාතු' යයි කියති. "තුඩ ලමින්, ඉසුඹු ලමින්" යන දෙතන්හි 'ලමින්' යන මිශ්‍රක්‍රියාවය පූර්ව ක්‍රියාර්ථවශයෙනි. "තුඩ ලමින්" යන තන්හි "ලමින්" යන්නෙහි ධාතුව "ලා-ලෑමෙහි" ද, දෙවැන්නෙහි "ලා-ගැණීමෙහි" ද වියයුතුයි. "ඉසුඹු ලමින්" යන්නෙහි අර්ථය වෙහෙස දුරුකර ගෙණ යනුයි. "ඉසුඹු" යන්න "විශ්‍රාම" ශබ්දයෙන් සිංහල වූවෙකි. 'බිඳ' යන්න බුද (බොදුම්හි) ධාතුවෙන් සිඬයි.

**36 රි වි තෑ වු ලේ පි පි කා ම ලේ විල් ගැව සි**
**මත කොවු ලේ තු රු ව ද ලේ හඬනි සි**
**ව න සැ වු ලේ ම ග අ ස ලේ පොර සැල සි**
**ගුරු බැ වු ලේ ය ව අ වු ලේ නොවි කි සි**

<u>විභක්ති</u>– රිවිතෑවුලේපිපිකාමලේ 4. විල් 4. ගැවසි 8. මතකොවුලේ 3. තුරු 7. වදලේ 8. හඬන 8. නිසි 7. වනසැවුලේ 3. මග 7. අසලේ 8. පොර 8. සැලසි 8. ගුරුබැවුලේ 8. අවුලේ 2.

<u>සදැහි</u>– රිවිතෑවුලේ, සූර්‍ය්‍යතාපයෙන්; පිපිකාමලේ, පිපියා වූ පියුම් ඇති; විල්, තඩාගවලින්; ගැවසි, ගැවසුනා වූ; නිසි, යොග්‍ය වූ; තුරු, වෘක්ෂයන්ගේ; වදලේ, මුවායෙහි; මතකොවුලේ, මත්තකොකිලයන්; හඬන, නාදකරන්නා වූ; මග අසලේ, මාර්ගාසන්න යෙහි; වනසැවුලේ, වලිකුකුළන්; පොර, යුඬයෙහි; සැලසි, යෙදුනා වූ; ගුරුබැවුලේ, ගුරුබැවුල නම් පෙදෙසෙහි දී; කිසි අවුලේ නොවී, සවල්ප වූ ද අවුලකට නොපැමිණ; යව, ගමන්කරව.

භාවය- නුඹ පියුම් විල්වලින් හා රුක්මුවාවේ සිට නාදකරණ මත් කොවුලන්ගෙන් ද මඟදෙපස පොරට සැරසී සිටිනා වලිකුකුළන්ගෙන් ද යුත් ගුරුබැවුලේදී මද අවුලකටත් නො පැමිණ පලයන්.

ක්‍රි: ය- කෝ කිසි අවුලේ නොවි ගුරුබැවුලේ යව.

උ: ක- යව: විධික්‍රියා සි. කෝ: උක්තකර්තෘ සි. නොවි: පෙර කිරියට ද කෝ යනු ම උක්තකර්තෘ සි. කිසි අවුලේ: අනුක්තකර්ම සි. ගුරුබැවුලේ: අනුක්තාධාර සි.

අර්ථක්‍රියා- ගැවසි, හඬන, සැලසි.

ගැවසි: ගවස (ගැවසුම්හි): ධාතු සි. ආධාර කාරක සි. ගුරු බැවුල: කා: උක්තාධාර සි. හඬන: හඬ (හැඬිමෙහි); ධාතු සි. ආධාර කාරක සි. ගුරුබැවුල: කා: උක්තාධාර සි. සැලසි: සලස් (සැලැස් මෙහි): ධාතු සි. ආධාරකාරක සි. ගුරුබැවුල: උක්තාධාර සි.

සමාස- 1 රිවිතැවුලේපිපිකමලේ. 2 මතකොවුලේ. 3 වන සැවුලේ.

විග්‍රහ- 1 රිවිගේ තැවුල්=රිවිතැවුල්. රිවිතැවුලෙන් පිපි කමල් යම් තැනෙක්හි ද ඒ=රිවිතැවුල්පිපිකමල්- රිවිතැවුලේ පිපිකමලේ. 2 මත් වූවෝ ද ඔහු කොවුලෝ වූවෝ ද=මත්කොවුල්, ඔවුන්-මත කොවුලේ. 3 වෙනෙහි සැවුල්=වනසැවුල්-වනසැවුලේ-ඔවුන්.

විශෙෂ විභාග- "රිවිතැවුලේ, පිපිකමලේ, වනසැවුලේ, අවුලේ" යන තන්හි සි වූ අනන ඒ කාරය වර්ණාලඞ්කාරය හා ඡන්දස පිණිස යි. කොවුලන්ගේ මත්විම වසන්ත කාලයේ ලක්ෂණයෙකි. "වදුල" නම් ගස් ආදියෙන් ගහන වූ තැනි. "වදුල" යයි ද කියනු ලැබේ. "ගුරුබැවුල" නම් දැන් 'වානගුරුගොඩැල්ල' යන නමින් ප්‍රසිඛ ප්‍රදෙශය යි. "නොවි" යන පූර්වක්‍රියාව ප්‍රාප්ත්‍යාර්ථ 'වූ' ධාතුවෙන් සිඛ යි.

37 ව න සි රි පියුම් රා බඳ රණබරණ සු රු
ව ට පි රි සුපුල් දුනුකෝ මල්මුරුත තු රු
බි ගු පි රි වැරූ ඔළු පුලැඹලවල තඹු රු
හි ම ස රි සිහිල්දිය හෙබ දැක යන් මිතු රු

විභක්ති- වනසිරි 7. පියුම්රා 4. බඳ 7. රණබරණ 7. අයුරු 4. වට පිරිසුපුල්දුනුකෝමල්මුරුතතුරු 2. බිගු 3. පිරිවැරූ 4. ඔළු 4. උපුල් 4. ඇඹුල 4. අවල 2. තඹුරු 4. හිමසරිසිහිල්දියනෙබ 2. මිතුරු 9.

**පදාර්ථ** - වනසිරි, වනලක්ෂ්මියගේ; පියුම්රා, පද්මරාගමාණික්‍ය යන්; බඳ, බඳිනලද්ද වූ; රණබරණසුරු, ස්වර්ණාභරණාකාරයෙන්; වට, හාත්පස්හි; පිරි, පිරුණා වූ; සුපුල්, සුප්‍රඵුල්ල වූ; දුනුකෝ, දුනුකෝ ගස් හා; මල්මුරුතතුරු, මල්මුරුතගස් ඇත්තා වූ; බිඟු, භෘංගයන් විසින්; පිරිවැරූ, පිරිවරණලද්ද වූ; ඔලු, ඕලුවලින් ද; උපුල්, මානෙල් වලින් ද; ඇඹුල, හෙළමානෙල්වලින් ද; තඹුරු, තාමරස වලින් ද; අවුල, ආකුල වූ; හිමසරි, හිමට සමාන වූ; සිහිල්දිය, ශීතලජලයෙන් යුක්ත වූ; හෙබ, සොබ්භය (ගැඹුරුජලාශය) දැක, දර්ශනය කොට; මිතුරු, මිත්‍රය; යන්, ගමන් කරව.

**භාවය**- මිතුර නුඹ වනශොභා නමැති සිරිකතගේ පියුම්රා මිණි බැඳි ස්වර්ණාභරණයක් මෙන් වටේ පිරිහිබෙන්නා වූ මල් පිපුනු දුනුකෝ හා මල්මුරුත ගස්වලින් යුක්තවූ ද, භෘංගයන් පිරිවැරූ ඕලු ආදියෙන් යුක්තවූ ද හිමසරිසිහිල් දිය ඇති හෙබ දැක පලයන්.

**ක්‍රි: ය- මිතුරු නෝ හිමසරිසිහිල් දියහෙබ දැක යන්.**

**උ: ක**- **යන්:** විධික්‍රියා සි. **නෝ:** උක්තකර්තෘ සි. **මිතුරු:** සම්බොධන සි. **දැක** යන පෙරකිරියට ද **නෝ** යනු ම උක්තකර්තෘ සි. **හිමසරිසිහිල්දියහෙබ:** අනුක්තකර්ම සි.

**අන්‍යක්‍රියා- බඳ, පිරි, පිරිවැරූ.**

**බඳ:** බඳ (බැඳීමෙහි): ධාතුයි. ආධාරකාරක සි. **රණබරණ:** උක්තාධාර සි. **පිරි:** පුර (පිරීමෙහි): ධාතු සි. කර්තෘකාරක සි. **සුපුල් දුනුකෝමල්මුරුතතුරු:** උක්තකර්තෘ සි. **පිරිවැරූ:** පිරි පූර්ව-වර (වටලෑමෙහි): ධාතු සි. කර්මකාරක සි. **ඔලු-උපුල්-ඇඹුල-තඹුරු:** උක්තකර්ම සි.

**සමාස**- 1 වනසිරි. 2 පියුම්රා. 3 රණබරණ. 4 වටපිරිසුපුල් දුනුකෝමල්තමුරුතුරු. 5 හිමසරිසිහිල්දිය.

**විග්‍රහ**- 1 වනම සිරි=වනසිරි. 2 පියුමේ රා යමක ද ඒ=පියුම්රා. 3 රණින්කළ අබරණ=රණබරණ. 4 වටෙහි පිරි=වටපිරි, දුනුකෝ ද මල්මුරුත ද=දුනුකෝමල්මුරුත, දුනුකෝ මල්මුරුත ම තුරු=දුනුකෝ මල්මුරුතතුරු. සුපුල් ද එම දුනුකෝමල්මුරුතතුරු ද=සුපුල්දුනුකෝ මල්මුරුත තුරු. වටපිරි සුපුල්දුනුකෝමල්මුරුතතුරු යම් තැනක ද ඒ=වටපිරිසුපුල්දුනුකෝමල්මුරුතතුරු. 5 හිමට සරි=හිමසරි, සිහිල්

වූයේ ද එම දිය වූයේ ද=සිහිල්දිය, හිමසරි වූයේ ද එම සිහිල්දිය වූයේ ද=හිමසරිසිහිල්දිය, හිමසරිසිහිල්දියෙන් යුත් ගෙබ=හිමසරි සිහිල්දියගෙබ.

<u>විශෙෂ විභාග</u>– "වනසිරි" යන තන්හි 'වන' යන්නෙන් ගැණෙන්නේ වනයෙහි ශොභාව යි. අභෙදෙපචාරවශයෙනි. එබැවින් 'වනසිරි' යන්නේ අර්ථය 'වනශොභා නමැති ලක්ෂ්මියගෙ' යි ගතයුතුයි. මේ දියනෙබ වටෙහි පිරිතුබුනු දුනුයෝ ගස්වල හා මල්මුරුතනස්වල මල් වනශ්‍රියගේපියුම්රා මිණිබැඳි සවර්ණාභරණයක් කොට රූපණය කළහ. එහිදුනුයෝ මල් රත්වත් බැවින් සවර්ණාභරණයට ද, මල්මුරුතමල් රකනවර්ණබැවින් පියුම්රාමිණිවලට ද සම කොට රූපණය කළබව පෙනේ.

38 ස ලා දු ලා පියොවුරු තඹර රොන්ර ත
පු ලා නි ලා උපුලන් ලාගෙණ කණ ත
කලා පිලා නොව ඇල්ගෙව් කෙළින ඉ ත
බ ලා පලා ශව අස්වන් ගුරුළු කො ත

<u>විභක්ති</u>– දුලා 8. පියොවුරු 8 තඹර 7. රොන් 2. රත 7. පුලා 2. නිලා 2. උපුලන් 2. කණත 8. කලාපිළා 2. ඇල්ගෙවි 3. කෙළින 2. ඉත 3. අස්වන් 2. ගුරුළුකොත 2.

<u>පදාර්ථ</u>– දුලා, දිලිහෙන්නා වූ; පියොවුරු, පයොධරයන්හි; රතතඹර, රක්තතාමරසයන්ගේ; රොන්, රේණූන්; සලා, විසුරුවා ගෙණ; පුලා, පිපුනා වූ; නිලාඋපුලන්, නීලොත්පලයන්; කණත, කර්ණයෙහි; ලාගෙණ, බහාගෙණ; ඉත, හිතවත් වූ (අන්‍යොන්‍ය මිත්‍ර වූ); ඇල්ගෙවි, ශාලිගොපිකාවන්; කලාපිළා නොව, කලහපීඩාව කට නොපැමිණ; කෙළින, ක්‍රීඩාකරන්නා වූ; අස්වන්, අස්වැදුනා වූ; ගුරුළුකොත, ගුරුළුකොත නම් කුඹුර; බලා, නිරීක්ෂණය කොට; පලායව, පිටත්ව යව.

<u>භාවය</u>– නුඹ පයොධරයන්හි රත්තඹරරොන් හලාගෙණ, කන්හි නිලුපුල් පැලඳ ශාලිගොපිකාවන් ක්‍රීඩාකරණ අස්වන් ගුරුළු කොත බලා පිටත්ව පලයන්.

<u>ක්‍රි: ය</u>– තෝ ගුරුළුකොත බලා පලායව.

<u>උ: ක</u>– පලායව: පූර්වක්‍රියා පූර්වකාවිධික්‍රියා යි. තෝ: උක්ත කර්තෘ යි. බලා යන පෙරකිරියට ද තෝ යනුම උක්තකර්තෘ යි. ගුරුළුකොත; අනුක්තකර්ම යි.

<u>අර්ථක්‍රියා</u>– දුලා, කෙළින, (අස්)වන්.

**දුලා:** කර්තෘකාරක යි. **පියොවුරු:** උක්තකර්තෘ යි. **කෙළින:** ආධාරකාරක යි. **ගුරුළුසොන:** උක්තාධාර යි. **අස්වන්:** 'අස්' යන කර්මය උපපදකොට ඇති වද (වැදුම්හි): ධාතු යි. කර්තෘකාරක යි. **ගුරුළුසොන:** උක්තකර්තෘ යි.

**විශෙෂ විභාග**- මෙහි "දුලා පුලා තිලා" යන තන්හි ශබ්දයෝ "දුල් පුල්, තිල්" යනු යි. අකුරු සම් කිරීම සඳහා 'ආ' යන්නකින් යුක්ත කොට 'දුලා' පුලා, තිලා" යි යෙදීය. "කාලා" යන්න 'කලහ' ශබ්දයාගේ හකාරලොපයෙන් හා අකාරදීර්ඝයෙන් සිද්ධ යි. "පිලා" යන්නේ ප්‍රකෘතිය 'පිළා' යනු යි. පාලි 'පිළා' ශබ්දයෙන් හෝ සංස්කෘත 'පීඩා' ශබ්දයෙන් ආයේ වේ. වර්ණාලඞ්කාරය සඳහා අකුරු සමකිරීමට 'ළ' යන්න 'ල' යන්නට පෙරළීය. "ඉන" යන්න 'හිත' ශබ්ද යෙන් ආදේශ. 'ඇල්ගෙව්' නම් හැල්කෙත්රකින්නවුන්ගේ කාන්තාවෝයි. 'අස්වන්' යන තන්හි 'අස්' යන්න ආශ්‍රය 'ශස්‍ය' ශබ්දයෙනි. ශස්‍ය නම් වෘක්ෂාදීන්ගේ ඵලය යි. 'අස්වන්' යන්නේ අර්ථය ඵලභාවයට පැමිණි යනු යි. පියොවුරු 'යන්න 'පයොධර' ශබ්දයෙන් ආදේශ වේ. පය (කිරි) දරන්නේ යන අර්ථ යෙන් 'පියොවුරු' යි කියනු ලැබේ.

39 බ න් නේ මරම්ණි දුල පබළු මුතු ප ට
වැන් නේ ගම්බු ගෙලෙ පල මල් කුමුකු ව ට
ග න් නේ නසිත එබැවින් නොවැද කෙළිය ට
ය න් නේ වෙළඳගොඩ දැක මඳකලක් සි ට

**විභක්ති**- බන් 2. නේමරාම්ණිදුල 2. පබළුමුතුපට 2. ගම්බුගෙලෙ 8. පලමල් කුමුකුවට 1. ගන්නේ 1. න 7. සිත 2. එබැවින් 6. කෙළියට 5. වෙළඳ ගොඩ 2. මඳකලක් 2.

**පදාර්ථ**- පලමල්, ඵලයෙන් හා මලින් යුක්ත වූ; කුමුකුවට, පුවක්ගස්වැට; ගම්බු, ග්‍රාම නමැති කාන්තාවගේ; ගෙලෙ, ග්‍රීවයෙහි; බන්, බඳනාලද්දා වූ; නේමරාම්ණි, නොයෙක් මරකතමාණික්‍යයෙන්; දුල, දිලිසෙන්නා වූ; පබළුමුතුපට වැන්නේ, පබළයෙන් කළ මුතු හරක් වැනි වූයේ; න සිත, නාගේ චිත්තය; ගන්නේ, ග්‍රහණය කරන්නේ වේ. එබැවින්, ඒ භාවයෙන්; කෙළියට නොවැද, ක්‍රීඩාවට ප්‍රවිෂ්ට නොව; වෙළඳගොඩ, වෙළඳගොඩ නම් ගම; දැක, දර්ශනය කොට; මඳකලක් සිට, ස්වල්පකාලයක් නැවතී; යන්නේ, ගමන් කරන්න.

**භාවාර්ථ**- ග්‍රාමනමැති ස්ත්‍රියගේ බෙල්ලේ බැඳි නොයෙක් මරාම්ණියෙන් දිලිසෙන පබළුමුතුපටක් වැනි, ඵලත් හා මලින් ගැවසිගත් පුවක්ගස්වැටට නුඹගේ සිතගන්නැකි ය, එබැවින් සැළලිහිණිය සෙල්ලමට නොගොස් මඳකලක් සිට පලයන්.

ක්‍රි: ප– 1 පලමල්කුමුකුවට තසින ගන්නේ වේ. 2 එබැවින් (සැළලිහිණිතෙමේ) සොළියට නොවැද වෙළඳගොඩ දැක මදසාලක් සිට යන්නේ.

උ: ක - වේ යන අධ්‍යාහෘතක්‍රියාපදයට. **පලමල්කුමුකුවට:** උක්තප්‍රකෘතිකර්තෘ සි. **ගන්නේ:** විකෘතිකර්තෘ සි. **ගන්නේ** යන අරුත්කිරියට **පලමල්කුමුකුවට:** උක්තකර්තෘ සි. **සින:** අනුක්ත කර්ම සි. **ත:** තත්සම්බන්ධ සි.

2 **යන්නේ** යනු අන්‍යකාරක විධික්‍රියා සි. **සැළලිහිණි තෙමේ:** අධ්‍යාහෘත උක්තකර්තෘ සි. **නොවැද** යන පෙරකිරියට ද 'සැළලිහිණිතෙමේ' යනු ම උක්තකර්තෘ සි. **සොළියට:** අනුක්ත සම්ප්‍රදාන සි. **එබැවින්:** හෙත්වර්ථයෙහි අවධි සි. **දැක** යන පෙර කිරියට ද 'සැලලිහිණිතෙමේ' යනු ම උක්තකර්තෘ සි. **වෙළඳගොඩ:** අනුක්තකර්ම සි. **සිට** යන පෙරකිරියට ද 'සැළලිහිණිතෙමේ' යනු ම උක්තකර්තෘ සි. **මදසාලක්:** අත්‍යන්තසංයොගයෙහි කර්ම සි.

අර්ථක්‍රියා– **බන්, දුල, ගන්නේ.**

**බන්:** බඳ (බැඳුම්හි) ධාතු සි. කර්මකාරක සි. **පබළුමුතුපට:** උක්තකර්ම සි. **දුල:** කර්තෘකාරක සි. **පබමුතුළුපට:** උක්තකර්තෘ සි. **ගන්නේ:** ගන් (ගැණීමෙහි) ධාතු සි. කර්තෘකාරක සි. **පලමල් කුමුකුවට:** උක්තකර්තෘ සි.

සමාස– 1 නේමරාමිණිදුල. 2 පබළුමුතුපට. 3 ගමඹුගෙලෙ. 4 පලමල්කුමුකුවට.

විග්‍රහ– 1 මරා වූයේ ද එම මිණි වූයේ ද=මරාමිණි. නේ වූයේ ද එම මරාමිණි වූයේද=නේමරාමිණි. නේමරාමිණියෙන් දුල=නේමරාමිණිදුල. 2 මුතුයෙන් කළ පට=මුතුපට, පබළුයෙන් යුත් මුතුපට=පබළුමුතුපට. 3 ගම ම අඹු=ගමඹු. ගමඹුගේ ගෙල=ගමඹුගෙල. එහි– 4 පල ද මල් ද=පලමල්. කුමුකුවල වට=කුමුකුවට. පලමලින් යුත් කුමුකුවට=පලමල්කුමුකුවට.

විශෙෂ විභාග– මෙහි වෙළඳගොඩ නම් ගම ක්ෂත්‍රියක් කොට ද, ගම වට කොට සිටි නිල් රතු ගෙඩිවලින් හා සුදුමලින් යුත් පුවක්ගස්වැට ක්ෂත්‍රියගේ බෙල්ල වටකොට බැඳි මරාමිණියෙන් හා පබළුයෙන් යුත් මුතුවැලක් කොට ද රූපණය කළහ. නිල්ගෙඩි මරාමිණිවලට ද, රතුගෙඩි පබළුවලට ද, සුදුමල් මුතුවැලට ද සමාන ය.

ඇතැම් අය "යන්නේ" යන්න විධික්‍රියාවක් නොවේ යයි ද, විධික්‍රියාව අන්‍යකාරකයෙහි නොයෙදේ යයි ද කියතත් සිදත්සඟරා කර්තෘත්වහන්සේගේ අදහසේ හැටියටත්, පාලිසංස්කෘත ව්‍යාකරණ කර්තෘවරයන්ගේ අදහස්වල හැටියටත් අන්‍යකාරකයෙහි ද විධික්‍රියාව භාෂාවෙහි යෙදේ. එබැවින් 'යන්නේ' යන්න 'යා' ධාතුවෙන් "අන්නේ" ප්‍රත්‍යය යෙදීමෙන් අන්‍යකාරකයෙහි සිඬ විධික්‍රියා රූපයෙකි. "වෙළදගොඩ" යනු දූත් 'බැළගම' යන නමින් ප්‍රසිඬ ගම්පෙදෙස යි.

40 අවට සුපිපි සපු දුනුකේ සල ලාන
හඬන තැනින් තැන විලිකුළු කිර ලාන
පැසි නැමි සරල් රත්හැල් සහ ලාන
වඩින මැනවි මහවෙල මැද වෙර ලාන

විභක්ති- අවට 8. සුපිපිසපුදුනුකේසලලාන 7. හඬන 7. තැනින්තැන 8. විලිකුළුකිරලාන 3. නැමිසරල් රත්හැල් සහලාන 7. වඩින 1. මහවෙල 7. මැද 8. වෙරලාන 7.

පදාර්ථ- අවට, හාත්පස්හි; සුපිපි, මනාකොට පිපුනා වූ; සපු, චම්පකය; දුනුකේ, රාජකේතකිය; සලලාන, හොරය යන මොවුන් ඇත්තා වූ; තැනින්තැන, තන්හි තන්හි; විලිකුළුකිරලාන, විලිකුළන් හා කිරලුන්; හඬන, නාදකරන්නා වූ; පැසී, පරිණත වැ; නැමි සරල්, නැමුනු සරල් ඇත්තා වූ; රත්හැල්, රත්හැල්වලින්; සහලාන, යුක්ත වූ; වෙරලාන, වෙරලාන නම් වූ; මහවෙල මැද, මහාක්ෂෙත්‍රයාගේ මධ්‍යයෙහි; වඩින මැනවි, ගමන්කිරීම යහපති.

භාවය- මල්පිපුනු සපුහස් ආදිය හා තැන්තැන්වල හඬන විලිකුළු කිරලුන් වට කොට ඇති පැසුනු රත්හැල් කරලින් යුත් වෙරලාන නම් මහවෙල මැද පලයන්.

ක්‍රි: ය- තා මහවෙල මැද වඩින මැනවි වේ.

උ: ක- වේ: ක්‍රියා යි. වඩින: උක්තප්‍රකෘතිකර්තෘ යි. මැනවි: විකෘතිකර්තෘ යි. මැද: අනුක්තාධාර යි. මහවෙල: තත්සම්බන්ධ යි. වඩින: භාවක්‍රියා යි. තා: අනුක්තකර්තෘ යි.

අඞ්ගක්‍රියා- සුපිපි, හඬන, නැමි.

සුපිපි: සුපුපි පුප (පිපීමෙහි): ධාතු යි. කර්තෘකාරක යි. සපු දුනුකේසලලාන: උක්තකර්තෘ යි. හඬන: ආධාරකාරක යි. මහවෙල: උක්තාධාර යි. නැමි: නම (නැමීමෙහි): ධාතු යි. කර්තෘකාරක යි. සරල්: උක්තකර්තෘ යි.

<u>සමාස</u>– 1 සුපිපිසපුදුනුකෝ සලලාන. 2 විලිකුළුකිරලාන. 3 නැමි කරල් රත්හැල්සහලාන. 4 මහවෙල.

<u>විග්‍රහ</u>– සපු ද දුනුකෝ ද සලල ද=සපුදුනුකෝසලල. සපුදුනුකෝ සලල ම=සපුදුනුකෝ සලලාන. සුපිපියා වූ සපු දුනුකෝ සලලාන යම් තැනෙක්හි ද ඒ=සුපිපි සපු දුනුකෝ සලලාන, 2 විලිකුළු ද කිරලු ද= විලිකුළුකිරලු, ඔවුන්–විලිකුළු කිරලාන. 3 නැමි කරල් යම්කා ද ඒ=නැම්කරල්. රත් ද එම හැල් ද=රත්හැල්. නැම්කරල් වූයේ ද එම රත්හැල් වූයේ ද=නැම්කරල්රත්හැල්. නැම්කරල් රත්හැලින් සහලාන=නැම්කරල්රත්හැල්සහලාන. 4 මහ වූයේ ද එම් වෙල වූයේ ද=මහවෙල.

<u>විශෙෂ විභාග</u>– මෙහි "සහලාන" ශබ්දය යුක්තාර්ථ යි. "ශාලිත" හෝ "ශාලින්" ශබ්දය පදන්ත ව යෙදුනු විට සුක්තාර්ථය ගෙණ දේ. "සහලාන" යන්න ද එයින් ආ ශබ්දයෙකැ යි සිතිය හැකි වේ.

"තැනිත්තැන" යන තන්හි අලුප්ත අවධිවිභක්ති සමාස යි. එක් තැනක් එක් තැනකට ඉම් වන බැවින් පූර්වපදය අවදි විය. මේ පූර්වපදයේ විභක්තිය ලොප් නොව සිටි තැනෙකි. මෙහි වීප්සායෙහි විෂය බැවින් එහි කිරලුන් සිටි සියලු තැන් ම ගැණෙති.

41 පත් ගනපුල්මල් දෙඹතුරෙකා පියකා : රු
සිත් පිණවා ඉඳ සැළලිහිණින් අතු රු
ගත් සරතාස හැර විඳ සුවඳ මඳම රු
කිත් සිරිමේ වෙහෙරට වදුව පස්ව රු

<u>විභක්ති</u>– පත්ගන 8. පුල්මල් 8. දෙඹතුරෙක 8. පියකරු 8. සිත් 2. සැළලිහිණින් 7. අතුරු 8. ගත්සරතාස 2. සුවඳ 2. මඳමරු 2. කිත්සිරිමේ වෙහෙරට 2. පස්වරු 8.

<u>පදාර්ථ</u>– පත්ගන, පත්‍රයෙන් ගහන වූ; පුල්මල්, පිපුනු මල් ඇති; පියකරු, ප්‍රියඞ්කර වූ; දෙඹතුරෙක, පුන්නාගවෘක්ෂයෙක්හි; සැළලිහිණින් අතුරු, ශාරිකාපක්ෂීන් මධ්‍යයෙහි; ඉඳ, නිෂදනය කොට; සිත්, චිත්තය; පිණවා, ප්‍රීණනයට පමුණුවා; සුවඳ, සුවඳ වූ; මඳමරු, මන්දමාරුතය; විඳ; විඳිනය කොට; ගත්, ශරීරයෙහි; සර තාස, විඩාව; හැර, දුරුකොට; පස්වරු, අපරාහ්ණ කාලයෙහි; කිත් සිරිමේ වෙහෙරට, කීර්ත්තිශ්‍රීමෙඝවිහාරයට; වදු, ප්‍රවිෂ්ට වෙව.

<u>ක්‍රි: ය</u>– **තෝ පියකරු පත්ගන පුල්මල් දෙඹතුරෙකා සැළලිහිණින් අතුරු සිත් පිණවා ඉඳ, ගත්සරතාස හැර, සුවඳ මඳමරු විඳ, පස්වරු කිත්සිරිමේවෙහෙරට වදුව.** (මේ කාවෙහි භාවය ද මෙමැ යි.)

උ: න- වදුව; විධික්‍රියා සි. නෝ: උක්තාඛ්‍යාතිය සි. කිත්සිරිමේ වෙහෙරට: අනුක්තකාමී සි. පස්වරු: කාලාධාරයෙහි අනුක්තාධාර සි. ඉඳ යන පෙරකිරියට අතුරු යනු ද දෙඹතුරෙක යනු ද අනුක්තාධාර සි. පියසාරු-පත්ගන පුල්මල් යනු 'දෙඹතුරෙක' යන්නෙහි විශෙෂණ සි. සැළලිහිණින් යනු 'අතුරු' යන්නෙහි සම්බන්ධ සි. හැර යන පෙරකිරියට ගත්සරතස: අනුක්තකාමී සි. විඳ යන පෙරකිරියට මඳමරු: අනුක්තකාමී සි. සුවඳ: තද් විශෙෂණ සි. මේ සියලුක්‍රියාවන්ගේ ම කර්තෘ නෝ යනු සි.

සමාස- 1 පත්ගත. 2 පුල්මල්. 3 දෙඹතුරෙක. 4 පියසාරු. 5 ගත්සරතස. 6 සුවඳ. 7 මඳමරු. 8 කිත්සිරිමේවෙහෙරට. 9 පස්වරු.

විග්‍රහ- 1 පතින් ගන=පත්ගත. 2 පුල් වූ මල් යමක ද ඒ=පුල් මල්. 3 දෙඹ ම තුරෙක්=දෙඹතුරෙක්-එහි. 4 පිය සොරේනුයි= පියසාරු (කම්විබත්සමස්) 5 ගතේ සරතස=ගත්සරතස. 6 මනා ගඳ=සුවඳ. 7 මඳ වූයේ ද එම මරු වූයේ ද=මඳමරු. 8 කිත්සිරිමේ විසින් කළ වෙහෙර=කිත්සිරිමේවෙහෙර-ඊට. 9 පසු ලැබෙන වරුව=පසුවරු-පස්වරු. (අදරවිබත්සමස්.)

විශෙෂ විභාග- "කිත්සිරිමේවෙහෙර" නම් කිත්සිරිමෙවන් රජ විසින් කරවනලද "කිත්සිරිමෙවන්කැලණිය" යන නමින් ප්‍රසිඬ විහාරස්ථාන ය සි.

42 සො ද මුනිරද පිඩුකළ යස මෙරද ස ම
පු ද කළ ඔහු නෙත් නිල් කැලුමෙව් බැර ම
ස ද යුරු සඳ වෙලෙන් රැඳි රුසිරු මනර ම
ව ද නෙහි තෝ දගැප් මහබෝ පිළි ම

විභක්ති- සොද 7. මුනිරද 7. පිඩුකළ 3. යසමෙරද 3. සම 2. ඔහු 3. පුදකළ 7. නෙත් 7. නිල්කැලුම් 2. බැරම 2. සඳ 7. අයුරු 4. සඳවෙලෙන් 4. රැඳි 7. රුසිරු 2. මනරම 2. තෝ 1. දගැප් 2. මහබෝ 2. පිළිම 2.

සඳැස්- සොඳ, සුන්දර වූ; මුනිරද, මුනීන්ද්‍රයන්වහන්සේගේ; පිඩුකළ, පිඩුකරණ ලද්ද වූ; යස මෙරද, යශස් නමැති රශ්මිය හා; සම, සමාන වූ; දගැප්, ධාතුගර්භය ද; ඔහු, උන්වහන්සේ විසන්; පුද කළ, පූජාකරණ ලද්ද වූ; නෙත්, නෙත්‍රයන්ගේ; බැරම, බොහෝ වූ; නිල්කැලුමෙව්, නීලකාන්තිය වැනි වූ; මහබෝ, මහබොධියද; සඳ

වෙලෙන්, සන්ධ්‍යාවලාහකයෙන්; රඳි, රජිත වූ; සඳපුරු, චන්ද්‍රාකාර යෙන්; රුසිරු, රුචිර වූ; මනරම, මනෝරම්‍ය වූ; පිළිම, ප්‍රතිමාවහන් සේ ද; තෝ, යුෂ්මත් තෙමේ; වඳනෙහි, වන්දනය කරන්නෙහි.

භාවය- නුඹ මුනීන්ද්‍රයන්වහන්සේ සම්බන්ධයෙන් කැටි වූ යශෝරශ්මිය වැනි දගැබ්වහන්සේ ද, බුදු වූ දෙවන සතියෙහි අනිමිෂ ලෝචනයෙන් ඇති වූ නීලකාන්තිය වැනි බෝධීන්වහන්සේ ද, සන්ධ්‍යාවලාහකකාන්තියෙන් රඳි චන්ද්‍රයා බඳු මනරම් රුසිරු යුත් පිළිමවහන්සේ ද වැඳගන්.

**ක්‍රි: ය- තෝ දගැප් මහබෝ පිළිම වඳනෙහි.**

උ: ක- වඳනෙහි යනු ආඛ්‍යාත ත ශබ්දකාරක වශයෙන් යෙදුනු කර්තෘකාරක කෘදන්ත සි. **තෝ** උක්තකර්තෘ සි. **දගැබ්-මහ බෝ-පිළිම** යනු වෙන් වෙන් වශයෙන් අනුක්තකර්ම යි.

අඞ්ගක්‍රියා- **පිඩුකළ, පුදකළ, රඳි.**

**පිඩුකළ:** 'පිඬු' පූර්ව 'කර' ධාතු සි. කර්මකාරක සි. **යස මෙරද:** උක්තකර්ම සි. **පුදකළ:** 'පුද' යනු පූර්ව-කර ධාතු සි. **තෙනේ:** උක්තකර්ම සි. **රඳි:** රඳ (රැඳුම්හි) ධාතු සි. කර්මකාරක සි. **සඳ:** උක්තකර්ම සි.

සමාස 1 මුනිරද. 2 යසමෙරද. 3 නිල්කැලුම්. 4 සඳවෙලෙන්. 5 මනරම. 6 දගැබ්. 7 මහබෝ.

විග්‍රහ- 1 මුනින්ගේ රද=මුනිරද. 2 යස ම මෙරද=යසමෙරද. 3 නිල් වූයේ ද එම කැලුම් වූයේ ද=නිල්කැලුම්. 4 සඳෙහි වූ වලා=සඳ වලා, එයින්-සඳවෙලෙන්. 5 මනට රම්=මනරම්-මනරම. 6 ගැබෙහි ද යමක ද ඒ=දගැබ්-දගැප්. 7 මහ වූයේ ද එම පිළිම වූයේ ද=මහපිළිම.

විශෙෂ විභාග- "පිඩුකළ" යන්නෙහි අර්ථය පිඩක් මෙන් කරණලද යනු යි. යශෝරශ්මිය පිඩක් මෙන් කරණු විනා පිඩක් කිරීම නොහැකි ය. මෙහි දගැබ බුදුරජානන්වහන්සේගේ ශුභ්‍රයශෝරශ්මිපිණ්ඩයකට සම කෙළේ ය. එයින් දගැබේ ශුභ්‍රවර්ණය පළ වේ.

අනිමිෂලෝචනයෙන් (ඇසිපිය නොහෙළා බලාසිටීමෙන්) බෝධිපූජාව කරද්දී ඇති වූ නෙත්‍රකාන්තිය නීලවර්ණ බැවින් මෙහි වූ බෝධිය ද ඒ නීලකාන්ති යට සම කෙළේ ය.

**43 ස ල් සපු කිනා දෙඹ රුරඟ නා මිදෙ ලි**
**පු ල් එරහැඳි හෝ පලු මි අඹ පලෝ ලි**
**පොල් පුවඟුගු රඹ මල බුලති සලි ම ලි**
**නි ල් ගනා සා සෙවනලු දෙනෙර මනඞා ලි**

<u>විගහකිරි</u>-සල්--මිදෙලි 7. පුල් 7. එරහැඳි—පළොලි 7. පොල්පුවකුගුරඹ 7. මලබුලත් 7. සලිමලි 7. --තිල් 7. ගන 7. සා 7. සෙවනලු 8. දෙතෙර 8. මනකලි 8.

<u>පදාර්ථ</u>-සල්, ශාලය; සපු, චම්පකය; කිහ, නමෙරුය; දෙඹ, පුන්නාගය; රුරන, ඹෂධිය; නා; නාය; මිදෙලි, තිවුලය; (යනමේ වෘක්ෂයන්ගේ ද); පුල්, ඵුල්ලවූ; එරහැඳි, ඇසළය; හෝ, අශෝකය; පලු, මොරය; මිඅඹ, සහකාරය; පළොලි, පළොල්ය, (යන මේ වෘක්ෂයන්ගේද); පොල්, නාරිකෙලය; පුවක්, පූගය; උගු, උක්ය; රඹ, කෙසෙල්ය (යන මේ වෘක්ෂයන්ගේ ද); මලබුලති, මලබුලතින් යුක්ත වූ; සලිමලි, ඉඹුල් වෘක්ෂයන්ගේද; තිල්, තිලවණ්වූ; ගන, සාන්‍ද්‍රවූ; සා, ශාඛාවන්ගේ; සෙවනලු, සෙවනැලි ඇත්තා වූ; මනකලී, මනොඥවූ; දෙතෙර, උභය තීරයෙහි (මතුසම්බන්ධයි).

44 ග ව සා සුපුල් කඩුපුල් මල් නිල් වර ල
ස ල සා උකුල වට රසුදුල මිණි මෙවු ල
ස ක සා දෙනන හර සඳුනෙන් සර සිසි ල
දෙ ප සා ඉසින නිල්පැහැනෙත දිගු පුළු ල

<u>විගහකිරි</u> සුපුල් 2. කඩුපුල්මල් 2. තිල්වරල 8. උකුලවට 8. රසුදුල 2. මිණිමෙවුල 2. දෙතන 2. හරසඳුනෙන් 4. සිසිල 2. දෙපසා 8. ඉසින 3. තිල්පැහැ 2. නෙත 8. දිගු පුළුල 8.

<u>පදාර්ථ</u>- තිල්වරල, නිලවණ්වූ කෙශකලාපයෙහි; සුපුල්, සුප්‍රඵුල්ල වූ; කඩුපුල්මල්, කාණ්ඩොත්පල කුසුමයන්; ගවසා, පුරා පැලඳගෙන; රස් උදුල, රශ්මියෙන් දිලිසෙන්නාවූ; මිණිමෙවුල, මාණික්‍ය මෙඛලාදාමය; උකුලවට; ජඝන වෘත්තයෙහි; සලසා, යොදා; දෙතන, පයොධර යුග්මය; හර සඳුනෙන්, මුක්තාහාරයෙන් හා චන්‍දනයෙන්; සකසා, යහපත්ලෙස; සිසිල සර, සිසිල් කොට; දිගු, දිඝී වූ; පුළුල, පළල් වූ; නෙත, නෙත්‍රයෙහි; තිල්පැහැ, නීල ප්‍රභාව; දෙපසා, උභය පාර්ශ්වයෙහි; ඉසින, ඉසින්නාවූ; (මතු සම්බන්ධයි.)

45 ම න හර නා මෙමෙණෙවියනිඳ ලවැලි පි ට
ගෙ න මිණිමෙවෙණ තන් නියසින් මැද රුව ට
ක න හෙව කියන බුදුගුණ ගි මියුරු කො ට
සැ න හෙව කැලණි ගඟබඩ මඳ කලක් සි ට

<u>විගහකිරි</u>-මනහර 3. නාමෙමෙණෙවියන් 3. ලවැලිපිට 8. මිණිවෙණ 2. තන් 2. නියසින් 4. රුවට 2. කණ 8. කියන 2. බුදුගුණගී 2. මියුරු 2. කැලණිගඟබඩ 8. මඳකලක් 2.

**පදාර්ථ**– මනහර, මනොහරවූ; නාමෙණෙවියන්, නාගමාණවිකාවන්; ලවැලිපිට, තරුණ (අලුත්) වැලිමතුයෙහි; ඉඳ, හිඳීම් කොට; මිණිවෙණ, මිණියොදා සාළ වීණාවන්; ගෙණ, ග්‍රහණයකොට; තත්, තන්ත්‍රීන්; නියගින්, නඛාග්‍රයෙන්; රුවට, මනාසේ; මැද, පිරිමැද; මියුරුකොට, මධුර කොට; කියන, කියනු ලබන්නා වූ; බුදුගුණගී, බුඩගුණ ගීතිකාවන්; සාණ, සාණියෙහි; හෙව, බහා; සැලණිගහබඩ, සාලයාණිනදීසමීපයෙහි; මඳකලක් සිට, ස්වල්පකාලයක් නැවතී; සැනහෙව, සන්තර්පිත වෙව.

**කාව්‍යාර්ථ භාවය**–සැළලිහිණිය, කැලණිගඟේ දෙකොඩ සල් සපු ආදි වෘක්ෂයන්ගේ සෙවනෙන් මනහර ය. එහි නාගමාණවිකාවන් තිල් වරල්හි කඩු පුල්මල් පැලඳ, උකුල්වට මිණිමෙවුල් බැඳ, දෙතන මුතුහරින් හා සඳුනෙන් සිහිල්කරගෙන, නිලකාන්තියෙන් යුත් ඇස්වලින් දෙපස බලමින් අලුත් වැලිමතුයෙහි හිඳගෙණ මිණිවෙණ වයමින් කියන බුදුගුණ ගී අසා මඳකලක් ගඟ ලඟ සිට සැනසියන්.

**ක්‍රි: ය**–**නෝ බුදුගුණ ගී සාණ හෙව සැලණිගහබඩ මඳ කලක් සිට සැනහෙව.**

**උ: න**– **සැනහෙව:** විධික්‍රියා යි. **නෝ:** උක්තකර්තෘ යි. **සිට:** යන පෙරකිරියට ද **නෝ:** යනු ම උක්තකර්තෘ යි. **සැලණිගහබඩ:** අනුක්තාධාර යි. **මඳකලක්:** අත්‍යන්තසංයොගකර්ම යි. **හෙව:** යන පෙරකිරියට ද **නෝ** යනු ම උක්තකර්තෘ යි. **බුදුගුණගී:** අනුක්තකර්ම යි. **සාණ:** අනුක්තාධාර යි.

**අර්ථක්‍රියා**– **සුපුල්, උදුල, ඉසින, කියන.**

**සුපුල්:** කර්තෘකාරක යි. **කඩුපුල්මල්:** උක්තකර්තෘ යි. **උදුල:** කර්තෘකාරක යි. **මිණිමෙවුල:** උක්ත කර්තෘ යි. **ඉසින:** ඉස (ඉසීමෙහි) ධාතු යි, කර්තෘකාරක යි. **නාමෙණෙවි:** උක්තකර්තෘ යි. **කියන:** කිය (කීමෙහි) ධාතු යි. කර්මකාරක යි. **බුදුගුණගී;** උක්තකර්ම යි.

**සමාස**– 1 දෙතෙර. 2 මනකල්. 3 කඩුපුල්මල්. 4 තිල්වරල. 5 උකුලවට. 6 රසුදුල. 7 මිණිමෙවුල. 8 දෙතන. 9 හරසඳුනෙන්. 10 දෙපස. 11 තිල්පැහැ. 12 දිගුපුළුල. 13 නාමෙණෙවියන්. 14 ලවැලි. 15 මිණිවෙණ 16 නියගින්. 17 බුදුගුණගී. 18 සැලණිගහබඩ. 19 මඳ කලක්.

**විග්‍රහ**- 1 තෙර දෙකක් එක්කොට සලකන ලද්දේ=දෙතෙර. 2 මනට කල්=මනකල් (සබඳ–වි: සමස්.) 3 කඩුපුල් වූයේ ද එම මල් වූයේ ද=කඩුපුල්මල්. 4 උකුලේ වට=උකුලවට. 5 රසින් උදුල=

රජුදුල. 7 මිණියෙන් යුත් මෙවුල=මිණිමෙවුල. 9 හර ද සඳුන් ද=හරසඳුන්-ඉන්- 12 දිගු වූයේ ද එම පුළුල් වූයේ ද=දිගුපුළුල්. (විශෙෂණ උභයපද වෙසෙසුත් සමස්.) 13 නා වූවා ද ඔම මෙණෙවි වූවා ද=නාමෙණෙවි-ඔවුන්. 14 ලා වූයේ ද එම වැලි වූයේ ද=ලවැලි. 15 මිණියෙන් යුත් වෙණ=මිණිවෙණ. 16 තියේ අග=තියග-එයින්- 17 බුදුන්ගේ ගුණ=බුදුගුණ. බුදුගුණෙන් යුත් ගී=බුදුගුණගී. 18 කැලණි වූවා ද ඔම ගඟ වූවා ද=කැලණිගඟ. කැලණිගඟේ බඩ=කැළණිගඟබඩ. 19 මද වූයේ ද එම කාලක් වූයේ ද=මදකාලක්. ('සල් සපු' යනාදිය ද්වන්ද්වසමාසවශයෙන් ගතයුතු යි.)

__විශෙෂ විභාග__- 42 වෙනි කවෙහි- "රැරඟ" යනු රාත්‍රිකාලයෙහි සඳ පහන මෙන් දිලිසෙන ලතා විශෙෂයෙකි. "මිදෙල්, පළොල්, මනකල්" යන තුණ "සලිමලි" යන්නේ අග හා සමකිරීම පිණිස ඉකාරාන්ත කොට "මිදෙලි පළොලි මනකලි" යි යොදනලදි. "මලබුලති" යන තන්හි ඇති යන අර්ථයෙහි 'ඉ' ප්‍රත්‍යයයි. 'මලබුලත් ඇතියේ=මලබුලති' යනු විග්‍රහ යි.

43 වැන්නෙහි- "ගවසා, සලසා, සකසා" යන තුණ පූර්ව ක්‍රියා යි. 'ගවස, සලස, සකස, යනු ධාතු යි. එහිදු 'සකසා' යන්න ක්‍රියාවිශෙෂණාර්ථ යි. "කඹුපුල් මල්" නාගලොකයෙහි වූ පුෂ්පවිශෙෂයෙකි. 'හර' යන්නෙන් ගැණෙන මුතු හා සඳුන් ශරීරයට සීතගුණය ගෙණදෙන වස්තු යි. එබැවින් "හරසඳුනෙන් සාර සිසිල" යි කියනලදි. නිලකාන්තියෙන් යුත් ඇස්වලින් දෙපස බලනවිට ඇස්වල චඤ්චලභාවය නිසා නිල්පැහැය ඉසින්නාක් වැනි ය. එබැවින් "දෙපසා ඉසිනා නිල්පැහැ නෙත දිගුපුළුල" යි කියනලදි.

45 වැන්නෙහි= "නාමෙණෙවියන්" යන්නෙන් ගැණෙන්නේ මනුෂ්‍යශරීරය මවාගත් දිව්‍ය නාගතරුණියෝ ය. මෙහි වූ 'මෙණෙවි' ශබ්දය 'මාණවිකා' ශබ්දයෙන් සිංහල වූවකි. එය මූර්ධන්‍යණකාරවත් වනුයේ අල්පාර්ථ (තරුණ වයස්ක මනුෂ්‍යාර්ථ) තන්හි ය. දන්ත්‍යනකාරයෙන් යුක්ත තන්හි "මනුෂ්‍ය" යන අර්ථ යි. "ලවැලි" නම් ගංවතුරෙන් ගොඩගැසු අලුත් වැලි යි. අලුත් දේ ලාශබ්දයෙන් යුක්ත යි. "කණ නෙව" යන තන්හි 'හෙව' යනු ප්‍රයොජ්‍යාර්ථ පූර්වක්‍රියා යි. එහි ධාතුව හෙ (වැටීමෙහි) යනු යි. ප්‍රයොජ්‍ය රහිත පූර්වක්‍රියාව 'හි' යි යෙදේ. 'හි-වැටී; හෙව-වට්ටවා, යනු අර්ථ යි. මෙහි අර්ථය බුදුගුණගී කණෙහි වට්ටවා යනු යි. වැටීම් අර්ථයෙහි 'හෙ' ධාතුව 'හෙයි, හෙත්, හිති' යනාදි වශයෙන් වරනැගේ. මේ කවෙහි 'මන, සැන' දෙතන්හි නකාරය හා සමකිරීම පිණිස 'ගෙණ කණ' දෙතන්හි මූර්ධන්‍යණකාරය පෙරළා කොට 'ගෙන කන' යි යොදනලදි. පද්‍යාදියෙහි එසේ අකුරු සම කිරීම වර්ණාලඞ්කාරවිශෙෂයෙකි. සමහර වර්ණයන් එලෙස සම කොට යෙදීම ගැණ අලඞ්කාරශාස්ත්‍රයෙහි අවසර ඇත්තේය.

46 ස පු ම ල් යොහොඹු ලා බැඳ වරල මනර ඟ
පැහැ දු ල් දෙඹ කැකුළු හර සර ලා තන ඟ
රොණ වු ල් නා කුසුම් කණ ලා කොඬොල් ර ඟ
ද ව හ ල් උයන්කෙළි කෙළ සලෙළුන් සම ඟ

විභක්ති– සපුමල් 2. සොහොඹු 2. වරල 2. මනරඟ 2. පැහැදුල් 2. දෙඹ කැකුළු 2. හර 2. තනග 8. රොණවුල් 2. නා කුසුම් 2. කණ 8. කොඩොල්රඟ 4. දවහල් 8. උයන්කෙළි 2. සලෙලුන් 3.

පදාර්ථ– සපුමල්, චම්පකපුෂ්පයන් ද; සොහොඹු, මාධවීපුෂ්පයන් ද; ලා, බහා; වරල, කේශකලාපය; මනරඟ, මනහර ලෙස; බැඳ, බන්ධනය කොට; පැහැදුල්, ප්‍රභායෙන් දිලිසෙන්නා වූ; දෙඹකැකුළු, පුන්නාගමුකුලයන්; හර කර, මුක්තාහාර කොට; තන අග, පයොධරාග්‍රයෙහි; ලා, පැලඳගෙන; රොණවුල්, රේණුයෙන් ගැවසීගත්තා වූ; නාකුසුම්, නාමල්; කොඩොල්රඟ, කුණ්ඩලාභරණ විලාසයෙන්; කණ, කර්ණයෙහි; ලා, බහා; සලෙලුන් සමග, තරුණයන් සමග; දවහල්, දිවාකාලයෙහි; උයන්කෙළි කෙළ, උද්‍යානක්‍රීඩාකොට. (මතු සම්බන්ධයි.)

47 නුවනින් නිල්උපුල් මදහසිනි හෙළැඹු ල
වුවනින් කමල් පෑ ලවලතිනි රතුපු ල
පවනින් අඹල රණ ලියවන් ලියන් කැ ල
රුවනින් ලකළ ගඟදිය කෙළෑ නිමුනු ක ල

විභක්ති– නුවනින් 4. නිල්උපුල් 2. මදහසිනි 4. හෙළැඹුල 2. වුවනින් 4. කමල් 2. ලවනතිනි 4. රතුපුල 2. පවනින් 4. අඹල 2. රණලිය 2. ලියන් 7. කැල 3. රුවනින් 4. ලකළ 8. ගඟ දිය 8. නිමුනු 8. කල 8.

පදාර්ථ– නුවනින්, නෙත්‍රයෙන්; නිල්උපුල්, නීලොත්පලයන් ද; මදහසිනි, මදසිනායෙන්; හෙළැඹුල, සුදුමහනෙල් ද; වුවනින්, වක්ත්‍රයෙන්; කමල්, පද්මයන් ද; ලවනතිනි, අධරයෙන්; රතුපුල්, රතුමහනෙල් ද; පෑ, ප්‍රකාශ කොට (දක්වා): පවනින්, මාරුතයෙන්; අඹල, ආවෘතන වූ (ඇඹරීගියා වූ); රණලිය වන්, සවර්ණලතාවන් සමාන වූ; ලියන්කැල, කාන්තාසමූහය; රුවනින්, රත්නයෙන්; ලකළ, අලඞ්කෘත වූ; ගඟදිය, ගඞ්ගාජලයෙහි; කෙළ, ක්‍රීඩා කොට; නිමුනුකල, නිමාවට පැමිණි කාලයෙහි. (මතුසම්බන්ධ යි)

48 වැදමෙන් සවස නල හැඹිරෙණ දිගතුව ල
සොබමන් සුනිල් මිණිනිල් කුබතුර විපු ල
පතසන් අවරගිරි නැඹියෙන් වැටෙන ක ල
විළිකුන් සුරත් පල වැනි වේ රිවිමඬ ල

විභක්ති– සවසතල 3. හැසිරෙණ 8. දිගතුවල 8. සොබමින් සුනිල්මිණිනිල් 8. කුබතුර 8. විපුල 8. පත් 2. අසන් 2. අවරගිරිනැඹියෙන් 6. වැටෙනර්. කල 8. විළිකුන් 4. සුරත් 2. පල 2. රිවිමඬල 1.

**පදුණු**- දිගහුවල, දිශා නමැති ශාඛාවන්හි; හැසිරෙණ, හැසි රෙන්නාවූ; සවසනල, සායාහ්නමාරුතය; වැද මෙන්, වැදීලා මෙන් (වැදීමෙන්මෙන්); සොබමන්, ශොභමාන වූ; සුනිල්මිණි, යහපත් ඉන්‍ද්‍රනීල මාණික්‍යයක්මෙන්; නිල්, නිල්වන් වූ; විපුල, මහත් වූ; නුබ තුර, ආකාශ නමැතිවෘක්ෂයෙහි; අවරගිරි නැටියෙන්, අපරපර්‍වත නමැති වෘන්තයෙන්; වැටෙන කල, වැටෙන්නා වූ කාලයෙහි; රිවි මඩල, සූර්‍ය්‍යමණ්ඩලය; අසන්පත්, ආසන්නප්‍රාප්ත වූ; විළිකුන්, පැසු නා වූ; සුරත්, ඉතාරක්තවර්ණ වූ; පල වැනි වේ, ඵලයක් සමාන වේ.

**භාවිතාර්ථ භාවය**- සපුමලින් හා යොහොඹු මලින් කෙස්වැටියත් දෙඹ කැකුළු මුතුහරින් පයෝධරාග්‍රයත්, නාමලින් කණ්ඨයත් සරසා ගෙන දවල් කාලයෙහි උද්‍යානක්‍රීඩායෙහි යෙදී, ඉක්බිති සවස ක්‍රීඩායෙන් යුක්තව ස්නානය කොට අවසන් වූ කල්හි ඉර බස්නේ ය.

**ක්‍රි: ය- රිවිමඩල සුරත් පල වැනි වේ.**

**උ: න**- **වේ**: ක්‍රියා යි. **රිවිමඩල**: උක්තකර්තෘ යි. **සුරත්පල**: තදුපමාන යි. **වැනි**: උපමාද්‍යෝතකනිපාත යි.

**අප්‍රධානක්‍රියා- අඩල, නිමුතු, හසිරෙණ, සොබමන්, පත්, වැටෙන.**

**අඩල**: අඹර (ඇඹරීමෙහි): ධාතු යි. කර්මකාරක යි. **රණලිය**: උක්තකර්ම යි. **නිමුතු**: නිම (නිමවීමෙහි): ධාතු යි. ආධාරකාරක යි. **කල**: උක්තාධාර යි. **හැසිරෙණ**: හසර (හැසිරීමෙහි): ධාතු යි. ආධාරකාරක යි. **නුබතුර**: උක්තාධාර යි. **සොබමන්**: 'ශොභ මාන' ශබ්දයෙන් ආයේ වේ. කර්තෘකාරක යි. **සුනිල්මිණි**: උක්ත කර්තෘ යි. **පත්**: "පත්ත" ශබ්දයෙන් ආයේ වේ. කර්තෘකාරක යි. **පල**: උක්තකර්තෘ යි. **වැටෙන**: වට (වැටීමෙහි): ධාතු යි. ආධාර කාරක යි. **කල**: උක්තාධාර යි.

**සමාස**- 1 සපුමල්. 2 පැහැදුල්. 3 දෙඹකැකුළු. 4 නනග. 5 රොණවුල්. 6 නා කුසුම්. 7 කොබොල්රඟ. 8 උයන්කෙළි. 9 නිල් උපුල්. 10 මදහසිනි. 11 හෙළඹුල. 12 රතුපුල. 13 රණලිය. 14 ගහදිය. 15 සවසනල. 16 දිගහුවල. 17 සුනිල්මිණිනිල්. 18 නුබ තුර. 19 අවරගිරිනැටියෙන්. 20 රිවිමඩල.

**විග්‍රහ**- 2 පැහැයෙන් දුල්=පැහැදුල්. 3 දෙඹ ම කැකුළු=දෙඹ කැකුළු. 5 රොණින් අවුල්=රොණවුල්. 7 කොබොලේ රඟ= කොබොල් රඟ. 8 උයනේ (කෙළිත) කෙළි=උයන්කෙළි. (අදර වි: සමස්) 10 මද වූයේ ද එම හස වූයේ ද=මදහස. ඉන් 13 රත් වැනි

ලිය=රණලිය. නොහොත්-රණින්කළ ලිය=රණලිය. 14 ගඟේ දිය=ගඟදිය. 15 සවස්හි තල=සවසතල. 15 දික් ම අතු=දිගතු. එහි. 17 තිල් වූයේ ද එම මිණි වූයේ ද=තිල්මිණි. මනා තිල්මිණි=සුතිල් මිණි. සුතිල්මිණි එව් තිල් යමකද ඒ=සුතිල්මිණිතිල්. 18 තුබ ම තුර=තුබතුර. 19 අවරගිරි ම නැවි=අවරගිරිනැවි-එසින්. 20 රිවිගේ මඩල=රිවිමඩල.

<u>විශෙෂ විභාග</u>- "පවහිත් අඹල රණලියවන් ලියත්කැල" යන්නෙන් ඇඟෙනුයේ කැළණිගඟබඩ සත්‍රීන් සවර්ණලතාවන් වැනි බව හා ඔවුන් ජලක්‍රීඩා සෙහි යෙදී සිටිනම්ට ශරීර ආවර්තනය වන සුලු බැවින් නිශ්චල සවර්ණලතාවන් නොව සුලඟින් ඇඹරිගිය සවර්ණලතාවන් වැනි බව යි. "රුවනිත් ලකල ගඟදිය" යන්නෙන් ඇඟෙනුයේ කැළණිගඟේ දිය සට රත්නයන් ඇති බව යි. "නුවනිත් තිල්උපුල්" යනාදියෙන් ඇඟෙනුයේ සත්‍රීන් ජලක්‍රීඩා කරණවිට ඔවුන්ගේ ඇස් තිල්උපුල් මෙන් ද, මද සිනාව නෙළුඹුල මෙන් ද, මුහුණු පියුම් මෙන් ද තොල් රතුපුල් මෙන් ද පෙනෙන බව යි. මෙහි මුළු අහස්තලය රුකක් කොට ද අපරපර්වතය නටුවක් කොට ද සාමාන්‍ය සූර්යමණ්ඩලය ගෙඩියක් කොට ද සන්ධ්‍යාසූර්යමණ්ඩලය ඉදුනු ගෙඩියක් කොට ද ඉරබැසීම ගෙඩිය නටු සෙන් ඉගිලීවැටීමක් කොට ද නිරූපිතය. "දවහල්" යන්න "දිවාකාල" යන් නෙන් ආයේ වේ. දිවාකාල=දිවකල්=දවකල්=දවහල් යනු විසිනි. මෙහි කකාර යට හකාරයයි.

49 ම හ තු න් හසළ තමහට යස පිහිට ලෙ ස
නි ය ති න් නොහළ යුතුබව පැමිණෙන වෙහෙ ස
සු ද න න් පැවැති සිරිතැයි දන්වන විල ස
නු බ මි න් සමග ගෙවෙනුය දවහල් දව ස

<u>විභක්ති</u>- මහතුන් 7. හසළ 7. තමහට 7. යස පිහිටලෙස 4. නියතින් 4. නොහළයුතු බව 1. වෙහෙස 2. සුදනන් 7. පැවති 1. සිරිත 1. දන්වන 7. විලස 4. නුබමින් 3. ගෙවෙනු 1. දවහල්දවස 1.

<u>පදාර්ථ</u>- තමහට, තමාහට; යසපිහිට ලෙස, යහපත් ප්‍රතිෂ්ඨාවක් ලෙසින්; හසළ, (තමන්විසින්) ඇසුරුකළා වූ; මහතුන්, මහාත්මයන්ට; වෙහෙස පැමිණෙන, වෙහෙසක් පැමිණෙන කල්හි; නියතින්, ඒකාන්තයෙන්; නොහළයුතුබව, අත්නොහැරිය යුතුබව; සුදනන්, සත්පුරුෂයන් අතර; පැවති සිරිතැ යි, පැවැත්තා වූ චාරිත්‍රයෙකැ යි; දන්වන විලස, දන්වන්නෙකුගේ විලාසයෙන්; නුබමින් සමග, සූර්යයා හා එක්ව; දවහල් දවස, දවල්කාලය; ගෙවෙනු ය ගෙවෙන්නේය.

<u>භාවය</u>- තමන් ඇසුරුකළ මහතුන්ට වෙහෙසක් පැමිණිවිට ඒකාන්ත යෙන් ම ඔවුන් අත් නොහැරිය යුතුබව සුදනන් අතර පැවති සිරිතක්ය යි දන්වන්නාක් මෙන් දවල්දවස ගෙවේ.

<u>ක්‍රි: ය</u>- දවහල්දවස නුබමින් සමග ගෙවෙනු වේ.

<u>උ: න</u>- වේ: යනු ක්‍රියා යි. දවහල්දවස: උක්තප්‍රථමා විභක්ති යි. ගෙවෙනු: උක්තවිශේෂණ විභක්ති යි. නුබමින්: සමග යන සහාර්ථ නිපාතයොගයෙහි තෘතීයා යි.

<u>අර්ථක්‍රියා</u>- හසළ, (නොහළ) යුතු, පැවති, දන්වන.

හසළ: හසර (ඇසුරුකිරීමෙහි) ධාතු යි. කර්මකාරක යි. මහත්: උක්තකර්ම යි. යුතු: කර්තෘකාරක යි. නොනෙක්: අධ්‍යාහෘත උක්ත කර්තෘ යි. පැවති: පවත් (පැවැත්මෙහි): ධාතු යි. කර්තෘකාරක යි. සිරිත්: උක්තකර්තෘ යි. දන්වන: දන් (දැනීමෙහි) ධාතු යි. කර්තෘ කාරක යි. දවහල්දවස: උක්තකර්තෘ යි.

<u>සමාස</u>- 1 යස පිහිටලෙස. 2 නොහළයුතුබව. 3 සුදනන්. 4 නුබමින්. 5 දවහල්දවස.

<u>විග්‍රහ</u>- 1 යස වූයේ ද එම පිහිට වූයේ ද=යසපිහිට. යසපිහිටේ ලෙස=යසපිහිටලෙස. එයින්. 2 නොහළෙහි යුතු=නොහළයුතු, නොහළ යුත්තහුගේ බව=නොහළයුතුබව. 3 මනා දනෝ=සුදනෝ-ඔවුන්. 4 නුබට මින්=නුබමින්. (සබඳ වි: සමස්). 5 දවසේ දවහල්= දවහල්දවස. නොහොත්- දවහල් ම දවස=දවහල්දවස.

<u>විශෙෂ විභාග</u>- මෙහි දක්වෙන මහාත්මයා සූර්‍ය්‍යයා යි. ඔහු පිහිට වනුයේ දවහල් දවසට ය. ඔහුට පැමිණී වෙහෙස නම් අස්තයට යාම ය. ඔහුට ඒ වෙහෙස පැමිණෙන කල්හි ඔහුගේ පිහිට ලැබූ දවහල් දවස ද ඔහු අත්නොහැර ඔහු සමගම අවසානයට යාම සුදනන් අතර පැවති සිරිතක් දන්වන ලෙස වූ සිද්ධියකැ යි කීම උත්ප්‍රේක්ෂාවකි. ඉර බැසීමෙන් දවාල අවසන්වීම එබඳු දූත් විමකින් නොවන බැවිනි.

"නොහළ යුතුබව" යන තන්හි 'නොහළ' යන්න භාව වශයෙන් සිඛ යි. 'නොහළයුතුබව' යන්නෙහි අර්ථය නොහැරීමෙහි හෝ නොහැරීමෙන් යුක්ත වූවෙකුගේ ආකාරය යනු යි. "නුබමින්" යන තන්හි 'මින්' යන්න 'මණි' ශබ්ද යෙන් ආදේ වේ. එයින් සවරාත්ත ව ආයේ 'මිණි' යනු යි.

50 සැ දූ ලෙන් වරුණ දෙව්රද මුහුද වි සූ
සැ දූ සහසකර එන මහවන සැල සූ
වි දැ උපුල්පිල මෙන් රත් පටින් වැ සූ
සැදැ විලාපෙල සැළදිග පෙනුනු ප සූ

<u>විහකති</u>- සැදූලෙන් 4. වරුණදෙව්රද 3. මුහුද 8. විසූ 3. සැදූ 3. සහසකර 3. එන 8. මහවන 8. සැලසූ 2. විදූඋපුල්පිළු 2. රත්පටින් 4. වැසූ 2. සැදැවිලාපෙළ 7. සැළදිග 8. පෙනුනු 6. පසූ 8.

පදාර්ථ- මුහුද විසූ, සමුද්‍රයෙහි වාසයකළා වූ; වරුණ දෙව්රද, වරුණ දිව්‍යරාජයා විසින්; සැදැලෙන්, ශ්‍රද්ධාචිත්තයෙන් (ආදර සිතින්); සැදෑ, සමාන ජාති ඇත්තා වූ; සහසකර, සූය‍්‍යීයා; එන, එන්නා වූ; මගවත, මහාපථයෙහි; සැලසූ, යොදනලද්ද වූ; රත් පටින්, රක්තවර්ණවස්ත්‍රයෙන්; වැසූ, වසනලද්ද වූ; විදූඋපුල්පිළ මෙන්, කුරවින්ද පාෂාණ බඩ වෙදිකාවක් මෙන්; සැඳෑවලාපෙළ, සන්ධ්‍යාවලාහකපඞ්ක්තිය; පැළදිග, පශ්චිම දිශායෙහි; පෙනුනුපසු; පෙනීමෙන් ඉක්බිති. (මතුසම්බන්ධ යි.)

51 උ දු ල සොම්කැලුම් නිසයුරුහිමි පුව ළ
පහ ළ වන බැවින් තම වෙත නිසඹු දෙ ළ
ල කළ ගුවන්තල සිරියහනැ නිකස ළ
අතු ළ කුසුම් විලසින් සැදෙන තුරුවැ ළ

විභක්ති- උදුල 3. සොම්කැලුම් 3. නිසයුරුහිමි 3. පුවළ 3. පහළවන 7. බැවින් 4. තම 7. වෙත 8. නිසඹු 3. දෙළ 3. ලකළ 8. ගුවන්තල සිරියහන 8. නිකසළ 3. අතුළ 7. කුසුම් 7. විලසින් 4. තුරුවැල 2.

පදාර්ථ- උදුල, උජ්ජ්වලිත වූ; සොම්කැලුම්, සෞම්‍යකාන්ති ඇත්තා වූ; පුවළ, ප්‍රෞඪ වූ; නිසයුරුහිමි, නිශාකර නමැති ස්වාමියා; තම වෙත, තමාගේ සමීපයෙහි; පහළ වන බැවින්, ප්‍රකාශ වන බැවින්; දෙළ, අභිලාෂවත් වූ; නිසඹු, රාත්‍රිනමැති භාය‍්‍යීාව විසින්; නිකසළ, කසළ රහිත වූ; ලකළ, අලඞ්කෘත වූ; ගුවන්තල සිරියහනැ, ගගනතල නමැති ශ්‍රී ශයනයෙහි; අතුළ, අතුරණලද්ද වූ; කුසුම් විල සින්, පුෂ්පවිලාසයෙන්; තුරුවැල, තාරකාවලිය; සැදෙන, සැදෙන කල්හි. (මතුසම්බන්ධ යි).

52 ද න කැ න් ගෙණ දමන ගොදුරට නොහැකිළිය
ප නි මි න් දියෙන් ඔවුනොවුනැගෙහි පෙරළිය
ලෙ හෙ ළු න් කෙළින කර පෙණපිඩු රළ රැ ළිය
එ තැ නි න් පියාසර කර දකු මස්කෙ ළිය

විභක්ති- දනකැන් 3. දමන 7. ගොදුරට 7. දියෙන් 6. ඔවුනොවුන් 7. ඇගෙහි 8. ලෙහෙලුන් 3. කෙළින 2. පෙණපිඩු 2. රළුරැළිය 2. එතැනින් 5. පියාසර 2. මස්කෙළිය 2.

පදාර්ථ- එතැනින්, ඒ ස්ථානයෙන් (කාලඤ්ගහබඞින්); පියා සර කර, පක්ෂප්‍රසාරණය කොට; දනකැන්, ජනසමූහයා විසින්; ගෙණ, ග්‍රහණය කොට; දමන, ප්‍රක්ෂෙප කරණුලබන්නා වූ; ගොදු රට, ආහාරයට; නොහැකිළිය, සඞ්කුචිත නොවී (නොහැකිලී);

දියෙන්, ජලයෙන්; පනිමින්, උල්ලඞ්ඝනය කරමින්; ඔවුනොවුන්, අන්‍යොන්‍යයන්ගේ (එකිනෙකාගේ); ඇඟෙහි, ශරීරයෙහි; පෙරළිය, පෙරළි; පෙණපිඩු, ඵෙණපිණ්ඩයන් ද; රළරැළිය, තරඞ්ගභඞ්ගයන් ද; කර, (ඇති) කොට; ලෙහෙළුන්, රොහිත මත්ස්‍යයන්, කෙළින, ක්‍රීඩාකරන්නා වූ; මස්කෙළිය, මස්කෙළිය නම් වූ නදීතීර්ථය; දකු, දර්ශනය කරව.

<u>කවිතුමාණෝ භාවය</u>– ඉර බැසීමෙන් පසු තරුවැල සැදුනු කල්හි නුඹ කැලණිගඟබඩින් ගොස් මස්කෙළිය නම් තොටුපල දකගන්.

**<u>ක්‍රි: ය</u>– තෝ එතැනින් පියාසර කර මස්කෙළිය දකු.**

<u>උ: න</u>– **දකු:** විධික්‍රියා යි. **තෝ:** උක්තකර්තෘ යි. **මස්කෙළිය:** අනුක්තකර්ම යි. **කර** යන පෙරකිරියට ද **තෝ** යනු ම කර්තෘ යි. **පියාසර:** අනුක්තකර්ම යි. **එතැනින්:** අනුක්ත අවධි යි.

**<u>අඞ්ගක්‍රියා</u>– විසූ, එන, සැලසූ, වැසූ, එදුල, ලකළ, අතුළ, දමන, කෙළින.**

**විසූ:** වස (විසීමෙහි): ධාතු යි. කර්තෘකාරක යි. **වරුණදෙව්රද:** කා: උක්තකර්තෘ යි. **එන:** ආධාරකාරක යි. **මහවත:** කා: උක්තාධාර යි. **සැලසූ:** සලස් (සැලසීමෙහි): ධාතු යි. කර්මකාරක යි. **විදූඋපුල්පිල:** කා: උක්තකර්ම යි. **වැසූ:** වස් (වැසීමෙහි): ධාතු යි. කර්මකාරක යි. **විදූඋපුල්පිල:** කා: උක්තකර්ම යි. **එදුල:** කර්තෘකාරක යි. **සොමිකැලුම්:** කා: උක්තකර්තෘ යි. **ලකළ:** කර්මකාරක යි. **ගුවන්තලසිරියහන:** කා: උක්තකර්ම යි. **අතුළ:** අතුර (ඇතිරීමෙහි)ධාතු යි. කර්මකාරක යි. **කුසුම්:** උක්තකර්ම යි. **දමන:** දම (දැමීමෙහි): ධාතු යි. කර්මකාරක යි. **ගොදුරු:** උක්තකර්ම යි. **කෙළින:** ආධාරකාරක යි. **මස්කෙළිය:** උක්තාධාර යි.

<u>සමාස</u>– 1 සැඳලෙන්. 2 වරුණදෙව්රද. 3 සැදූ. 4 සහසකර. 5 මහවත. 6 විදූඋපුල්පිළ. 7 රත්පටින්. 8 සැඳෑවලාපෙළ. 9 සොමිකැලුම්. 10 නිසපුරුඟිම්. 11 නිසඹු. 12 ගුවන්තල සිරියහන. 13 නිකසළ. 14 කුසුම්විලසින්. 15 තුරුවල. 16 දනකැන්. 17 පෙණපිඩු. 18 රළරැළිය. 19 පියාසර. 20 මස්කෙළිය.

<u>විග්‍රහ</u>– 1 සැඳෑයෙන් යුත් ල=සැඳෑල–ඉන්. 2 වරුණ වූයේ ද එම දෙව් වූයේ ද=වරුණදෙව්. වරුණදෙව් ද එම රද ද=වරුණදෙව් රද. 3 සමවූ දෑ යමෙකුට ද ඒ=සැදෑ. 4 සහසක් කර යමෙකුට ද ඒ= සහසකර. 5 මහ වූයේ ද එම වත වූයේ ද=මහවත–එහි. 6 විදූ ම

උපුල්=විදූඋපුල්. විදූඋපුලෙන් කළ පිළ=විදූඋපුල්පිළ. 7 රත් වූයේ ද එම පට වූයේ ද=රත්පට-ඉන්. 8 සැඳැහි වලා=සැඳැවලා. සැඳැවලා වල පෙළ=සැඳැවලාපෙළ. 9 සොමි වූ කැලුම් යමෙකුගේ ද ඒ=සොමි කැලුම්. 10 තිස සාරණුයේ=තිසයුරු (සාම: වි: සමස්) තිසයුරු ම හිමි=තිසයුරුහිමි. 11 තිස ම අඹු=තිසඹු. 12 ගුවන ම තල=ගුවන් තල-ගුවන්තල ම සිරියහන=ගුවන්තලසිරියහන. 13 කසළ නැති යේ=තිකසළ. 14 කුසුම්වල විලස=කුසුම්විලස. ඉන්- 15 තුරු වල වැල=තුරුවැල. 16 දහන්ගේ කැන්=දහකැන්. 17 පෙණවල පිඩු=පෙණපිඩු. 18 රළවල රැළි=රළරැළි. 19 මසුන්ගේ කෙළි යම් තැනෙක්හි ද ඒ=මස්කෙළිය.

<u>විශෙෂ විභාග</u>- "වරුණදෙව්රද" යනු පශ්චිමදිශාධිපති දෙව්රජෙකි. හෙතෙමේ ජලයටද අධිපති වේ. මොහුගේ පියා කාශ්‍යප යි. මව අදිති යි. "සඳ" යනුවෙන් ගැණෙන්නේ සූර්‍ය්‍යා ද අදිතිපුත්‍ර බැවින් වරුණ හා සමාන ජාතික බව යි. "විදූ-උපුල්" යනු 'කුරුවින්ද-උපල'යන මෙයින් සිංහල වියයි කිය යුතු යි. 'කුරුවින්ද' යනු පද්මරාගයට ද 'උපල' යනු පාෂාණයට ද නම්. මෙහි සැඳැවලාපෙළ පද්මරාගමාණික්‍යයෙන් කොට රතුරෙද්දෙන් වැසූ පිළකට සම කරණ ලද්දේ ය. එබඳු පිළ ද සමහුම්යට වඩා මඳක් මතුවී පෙනේ. සැඳැ වලාපෙළ ද සෙසු වලාකුල්වලට වඩා මදක් මතුවී ඒ වර්‍ණයෙන් පෙනේ. "පුවළ" යන්නේ අර්‍ථය මේරු යනු යි. මේ දිනය පුර නවවක බැවින් සඳ මේරි මට පැමිණි කාලය යි. "තිසඹුදෙළ" යන තන්හි 'දෙළ' යනු ආගාවට නමෙකි. ඒ වනාහි පාලි 'දෙහළ' ශබ්දයෙන් ආයේ වේ. මෙහි 52 වන කවෙහි- "තොනැ කිළිය, පෙරැළිය, රළරැළිය" යන තන්හි 'ය' කාරය එළිසම කිරීම පිණිස යි. 'මස්කෙළිය' යන නමින් ප්‍රසිඬ ස්ථානයක් දූන් නැතත් ඒ කාලයෙහි මිනිසුන් දමන කැම කන්නට මසුන් රැස්වන තොටක් කැළණිය අසල තුබුනබව මෙයින් හැගේ.

53 පැ හැ ස ර ණි ය මි ණි පැමිණිය කොත් අග ට
බ ද කි කි ණි ය දද ගි හි ණි ය විමන් ව ට
නොව පැර ණි ය වන ර ම ණි ය විපින් වි ට
සැ ල ලි හි ණි ය වදු කැල ණි ය පුරවර ට

<u>විභක්ති</u>- පැහැසරණියමිණි 7. පැමිණිය 2. කොත් 7. අගට 2. බද කිකිණිය 4. දද 4. ගිහිණිය 2. විමන් 7. වට 8. පැරණිය 2. වන 2. රමණිය 2. විපින්විට 8. සැළලිහිණිය 9. කැලණිය පුරවරට 2.

<u>පදාර්ථ</u> - කොත්අගට, කොත්වල මුදුනට; පැමිණිය, ප්‍රාප්ත වූ; පැහැසරණියමිණි, ප්‍රභාශ්‍රෙණියෙන් යුත් මාණික්‍යයන් ඇත්තා වූ; විමන්, විමානයන්ගේ; වට, හාත්පස්හි; බදකිකිණිය, බඳිනලද කිකිණි ඇති; දද, ධවජයන්ගෙන්; ගිහිණිය, ගැවසීගත්තා වූ; පැර

ණීය නොව, පුරාණභාවයට නොපැමිණ; විටින්විට, වරින්වර; රම ණීය වන, සිත්කලු බවට පැමිණෙන්නා වූ; කැලණිය පුරවරට, කල්‍යාණිපුරවරයට; සැලලිහිණිය, ශාරිකාපක්‍ෂිරාජය; වදු, ප්‍රවිෂ්ට වෙව.

<u>භාවය</u>– සැලලිහිණිය හුඹ ධවජආදියෙන් ශෝභාව වරින්වරම පැරණි නොවී සිත්කලු වන්නා වූ කැලණිය පුරවරට පලයන්.

<u>ක්‍රි: ය</u>– සැලලිහිණිය නෝ කැලණිය පුරවරට වදු.

<u>උ: න</u>– **වදු:** විධික්‍රියා යි. **නෝ:** උක්තකර්තෘ යි. **සැලලිහිණිය:** සම්බොධන යි. **කැලණිය පුරවරට:** අනුක්තකර්ම යි.

<u>අප්‍රධානක්‍රියා</u>– **පැමිණ, බඳ, වන.**

**පැමිණි: පමුණ:** (පැමිණීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **පැහැසරණියමිණි:** කා: උක්තකර්තෘ යි. **බඳ:** බඳ (බැඳුම්හි) ධාතු යි. කර්මකාරක යි. **කිකිණි:** උක්තකර්ම යි. **වන:** කර්තෘකාරක යි. **කැලණියපුරවර:** උක්තකර්තෘ යි.

<u>සමාස</u>– 1 පැහැසරණියමිණි. 2 බඳකිකිණිය. 3 කැලණිය පුරවරට.

<u>විග්‍රහ</u>– 1 පැහැයේ සරණි=පැහැසරණි. පැහැසරණියෙන් යුත් මිණි යමකාද ඒ=පැහැසරණය මිණි. බඳ කිකිණි යමෙක්හි ද ඒ= බඳකිකිණි, 3 වර වූයේ ද එම පුර වූයේ ද=පුරවර. කැලණි වූයේ ද එම පුරවර වූයේ ද=කැලණියපුරවර-ඊට.

<u>විශෙෂ විභාග</u>– ඇතැම් නුවරක් වරක් සිත්කලු ව තිබී නැවත කලක් පැරණි වීමෙන් සිත්කලු බව නැසෙන සුලු ය. එඩා එසේ වියහැක්කේ කලක් එක් රජෙකු ම රාජ්‍යය කිරීමෙනි. කලණි පුරය එයේ නොව විටින්විට පැමිණි ඒ ඒ රජවරුන්ගේ අභිනව ප්‍රතිසංස්කරණවලින් විටින් විටම සිත්කලු වූ බැවි "නොව පැරණිය වන රම්‍ණිය විටින්විට" යන්නෙන් පැවසේ.

"නොව" යන පෙර කිරියට "පැරණිය" යනු කර්ම යි. ධාතුව පැමිණීම් අර්ථ බැවිනි. "විටින්විට" යන තන්හි කාලාර්ථ 'විට' ශබ්ද දෙකෝ වීප්ස ය යි. එබඳු සමහර ශබ්දයන් වීප්සවීමේදී පූර්ව ශබ්දය කරණ විභක්තිරූපයෙන් යෙදේ. 'වරින් වර-තැනින් තැන' යනාදි වශයෙනි.

"පැහැසරණිය, බඳකිකිණිය, කැලණිය, ගිහිණිය, පැමිණිය, පැරණිය රමණිය" යන තන්හි යකාරය එණිලඞකාරය සඳහා අකුරු සම කිරීම පිණි සයි. 'සරණි' යන්න 'ශ්‍රෙණි' ශබ්දයෙන් ආයේය. "හිහිණි" යන්න පෙර කී පරිදියි. එහි වූ මූර්ධන්‍ය නකාරය ද අකුරු සම කිරීම පිණිසයි,

54 දි ය ක ඳ ගැඹර පිරි පුවතර මහසයු ර
මු ව ර ද ලෙසින් වන අගතිසි කරතඹ ර
ම න න ඳ කරණ මිණිගණ මෙන් දිසි එව ර
පැහැනඳ පහන් එහි මහවෙයැ බල මිතු ර

<u>විභක්ති</u>– දියකඳ 4. ගැඹර 4. පිරි 2. පුවතර 2. මහසයුර 2. මුවරද 7. ලෙසින් 4. අගතිසි 7. කරතඹර 8. මනනඳ 2. කරණ 2. මිණිගණ 2. දිසි 2. එවර 8. පැහැනඳ. 2 පහන්. 2 එහි. 8 මහවෙයැ. 8 මිතුර 9.

**<u>පදාර්ථ</u>:** ගැඹර, ගම්භීර වූ; දියකඳ, ජලස්කන්ධයෙන්; පිරි, පිරුණා වූ; පුවතර, ප්‍රසිද්ධ වූ; මහසයුර, මහාසාගර ය; අගතිසි, අගස්ති ඍෂිහුගේ; කරතඹර, හස්තතල නමැති තාමරසයෙහි; මුව රද ලෙසින්, මකරන්දයක් මෙන්; වන, වනකල්හි; දිසි, දෘශ්‍යමාන වූ; මනනඳ කරණ, මනොනන්දය කරන්නා වූ; මිණිගණ මෙන්, මාණික්‍ය සමූහය මෙන්; එවර, ඒ කාලයෙහි; එහි, ඒ කැලණිපුර යෙහි; මහවෙයැ, මහාවීථියෙහි; දිසි, දෘශ්‍ය වූ; පැහැනඳ, ප්‍රභා යෙන් සමෘද්ධ වූ; පහන්, ප්‍රදීපයන්; මිතුර, මිත්‍රය; බල, අවලොක නය කරව.

**<u>භාවය</u>**– මිතුර නුඹ, මහමුහුදේ ජලය අගස්ති ඍෂියාගේ අතට ගත් කල්හි මුහුදෙහි පෙනෙන මාණික්‍ය සමූහයා මෙන් ඒ කාලයෙහි කැලණිපුර මහාවීථියෙහි පෙනෙන ප්‍රභාවෙන් සමෘද්ධ වූ ප්‍රදීපයන් බලාපන්.

**<u>ක්‍රි: ය:</u>– මිතුර නෝ පැහැනඳ පහන් බල.**

**<u>උ: න</u>– බල:** විධික්‍රියා සි. **නෝ:** උක්තකර්තෘ සි. **මිතුර:** සම්බො ධන සි. **පහන්:** අනුක්තකර්ම සි. **පැහැනඳ:** තද් විශෙෂණ සි.

**<u>අර්ථක්‍රියා</u>– පිරි, කරණ, දිසි, නඳ.**

**පිරි:** පුර– (පිරුම්හි) ධාතු සි. කර්තෘකාරක යි. **මහසයුර:** උක්ත කර්තෘ සි. **කරණ:** කර්තෘකාරක යි. **මිණි–පහන්:** උක්තකර්තෘසි. **දිසි:** දිස් (දැකුම්හි) ධාතු සි. කර්මකාරක සි. **මිණි–පහන්:** උක්ත කර්ම සි. **නඳ:** නඳ (වැඩුම්හි) ධාතු සි. කර්තෘකාරක සි. **පහන්:** උක්ත කර්තෘ සි.

**<u>සමාස</u>**– 1 දියකඳ. 2 මහසයුර. 3 කරතඹර. 4 මනනඳ. 8 මිණි ගණ. 6 පැහැනඳ. 7 මහවෙයැ.

**<u>විග්‍රහ</u>**– 1 දියේ කඳ – දියකඳ. 3 කර ම තඹර = කරතඹර. 4 මනේ නඳ = මනනඳ. 5 මිණිවල ගණ = මිණිගණ 6 පැහැයෙන් නඳ = පැහැනඳ. 7 මහ වූ යේ ද එ ම වේ වූයේ ද = මහවේ. එහි.

<u>විශේෂ විභාග</u>- මෙහි අගස්ති ඍෂියාගේ අත්ල පියුමක් කොට ද සමුද්‍ර ජලය මුවරද කොට ද රූපණය කිරීමෙන් අගස්ති ඍෂියා සමුද්‍රජලය හසන තල සට ගත් බව පවසත්. ඔහු එක් දිනක් සමුද්‍රය සමග කිපි සමුද්‍රජලය දෙහොතට ගෙණ පානය කෙළේය යනු දෙව කථා යි. ඔහුට එබඳු සාමර්ථ්‍යයක් තුබුනුබවද ප්‍රසිද්ධ ය. අගස්ති ඍෂියාගේ තත්ත්වය පවසන්නාහු:

> ඝටො ජන්මස්ථානං මෘගපරිජනො භූර්ජවසනො
> වනෙ වාසඃ කන්දාදිකමශනමෙවංවිධගුණඃ,
> අගස්ත්‍යඃ පාථොධිං යදකෘත කරාම්භොජකුහරෙ
> ක්‍රියා සිද්ධිඃ සත්ත්වෙ භවති මහතාං නොපකරණෙ.

යනු කීහු. අගස්ති ඍෂිහුගේ ජන්මස්ථානය කලය බවත්, පිරිවර මෘග සමූහයා බවත්, ඇඳීම රිටි සුඹුලු බවත්, විසීම වනයෙහි බවත්, කෑම වනමුල් ඵලාදියබවත්, මෙයින් පැවසේ. නමුත් මෙබඳු ගුණයුත් ඔහු සමුද්‍රජලය හසන නමැති පියුමට ගත් බවද. උපකරණ නැතත් ඒ ඒ වස්තු විෂයෙහි මහතුන්ගේ ක්‍රියා සිද්ධිය වන බවද මෙයින් ම පැවසේ.

'අගස්ති' ශබ්දය පර්වතවාචක 'අග' ශබ්ද පූර්ව-'අස-ක්ෂෙපෙ' යන ධාතුවෙන් සිඬයි. "අගං අස්‍යතීති=අගස්තිඃ" යනු විග්‍රහයි. පර්වතය මෙහෙයා ගත්තෝ ය යනු එහි අර්ථයි. එක් කලෙක්හි මෙතෙමේ විංධ්‍ය පර්වතය කොරෙහි කිපියේලු, එකල බියට පත් පර්වතය මොහුගේ පාමුලට පැමිණ ක්ෂමාකරවා ගත්තේලු.

"අගතිසි" යන්න- අගස්ති ශබ්දයෙන් ආ 'අගත්' පදය හා 'ඉසි' ශබ්දය එක්වීමෙන් සිඬයි.

55 උ ද ය ග   පියුම්රා පැහැ වැද මෙන් රැ   ඳු නු
පෙ ර දි ග   පෙනෙන සඳ සඳකැල්මෙන් දි   ලු නු
ම න ර ග   එපුර සඳකාන දගහඹින් වැ   ඩු නු
සු ර ග ඟ   පතිනිදම් රැකුමෙහි වැනි දැ   පු නු

<u>විභක්ති</u>- උදයග 8. පියුම්රා පැහැ 3. රැඳුනු 2. පෙරදිග 8. සඳ 2 සඳකැල්මෙන් 4. දිලුනු 2. මනරඟ 8. එ 8. පුර 8. සඳකතගෙහි 8. අඹින් 4. වැඩුනු 1. සුරඟඟ 1. පතිනිදම් රැකුමෙහි 8. දැපුනු.

<u>පදාර්ථ</u>- උදයග, උදය පර්වතාග්‍රයෙහි; පියුම්රාපැහැ, පද්මරාග මාණික්‍ය ප්‍රභාව; වැද, ස්පර්ශ ව; රැඳුනු මෙන්, රඤ්ජිත වූවාක් මෙන්; සඳකැල්මෙන්, සන්ධ්‍යාකාන්තියෙන්; දිලුනු, ජ්වලිත වූ; සඳ, චන්ද්‍රයා; පෙරදිග, පූර්වදිශායෙහි; පෙනෙන, දෘශ්‍යමාන කල්හි; මනරඟ, මනොඥ වූ; එපුර, ඒ කල්‍යාණී පුරයෙහි; සඳකතගෙහි, චන්ද්‍රකාන්ත පාෂාණමය ගෘහයෙහි; අඹින්, ජලයෙන්; වැඩුනු, වැඩුනා වූ; සුරගඟ, ආකාශ ගඞ්ගාව; පතිනිදම් රැකුමෙහි, පතිව්‍රතා ධර්ම රක්ෂණයෙහි; දැපුනු වැනි, දර්පිත වූවාක් වැන්න.

භාවාර්ථ– සන්ධ්‍යාකාන්තියෙන් දිලිහී ගිය සඳ පූර්වදිශායෙහි පෙනෙන කල්හි කැලණිපුරයෙහි වූ චන්ද්‍රකාන්තපාෂාණමය ගෘහයන්ගේ ජලයෙන් වැඩුනු ආකාශ ගඞ්ගාව පතිව්‍රතා ධර්මය රැකීමෙහි තත්පරවූවාක් වැනිය.

**ක්‍රි: ප:– සුරගඟ පතිනිදම්රැකුමෙහි දැපුනු වැනි වේ.**

උ: කා– **වේ:** ක්‍රියායි. **සුරගඟ:** උක්තකර්තෘයි. **දැපුනු:** උත්ප්‍රේක්ෂාවිෂයී කර්තෘයි. **වැනි:** උත්ප්‍රේක්ෂාද්‍යෝතක නිපාත යි. **පතිනිදම්රැකුමෙහි:** දැපුනු යන්නෙහි අනුක්තාධාර යි.

අර්ථක්‍රියා– **රැඳුනු, දිලුනු, වැඩුනු: දැපුනු.**

**රැඳුනු:** රඳ (රැඳුම්හි) ධාතුයි. කර්මකාරකයි. **සඳ:** උක්ත කර්මයි. **දිලුනු:** දල (දිලිසීමෙහි) ධාතුයි. කර්තෘකාරකයි. **සඳ:** උක්තකර්තෘයි. **වැඩුනු:** වඩ (වැඩුම්හි) ධාතුයි. කර්තෘකාරකයි. **සුරගඟ:** උක්තකර්තෘ යි. **දැපුනු:** දප (දැපුම්හි) ධාතුයි. කර්තෘකාරකයි. **සුරගඟ:** උක්තකර්තෘ යි.

සමාස– 1 උදයග. 2 පියුම්රුපැහැ. 3 පෙරදිග. 4 සඳකැල්මෙන්. 5 මනරඟ. 6 සඳකතගෙහි. 7 සුරගඟ. 8 පතිනිදම්රැකුමෙහි.

විග්‍රහ– 1 උදයේ අග = උදයග. 2 පියුමට බදු රු යමෙක්හි ද ඒ=පියුම්රු, පියුම්රුහි පැහැ=පියුම්රුපැහැ. 3 පෙර වූයේ ද එම දික් වූයේ ද = පෙරදික්, එහි. 4 සඳෙහි කැල්ම = සඳකැල්ම. 5 මනට රඟ = මනරඟ. මන රඳනුයි හෝ = මනරඟ. 6 සඳ කත් (කැමැති) වනුයේ යමකට නු යි=සඳකත්, සඳකතින් කළ ගේ=සඳකතගේ. එහි 8 පතිනිගේ දම් = පතිනිදම්, පතිනිදමේ රැකුම = පතිනිදම්රැකුම. එහි.

විශේෂ විභාග– සැන්ද්‍ර කාලයෙහි පායන සඳ සන්ධ්‍යාකාන්තිය වැදී මෙන් මදරත්වන් වේ. එසේ විම අන් අයුරකින් සලකන්නාහු "උදයග පියුම්රුපැහැ වැද මෙන් රැඳුනු" යයි කීහු. උදයපර්වතය මුළුල්ල ම පද්මරාග මාණික්‍ය මය වුවත් පායන සඳෙහි වැදියහැකි වන්නේ පර්වත ශිඛර මණි කාන්තිය බැවින් "උදයග" යි කීහු. එබැවින් මෙහි 'අග' ශබ්දය ශිඛරාර්ථ යි. පර්වතාර්ථ නොවේ. 'උදය' යන්නෙන් පමණක් උදයපර්වතය ගැණේ.

"සඳකැල්ම" නම් ඉර බසින වේලෙහි වලාකුල්වල පෙනෙන රක්තවර්ණය යි. ස්වාමියා දුකට පැමිණි කල්හි භාර්යාව දුකට පැමිණීම ද, සතුටුවූ කල්හි සතුටු වීම ද, ස්වාමියා අන් රටකට පැමිණි කල්හි මලිනවීම හා කෘශ වීම ද, පත් නී ධර්ම යි. ඒ ධර්මයන් රැකීම පතිනිදම් රැකුමයි. මෙහි සමුද්‍රය පතිත්වයෙන් ද ගඞ්ගාව පත්නීත්වයෙන් ද නිරූපණය කොට චන්ද්‍රෝදයකාල

යෙහි. සමුද්‍රයේ ජලසවැඩීවීම සවාමියාට ඇති වූ සතුටකි. ඒ සමග ම චන්‍ද්‍රකාන්ත පාෂාණමය ගෘහවලින් ගිලිහුණු ජලයෙන් අහස්ගඟ ජලය වැඩිවීම පතිනි යට වූ සතුටකි. මේ මේසේවීම පතිව්‍රතා ධර්මය රැකුමක් මෙතැයි උත්‍ප්‍රේක්ෂා කිරීමෙන් ප්‍රකාශිත "සුරගඟ පතිනිදම්" යනාදිය කීහු. දුපිම නම් ආඩම් බර වීමයි, මුහුදුදිය වැඩිවීම සමග ම තමාගේ ජලය වැඩිවීම ද ආඩම්බරයක් කොට සැලකේ.

56 සු නි ල් වලා නවසඳ නිලුපුල් පබ ළ
වි ම ල් සක් ගිජිඳුකුඹු සිරිවැස බැබ ළ
වි පු ල් පුලින රඹ සිකිගල මුතු ලද ළ
ල ක ල් රණලිසන් සරණා බල යහ ළ

<u>විශකානි</u>- සුනිල්වලා 4. නවසඳ 4. නිලුපුල් 4. පබළු 4. විමල් 4. සක් 4. ගිජිදුකුඹු 4. සිරිවැස 4. බැබළු 4. විපුල්පුලින 4. රඹ 4. සිකිගල 4. මුතු 4. ලදළු 4. ලකල් 2. රණලියන් 2. සරණා 2. යහළු 9.

<u>පදාර්ථ</u>- සුනිල්වලා, ඉතා නිල් වලාකුල් ය; නවසඳ, අභිනව චන්ද්‍ර ය; නිලුපුල්, නිලෝත්පලය; පබළු, ප්‍රවාලය; විමල්, සක්ෂිමාලා වය; සක්, ශඞ්ඛය; ගිජිඳුකුඹු, හස්තිකුම්භය; බැබලූ, භ්‍රාජිතවූ; සිරි වැස, උඩැක්කිය; විපුල්පුලින, මහත් වැලිතලාය; රඹ, කෙසෙල්ය; සිකිගල, මයූරග්‍රීවය; මුතු, මුක්තාය; ලදළු, තරුණපල්ලවය (යන මේ සමූහයෙන්); ලකල්, මනොඥ වූ; සරණා, හැසිරෙන්නා වූ; රණලියන්, සවර්ණලතාවන්; යහළු, මිත්‍රය; බල, අවලොකනය කරව.

<u>භාවය</u>- මිතුර නුඹ කොස්වැටි ආදියෙන් මනාහරව මෙපුර හැසිරෙණ රණලියන් වැනි ස්ත්‍රීන් බලාපන්.

<u>ක්‍රි: ය:</u>- යහළු නෝ රණලියන් බල.

<u>උ: ක</u>- බල: විධික්‍රියායි. නෝ: උක්තකර්තෘයි. රණලියන්: අනුක්තකාමයි. යහළු: සම්බොධනයි.

<u>අර්ථක්‍රියා</u>- සරණා: සර (හැසුරුම්හි) ධාතුයි. කර්තෘකාරකයි. රණලිය: උක්තකර්තෘ යි.

<u>සමාස</u> 1 සුනිල්වලා. 2 නවසඳ. 3 නිලුපුල්. 4 විමල්. 5 ගිජිඳුකුඹු. 6 ලදළු. 7 ලකල්. 8 රණලියන්.

<u>විග්‍රහ</u>- 4 වියන්ගේමල්=විමල්. 5 ගජවූයේ ද එම ඉඳු වූයේ ද =ගිජිඳු, ගිජිදුන්ගේ කුඹු=ගිජිඳුකුඹු. 7 සිකින්ගේ ගල=සිකිගල. 8 ලාවූයේ ද එම දළු වූයේ ද = ලදළු. 9 ලයට කාල්=ලකල්. 19 රණින් කළ ලිය= රණලිය- ඔවුන්.

__විශේෂ විභාග__– මේ කවෙහි "රණලියන්" යනු උපමාන කළ උපමේයක් සේ ගැණෙන්නාහු පුරඟනෝහු යි. උපමේය ගැණීමට උපමාව පමණක් දක්වනුයේ සමාසෝක්ති වශයෙනි. බැවින් එයින් ගතයුතු අර්ථය "සවර්ණලතාවන් වැනි ස්ත්‍රීන් බලව" යනු යි. එසේම ඒ ස්ත්‍රීන්ගේ හිස පටන් පතුල් තෙක් ඇති අවයවයන් උපමා පක්ෂයෙහිලා දක්වන්නාහු "සුනිල්වලා" යනාදිය කීහු. එයින් ගැණෙන උපමේය පක්ෂය මේ ආකාරයෙන් ගතයුතු යි, එනම්- 'සුනිල්වලා' යන්නෙන් කෙශකලාපය ද 'තුවසද' යන්නෙන් නළල ද, 'තිලුපුල්' යන්නෙන් ඇස් ද, 'පබළු' යන්නෙන් තොල් ද, 'විමල්' යන්නෙන් දත් ද, 'සක්' යන්නෙන් බෙල්ල ද, 'ගිජිඳුකුඹු' යන්නෙන් පයොධර ද 'සිරිවැස' යන්නෙන් සිහිනිග ද. 'විපුල්පුලින'යන්නෙන් උකුළ ද, 'රඹ' යන්නෙන් වටොර ද, 'සිකිගල' යන්නෙන් කෙන්ඩා ද. 'මුතු' යන්නෙන් නිය ද, 'ලදළු' යන්නෙන් අතුල්පතුල් ද, ගතයුතු යි.

"පබළු" නම් රතුමැණික් වෙසෙසෙකි. එයින් තොල් රතු බව අඟවයි. "විමල්" යන්නට සත්තවල නිර්මල වූ කියා සක් යන්නට විශෙෂණ කොට අරුත් පවසා තිබේ. එසේ වුවොත් දත් ගැණීමට උපමාවක් නොලැබේ. දත් ද විශෙෂයෙන් කියයුතු අවයවයෙකි. දත්වලට පක්ෂිමාලාව උපමා කිරීම කවිසමයෙහි කොපමණවත් දක්නා ලැබේ. 'විමල්' යන තැන්හි 'වි' ශබ්දය පක්ෂිවාචකයි. එබැවින් මෙහි 'විමල්' යන්නෙන් ශුභ්‍රවර්ණ පක්ෂිමාලාව ද, එයින් දන්ත පඞ්ක්තිය ද ගතයුතු යි. 'විමල්' යන්න 'සක්' යන්නට විශෙෂණ කිරීමෙන් ඵල යක් ද නැත්තේ ය.

"සිරිවැස" යන්න 'ශ්‍රීවත්ස' ශබ්දයෙන් ආයේ යයි සමහරු කියති. ශ්‍රීවත්ස නම් විෂ්ණුගේ වක්ෂයෙහි වූ මහත් බව දක්වන ලකුණකි. කවිසමයෙහි සිරිවැස උපමා කෙළේ සිහිනිගටය "රන්සිරිවැස නිගාය සිහිනිගාය" යනාදි වශයෙනි. එබැවින් 'සිරිවැස' යන්නෙන් ගතයුත්තේ උඩැක්කි ය යි. එය පාලි "සිරිවච්ඡ" ශබ්දයෙන් ආයේ ය. මේ කවියෙහි උපමේය පක්ෂය නොදක්වා උපමා පක්ෂය පමණක් දක්වූයේ සමාසෝක්ති වශයෙනි.

57 ඔ ද වැඩි කෙළි මගුල් ලැබ තුටු නිසාක ල
ස ද සක්මඳෙසිනැද දෙන දුණුකැන්දුහු ල
සොඳ පුර අඟන පහසුමුගින් පැහැඋදු ල
සෙ ද දුන් අඹර මතු ඇය රැස් මිණිමෙවු ල

__විභක්ති__–ඔදවැඩි 2. කෙළිමගුල් 2,තුටු 2. නිසාකල 3. සඳසක්මදෙසින් 6. දුණුකැන් දුහුල 2. සොඳ 1. පුරඅඟන 1. පහසුමුගින් 6. පැහැඋදුල 6. අඹරමතු 8. ඇය 7, රැස්මිණිමෙවුල 2.

__පදාර්ථ__– ඔදවැඩි, ඔජෝගුණාධිකවූ (ශක්තිමත්වූ); කෙළිමගුල්, ක්‍රීඩාමඞගලයන්; ලැබ, ලබා; තුටු, සතුටු වූ; නිසාකල, රාත්‍රිනමැති කාන්තාව විසින්; සඳ සක් මදෙසින්, චන්ද්‍රනමැති ශඞ්ඛමංජුෂායෙන් (සක්පෙට්ටියෙන්); ඇද, ආකර්ෂණය කොට; දුණුකැන්දුහුල, ජ්‍යොත්ස්නාසමූහ නමැති වස්ත්‍රය (සවකිය කාන්ති නමැති වස්ත්‍රය);

දෙත, දනය කරණකල්හි ;සොඳ, සුන්දරවූ; පුරගන, පුරනමැති අඹග නාතොමෝ; පැහැඋදුල, ප්‍රභාවෙන් උජ්ජ්වලිතවූ; පහසමුගින්, ප්‍රාසාද නමැති සමුද්ගයෙන් (ප්‍රාසාද නමැති කරඬුවෙන්); රුස්, රශ්මිනමැති, මිණිමෙවුල, මණිමෙඛලාව; ඇය, ඒ තිශාකාන්තාවගේ; අඹරමතු, (වස්ත්‍රකාන්ති නමැති) වස්ත්‍රමස්තකයෙහි; සෙද, ශීඝ්‍ර ව; දුන්, දනය කළාය.

<u>භාවය</u>- ජයවර්ධනපුරයට සඳ පැමු කල්හි පුරයෙහි වු ප්‍රාසාදයන්ගේ මාණික්‍ය කාන්තිය සඳපහතෙහි මිණිමෙවුල් මෙන් සිටියේ ය.

**<u>ක්‍රි: ය</u>- පුරඅඟන රුස්මිණිමෙවුල අඹරමතු සෙද දුන්.**

<u>උ: න</u>- **දුන්;** අතීත කර්තෘකාරක ප්‍රථමපුරුෂ බහුවචන සි. **පුර අඟන** උක්තකර්තෘ සි. **රුස්මිණිමෙවුල:** අනුක්තකර්ම සි. **අඹර මතු:**අනුක්තාධාර සි. **සෙද:** ක්‍රියා විශෙෂණ නිපාත සි.

**<u>අඣක්‍රියා</u>- වැඩි, තුමු, උදුල.**

**වැඩි:** වඩ (වැඩුම්හි) ධාතු සි. කර්තෘකාරක සි. **කොළිමගුල්:** කා: උක්තකර්තෘ සි. **තුමු:** තුස් (තොස්හි) ධාතු සි. කර්තෘකාරක සි. **නිසාකල:** උක්තකර්තෘ සි. **උදුල:** කර්තෘකාරක සි. **පහසුමුගින්:** උක්තකර්තෘ සි.

<u>සමාස</u>- 1 ඔදවැඩි. 2 කොළිමගුල්. 3 නිසාකල. 4 සඳසක් මදෙසින්. 5 දුණුකැන්දුහුල. 6 පුරඅඟන. 7 පහසුමුගින්. 8 පැහැ උදුල. 9 අඹරමතු. 10 රුස්මිණිමෙවුල.

<u>විග්‍රහ</u>- 1 ඔදෙන් වැඩි=ඔදවැඩි. 2 කොළි ම මගුල්=කොළිමගුල් 3 නිසා ම කල=නිසාකල. 9 සකොන් කළ මදෙස=සක්මදෙස, සඳම සක්මදෙස=සඳසක්මදෙස-ඉන්. 5 දුණුවල කැන්=දුනුකැන්. දුණු කැන් ම දුහුල=දුණුකැන් දුහුල. 7 පහ ම සුමුග=පහසුමුග- ඉන්. 8 පැහැයෙන් උදුල=පැහැඋදුල. 9 අඹරේ මතු=අඹරමතු. 10 මිණි යොදා කළ මෙවුල = මිණිමෙවුල, රුස් ම මිණිමෙවුල=රුස්මිණි මෙවුල.

<u>විශෙෂ විභාග</u>- මෙහි කල්‍යාණිපුරය ස්ත්‍රීරූපයෙන් දක්වා, සඳ රාත්‍රි නමැති ස්ත්‍රියගේ පෙට්ටියක් කොට ද, සඳරැස ඒ පෙට්ටියෙහිවූ සිනිඳු පට සළුවක් කොට ද, කල්‍යාණිපුරයෙහි වූ ප්‍රාසාද පුර නමැති ස්ත්‍රියගේ කරඬු කොට ද, එහි වූ මාණික්‍යයන්ගේ කාන්තිය රුවන් මෙවුල්දම් කොට ද නිරූපණය කළහ. එහි පුරස්ත්‍රීගේ ක්‍රීඩාමණ්ඩලාභාවයන් දැක සතුටු වූ රාත්‍රි නමැති ස්ත්‍රිය තමාගේ සඳ නමැති සක්පෙට්ටියෙන් සඳරැස් නමැති සිනිඳු පට

සළුව ගෙණ පුරඟනියට ත්‍යාග කල බවද, ඒ ලැබූ පුරඟනිය තමාගේ ප්‍රාසාද නමැති කරඬුවෙහි වූ රශ්මි නමැති මිණිමෙවුල රාත්‍රි නමැති ඟනිය දුන් සඳරැස් නමැති වස්ත්‍රයාගේ මත්තෙහි හෙළූ බවද රූපකාලඞ්කාරවශයෙන් සූචිත යි. මෙයින් පවසනුයේ ප්‍රාසාදයන්හි වූ මිණිරැස් ආදිය සඳපානට වැටුනුවිට මිණිමෙවුල් මෙන් පෙනුනු බවය.

'ඔදවැඩි' යන තැන්හි 'ඔද' ශබ්ද ය 'ඔජ' ශබ්දයෙන් ආයේ වේ. 'ඔද' ශබ්දයෙහි බොහෝ අර්ථ ඇතත් මෙහි 'බල-තෙජස්' යන අර්ථය ගතයුතුයි. එකල්හි මේ පුරයෙහි පැවති ක්‍රීඩා මඞ්ගල මධුපාන රත්‍යුත්සවාදි වශයෙන් බලයෙන් හා තෙදින් සමෘද්ධ වූහ.

මඳෙස- දුණු- සුමුන- අඹර- යන මේ ශබ්දයෝ පිළිවෙළින් 'මඤ්ජූසා- ද්‍රුණ්හ- සමුග්ග- අම්බර, යන ශබ්දයන්ගෙන් ආවාහුය. 'අඹර' ශබ්දය වස්ත්‍ර වාචක ද ආකාශවාචක ද වේ. ආකාශවාචක වුවත් මෙහි ගතයුත්තේ පෙර කී සඳරැස් නමැති පටවස්ත්‍ර ය යි.

58 තවර සාර කොකුම් සඳුනෙන් තුනු සිය ළ
පවර සුවඳ මල්දම් පැලඳ මනකල
බැහැර සිතු නොලු හිමිනඹුවො කෙළිලොල
එ පුර ඉඳිති සඳපානේ සඳලුවල

විභක්ති- පවර 2. කොකුම්සඳුනෙන් 4. තුනු 2. සියල 2. පවර 2. සුවඳ මල්දම් 2. මනකල 2. බැහැර 8. සිතු 2. නොලු 1. හිමිනඹුවො 1. කෙළිලොල 1. එපුර 8. සඳපානේ 8. සඳලුවල 8.

පදාර්ථ- කොකුම්සඳුනෙන්, කුඞ්කුමයෙන් හා චන්දනයෙන්; සියල තුනු, සකල ශරීරය; තවර සාර, චර්චිත කොට (ආලෙප කොට;) මනකල, මනොඥ වූ; සුවඳ මල්දම්, සුගන්ධ මාලාදමයන්; පැලඳ, ප්‍රසාධනය කොට; සිතු, චිත්තයන්; බැහැර, පිටත්හි; නොලූ, නොහෙළූ; කෙළිලොල, ක්‍රීඩාලොල වූ; හිමිනඹුවො, දම්පතිහු (අඹු සැමියෝ;) එ පුර, ඒ පුරයෙහි; සඳලුවල, චන්ද්‍රශාලාවන්හි; සඳපානේ, චන්ද්‍රාලොකයෙහි; ඉඳිති, ඉඳිම කරති.

භාවය- කැලණිපුර සත්‍රී පුරුෂයෝ කොකුම් ආදිය ඇඟ ගාගෙණ කෙළිලොලින් සිත පිටතට නොහැර සඳපානේ සඳලුවල වාඩිවී සිටිත්.

ක්‍රි: ශ- හිමිනඹුවො තුනු කොකුම්සඳුනෙන් තවර සාර සුවඳමල්දම් පැලඳ සඳලුවල ඉඳිති.

උ: ක- ඉඳිති: ක්‍රියා යි. හිමිනඹුවො: උක්තකර්තෘ යි. සඳලුවල: අනුක්තාධාර යි. සාර: පෙරකිරි ය යි. තුනු: අනුක්ත ප්‍රකෘතිකර්ම යි. තවර: විකෘතිකර්ම යි. කොකුම්සඳුනෙන්: අනුක්ත කරණ යි. පැලඳ: පෙරකිරි ය යි. සුවඳමල්දම්: එහි අනුක්ත කර්ම යි,

**අන්‍වය ක්‍රියා**- නො-දූ, ලොල්.

**නො-දූ:** ක්‍රියාකාරක සි. **ලොල්:** 'ලොල' ශබ්දයෙනි. ක්‍රියාකාරක සි. **හිමිනඹුවො:** කර්‍තෘ උක්තකර්‍තෘ සි.

**සමාස**- 1 සොකුම්සඳුනෙන්. 2 සුවඳමල්දම්. 3 මනකල. 4 හිමිනඹුවො. 5 සොළිලොල. 6 සඳපානේ. 7 සඳලුවල.

**විග්‍රහ**- 1 සොකුම් ද සඳුන් ද=සොකුම්සඳුන්- ඉන්. 2 සුවඳ වූයේ ද එම මල් වූයේ ද = සුවඳමල්. සුවඳමලින් (කළ) දම්- සුවඳමල්දම්. 4 හිමි ද අඹු ද=හිමිනඹුවො. හිමිනඹුවෝ ද හිමිනඹුවෝ ද=හිමිනඹුවො (එකශෙෂ-ද අරුත්සමස්) 5 සොළියෙහි ලොල්= සොළිලොල්-සොළිලොල. සඳේ පාන=සඳපාන-එහි.

**විශෙෂ විභාග**- 'හිමි අඹුවො' යන තන්හි නකාරාගමවිධියෙන් "හිමිනඹුවො" යි සිඬ සි. සොළිලොලින් බැහැර සිත් නොයවා අඹු සැමි යුවල යුවල සිටි බව මෙහි සූචිත සි.

59 මුවලඹ රඹ වලුබර රන් තැඹිලි තු රු
සැදි ගෙළයන් ගෙවමින් වේමග අ තු රු
සරසැවෙමින් දකුණට අවුදින් මි තු රු
වදු වෙහෙරට සිහිකර නවගුණ ම තු රු

**විභක්ති**- මුව 3 ලඹ. 4 රඹ. 4 වලුබර. 4 රන්තැඹිලිතුරු 4 සැදි. 2 ගෙළයන්. 2 වේමග. 7 අතුරු. 8 දකුණට. 2 මිතුරු. 9 වෙහෙරට. 2 නවගුණමතුරු.

**පදාර්‍ථ**- වේමග, වීථිමාර්‍ගයාගේ; අතුරු, අතරෙහි වූ; මුවලඹ, මුහ එල්ලෙන්නා වූ; රඹ, කෙසෙල්ගසින් ද; වලුබර, ඵලභරිත වූ; රන්තැඹිලිතුරු, රන්තැඹිලිගසින් ද; සැදි, සජ්ජිත වූ; ගෙළයන්, ගෘහොද්‍යානයන්; ගෙවමින්, පසුකරමින්; දකුණට සරසැවෙමින්, දක්‍ෂිණාවෘත්ත වෙමින්; අවුදින්, ආගමනය කොට; නවගුණමතුරු, නවගුණමන්ත්‍ර ය; සිහිකර, මෙනෙහි කොට; මිතුරු, මිත්‍රය; වෙහෙරට, විහාරස්ථානයට; වදු, ප්‍රවිෂ්ට වෙව.

**භාවය**- මිත්‍රය තුඹ, පාරදෙවට තිබෙන ගෘහොද්‍යානයන් පසුකොට දකුණට හැරී නවඅරහාදි බුදුගුණ සිහි කොට විහාරස්ථානයට පලයන්.

**ක්‍රි: ය**- මිතුරු (තෝ) ගෙළයන් ගෙවමින් දකුණට සරසැවෙමින් අවුදින් නවගුණ මතුරු සිහිකර වෙහෙරට වදු.

**උ: ත**- **වදු:** විධික්‍රියා සි. **තෝ:** උක්තකර්‍තෘ සි. **වෙහෙරට:** අනුක්තකර්ම සි. **ගෙවමින්- සරසැවෙමින්- අවුදින්- සිහිකර-**

යන ක්‍රියාවන්ට ද **තෝ:** යනු ම උක්තකර්‍තෘ සි. **ගෙළුයන්:** 'ගෙව මින්' යන්නෙහි කර්‍ම සි. **දකුණුව:** 'කරකැවෙමින්' යන්නෙහි කර්‍ම සි. **නවගුණමතුරු:** 'සිහිකර' යන්නෙහි කර්‍ම සි.

**අඛ්‍යාතක්‍රියා**– **ලඹ, සැදි.**

**ලඹ:** 'ලම්බ' යන සෘද්ධන්තයෙන් ආයේ ය. ආධාරකාරක සි. **රඹ:** සා: උක්තාධාර සි. **සැදි:** කර්‍මකාරක සි. **ගෙළුයන්:** සා: උක්තකර්‍ම සි.

**සමාස**– 1 වලුබර. 2 රන්තැඹිලිතුරු. 4 ගෙළුයන්. 5 වේම්ග. 6 නවගුණමතුරු.

**විග්‍රහ**– 1 වලුවලින් බර=වලුබර. 3 රන්වන් තැඹිලි=රන් තැඹිලි. රන්තැඹිලි ම තුරු=රන්තැඹිලිතුරු 4 ගේ අසල වූ උයන්= ගෙළුයන් (සබඳ වි: සමස්) 7 වේහි වූ මග=වේමග. 6 නවයක් ගුණ යමක ද ඒ=නවගුණ. (සබඳ අරුත අනරුත්සමස්). නවගුණ වූයේ ද එම මතුරු වූයේ ද=නවගුණමතුරු.

**විශෙෂ විභාග**– "මුවලඹ රඹ" යන තන්හි 'මුව' යන්නෙන් ගැණෙන්නේ කෙසෙල් මලයි. වඞ්ගභාෂාවෙහි කෙසෙල්මලට 'මොචා' සි කියනු ලැබේ. 'මොචා' යන්නෙන් සිංහලට ආ ප්‍රකෘතිය 'මුහ' යනු සි. දනුදු බහුලව්‍යවහාරය 'මුහ' කියා සි. 'මුව' සි කියනොත් 'හ' යන්නට 'ව' යන්න විමෙන් වියයුතුසි. ගස්වල මුහ එල්ලෙන්නේ ලොකුකැන් සැදි අවසන්වන කාලයෙහි ය. එබැවින් මෙයින් ගැණෙන්නේ මුහ සහිත ලොකුකැන් ඇති කෙසෙල්ගසු සි.

'ගෙවමින්' යන තන්හි ධාතුව 'ගෙව' යනු සි. 'කරකැවෙමින්' යන තන්හි ධාතුව 'කරක' යනු සි. මෙහි 'ව' යන්න සවාර්ථයෙහි ප්‍රත්‍යයෙකි. 'කැරකැවෙමින්' කියා ද වහර යෙදේ. ප්‍රයොජ්‍යාර්ථ 'ව' ප්‍රත්‍යය වූ කල්හි 'කරකවමින්' යි සිඬ සි. 'අවුද්න්' යන තන්හි ධාතුව 'එ'යනුසි. නිපාතනයෙන් පූර්වක්‍රියා ප්‍රත්‍යය සහිත ධාතුවට 'අවුදින්' ආදෙශ සි.

"නවගුණ මතුරු" යන්නෙන් ගැණෙන්නේ "ඉතිපිසො භගවා" යනාදි වශයෙන් දක්වෙන බුදුගුණ නවය සි. එනම්– 1 අරහං, 2 සම්මාසම්බුද්ධො, 3 විජ්ජාචරණසම්පන්නො, 4 සුගතො, 5 ලොකවිදූ, 6 අනුත්තරොපුරිසදම්මසාරථි, 7 සත්ථා දෙවමනුස්සානං, 8 බුද්ධො, 9 භගවා, යන මේ පදයන්ගෙන් දක්වෙන ගුණ සි. මන්ත්‍ර නම් ආරක්ෂාව පිණිස කරණ ගුප්තභාෂණ සි. මේ ගුණ නවය ද බෞද්ධයන් විසින් ඒ ඒ අවස්ථාවන්හි ආරක්ෂාව පිණිස මෙනෙහි කටයුතු බැවින් බුඬ මන්ත්‍ර සි.

60 දි ග තො ක් පැතිරයිවි බුදුගුණ කියා හැ ම
ස ග මො ක් ලබනු වස් පියයුග ඔබා බි ම
යි ශ ස ක් පුරා දුටු මෙන් තුමුව මුනිඳු ම
ව ඳු ල ක් තිලකයෙහි වැඩඋන් මග පිළි ම

සිංහගණනි- දිස 2. සිරි 2. බුදුගුණ 2. හැම 2. සගමොක් 2. ලබනු 2. පියයුග 2. බිම 8. සියසක් 2. දුටු 2. තුටු 1. මුනිතුම 2. ලක්තිලකගෙහි 8. වැඩඋන් 2. මහපිළිම 2.

පදාර්ථ- හැම දිය නෙක්, මුළුලොව කොළවරකොට; පැතිරසිරි, ව්‍යාප්ත ව සිටියා වූ; බුදුගුණ, බුඩගුණයන්; කියා, කථනය කොට; සග මොක් ලබනු වස්, ස්වර්ග මොක්ෂ ලාභය පිණිස; පියයුග, පක්ෂ යුග්මය; බිම, භූමියෙහි; ඔබා, පිහිටුවා; මුනිතුම, මුනීන්ද්‍රයන් වහන්සේ; සියසක් පුරා, ස්වකීය නෙත්‍ර පූරණය කොට; දුටුමෙන්, දර්ශනය කොළෙකු මෙන්; තුටුව, සන්තුෂ්ට ව; ලක්තිලකගෙහි, ලඞ්කා තිලක නම් වූ ප්‍රතිමාගෘහයෙහි; වැඩඋන්, වැඩසිටියා වූ; මහපිළිම, මහාප්‍රතිමාවහන්සේ; වදු, වඳුව.

භාවය-මිතුර නුඹ වෙහෙරට ගොස් සගමොක් සැප ලැබීම පිණිස බුදු ගුණ කියා,මුනිඳුයන් දුටු ලෙස තුටුව ලක්තිලක විහාරයෙහි වූ මහ පිළිමයට නමස්කාර කරපන්.

**ක්‍රි: ය- නෝ බුදුගුණ කියා පිය යුග බිම ඔබා මහපිළිම වඳු.**

කා: නා- **වඳු:** විධික්‍රියා සි. **නෝ:** උක්තකර්තෘ සි. **මහපිළිම;** අනුක්තකර්ම සි. **ඔබා:** පූර්වක්‍රියා සි. **නෝ** යනු ම කර්තෘ සි. **පියයුග:** අනුක්තකර්ම සි. **බිම:** අනුක්තාධාර සි. **කියා:** පූර්වක්‍රියා සි. **නෝ** යනු ම උක්තකර්තෘ සි. **බුදුගුණ:** අනුක්තකර්ම සි.

**අප්‍රක්‍රියා- සිටි, දුටු, තුටු, (වැඩ)උන්.**

**සිටි:** සිට (සිටිමෙහි) ධාතු සි. කර්තෘකාරක සි. **බුදුගුණ:** කා: උක්ත කර්තෘ සි. **දුටු:** දිස් (දැකිමෙහි) ධාතු සි. කර්තෘකාරක සි. **නෝ;** කා: උක්තකර්තෘ සි. **තුටු:** තුස් (සතුටුවීමෙහි) ධාතු සි. කර්තෘකාරක සි. **නෝ:** කා: උක්තකර්තෘ සි. **උන්:** ඉඳ (ඉඳිමෙහි) ධාතු සි· කර්තෘ කාරක සි. **මහපිළිම:** කා: උක්තකර්තෘ සි.

සමාස- 1 බුදුගුණ. 2. සගමොක්. 3 පියයුග. 4 සියසක්. 5 මුනි තුම. 6 ලක්තිලකගෙහි. 7 මහපිළිම.

විග්‍රහ- 1 බුදුන්ගේ ගුණ=බුදුගුණ. 2 සග ද මොක් ද=සග මොක්. 3 පියවල යුග=පියයුග. 4 සිය වූයේ ද එම සක් වූයේ ද= සියසක්. 5 මුනි වූයේ ද එම උතුමා වූයේ ද=මුනිතුමා. 6 ලකට තිලක නුයි=ලක්තිලක (සබ්ඳ වි: සමස්) ලක්තිලක ම ගේ=ලක්තිලක ගේ-එහි. 7 මහ වූයේ ද එම පිළිම වූයේ ද=මහපිළිම.

**විශෙෂ විභාග**– 'දියශතන්' යන තන්හි 'නෙක්' යනු අවධි අර්ථනිපාත යෙකි. 'දිය' යනු ඒ යොගයෙහි කම්ප්‍රබන්ධ. 'ඌස්' යනු පිණිස අර්ථයෙහි නිපාත යෙකි. 'ලබනු' යනු ඒ යොගයෙහි කම්ප්‍රබන්ධ. "සියසක් පුරා දුටු මෙන් තුටුව මුනිතුම" යනාදියෙන් ගැණෙන්නේ ජීවමාන බුදුන් ඇතිතාක් බලා සතුටු වූවෙකු මෙන් ලඞ්කාතිලක විහාරයෙහි වැඩසිටින පිළිමවහන්සේ වැදපත් යන අර්ථ යි.

61 පෙ ර ද ල   නිදු දියසාඳ රට බිම් ගල   න
සු ර කු ල   හිමි රකිනුව ලක මැවූ ස   න
ම න කා ල   ඒ සමුදුර පැහැයෙන් දිමු   න
ව ඳු ස ල   පිළිම හිමි සිරි සරණසියප   ත

**විභක්ති**– පෙර 8. දලනිදු 3. දියකඳ 4. රටබිම් 2. සුරකුලහිමි 3. රකිනුව 5. ලක 8. මැවූ 7. සත 7. මනකල 7. ඒ 7. සමුදුර 7. පැහැයෙන් 4. දිමුත 7. සලපිළිම හිමි 7. සිරිසරණ සියපත 2.

**පදාර්ථ**– පෙර, පූර්වකාලයෙහි; දලනිදු, මහා සමුද්‍රයා; දියකඳ, ජලස්කන්ධයෙන්; රටබිම්, ජනපද භූමිප්‍රදෙශයන්; ගලන, නිමග්න කරණ කල්හි; ලකසත, ලඞ්කාවාසි සත්වයන්; රකිනුව, රක්ෂාකරණු පිණිස; සුරකුලහිමි, ශක්‍රයා විසින්; මැවූ, මවනලද්ද වූ; මනකල, මනොඥ වූ; ඒ සමුදුර පැහැයෙන්, ඒ සමුද්‍රයාගේ ප්‍රභායෙන්; දිමුත, දීප්තිමත් වූ; සලපිළිමහිමි, ශිලා ප්‍රතිමා ස්වාමීන්ගේ; සිරිසරණ, ශ්‍රී පාද නමැති; සියපත, ශතපත්‍රය; වඳු, වඳුව.

**භාවය**– නුඹ ඊලඟට පෙර කැලණිතිස් රජකාලයෙහි මුහුද ගැලීමෙන් රට වැනසෙද්දී ලකසත රකිනු පිණිස ශක්‍රයා මැවූ ගල්පිළිමය වැඳපත්.

**ක්‍රි: ය**– **නෝ සලපිළිමහිමි සිරිසරණසියපත වඳු.**

**උ: න**– **වඳු**: විධික්‍රියා යි. **නෝ**: උක්තකර්තෘ යි. **සිරිසරණ සියපත**: අනුක්තකර්ම යි. **සලපිළිමහිමි**: තත්සම්බන්ධ යි.

**අර්ථක්‍රියා**– **මැවූ**: මව (මැවීමෙහි) ධාතු යි. කර්මකාරක යි. **සල පිළිමහිමි**: සා: උක්තකර්ම යි.

**සමාස**– 1 දලනිදු. 2 දියසාඳ. 3 රටබිම්. 4 සුරකුලහිමි. 5 මන කල. 6 සලපිළිමහිමි. 7 සිරිසරණසියපත.

**විග්‍රහ**– දලට නිදු=දලනිදු. (සබඳ වි: සමස්) 2 දියේ සාඳ=දිය සාඳ. 3 රට ද බිම් ද=රටබිම්. 4 සුරන්ගේ කුල=සුරකුල. සුර කුලට හිමි=සුරකුලහිමි. 6 සෙලින් කළ පිළිම=සලපිළිම. සලපිළිම ම හිමිසලපිළිමහිමි. 7 සිරියෙන් යුත් සරණ=සිරිසරණ. සිය (ගණන්) පත් යමක ද ඒ=සියපත්. සිරිසරණ ම සියපත= සිරිසරණසියපත.

<u>විශේෂ විභාග</u>– 'දලනිදු' යන්න 'ජලනිධි' ශබ්දයෙන් ආයේ වේ. මෙහි නිධි ශබ්දය ආධාරාර්ථ යි. ජලයට ආධාරය යන අර්ථයෙන් මුහුදට 'ජලනිධි' යයි කියනු ලැබේ. 'දලනිදු' යන්නෙන් මෙහි ගතයුත්තේ සමුද්‍රයට අරක්ගත් දෙව විශේෂ යයි. 'රටබිම්' යන තන්හි 'රට' යන්නෙන් රටවැස්සෝ ද 'බිම්' යන්නෙන් පොළොව ද ගැණෙති. මුහුද ගැලීමෙන් ඒ සියල්ල ම විනාශවූ බව දක්වත්.

මෙහි 'පෙර' යන්නෙන් ගැණෙන්නේ කැලණිතිස් රජකාලය යි. ඒ කාලයෙහි කැලණිතිස්රජ නිරපරාධ කැලණිතිස් රහතුන් වහන්සේ කෙරෙහි ලියුමක් ගැණ සැකයක් කොට හුණුතෙල් සැලක ලැවූ බැවින් ඒ ගැණ කිපියා වූ දෙවියෝ මුහුදුදිය උතුරුවන්නට පටන්ගත්හ. ඒ ජලගැල්මෙන් කුඩාදිවයින් තවයක් හා තිස්පන්දස් පන්සියයසතරක් පටුනුගම් ද මූදුබත් වූහ. මේ ජලගැල්මෙන් ලකසත රකිනු පිණිස ශක්‍රයා විසින් මැවූ පිළිමය මෙහි සඳහන් සලපිළිම යයි. මේ රහතුන් වහන්සේ තෙල්සැලෙහිදී ම විදසුන් වඩා රහත් වූහ. විස්තර මහාවංශයෙන් දතයුතුයි.

| | | | | |
|---|---|---|---|---|
| 62 ගි | ලි | ය | නොදි සැට මහණන් බව මහ | ණ |
| ම | ලි | ය | දෙව් තෙරිඳු වැඩ හිඳ දෙසූ බ | ණ |
| දි | ලි | ය | පස් මහල්පායෙහි මිණිකිර | ණ |
| බැ | ලි | ය | හැකිවි නම් දුක වැඳ යා කල | ණ |

<u>විභක්ති</u>– ගිලිය 2. සැට 7. මහණන් 7. බවමහණ 8. මලියදෙව්තෙරිඳු 3, දෙසූ 8. බණ 2. දිලිය 2. පස්මහල් පායෙහි 8. මිණිකිරණ 2. හැකි 1. කලණ 9.

<u>පදාර්ථ</u>– සැට මහණන්; සැට නමක් පමණ වූ ශ්‍රමණයන් වහන්සේ; බවමහණ, සංසාර මහාර්ණවයෙහි; ගිලිය නොදී, ගිලෙන්නට (ඉඩ) නොදී; මලියදෙව් තෙරිඳු, මලියදෙව ස්ථවිරයන් වහන්සේ; වැඩ හිඳ, නිෂණ්ණ ව; බණ දෙසූ, ධර්මදේශනා කළා වූ; පස්මහල් පායෙහි, පඤ්ච භූමක ප්‍රාසාදයෙහි; දිලිය, දිලිසෙන්නා වූ; මිණිකිරණ, මිණිරැස; බැලිය හැකිවි නම්, නිරීක්ෂණ ය කළ හැකි නම්; කලණ, කල්‍යාණ මිත්‍රය; දුක, එය දර්ශනය කොට; වැඳ, වන්දනය ද කොට; යා, ගමන් කරව.

<u>භාවය</u>– මිතුර නුඹ සැටනමක් පමණ වූ භික්ෂූන් අර්හත් මාර්ගඵලාවබෝධ යට පමුණුවාලීම සඳහා මලියදෙව් තෙරිඳු ජවසාධ සූත්‍රය දෙසූ පස්මහල්පායෙහි මිණිකිරණ බලන්නට හැකිවුවොත් දැක වැඳ පලයන්.

**<u>ක්‍රි: ය</u>– කලණ තෝ පස්මහල්පායෙහි මිණිකිරණ බැලිය හැකිවි නම් දුක වැඳ යා.**

උ. ක– යා: විධික්‍රියායි. නෝ: උක්තකර්තෘ යි. දක-වැද: පෙර කිරිය දෙකට ද **නෝ:** යනු ම උක්තකර්තෘ යි. **මිණිකිරණ:** අනුක්ත කර්ම යි. **පස්මහල්පායෙහි:** තදාධාර යි. **වි:** ක්‍රියාවට **නෝ:** උක්ත ප්‍රකෘතිකර්තෘ යි. **හැකි:** විකෘතිකර්තෘ යි. **බැලිය:** යනු **හැකි:** යොග යෙහි සම්ප්‍රදාන යි. **නම්:** අනියමාර්ථයෙහි නිපාත යි. **කලන:** සම්බොධන යි.

අර්ථක්‍රියා– **දෙසූ,** දෙස (දෙසීමෙහි) ධාතු යි. ආධාරකාරක යි. **පස්මහල්පාය:** කා: උක්තාධාර යි. (**බණ:** අනුක්තකර්ම යි.)

සමාස– 1 බවමහණ. 2 මලියදෙව්තෙරිඳු. 3 පස්මහල්පායෙහි 4 මිණිකිරණ.

විග්‍රහ– මහ වූයේ ද එම අණ වූයේ ද=මහණ. බව ම මහණ=බව මහණ. 2 තෙර වූයේ ද එම ඉඳු වූයේ ද=තෙරිඳු, මලියදෙව් වූයේ ද එම තෙරිඳු වූයේ ද=මලියදෙව්තෙරිඳු. 3 මහල් පසක් යමෙක්හි ද ඒ=පස්මහල්. පස්මහල් වූයේ ද එම පා වූයේ ද=පස්මහල්පා– එහි. 4 මිණිවල කිරණ=මිණිකිරණ.

විශෙෂ විභාග– "ගිලිය නොදී සැට මහණන් බවමහණ" යන මෙයින් පැවසෙන්නේ මලියදෙව් තෙරිඳුන් මෙදින දහම් දෙසීමෙන් භික්ෂූන් සැටනමක් රහත් වූ බව යි. එසේ නැත්නම් උන්වහන්සේලා භවාර්ණවයෙහි ගිලෙති. බුදු සසුනේ අන්තිම රහතන්වහන්සේ මලියදෙව් තෙරුන්නාන්සේ යයි ප්‍රකට ය. මෙ කියන පස්මහල් පාය ද කැලණිවිහාරයෙහි වූ වකි.

'ගිලිය-බැලිය' යන පද භාවක්‍රියාපද යි. 'ගිලිය' යනු 'නොදී' යන පෙර කිරියෙහි කර්ම යි. 'බැලිය හැකිවි නම්' යන්නේ අර්ථය බැලීමට සමර්ථ වේ නම් යනුයි.

**63** පෙ ර උ වි ඳ ගෙ ණ ගි රි ඳ සිඳු සල ත
නැ ගි පැ හැ ද පෙ ණ ස මු ද සැව් නුමු ත
මෙ න උ ළි ඳ පැ හැ වි හි ද නෙදිගු බි ත
සැ දි ව ට ද ගෙ හි ව ළු ද ගැබ දිමු ත

විභක්ති– පෙර 8. උවිඳ 2. ගිරිඳ 2. නැගි 7. පෙණසමුද 7. සැව් 2. නුමුත 2. උළිඳ 2. පැහැ 2. නෙදිගුබිත 8. සැදි 2. වටදගෙහි 8. දගැබ 2. දිමුත 2.

පදාර්ථ– පෙර, පූර්වකාලයෙහි; උවිඳ, උපෙන්ද්‍රයා (විෂ්ණු); ගිරිඳ, මන්දරපර්වතය; ගෙණ, ග්‍රහණය කොට; සිඳු, සමුද්‍රය; සලත, අළලත කල්හි; පැහැද, ප්‍රසන්න ව; නැගි, උද්ගත වූ; පෙණසමුද, පෙණ සමූහයෙහි; සැව්, සණ්ඨානය (විලාසය); නුමුත, නොහැරියා වූ;

උළිඳු මෙන, චන්ද්‍රයා මෙන්; පැහැ, ප්‍රභාව; නෙදිගුබිත, නොයෙක් දිශාවකාශයන්හි; විහිද, විසතිණි කොට; සැදි, සජ්ජ වූ; වටදගෙහි, චෛත්‍යධාතුගෙහි; දිමුත, දීප්තිමත් වූ; දගැබ, ධාතුගර්භය; වඳු, වන්දනය කරව.

**භාවය**- නුඹ පෙර විෂ්ණු මුහුද කලඹද්දී මතු වූ පෙණගොඩක් බඳු වටදගෙහි දගැබ වැඳපන්.

**ක්‍රි:ස** - **තෝ වටදගෙහි දගැබ වඳු.**

**උ: ක**- **වඳු:** විධික්‍රියා යි. **තෝ:** උක්තකර්තෘ යි. **දගැබ:** අනුක්තකර්ම යි. **වටදගෙහි:** තදාධාර යි.

**අඤ්ඤක්‍රියා-සලන, නුමුන, සැදි.**

**සලන:** සල (සැලීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **උවිඳු:** කා උක්තකර්තෘ යි. **නුමුන:** 'න' පූර්ව මුද (මිදීමෙහි) ධාතු යි. කර්තෘ කාරක යි. **දගැබ:** කා: උක්ත. ක. තෘ යි. **සැදි:** කර්මකාරක යි. **දගැබ:** කා: උක්තකර්ම යි. (මෙහි 'සලන' යන්න කාලාර්ථ ක්‍රියා යි.)

**සමාස**- 1 උවිඳු. 2 ගිරිඳු. 3 පෙණසමුදු. 5 උළිඳු. 5 නෙදිගුබිතා වටදගෙහි. 6 දගැබ.

**විග්‍රහ**- 1 ඉඳුට දෙවනු වූයේ=උවිඳු, ඔහු. 2 ගිරිනට ඉඳු=ගිරිඳු-ඔහු. 3 පෙණවල සමුදු=පෙණ සමුදු. 4 උළුනට ඉඳු=උළිඳු. ඔහු. 5 නේ වූවෝ ද ඔහු දිගු වූවෝ ද=නෙදිගු. නෙදිගුවල බිත්=නෙදිගුබිත්=එහි. 6 ද (ගැබ) පිණිස කළ ගේ=දගේ. වට (කොට) කළ ද ගේ=වටදගේ-එහි. 7 ගැබෙහි ද යම්කා ද ඒ=දගැබ. (සබඳ අරුත අතරුත් සමස්).

**විශේෂ විභාග**- "උවිඳු" ශබ්දය "උපෙන්ද්‍ර" ශබ්දයෙන් ආයේ වේ. විෂ්ණු වාමනාවතාරයේදී ඉන්ද්‍රයාගේ බාලසහෝදර ව උපන් බැවින් "උපෙන්ද්‍ර" විය. පෙර එක්කලෙක දෙවියෝ අසුරයන් හා මිත්‍රව මන්දර පර්වතය මන්ථනය (කළඹන) දණ්ඩ ද වාසුකී නාගරාජයා පර්වතය වෙළන රැහැන ද කොට අමෘතය ගැනීම පිණිස කිරිසයුර කැළඹූහ. ඒ බව මහාභාරතයෙහි දක්වනලද:-

"මන්ථානං මන්දරං කෘත්වා තථා නෙත්‍රඤ්ච වාසුකිම්,
දේවා මථිතුමාරබ්ධාඃ සමුද්‍රං නිධිමම්භසාම්."

යන මෙයින් පැවසේ. මෙහිදී විෂ්ණු ප්‍රධාන වූ බැවින් "පෙර උවිඳ ගෙණ ගිරිඳ සිඳු සලන" යනු කීහු. මේ කැලඹීමෙන් ගත් අමෘතය පානය කොට දෙවියෝ අමර වූහ. වටදගෙහි දගැබ මේ ඇළලීමේදී නැගි පෙණගොඩ මෙන් ශුභ්‍රවර්ණ යයි මෙහි දක්වූහ.

'උළිඳු' යන තන්හි 'උළු' යනු තාරකාවන්ට නමෙකි. 'උඩු' ශබ්දයෙන් ආයේ වේ. තාරකාවන්ට ඉඳු (අධිපති) චන්‍ද්‍ර යි. "නොදිගුබිතු" යන තන්හි 'බිතු' ශබ්දය අවසානාර්ථයෙහි හෝ ප්‍රදෙශාර්ථයෙහි වැටේ.

64 දි ගු නෙ ත් නිලුපුලෙව් රතදර පබළ ර ඟ
සි රි ම ත් සුපුන්සඳ වැනි වුවන මනර ඟ
පැ හැ ප ත් ලකළ රන්වන් විලසින් ලොව ග
වැදහො ත් පිළිමහිමි වඳු පායැ පැළදි ග

විභක්ති– දිගුනෙත් 2. නිලුපුල් 2. රතදර 2. පබලරඟ 2. සිරිමත් 2 සුපුන් සඳ 2. වුවන 2. මනරඟ 2. පැහැපත් 2. ලකළ 7. රන්වන් 7. විලසින් 4. ලොවග2. වැදහොත් 2. පිළිමහිමි 2. පායැ 3. පැළදිග 8,

පදාර්ථ– නිලුපුලෙව්, නිල්උපුල්වැනි වූ; දිගුනෙත්, දීර්ඝනෙත්‍ර ඇත්තා වූ; පබළරඟ, ප්‍රවාලාකාර වූ; රතදර, රතුතොල් ඇත්තා වූ; සිරිමත්, ශ්‍රීමත් වූ; සුපුන්සඳ වැනි, සම්පූර්ණ චන්‍ද්‍රයා මෙන්; මනරඟ, මනොරඤ්ජනය කරන්නා වූ; වුවන, මුඛමණ්ඩලයක් ඇත්තා වූ; ලකළ, අලඞ්කෘත වූ; රන්වන් විලසින්, සවර්ණවර්ණරූප විලාසයෙන්; පැහැපත්, ප්‍රභාප්‍රාප්ත වූ; පැළදිගපායැ, පශ්චිම දිශාභාගයෙහි වූ ප්‍රාසාදයෙහි; වැදහොත්, ශයනප්‍රාප්ත වූ; ලොවග, ලොකොත්තම වූ; පිළිමහිමි, ප්‍රතිමා ස්වාමීන්වහන්සේ; වඳු, වන්දනය කරව.

භාවය– නුඹ පැළදිගපායෙහි රන්රුවක් මෙන් දිලිසෙමින් සැතපෙන පිළිමය වැඳපන්.

ක්‍රි: ය– නෝ පිළිමහිමි වඳු.

උ: ත– වඳු: විධික්‍රියා යි. නෝ උක්තකර්තෘ යි. පිළිමහිමි: අනුක්තකර්ම යි.

අර්ථක්‍රියා– පත්, ලකළ, (වැද) හොත්.

පත්: 'පත්ත' ශබ්දයෙන් භින්න යි. කර්තෘකාරක යි. පිළිමහිමි: කා: උක්තකර්තෘ යි. (පැහැ: අනුක්තකර්ම යි.) ලකළ: කර්මකාරක යි. රන්වන් (රූ) කා: උක්තකර්ම යි. හොත්: හොව (හෙවීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. පිළිමහිමි: කා: උක්තකර්තෘ යි. (පායැ: අනුක්තාධාර යි.)

සමාස– 1 දිගුනෙත්. 2 නිලුපුල්. 3 රතදර. 4 පබලරඟ. 6 මනරඟ. 7 පැහැපත්. 4 රන්වන්. 9 ලොවග. 10 පිළිමහිමි. 11 පැළදිග.

විග්‍රහ- 1 දික් වූ නෙත් යමෙකුට ද ඒ=දිගුනෙත්. 3 රත් වූ අදර යමෙකුට ද ඒ=රතදර. 4 පබලවල රඟ යමෙක්හි ද ඒ=පබළ රඟ. 3 මොනවට පුන්=සුපුන්, සුපුන් වූයේ ද එම සඳ වූයේ ද=සුපුන් සඳ. 6 මන රඳ නුයි=මනරඟ (සාමි වි: සමස්) 7 පැහැයට පත්=පැහැ පත්. 8 රණේ වන් යමෙක්හි ද ඒ=රන්වන්. 9 ලොවට අග=ලොවග. 11 පැළ වූවා ද ඔම දික් වූවා ද=පැළදික්– එහි.

විශෙෂ විභාග– 'සිරිමත්' ප්‍රත්‍යයාන්ත නාම යි. සිරි ඇතියේ=සිරිමත් යනු විග්‍රහ යි. ඇති යන අර්ථයෙහි 'මත්' ප්‍රත්‍ය යයි. 'රන්වන්' යන්නෙහි අන්‍යපදය 'රැ' යනුයි. එය අධ්‍යාහාර වශයෙන් ගැණෙ. 'වැදහොත්' යන තන්හි 'වැද' යනු පෙරකිරියකි. වද (පිවිසුම්හි) යනු එහි ධාතු යි. මෙහි එය නැතත් 'හොත්' යන්න පමණකුදු සෑහේ, 'හොත්' යන්න 'ඔත්' කියා ද යෙදේ. මේ පිළිමය ඔත් පිළිමයෙකි (සැතපෙන පිළිමයෙකි.)

| | | | |
|---|---|---|---|
| 65 අ | හ | සින් අවුත් මිණිඅක්නසිඳු යැදුම | ට |
| ර | හ | තන් මැදෙහි වැඩ හිඳ මිණිපලඟ පි | ට |
| ද | හ | මුන් දෙසූ තැන සාළ සැටරියන් කො | ට |
| ම | හ | දගැප් හිමින් වඳු සොළොස තැන් සි | ට |

විභක්ති–අහසින් 4. මිණිඅක්නසිඳු 7. යැදුමට 5. රහතන් 7. මැදෙහි 8. මුනි 3. මිණිපලඟ 7. පිට 8. දහම් 2. දෙසූ 8. තැන 8. සාළ 2. සැටරියන් 2. මහ දගැප්හිමින් 3. සොළොසතැන් 8.

පදදර්ථ– මිණිඅක්නසිදු, මණ්‍යක්ෂික නාගරාජයාගේ; යැදුමට, යාච්ඤාවට; මුනි, සර්වඥයන් වහන්සේ; අහසින් අවුත්, ආකාශයෙන් වැඩමවා; රහතන් මැදෙහි, රහතුන්වහන්සේලා මධ්‍යයෙහි; මිණි පලඟ පිට, රත්නපර්‍ය්‍යඞ්ක මස්තකයෙහි; හිඳ, නිෂණ්ණ ව; දහමුත් දෙසූ, දහම් දෙසීම කළා වූ ද; තැන, ස්ථානයෙහි; සැටරියන් කොට, රියන් සැටක් ඇති කොට; සාළ, කරණලද්ද වූ; මහදගැප් හිමින්, මහදගැප් ස්වාමීන්වහන්සේ; සොළොස තැන්, ශොඩශස්ථානයෙහි; සිට, නැවතී; වඳු, වන්‍දනය කරව.

භාවය-බුදුරජානන් වහන්සේ මණ්‍යක්ෂික නාගරාජයාගේ ආරාධනාව පිළිගෙණ අහසින් වැඩ ධර්මදෙශනාදිය කළ ස්ථානයෙහි සැටරියන් කොට කළ මහදගැබ සොළොසතැන් සිට වැදපන්.

ක්‍රි: ය- නෝ සොළොසතැන් සිට මහදගැප් හිමින් වඳු.

උ: ක- වඳු: විධික්‍රියා යි. නෝ: උක්තකර්තෘ යි. මහදගැප් හිමින්: අනුක්තකර්ම යි. සිට: පෙරකිරියට ද නෝ: යනුම කර්තෘ යි. සොළොසතැන්: අනුක්තාධාර යි.

අන්වයක්‍රියා– දෙසූ, කළ–දෙසූ: දිස් (දෙසීමෙහි) ධාතු යි. ආධාර කාරක යි. තැන: සා; උක්තාධාර යි. කළ: කර්තෘකාරක යි. මහ දගැප්හිමි: සා: උක්තකර්තෘ යි.

සමාස– 1 මිණිඅක්නයිදු. 2 මිණිපලඟ. 3 සැටරියන්. 4 මහ දගැප්හිමින්. 5 සොළොසතැන්.

විග්‍රහ– 1 මිණි වැනි අක් යමෙකුට ද ඒ=මිණිඅක්. නයි ද එම ඉදු ද= නයිදු. මිණිඅක්ම නයිදු= මිණිඅක්නයිදු. 2 මිණියෙන් කළ පලඟ=මිණිපලඟ. 3 සැටක් රියන් යමක්හුගේ ද ඒ=සැටරියන්. තැන් සොළොසක් එක් කොට සලකනලද්දහු=සොළොසතැන්.

විශේෂ විභාග–බුදුරජාණන් වහන්සේ බුදුබව ලැබීමෙන් පස්වනවසෙහි නාගදීපයට වැඩි ගමනේදී මණිඅක්ඛි නම් නාරජ එහිදී ඔහුගේ භව නය වූ කල්‍යාණී නාගභවනයටත් වැඩම වීම පිණිස ආරාධනා කෙළේ ය. එය පිළිගත් බුදුරජාණන් වහන්සේ බුදුබවට පැමිණි අටවෙනි වසෙහි පන්සියයක් රහතුන් සමග එහි වැඩ නාරජු විසින් පිළියෙල කරණලද රත්නමණ්ඩපයෙහි පන්සියයක් රහතුන් සමග වැඩහිඳ දන් වලඳ අවසානයෙහි දහම් දෙසීම ද කළ සේක. ඒ ස්ථානයෙහි කරවන ලද්දේ මේ මහදගැබයි. මේ දාගැබට සොළොස තැන් සිට වඳින්නට අණකරණ ලද්දේය. ඒ ඒ දාගැප්වල වටප්‍රමාණයේ හැටි යට සිවුතැන් අටතැන් සොළොස්තැන් ආදී වශයෙන් ඒ ඒ තැන්වල සිට වැඳීම සාධුසම්මත සිරිත් වෙසෙසක් බව පෙනේ.

'දහමුත්' යන තන්හි 'උත්' යන්න සමුච්චයාර්ථ නිපාතයෙකි. එය සංස්කෘත 'උත' යන නිපාතයෙන් ආයේ වේ. මෙයින් සමුච්චය කරණු ලබන්නේ දන් වැලඳීම් ආදිය යි. ඒ ස්ථානයෙහි දන් වැලඳීම් ආදිය ද කළ බැව්නි.

66 ස ව න සතිය වැසි වසි නා දසදි ගෙ හි
පෙණින සෙවෙනි මුදලිඳු නා දරණ ගෙ හි
ස ව න හිඳිනු දන නඳ නා නෙතුසු ගෙ හි
ව ඳි න මැනවි පි ළි ම ය නා පිළිම ගෙ හි

විභක්ති–සවන 8. සතිය 8. වැසි 3. වසිනා 8. දසදිගෙහි 8. පෙණින 4, සෙවෙනි 8. මුදලිඳුනා 7. දරණගෙහි 8. සවන 7. හිඳිනු 2. දනන් 7. අඳනා 2. නෙතුයුගෙහි 8. වඳින 1. පිළිමය 2. නාපිළිමගෙහි 8.

පදාර්ථ–දසදිගෙහි, දශදිශායෙහි; වැසි වසිනා, වර්ෂණය කරන්නා වූ; සවන සතිය, ෂඩ්සප්තාහයෙහි; මුදලිඳුනා, මුචලින්දනාග යාගේ; පෙණින, පෙණය කරණ කොට ගෙණ; සෙවෙනි, ඡදන වත් වූ; දරණගෙහි, භොගාවලිගෘහයෙහි; සවන, සර්ෂදයන්වහන්

සේගේ; හිඳිනු, වැඩහිඳීම; දනන්, ජනයන්ගේ: නෙතුයුගෙහි, නෙත්‍රයුග්මයෙහි; අඳනා, අජනය කරන්නා වූ; (දක්වන්නා වූ); නාපිළිමගෙහි, නාගප්‍රතිමා ගෘහයෙහි; පිළිමය, ප්‍රතිමාව; වඳින මැනවි, වැඳීම කරපති.

<u>භාවය</u>– සර්වඥයන්වහන්සේ බුදුබවට පැමිණීමෙන් සවන සතියෙහි මුච ලින්ද නාගරාජයාගේ දරණවැල තුළ වැඩ සිටි ආකාරයට කරවනලද නා පිළිම ගෙහි පිළිමය වැඳපන්.

**<u>ක්‍රි; ප</u>- නාපිළිමගෙහි පිළිමය වඳින මැනවි වේ.**

**<u>උ: ක</u>- වේ:** අධ්‍යාහෘත ක්‍රියා යි. **වඳින:** උක්තප්‍රකෘති කර්තෘ යි. **මැනවි:** විකෘති කර්තෘ යි. **පිළිමය:** 'වඳින' යන භාවක්‍රියායෙහි කර්ම යි. **නාපිළිමගෙහි:** තදධාරයි.

**<u>අර්ථක්‍රියා</u>– වසිනා, අඳනා.**

**වසිනා;** වස් (වැසි වැස්මෙහි) ධාතුයි. ආධාරකාරකයි. **සවන සතිය:** කා: උක්තාධාරයි. **අඳනා:** අඳ (ඇඳීමෙහි) ධාතුයි. කර්තෘ කාරකයි. **පිළිමය:** කා: උක්තකර්තෘ යි.

<u>**සමාස**</u>– 1 දසදිගෙහි. 2 මුදලිඳුනා. 3 දරණගෙහි. 4 නෙතුයු ගෙහි. 5 නාපිළිමගේ. 6 දරණගෙහි.

<u>**විග්‍රහ**</u>– 1 දික් දසයක් එක්කොට සලකන ලදහු=දසදික්– එහි. 2 මුදලිඳු ම නා=මුදලිඳුනා. 3 දරණ ම ගේ=දරණගේ–එහි. 4 නෙත් වල යුග=නෙතුයුග-එහි. 5 නයා කොරෙහි (නාදරණෙහි වූ) පිළිමය= නාපිළිමය. නාපිළිමයට කළ ගේ= නාපිළිමගේ එහි .6 දරණ ම ගේ= දරණගේ– එහි.

<u>**විශෙෂ විභාග**</u>– බුදුන් බුදුවීමෙන් සවනසතියෙහි මිදෙල්ල රුකමුල වැඩසිටිද්දී වස්සවලාහකයාගේ සතුටින් මෙන් සත්දවසක් නොකැඩී පවත්නා සත්තාහවද්දලිකා නම් වූ මහාමෙඝයක් ඇති විය. එකල්හි මුචලින්දනාගරාජයා සර්වඥයන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙහි නො හැපෙන ලෙස දරණ සත්වටක් කොට පෙණමඩලින් වසාගෙණ සිටි බව අත්‍ථකථාදියෙහි පෙනේ. කැලණි වෙහෙර නාපිළිම ගෙහි වූ පිළිමය ද යටාලතිස්ස රජ විසින් ඒ ආකාරයට කර වන ලද්දකි.

**67 ස ස රි න් මුදු ලෙව් සඳහම් අ මා දී**
**ඡ ක ගි න් මුනිඳු හුන් වැනි නිසර මා දී**
**ලකුණෙන් සපිරි පිළිමග දැක ස මා දී**
**වැ ඳ ග න් මිතුර තුන්ගින හර ස මා දී**

විභක්ති- සසරින් 6. ලෙව් 2. සදහම් අමා 2. එකඟින් 4. මුනිඳු 3. හුන් 2. නිපරමාදි 3 ලකුණෙන් 4. සපිරි 2. පිළිමය 2. සමාදි 2. මිතුර 9. තුන්සිත 7. සමාදි 2.

පදාර්ථ- සදහම් අමා, සද්ධර්ම නමැති අමෘතය; දී, දානය කොට; ලෙව්, ලොකසත්‍වයා; සසරින්, සංසාරයෙන්; මුද, මුක්ත කොට; නිපරමාදි, සමෘතිවිප්‍රවාස රහිත වූ; මුනිඳු, මුනීන්ද්‍රයන් වහන්සේ; එකඟින්, චිත්තෙකාග්‍රතායෙන් (යෙදී); හුන් වැනි, වැඩ උන්නාක් වැනි වූ; ලකුණෙන්, ලක්ෂණයෙන්; සපිරි, සම්පූර්ණ වූ; සමාදි පිළිමය, සමාදි නම් පිළිමය; දක, දර්ශනය කොට; මිතුර, මිත්‍රය; තුන්සිත, ත්‍රිවිධ චිත්තය; සමාදි කර, සමාධි කොට (එකඟ කොට); වැඳගන්, වන්දනය කරව.

භාවය-මිතුර නුඹ, සර්වඥයන්වහන්සේ සමාධියට පැමිණ වැඩහුන් විලසට කරවා තිබෙන සමාදි පිළිමය තුන්සිත පහද වැඳගන්.

ක්‍රි: ය- මිතුර නෝ තුන්සිත සමාදි කර සමාදිපිළිමය දක වැඳගන්.

උ: ක-වැඳගන්. විධික්‍රියා සි. නෝ: උක්තකර්තෘ සි. සමාදිපිළි මයඅනුක්තකර්මසි. දක: පෙරකිරියට ද නෝ යනුම කර්තෘසි. සමාදි පිළිමය: අනුක්තකර්ම සි. කර: පෙරකිරියට ද, නෝ: යනු ම කර්තෘසි. සමාදි: කර්මසි. තුන්සිත: තත්සම්බන්ධ සි.

අප්‍රධානක්‍රියා- සපිරි: කර්තෘකාරක සි. පිළිමය: කා: උක්ත කර්තෘ සි.

සමාස-1 සදහම් අමා. 2 මුනිඳු. 3 නිපරමාදි. 4 තුන්සිත.

විග්‍රහ- සදහම් ම අමා= සදහම්අමා. 3 පරමාද නැත්තේ= නිපර මාද –නිපරමාදි. 4 සිත් තුණක් එක් කොට සලකනලදහු= තුන්සිත.

විශෙෂ විභාග-සසර නම් ස්කන්ධයන්ගේ හා ධාතු ආයතනයන්ගේ නුසුන්ව පවත්නා පිළිවෙළ යි. නිවණට පැමිණීකල සත්‍වයා සසරින් මිදුණේ වේ. 'එකඟ' යන්න පාලි 'එකග්ග' ශබ්දයෙන් ආයේ වේ. 'එකග්ග' යන තන්හි 'අග්ග' ශබ්දය ශ්‍රමනාර්ථ යි. සිත එක් අරමුණකට පැමිණ පවතී නම් ඒ සිත 'එකග්ග'නම් වේ. 'හුන්' යන්නෙන් ඇඟෙන්නේ මේ පිළිමය වැඩ ඉන්න ආකාර පිළිමයක් බව යි. 'නිපරමාදි' යන තන්හි'පරමාද' යන්න'ප්‍රමාද'ශබ්දයෙන් ආයේ වේ. එය 'නි' යන අව්‍යය සමග අන්‍යාර්ථ සමාස වීමෙන් 'නිපරමාද' යි සිඩ යි. අකුරු සම කිරීමට 'නිපරමාදි' යි යෙදිනා. අන්‍යාර්ථ සමාසයෙන් ඇති යන අර්ථය ලැබෙන බැවින් අස්ත්‍යර්ථයෙහි 'ඉ' ප්‍රත්‍යය යෙදීම නිරර්ථක ය. කටයුතු නොකටයුතු විෂයෙහි මුළානත්ය 'පරමාද' යයි. එබඳු මුළා ගතියක් නැත්තේ 'නිපරමාද'යි. මෙහි 'ලකුණෙන් සපිරි' යන්නෙන් ගැණෙන්නේ සමාධිලක්ෂණ

සොත් සම්පූර්ණ බව යි. මේ ටළිම්ය සමාදි පිළිමය බැව්නි. සිත එකඟ කොට ඉන්න විට ඇතිවිය යුතු සියලු ලකුණුවලින් මේ පිළිමය පිරිතුබුනු බව දක් වේ. 'තුන් සිත' නම් පින් කරණ විට ඇතිවිය යුතු-පූර්වචේතනා, මුඤ්චනචේතනා, අපර චේතනා යන චේතනා තුනෙන් යුත් සිත යි. එහි කර්මය කරන්නට පෙර ඒ පිළිබඳව උපදනා චේතනාව පූර්වචේතනාවයි. කර්මය කරණවිට උපදනා චේතනාව මුඤ්චන චේතනාව යි. කර්මය කර අවසන් වූ විට ඒ පිළිබඳව උපදනා චේතනාව අපර චේතනාව යි. මේ අවස්ථා තුනෙහි ම සිත පිරිසිදු විය යුතුයි. එලෙසින් කළ පින්කම මහත් ඵල ගෙණ දෙන්නේ වේ.

68 අ ප මු නි ඳු   බුදු වන දින මුරුන් පි   ඳූ
පැහැ විහිඳූ   දිලි කාලඳේ යටින් යෙ   ඳූ
සැදි සි නි ඳු   ඉඳුනිල්මිණි සතෙකා බ   ඳු
වැ ඳ දු මි ඳු   වන පින්පල න අත් බ   ඳු

විභාගයි– අප 7. මුනිදු 3. බුදු 2. වන 8. දින 8. මුරුන් 3, පිදූ 7. පැහැ 3. විහිදූ 4. දිලි 4. කාලඳෙයටින් 4. යෙදු 7. සැදි 7, සිනිදු 7. ඉදුනිල්මිණිසත් 7. එකාබදු 2. දුමිදු 2, වන 2. පින්පල 2. න 7. අත් 8.

පදාර්ථ– අප, අපගේ; මුනිඳු, මුනීන්ද්‍රයන් වහන්සේ; බුදුවන දින, බුද්ධත්වයට පැමිණෙන දිනයෙහි; මුරුන්, දෙවියන් විසින්; පිදූ, පුදන ලද්දා වූ; පැහැ, ප්‍රභාව; විහිදූ, පැතුරුණා වූ; දිලි, බබලන්නා වූ; කාලඳෙයටින්, කාලධෞත (රිදී) මිටකින්; යෙදූ, යොදන ලද්දා වූ; සැදි, අලඞ්කෘත වූ; සිනිදු, සනිග්ධ වූ; ඉදුනිල්මිණිසත් එකාබදු, ඉන්ද්‍රනීල මාණික්‍ය ඡත්‍රයකට සමාන වූ; දුමිදු, ද්‍රුමෙන්ද්‍රයන් (බොධිරාජයන්); වැඳ, වන්දනය කොට; වන, සිදුවන්නා වූ; පින්පල, පුණ්‍ය ඵලය; න, යුෂ්මත්හුගේ; අත් බදු, හස්තයෙහි බැඳගණුව (හස්ත ප්‍රාප්ත කර ගණුව.)

කි: ය– නෝ දුමිඳු වැඳ පින්පල න අත් බඳු.

උ: ක– බඳු: විධික්‍රියා යි. නෝ: උක්තකර්තෘ යි. පින්පල: අනුක්තකර්ම යි. අත්: අනුක්තාධාර යි. න: තත්සම්බන්ධ යි. වැඳ: පෙරකිරියට ද නෝ යනු ම කර්තෘ යි. දුමිඳු: අනුක්තකර්ම යි.

අංගක්‍රියා– වන, පිදූ, විහිදූ, දිලි, යෙදූ, සැදි, වන.

වන: ආධාරකාරක යි. දින: කා: උක්තාධාර යි. (බුදු: අනුක්තකර්ම යි. මුනිඳු: අනුක්ත කර්තෘ යි.) පිදූ: පුද (පිදීමෙහි) ධාතු යි. කර්මකාරක යි. ඉදුනිල්මිණිසත්: කා: උක්තකර්ම යි. (මුරුන්: අනුක්තකර්තෘ යි.) විහිදූ: විහිද (විහිදීමෙහි) ධාතු යි. අවධිකාරක යි. කාලඳෙයට: කා: උක්ත අවධි යි. (පැහැ: අනුක්තකර්තෘ යි.) දිලි:

දල (දිලිහිමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **කලධෞතයට:** සා: උක්ත කර්තෘ යි. **සෙඳු:** කර්මකාරක යි. **ඉඳුනිල්මිණියක්.** සා: උක්ත කර්ම යි. **සැදි:** කර්මකාරක යි. **ඉඳුනිල්මිණිසත්:** උක්තකර්ම යි. **වන:** කර්තෘකාරක යි. **පින්පල:** සා: උක්තකර්තෘ යි.

<u>සමාස</u>- 1 මුනිඳු. 2 කලධෞතයටින්. 3 ඉඳුනිල්මිණිසත්. 4 දුමිඳු. 5 පින්පල.

<u>විග්‍රහ</u>- 2 කලධෞතයෙන් කළ යට=කලධෞතයට. ඉන්. 3 ඉඳු වැනි නිල යමෙකුගේ ද ඒ= ඉඳුනිල්. ඉඳුනිල් වූයේ ද එම මිණි වූයේ ද= ඉඳුනිල්මිණි, ඉඳුනිල්මිණි යොදා කළ සත=ඉඳුනිල්මිණිසත්. 4 දුම වූයේ ද එම ඉඳු වූයේ ද=දුමිඳු. 5 පිණේ පල=පින්පල.

<u>විශෙෂ විභාග</u>- 'කලධෞ' යනු 'කලධෞත' ශබ්දයෙන් ආයේ ය. ඉන් 'රන්-රිදී' දෙකම වාච්‍ය වේ. මෙහි කලධෞයට බෝගහේ කඳට සම වූ හෙයින් 'කලධෞ' යන්නෙන් රිදී ගතයුතු යි. 'ඉඳුනිල්මිණි' නම් මරකත මාණික්‍ය ය යි. එය කිරේ ලූ කල කිර නිල්වන් වන්නේ ලු. ඒ බව-

"ක්ෂීරමධ්‍යෙ ක්ෂිපෙත්නීලං ක්ෂීරං චෙත්නීලතාං ව්‍රජෙත්,
ඉන්ද්‍රනීලමිති ඛ්‍යාතං තද්ධි රත්නකොවිදෛඃ"

69 වි ට ං කා පැකිලිඳු දකුණස දෙරටුයෙ න
නි ස ං ඛා යෙන් පුදනන් තුරු ගොසසම් න
කා ල ං කා නොව කළ සුබ ලකුණු බබල න
ති ව ං කා නම් දෙපිළිම නැමද බැස ගෙ න

<u>විභක්ති</u>- විටංකපැකිලිඳු 6. දකුණසදෙරටුයෙන 6. නිසංඛායෙන් 4. පුදනන්තුරුගොස් 2. කලංක 2. කළ 4. සුබලකුණු 4. බබලන 2. තිවංක 2. දෙපිළිම 2.

<u>පදාර්ථ</u>- විටංක, කොබෝගෙඩිවලල්ලෙහි; පැකිලි, ප්‍රස්ඛලිත වූ (හැපුනා වූ); ඉඳු, චන්ද්‍රයා ඇති; දකුණසදෙරටුයෙන, දකුණුපස දෙරටුයෙන් (නික්ම); පුද, පූජාපිණිස වූ; නන්තුරුගොස්, නොයෙක් තූර්යනාදයන්; නිසංඛායෙන්, නිසැක ව; අසමින, ශ්‍රවණය කරමින්; කලංක නොව, අකලඞ්කව (දොස් නැතිව); කළ, කරණලද්දා වූ; සුබලකුණු, ශුභ ලක්ෂණයෙන්; බබලන, බබලන්නා වූ; තිවංකනම්, තිවංක නම් වූ; දෙපිළිම, ප්‍රතිමා දෙදෙනාවහන්සේ; නැම ද, වැඳ; බැසගෙණ, අවතීර්ණව (මතුසම්බන්ධ යි).

70 ස ම නො ළ ගිරිගිජිඳු දිගුකළ සොඬෙක සැ ඩි
සි හි ල ළ ගග සිලිල් සනහා මුනි නොගැ ඩි
පැ හැ දු ළ කුන්සිඹුරු ඇඳ පෙරව වැඩ සි ඩි
කැ න කා ළ සිඹුරු දගැබ වඳු නොපැ පි ඩි

**විභක්ති**-සමනොළගිරිගිජිඳු 3. දිගුසළු 7. සොඬ 7. එකසැටි 8. සිහිල් 3. අළු 8. ගඟ 8. සිලිල් 2. මුනි 3. නොගැටි 3. පැහැදුළු 2. තුන්සිවුරු 2. (වැඩ) සිටි 8. තැන 8. කළු 2. සිවුරුදගැබ 2. පිටි 2.

**පදාර්ථ**- සමනොළගිරි, සමන්තකූට පර්වත නමැති; ගිජිඳු, ගජේන්ද්‍රයා විසින්; දිගුසළු, ප්‍රසාරණය කරණලද්දවූ; සොඬෙකසැටි, සොඬවැලකට සමාන සටහන් ඇත්තා වූ; සිහිලළු, ශීතභාවය එළවූ; ගඟ, ගඞ්ගායෙහි; නොගැටි, වීතරාග වූ; මුනි, සර්වඥයන්වහන්සේ; සිලිල් සනහා, ජලස්නානය කොට; පැහැදුල, ප්‍රභායෙන් උජ්ජ්වලිතවූ; තුන්සිවුරු, ත්‍රිචීවරය; ඇඳපෙරව, නිවාසන පාරුපණ කොට; වැඩසිටි, වැඩසිටියාවූ; තැන, ස්ථානයෙහි; කළු, කරණලද්දවූ; සිවුරු දගැබ, චීවරධාතුගර්භය; පිටි නොපෑ, පරාම්මුඛ නොව; වඳු, වන්දනය කරව.

**භාවය**- නුඹ දකුණුපස දෙරටුවෙන් ඇතුල්ව තිවංක පිළිම දෙසා වැද ඉන් පහලට බැස බුදුහාමුදුරුවන් කැලණිගඟේ ජලස්නානය කොට ගොඩනැගී තුන්සිවුරු ඇඳ පොරවා වැඩසිටිතැන කළ සිවුරුදගැබ ද වැඳපන්.

**ක්‍රි: ය- තෝ දෙපිළිම වැඳ බැසගෙන පිටි නොපෑ සිවුරු දගැබ වඳු.**

**උ: ක- වඳු:** විධික්‍රියා යි. **තෝ:** උක්තකර්තෘ යි. **සිවුරුදගැබ:** අනුක්තකර්ම යි. **නොපෑ:** පෙරකිරියට **පිටි** අනුක්තකර්ම යි. **වැඳ:** පෙරකිරියට **දෙපිළිම:** අනුක්තකර්ම යි. **බැසගෙන:** පෙරකිරියට ("පහලට" යනු අධ්‍යාහෘත අනුක්තකර්ම යි).

**අනුක්‍රියා- පැකිළි, කළ, බබලන, (දිගු) සළ, අළ, දුළ, සිටි, කළ,**

**පැකිළි:** පැකිල (පැකිලීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **ඉඳු:** කා: උක්තකර්තෘ යි. **කළ:** කර්මකාරක යි. **දෙපිළිම:** කා: උක්තකර්ම යි. **බබලන:** කර්තෘකාරක යි. **දෙපිළිම:** කා: උක්තකර්තෘ යි. (දිගු) **සළ;** කර්මකාරක යි. **සොඬ:** කා: උක්තකර්ම යි. **අළ:** එළ (එළවීමෙහි) ධාතු යි. ආධාරකාරක යි. **ගඟ:** කා: උක්තාධාර යි. **දුළ:** කර්තෘකාරක යි. **තුන්සිවුරු:** කා: උක්තකර්තෘ යි. **සිටි:** ආධාරකාරක යි. **තැන:** කා: උක්තාධාර යි. **කළ:** කර්මකාරක යි. **සිවුරු දගැබ;** කා: උක්තකර්ම යි.

**සමාස** · 1 විටංකපැකිළිදු. 2 දකුණසදෙරටුයෙන. 3 තිසංක යෙන්. 4 පුදනන්නුරුගොස්. 5 සුබලකුණු. 6 තිවංක. 7 දෙපිළිම. 8 සමනොළ ගිරිගිජිඳු. 9 දිගුසළු. 10 එකසැටි. 11 නොගැටි. 12 පැහැදුල. 13 තුන්සිවුරු. 14 සිවුරුදගැබ.

<u>විග්‍රහ</u>– 1 විටංකයෙහි පැකිලි ඉඳු යමෙක්හි ද ඒ=විටංක පැකිළිඳු. 2 දකුණ ම අස=දකුණස. දකුණසෙහි දෙරටුව=දකුණස දෙරටුව–ඉනි. 3 සංඛ (සැක) නැත්තේ=නිසංඛ-ඉනි. 4 තත් වූවෝ ද ඔහු තුරු වූවෝ ද=තන්තුරු. තන්තුරුවල ගොස්=තන්තුරු ගොස්. පුද පිණිස වූ තන්තුරුගොස්=පුදතන්තුරුගොස්. 6 වංක තුණක් යමක්හුගේ ද ඒ=තිවංක. 8 සමතොළ වූයේ ද එම ගිරි වූයේ ද=සමතොළගිරි. සමතොළ ගිරි ම ගිජිඳු=සමතොළගිරිගිජිඳු. 9 දිගු නුවූවක් දිගු වූවක් සොළේ නුයි=දිගුසාළ. 10 එක් (සම) සැටි යමක ගේ ද ඒ=එකසැටි. 11 ගැට නැත්තේ=නිගැටි. 12 සිවුරම දෑ=සිවුරු දෑ, ගැබෙහි සිවුරු දෑ යමෙක්හි ද ඒ=සිවුරුදෑගැබ.

<u>**විශේෂ විභාග**</u>– "විටඞ්ක, තිස්සඞ්ක, කලඞ්ක, තිවඞ්ක" යනු පාලි ශබ්ද යි. "විටඞ්ක" නම් ප්‍රාසාදදිය මතුයෙහි ලීවලින් සාද තබන පරෙවිකූඩු යි. මෙහි කී දකුණුපස දෙරටුව මතුයෙහි තුබුනු විටංකයෙහි සඳ හැපෙන බව කීමෙන් ඒ දෙරටුව එපමණ උස්සයි හඟවති. 'දෙරටුයෙන' යනු උපාන්ත විෂයාවධි යි. අවදි විබත යෙදීමට සුදුසු ක්‍රියාවිශෙෂයක් නැති සමහර තන්හි එබඳු කිරිය වෙසෙසක් අධ්‍යාහාර වශයෙන් ගෙණ අරුත් පැවසීමට ද අව දිය යෙදීම පාලි සංස්කෘතයන්හි ද රීතියකි. එබැවින් මෙහිද 'නික්ම' යන කිරිය වෙසෙස අධ්‍යාහෘත යි. මෙහි 'නිසංකයෙන්'යි කීයේ තුයර්ඝොෂය ඇසෙනවිට සැළලිහිණියාට භය ඇතිවිය හැකි බැවින් නිර්භය කිරීම සඳහා ය.

"කලංක නොව කළ" යන තන්හි කලංක යන්නේ අර්ථය 'දෝෂ' යනු යි. මේ වාක්‍යඛණ්ඩයේ අර්ථය 'දෝෂ නැතිසේ' යනු යි. සිංහලයෙහි පෙරකිරිය පද බොහෝ අර්ථවල යෙදෙන බව පෙනේ. 'ව' යන පූර්වක්‍රියාව 'නො-ඇති' යනාදි පදයක් සමග යෙදෙන බොහෝ තන්හි ක්‍රියාවිශෙෂණාර්ථය ගෙණදේ. "කලංක නොව" යන තන්හි ද එසේ යි. සමහර තන්හි පූර්වක්‍රියාව ප්‍රතිෂෙධාර්ථයෙහි ද යෙදේ. 'දීලා කුමටද' යනාදියෙහි මෙනි. මෙහි අර්ථය නොදියයුතු යනු යි. එය "අලං දත්වා" යනාදි වශයෙන් සංස්කෘතයෙහි ද යෙදේ. 'දීලා අවසන්විය' යන තන්හි 'දීලා' යන පෙරකිරිය හෙත්වර්ථ යි. දීමෙන් (දීම හෙතුකොට ගෙණ) අවසන්විය යන අර්ථ යි. මේ ක්‍රියාවිශෙෂයේ මිශ්‍රක්‍රියාර්ථය හා පූර්වක්‍රියාර්ථය ප්‍රකට ය.

"නොගැටි" යන්න 'නො' නිපාතය හා "ගැට' ශබ්දය සමාසවීමෙන් සිඬ යි. 'ගැට' යනු පාලි "ගන්ථ" ශබ්දයෙන් ආයේ වේ. සත්වයා සංසාරයෙහි බඳින අර්ථයෙන් ලොභාදි කෙලෙස් වලට "ගන්ථ" යයි ද කියනු ලැබේ. තුන්සිවුරු නම්– අඳනය, තනිපට සිවුර, දෙපට සිවුර, යනු යි. 'වැඩසිටි' යන තන්හි 'වැඩ' යන්න ගෞරවාර්ථ යි. 'වැඩ' යන්න 'ගමන්කොට-වර්ධනය කොට' යනාදි අර්ථ වල ද යෙදේ. නිදසුන් ප්‍රකට යි.

71 නිරිඳුන් කැලණිතිස් නිවැරදි රහත් නැ න
සැකයෙන් ලැවූ හුණුකෙල් සැළ තුබූ නැ න
බැතියෙන් පිණැතියන් සාළ විසිතුරු විම න
වැඩහුන් පිළිම හිමි නමඳින් යහදස න

විභක්ති– තිරිඳුන් 3. කැලණිතිස් 3. තිවැරදි 2. රහත්තැන 2. සැකයෙන් 4. ලැවූ 3. හුණුතෙල්සැළ 2. තුබූ 8. තැන 8. බැතියෙන් 4. පිණැතියන් 3. කළ 8. විසිතුරුවිමන 8. වැඩහුන් 2. පිළිමහිමි 2. යහදසන 9.

පදාර්ථ– කැලණිතිස් තිරිඳුන්, කල්‍යාණතිස්ස නරේන්ද්‍රයන් විසින්; සැකයෙන්, ශඞ්කාවක් කරණකොට ගෙණ; තිවැරදි, නිර්දෝෂ වූ; රහත්තැන, රහතුන්වහන්සේ; ලැවූ, ප්‍රක්ෂෙපකරවූ; හුණුතෙල්සැළ, උෂ්ණතෛලස්ථාලිය; තුබූතැන, ස්ථාපිතස්ථානයෙහි; පිණැතියන්, පුණ්‍යාර්ථීන් විසින්; බැතියෙන්, භක්තියෙන්; කළ, කරණලද්දවූ; විසිතුරුවිමන, විචිත්‍ර විමානයෙහි; වැඩහුන්, උපවිෂ්ට වූ; පිළිමහිමි, ප්‍රතිමාස්වාමීන්වහන්සේ; යහදසන, ප්‍රියදර්ශනය (මිත්‍රය); නමදින්, නමදුව.

භාවය– තුඹ කැලණිතිස් රජහු විසින් නිර්දෝෂ කැලණිතිස් තෙරුන් වහන්සේ හුණුතෙල් සැලෙහි බහාලූ තැන කරවාතිබෙන පිළිමය ද වැඳපන්.

ක්‍රි: ය– යහදසන තෝ පිළිමහිමි නමදින්.

උ: ක– නමදින්: විධික්‍රියා යි. තෝ: උක්තකර්තෘ යි. පිළිමහිමි: අනුක්තකර්ම යි. යහදසන: සම්බොධන යි.

අඞ්ගක්‍රියා– ලැවූ, තුබූ, කළ, (වැඩ) හුන්.

ලැවූ: ලා (ලෑමෙහි) ධාතු යි. (සප්‍රයොජ්‍ය) ආධාරකාරක යි. හුණුතෙල්සැල: කා: උක්තාධාර යි. තුබූ: තබ (තැබීමෙහි) ධාතු යි. ආධාරකාරක යි. තැන: කා: උක්තාධාර යි. කළ: කර්මකාරක යි. විසිතුරුවිමන: කා: උක්තකර්ම යි. (වැඩ) හුන්: කර්තෘකාරක යි. පිළිමහිමි: කා: උක්තකර්තෘ යි.

සමාස– 1 තිරිඳුන්. 2 තිවැරදි. 3 රහත්තැන. 4 හුණුතෙල් සැළ. 5 විසිතුරුවිමන. 6 පිළිමහිමි. 7 යහදසන.

විග්‍රහ- 2 වැරදි නැත්තේ=තිවැරදි. 3 රහත් වූයේ ද එම තැන වූයේ ද=රහත්තැන. 4 හුණුවූ තෙල් යමෙක්හි ද ඒ=හුණුතෙල්, හුණුතෙල් වූයේ ද එම සැළ වූයේ ද=හුණුතෙල්සැළ. 7 යහ වූ දසුන් යමෙකුට ද ඒ=යහදසන.

විශේෂ විභාග– 'සැකයෙන්' යන්නෙන් ගැණෙන්නේ මේ තෙරුන් නාන්සේ අගමෙහෙසිය සමග සම්බන්ධ යයි උපන් සැකයයි. 'පිණැති' යන්න 'පුණ්‍යාර්ථීන්' ශබ්දයෙන් ආයේ වේ. 'පුණ්‍යාර්ථී' නම් පින්කැමැත්තෝයි. මෙසේ වන්දනීයස්ථාන පවසා ඉක්බිති රජගෙට යාමට අණ කරන්නාහු 'පිරිසිඳ' යනාදිය කීහු.

72 පි රි සි ඳ  නොදනහැකි මෙවැඳුම් පින් පඬු  රු
මන බැඳ  රැගෙන දෙන ලෙස දූසා එසුර වි  රු
සු ර ර ද  පාය වන් විජයොත් නම් මහ  රු
එ ම ස ඳ  වඩන රජගෙට මිතුර වැඩ සා  රු

විභක්ති– (නොදත)හැකි 2. මෙ 2. වැඳුම්පින්පඬුරු 2. මන 8. දෙන 7. ලෙස 4. එ 2. සුරවිරු 2. සුරරද 7. පාය 2. විජයොත් 2. මහරු 2. එ 8. සඳ 8. රජගෙට 2. මිතුර 9. වැඩකරු 9.

පදාර්ථ– පිරිසිඳ, පරිච්ඡෙද කොට; නොදතහැකි, දැනගත නොහැක්කා වූ; මෙ, මෙකියන ලද්දවූ; වැඳුම්පින්, නමස්කාරමය පුණ්‍ය නමැති; පඬුරු, ප්‍රාභෘතයන්; එසුරවිරු, ඒ (විභීෂණ) සුරවීරයා; දූසා, දර්ශනය කොට; දෙනලෙස, දානය කරණ පරිද්දෙන්; මන බැඳ, සිතෙහි බැඳගෙණ; රැගෙණ, ග්‍රහණය කොට; සුරරද, සුරරාජයාගේ; මහරු, මහාර්හ වූ; විජයොත් නම් පාය වන්, වෛජයන්ත නම් ප්‍රාසාදය වැනි වූ; රජගෙට, රාජගෘහයට; වැඩසාරු මිතුර, අභිවෘද්ධිකාරක මිත්‍රය; එමසඳ, එකල්හි ම; වඩන, යව.

භාවය– නුඹ මේ වැඳුම්වලින් රැස්කර ගත් මහපින්සාම් විභීෂණ දෙව්දුට දීම පිණිස මෙනෙහි කරගෙණ විභීෂණ දෙවාලයට පලයන්.

ක්‍රි: ය– මිතුර තෝ රජගෙට වඩන. උක්තානුක්ත දතයුතු යි.

සමාස– 1 වැඳුම්පින්පඬුරු. 2 සුරවිරු. 3 සුරරද. 4 රජගෙට. 5 වැඩකරු.

විග්‍රහ– 1 වැඳුම් ම පින්= වැඳුම්පින්. වැඳුම්පින් ම පඬුරු=වැඳුම්පින්පඬුරු. 2 සුර ද එම විරු ද=සුරවිරු–ඔහු. 5 වැඩ කරණ්නුයේ= වැඩකරු. (සාම් වි: සමස්)

විශෙෂ විභාග– 'පිරිසිඳ නොදත හැකි' යනුයෙන් ගැණෙන්නේ සැළලිහිණියා මෙකී වෙහෙර විහාර වැඳගැණීමෙන් කැටිකරගත් පින්වල ප්‍රමාණය මෙපමණ යයි කිය නොහැකි බව යි. 'විජයොත් පාය' නම් ශක්‍රයා මඝමාණව කව උපන් කාලයෙහි ආගන්තුක ශාලාවක් කරවීමේ විපාකයෙන් පහළ වූ වෛජයන්ත ප්‍රාසාද යයි. මේ පහය උසින් සත්සිය යොදුනෙකි.

73 පු ලා  සුවඳ මලවුල් සාර වරල් බැ  ඳ
දු ලා  රන්සකින් සරසා සවන් සො  ඳ
නි ලා  දිගු නුවන් රසඳුන් නනා අැ  ඳ
බ ලා  සිඹු රඟන රඟමඬල සාල්බ  ඳ

විභක්ති- පුලා 2. සුවඳමල් 2. අවුල් 2. වරල් 2. දුලා 4. රන්පතින් 4. සවන් 2. සොඳ 2. නිලා 8. දිගු 8. නුවන් 8. රසඳුන් 2. රඟන 2. රඟමඬල 8. කල්බඳ 2.

පදාර්ථ- පුලා, පිපුනා වූ; සුවඳමල්, සුගන්ධපුෂ්පයෙන්; වරල්, කෙශකලාපයන්; අවුල් කර බැඳ, ආකූල කොට බැඳගෙණ; දුලා, දිලියෙන්නා වූ; රන්පතින්, සවර්ණපත්‍රයෙන් (සවර්ණමය කර්ණාභරණයෙන්); සොඳ, සුන්දර වූ; සවන්, කර්ණයන්; සරසා, අලඞ්කෘත කොට; නිලා, නීලවර්ණ වූ; දිගු, දීර්ඝ වූ; නුවන්, නෙත්‍රයන්හි; රසඳුන්, රසාඤ්ජනයන්; තනා ඇඳ, විසිතුරු කොට ගා; රඟමඬල, රඞ්ගමණ්ඩලයෙහි; රඟන, නෘත්‍ය කරන්නී වූ; කල්බඳ, ස්ත්‍රීන්; බලා සිටු, බලමින් සිටුව.

භාවය- නුඹ සුවඳමලින් කෙස්වැටි ද රන්කඩුක්කන්වලින් කන් ද රසඳුනෙන් ඇස් ද සරසා රඟමඬල නටන ස්ත්‍රීන් බලා සිටපන්.

**ක්‍රි: ය- තෝ සුවඳමල් වරල් අවුල් කර බැඳ රන්පතින් සවන් සරසා නුවන් රසඳුන් තනා ඇඳ රඟමඬල රඟන කල් බඳ බලා සිටු.**

උ: ක- **බලා සිටු:** පූර්වක්‍රියා පූර්වක විධික්‍රියා සි. **තෝ:** උක්ත කර්තෘ සි. **රඟන:** කර්තෘකාරක අර්ථක්‍රියා සි. **කල්බඳ:** උක්ත කර්තෘ සි. **රඟමඬල:** අනුක්තාධාර සි. **බලා:** යන පෙරකිරියට **කල්බඳ:** අනුක්තකර්ම සි. **ඇඳ:** පෙරකිරියට **රසඳුන්:** අනුක්ත කර්ම සි. **නුවන්:** අනුක්තාධාර සි. **තනා:** පෙරකිරියට **නුවන්:** අනුක්තකර්ම සි. **සරසා:** පෙරකිරියට **සවන්:** අනුක්තකර්ම සි. **රන්පතින්:** අනුක්තකරණ සි. **බැඳ:** පෙරකිරියට **වරල්:** අනුක්ත කර්ම සි. **කර:** පෙරකිරියට **වරල්:** ප්‍රකෘතිකර්ම සි. **අවුල්:** විකෘති කර්ම සි. **සුවඳමල්:** අනුක්තකරණ සි.

සමාස- 1 සුවඳමල්. 2 රන්පතින්. 3 රසඳුන්. 4 රඟමඬල. 5 කල්බඳ.

විග්‍රහ: 2 රණින් කළ පත්=රන්පත්- ඉන්. 3 රස වූයේ ද එම අඳුන් වූයේ ද=රසඳුන්. 4 රඟ ම මඬල=රඟමඬල. 5 කල් වූ බඳ යමෙකුට ද ඒ=කල්බඳ.

විශෙෂ විභාග- 'රන්පතින්' යන තන්හි 'පත්' යනු පත්‍රාකාරයෙන් කළ කර්ණාභරණ විශෙෂයකට නම්. 'රසඳුන්' යනු 'රසාඤ්ජන' ශබ්දයෙන් ආයේ වේ. රසාඤ්ජන නම් ඇසට සිත පිණිස ඇසේ ගාන රස බෙහෙත් වූ අඳුනකි; 'තනා' යන පෙරකිරිය තන තැනීමෙහි යන ධාතුවෙන් ද 'ඇඳ' යන්න 'අඳ'

ඇදීමෙහි යන ධාතුවෙන් ද සිඛ සි. 'රඟම්ඬල' යනු නෘත්‍ය භූමියට නම්, 'කල් බඳ' යනු සංක්ෂිප්ත නමෙකි. කල්‍යාණ ශරීරයක් ඇත්තී යන අර්ථයෙනි. එහි 'කල්' යන්න පාලි 'කල්ල' ශබ්දයෙන් ද 'බඳ' යන්න 'බොන්දි' ශබ්දයෙන් ද ආයේ වේ.

74 වි දෙ න ලෙ ලෙ න නරුබර පුළුලුකුල රැ දී
හෙ ළ න න ග න අන නුවනග බැලුම් දි දී
රු වි න දි ලෙ න අබරණ කැලුම ගතයෙ දී
සැ ලෙ න ප හ න සිළු වැනි රඟන ලිය සැ දී

<u>විභක්ති</u>– විදෙන 1. ලෙලෙන 1. නරුබර 3. පුළුලුකුල 8. හෙළන 1. නගන 1. අන 2. නුවනග බැලුම් 2. රුවින 4. දිලෙන 1. අබරණකැලුම 3. ගත 8. සැලෙන 2. පහනසිළු 2. රඟන 1. ලිය 1.

<u>පදාර්ථ</u>– නරුබර, බර වූ නරුව; පුළුලුකුල, ප්‍රඵුල වූ ජඝන යෙහි; රැදී, රඤ්ජිතව (වැදීමෙන්); විදෙන, විහිදෙන්නා වූද; ලෙලෙන, ලෙලදෙන්නා වූ ද; නුවනග බැලුම්, නෙත් කොණින් බලන බැලුම්; දිදී, දානය කරමින්; අන, හස්තය; හෙළන, හෙළන්නා වූ ද; නගන, නගන්නා වූද; අබරණ කැලුම, ආභරණ කාන්තිය; ගත, ශරීරයෙහි යෙදී, යුක්තව (යෙදීම හෙතුකොටගෙණ); රුවින, සෞන්දර්‍ය්‍යයෙන්; දිලෙන, බබලන්නා වූද; සැදී, සැරසී; රඟන, නෘත්‍ය කරන්නා වූ; ලිය, කාන්තාවෝ; සැලෙන, චචල වන්නා වූ; පහනසිළු වැනි, ප්‍රදීප ශිඛා වන් වැනි වෙත්.

<u>භාවය</u>– උකුලේ වැදීමෙන් පැතිරී ලෙලදෙන නරුවෙන් හා නෙත් කොණින් බලමින් උස්පහත් කරන්නා වූ අත්වලින් ද, ආභරණ කාන්තිය වැදීමෙන් දිලිසෙන සිරුරෙන් ද යුක්තව නටන ස්ත්‍රීහු සෙලවෙන පහන්සිළු වැනි ය.

**<u>ක්‍රි: ය</u>– රඟන ලිය සැලෙන පහනසිළු වැනි වෙත්.**

<u>උ: ක</u>- **වෙත්:** ක්‍රියා සි. **ලිය:** උක්තකර්තෘ සි. **රඟන:** තද් විශෙෂණ සි. **පහන්සිළු: ලිය** යන්නෙහි උපමාන සි. **සැලෙන.** තද් විශෙෂණ සි.

<u>අර්ථක්‍රියා</u>– **විදෙන, ලෙලෙන, හෙළන, නගන, දිලෙන, සැලෙන, රඟන.**

**විදෙන:** විද (විසිරීමෙහි) ධාතු සි. **ලෙලෙන:** ලෙල (ලෙලදීමෙහි) ධාතු සි. (දෙක ම) ආධාරකාරක සි. **ලිය:** කා: උක්තාධාර සි. **හෙළන;** හෙළ (හෙළීමෙහි) ධාතු සි. **නගන:** නග (නැගීමෙහි) ධාතු සි. (දෙක ම) කර්තෘකාරක සි. **ලිය:** කා: උක්තකර්තෘ සි. (**අන:**

අනුකතාකම් සි.) **දිලෙන:** දල(දිලිසීමෙහි) ධාතු සි. කතෘකාරක සි. **පහනසිළු:** උක්තකතෘ සි. **රඟන:** රඟ (නැටීමෙහි) ධාතු සි. කතෘකාරක සි. **ලිය:** උක්තකතෘ සි.

<u>සමාස</u>– 1 නරුබර. 2 පුළුලුකුල. 3 නුවනගබැලුම්. 4 අබරණකැලුම. 5 පහනසිළු.

<u>විග්‍රහ</u>– 1 බර වූයේ ද එම නරු වූයේ ද=නරුබර. 3 නුවන්හි අග=නුවනග. නුවනගින් (බලන) බැලුම්=නුවනගබැලුම්. 4 අබරණවල කැලුම=අබරණකැලුම. 5 පහන්වල සිළු=පහන්සිළු–පහනසිළු.

<u>විශෙෂ විභාග</u>– මේ කවියෙන් පැවසෙන්නේ ස්ත්‍රීන් නටන කල පැවති ආකාර යි. නරුව තබා ඉහෙහි ඇඳි රෙද්ද පළල් උකුලේ වැදීමෙන් විහිදී ලෙල දීම එහි එක් ආකාරයෙකි. තෙත් කොණින් බල බලා අත් උස් පහත් කිරීම එක් ආකාරයෙකි. ඇඳ පැලඳගෙණ තිබෙන ආභරණකාන්තිය ඇඟ වැදීමෙන් දිලිසීම එක් ආකාරයෙකි. මෙලෙසින් සැරසී නටන ස්ත්‍රීහු සැලෙන පහන්සිළු මෙන් පෙනෙති.

මෙහි වූ 'රැඳී-සෙදී' යන පෙරකිරිය දෙක හෙතුවර්ථ වශයෙනි. රැඳීම හෙතුකොට ගෙණ සෙදීම හෙතුකොට ගෙණ යන අර්ථ යි. 'රුවිත' යන්නෙහි රූ ශබ්දය සුන්දරභාවාර්ථ යි.

**75 ලකල පුළුලුකුල බඳ මිණිමෙවු ල්ලා**
**සමග රන්සලඹ රැවු දී වෙවු ල්ලා**
**වසන පදට තබමින් පදකම ල්ලා**
**රඟන ලඳුන් බල රූසිරි සිය ල්ලා**

<u>විගකානි</u>–ලකළ 8. පුළුලුකුල 8. බඳ 3. මිණිමෙවුල්ලා 3. රන්සලඹ 2. රැවු 2. වසන 6. පදට 6. පදකම්ල්ලා 2. රඟන 7. ලඳුන් 7. රූසිරි 2. සියල්ලා 2.

<u>පදාර්ථ</u>– ලකළ, අලඞ්කෘත වූ; පුළුලුකුල, ප්‍රපුල වූ ජඝන ප්‍රදෙශයෙහි; බඳ, බඳනාලද්දා වූ; මිණිමෙවුල්ලා සමග, මණිමෙඛලාදාමය හා; රන්සලඹ, ස්වර්ණනූපුරය; වෙවුල්ලා, සොලවා; රැවු දී, නාද පවත්වා; වසන, වාදනය කරණු ලබන්නා වූ; පදට, පදයට; පදකම්ල්ලා, පාදපද්මය; තබමින්, ස්ථාපනය කරමින්; රඟන, නටන්නා වූ; ලඳුන්, ස්ත්‍රීන්ගේ; සියල්ලා රූසිරි, සකල රූපශ්‍රිය; බල, බලව.

<u>භාවය</u>– නුඹ මිණිමෙවුල්දම සමග ගිගිරිවලලු සොලවමින් හඬවා බෙර පදයට පා තබමින් නටන ස්ත්‍රීන්ගේ ශොභාව බලාපන්.

කි: ය- තෝ මිණිමෙවුල්ලා සමග රන්සලඹ රැවු දි වෙවුල්ලා වයන පදව පදකමල්ලා තබමින් රඟන ළඳුන් රූසිරි බල.

ල: කා- බල: විධික්‍රියා සි. තෝ: උක්තකර්තෘ සි. රූසිරි: අනුක්තකර්ම සි. ළඳුන්: තත්සම්බන්ධ සි. රඟන: ළඳුන් යන්නෙහි විශේෂණ සි. තබමින්: මුසුකිරියට පදකමල්ලා: අනුක්තකර්ම සි. වයන-පදව: අනුක්ත සම්ප්‍රදාන සි. වෙවුල්ලා: පෙරකිරියට රන්සලඹ: අනුක්තකර්ම සි. දි: පෙරකිරියට රැවු: අනුක්තකර්ම සි. මිණිමෙවුල්ලා: යනු සමග: යන සහාර්ථ නිපාතයොගයෙහි කතුවිබත්.

අර්ථක්‍රියා- වයන, රඟන.

වයන: වය (වැයීමෙහි) ධාතු සි. කර්තෘකාරක සි. පදව: කා: උක්තකර්ම සි. රඟන: කර්තෘකාරක සි. ළඳුන්: කා: උක්තකර්තෘ සි.

සමාස- 1 පුළුලුකුල. 2 මිණිමෙවුල්ලා. 3 රන්සලඹ. 4 පදකමල්ලා. (විග්‍රහ සුගම සි)

විශෙෂ විභාග- 'මෙවුල්ලා-කමල්ලා' යන දෙතන්හි 'ලා' යන්න අකුරු සම කිරීම පිණිස සි. 'වෙවුල්ලා' යන්න ප්‍රයොජ්‍යාර්ථ පූර්වක්‍රියා සි. 'වෙවුල්වා' යන තන්හි පූර්වරූප විධියෙන් 'වෙවුල්ලා' සි සිඬේ. වෙවුල (වෙව්ලීමෙහි) ධාතුසි. 'වයන පදව' යන තන්හි 'පද' යනු ප්‍රත්‍යයාර්ථ නාමයෙකි. "පද පිණිස වූයේ=පද" යනු විග්‍රහ සි. 'අ' ප්‍රත්‍ය යයි. පා තැබීම පිණිස වයන බෙර තාලයට පද ය සි කියනු ලැබේ. බෙරපදආදි වශයෙනි. වැයීම නම් බෙර ආදියෙන් පවත්වන නාද යයි. "පාසලඹ" නම් පාදභරණ විශෙෂයෙකි. ගිගිරිවලලු යයි ද කියති. එහි 'සලඹ' යන්න දෙමළ' 'සිලම්බු' ශබ්දයෙන් ආයේ සි.

76 ව ස් දඬු බිඟු කොවුල් විණානද මියු රැ
රැ ස් වූ සෙයින් සත්සර රස ගි සොඳු රැ
අ ස් වන ලියන් දූසා ලිය කිඳුරඟන යු රැ
තොස් කර ත සිත සවණත නුවනත මිතු රැ

විහකාරි- වස්දඬු බිඟු කොවුල් විණා 7. නද 3. මියුරු 3. රැස්වූ 2. සත් සර රසගි 2. සොඳුරු 2. අස්වන 2. ලියන් 2. ලියකිඳුරඟනයුරු 2. තොස් 2. ත 7. සිත 2. සවණත 2. නුවනත 2. මිතුරු 9.

පදාර්ථ- වස්දඬු, වස්කුලල්ය (නළාය); බිඟු, භෘඞ්ගය; කොවුල්, කොකිලය; වීණා, වීණාය යන මොවුන්ගේ; මියුරුනද, මධුරනාද යන්; රැස් වූ සෙයින්, රාශීභූත වූවාක් මෙන්; සොඳුරු, සුන්දර වූ; සත්සරරසගී, සප්තස්වරයෙන් යුත් රස ගීතිකාවන්; අස්වන, ශ්‍රවණය කරවන්නා වූ; ලියකිඳුරඟන යුරු, ලියකිඳුරු අඟනන් හා

සමාන වූ; ලියන්, ස්ත්‍රීන්; දූසා, දර්ශිතය කොට; මිතුරු, මිත්‍රය; ත, පුෂ්මත්හුගේ; සිත, චිත්තය ද; සවණත, කර්ණය ද; නුවනත, නයනය ද; තොස් කර, සන්තුෂ්ට කරව.

**භාවය**- මිතුර නුඹ නළාහඬ, මීමැසිහඬ, කොවුල්හඬ, වීණාහඬ, යන මොවුන් එක්තැනක කැටිව පවත්නාක් මෙන් සත්සරරසගී අස්වන ලියකිඳුරියන් වැනි ස්ත්‍රීන් දූසා නුඹගේ සිත් කන් නෙත් සතුටු කරගන්.

**කි: ය- මිතුර තෝ සත්සරරසගී අස්වන ලියන් දූසා සිත සවණත නුවනත තොස් කර.**

**ප: න- කර:** විධික්‍රියා සි. **තෝ:** උක්තකර්තෘ සි. **සිත-සවණත-නුවනත:** වෙන් වෙන් වශයෙන් අනුක්ත ප්‍රකෘති කම් සි. **තොස්:** විකෘති කම් සි. **දූසා:** පෙරකිරියට **ලියන්:** අනුක්තකම් සි. **අස්වන:** තද් විශෙෂණ සි. **සත්සරරසගී: අස්වන** යන අරුත් කිරියෙහි අනුක්තකම් සි

**අර්ථක්‍රියා- අස්වන:** අස් (අසිමෙහි) ධාතු සි. කර්තෘකාරක සි. **ලිය:** කෘ: උක්තකර්තෘ සි.

**සමාස**- 1 වස්දඬුබිඟුකොවුල්වීණා. 2 රුස්වූ. 3 සත්සරරසගී. 4 ලියකිඳුරඟනසුරු.

**විග්‍රහ**- 2 රුස් නු වූ වක් රුස් වූවක් වූනු සි=රුස්වූ. 3 සතක් සර යමෙක්හි ද ඒ=සත්සර, රසෙන් යුත් ගී=රසගී. සත්සර වූයේ දඑම රසගී වූයේ ද=සත්සරරසගී. 5 ලිය වැනි කිඳුරු=ලිය කිඳුරු. නොහොත් ලියෙහි (සමත්) කිඳුරු=ලියකිඳුරු. ලියකිඳුරන්ගේ අඟන=ලියකිඳුරඟන, ලියකිඳුරඟනන්ගේ අසුරු යමෙකුන්ට ද ඔවුහු=ලියකිඳුරඟනසුරු.

**විශෙෂ විභාග**- මෙහි 'සත්සර' යන්නෙන් ගැණෙන්නේ සංගීත ශාස්ත්‍රයෙහි වූ-ෂඩ්ජ, ඍෂභ, ගාන්ධාර, මධ්‍යම, පඤ්චම, ධෛවත, නිෂාද යන ස්වර විශෙෂ සත සි. මේ සතට පිළිවෙළින් 'ස-රි-ග-ම-ප-ධ-නි' යන නම් සත ව්‍යවහාර කෙරෙත්. මුළු සංගීත ශාස්ත්‍රය ම මේ සතෙහි ඇතුළත් වේ. 'රසගී' නම් ශෘඞ්ගාරරසාදියෙන් යුත් ගීතයෝ සි.

'කිඳුරු' යන්න වඩ්ග 'කිඤර' ශබ්දයෙන් ආයේ වේ. 'වඤර' ශබ්දයෙන් 'වඳුරු'යි ආවා මෙනි. 'කින්නර-කිඳුරු' යනු සාමාන්‍ය ජාතියෙකි. 'ලියකිඳුරු'යනු එහි විශෙෂ කොටසකි. දැනුදු දඹදිව නාගපුර් නම් පලාතෙහි එබඳු කින්නර ජාතියක් ඇති බවත් ඒ ජාතියෙහි පුරුෂයන් ද රූපලාවණ්‍යයෙන් ලියන් වැනි බව හා ඔවුන් ලයාන්විත ගීතයෙහි අතිදක්ෂ බවත් අසා දනිමු. ඒ ජාතිවිශෙෂය ලියකිඳුරු විය යුතු සි. 'ලිය' යනු ස්ත්‍රීන්ට හා නෘත්‍යගීතාදිය පිළිබඳ එකතාන ස්වරූප සම්භාවයට ද නමි.

77 මෙ සේ පැවති අනතුරු ගී රැඟුම් පු ද
තොසේ සිතින් වැඩ සිටි සුරවිමන් මැ ද
ය සේ පතළ දියතුල උතුළ මනන ඳ
ඇ සේ පුරා දකු විබිසණ සුරිඳු ස ඳ

විභක්ති–පැවති 7. ගිරැඟුම්පුද 7. තොසේ සිතින් 4. වැඩසිටි 2. සුරවිමන් මැද 8. යසේ 3. පතළ 2. දියතුළ 8. උතුළ 2. මනනඳ 3. ඇසේ 8. විබිසණ සුරිඳුසඳ 2.

පදාර්ථ– මෙසේ, මේ ආකාරයෙන්; පැවති, පැවැත්තා වූ; ගී රැඟුම්පුද අනතුරු, ගීත නෘත්‍ය පූජාවන්ට අනතුරුව; තොසේසිතින්, සන්තොෂ චිත්තයෙන්; සුරවිමන් මැද, දෙවවිමාන මධ්‍යයෙහි; වැඩ සිටි, වැඩ සිටියා වූ; මනනඳ, මනොඥ වූ; යසේ, කීර්තිය; දියතුළ, ලොකාභ්‍යන්තරයෙහි; පතළ, පැතිරී ගියා වූ ද; උතුළ, ඉතිරී ගියා වූ ද; විබිසණ සුරිඳුසඳ, විභීෂණ දිව්‍යරාජයා; ඇසේ පුරා, අක්ෂිපූර්ණය කොට; දකු, දර්ශනය කරව.

භාවය–මෙසි මින් පෙර කියන ලද ගිරැඟුම් පුද අසා බලා සතුටුව දිව්‍ය විමාන මධ්‍යයෙහි වැඩ සිටින විභීෂණ දිව්‍යරාජයා නුඹ හොඳට ඇස හැර බලාපන්.

ක්‍රි: ශ– තෝ විබිසණ සුරිඳුසඳ ඇසේ පුරා දකු.

ද: ක– දකු: විධික්‍රියා සි. තෝ: උක්තකර්තෘ සි. විබිසණ සුරිඳුසඳ: අනුක්තකාම් සි. පුරා: පෙරකිරියට ද විබිසණ සුරිඳුසඳ අනුක්තකාම් සි. ඇසේ: අනුක්තාධාර සි.

අර්ථක්‍රියා– පැවති, (වැඩ) සිටි, පතළ, උතුළ.

පැවති: කර්තෘකාරක සි. ගිරැඟුම්පුද: කා: උක්තකර්තෘ සි. (වැඩ) සිටි: කර්තෘකාරක සි. විබිසණ සුරිඳුසඳ: කා: උක්තකර්තෘ සි. පතළ: අවධිකාරක සි. විබිසණ සුරිඳුසඳ: කා: උක්තඅවධි සි. උතුළ: උතුර (ඉතිරීමෙහි) ධාතු සි. අවධිකාරක සි. විබිසණ සුරිඳු සඳ. කා: උක්තඅවධි සි.

සමාස– 1 අනතුරු. 2 ගී රැඟුම්පුද. 3 තොසේ සිතින්. 4 සුර විමන්මැද. 5 දියතුළ. 6 මනනඳ. 7 විබිසණසුරිඳුසඳ.

විග්‍රහ- 1 අතුරු නැත්තේ=අනතුරු (අව්‍යසමස්). 2 ගී ද රැඟුම් ද=ගීරැඟුම්. ගීරැඟුමෙන් කළ පුද (හෝ) පුද පිණිස කළ ගී රැඟුම් (හෝ)=ගීරැඟුම්පුද. 8 තොසින් යුත් සිත=තොස්සිත–තොසේ සිත–ඉන්. 6 මන නඳනුයි=මනනඳ. (කම්විබත්සමස්).

විශෙෂ විභාග- මෙහි 'තොස් සිතින්-යස පතළ' යි කියයුතු තන්හි අකුරු සම කිරීම සඳහා "තොසේ සිතින්-යසේ පතළ" යි යෙදීන.

78 පැ මිණ සිටි අඳුන් ගිරිකුළු මුදුන වෙ ත
රෙ හෙ ණ නැකත ගැලසිරි විලසින් දිමු ත
ස ර ණ මුළු ලොවට එසුරිඳු සිරස ප ත
කා ල ණ කිරුළ දිසි මුතුලැල් රුවන් යු ත

විභක්ති- සිටි 7. අඳුන්ගිරිකුළු 7. මුදුන 7. වෙත 8. රෙහෙණනැකත 7. ගැලසිරි 7. විලසින් 4. දිමුත 1 සරණ 7. මුළු 7. ලොවට 7. එ 7. සුරිඳු 7. සිරස 2. පත 1. කාලණකිරුළ 1. දිසි 1. මුතුලැල්රුවන්යුත 1.

පදගැටී- අඳුන්ගිරිකුළු, අඤ්ජනපර්වතකූටයක්හුගේ; මුදුනවෙත, මස්තකසමීපයෙහි; පැමිණසිටි, ප්‍රාප්තව සිටියා වූ; රෙහෙණනැකත, රොහිණීනක්ෂත්‍රය සම්බන්ධ වූ; ගැලසිරි විලසින්, ශකටශ්‍රියේ විලාස යෙන්; දිමුත, දීප්තිමත් වූ; මුළුලොවට, සමස්ත ලොකයට; සරණ, පිහිට වූ; එසුරිඳු, ඒ විෂ්ණුසුරේන්ද්‍රයාගේ; සිරසපත, ශීර්ෂප්‍රාප්ත වූ; මුතුලැල්රුවන්යුත, මුක්තාලතිකායෙන් හා රත්නයෙන් යුක්ත වූ; කාලණකිරුළ, කල්‍යාණ (සවර්ණ) කිරීටය තෙම; දිසි, දෘශ්‍ය වේ.

භාවය- ඒ විෂ්ණුදිව්‍යරාජයාගේ හිසට පත් සවර්ණමය ඔටුන්න අඤ්ජන පර්වතකූටයක්හුගේ මුදුනට පත් රෙහෙණනැකත පිළිබඳ ගැලෙහි ශොභාවෙන් පෙනේ.

ක්‍රි:ය- කාලණකිරුළ ගැලසිරි විලසින් දිසි වේ.

උ: ක- වේ: ක්‍රියා යි. කාලණකිරුළ: උක්තප්‍රකෘතිකර්තෘ යි. දිසි: විකෘතිකර්තෘ යි. ගැලසිරිවිලසින්: උපලක්ෂණ අරුත්හි කරණ යි.

අ:ඹ්ක්‍රියා- සිටි, පත, දිසි, යුත.

සිටි: කර්තෘකාරක යි. ගැලසිරි: කා: උක්තකර්තෘ යි. පත: කර්තෘකාරක යි. කාලණකිරුළ: උක්තකර්තෘ යි. දිසි; කර්මකාරක යි. කාලණකිරුළ: කා: උක්තකර්ම යි. යුත: කර්තෘකාරක යි. කාලණ කිරුළ: කා: උක්තකර්තෘ යි.

සමාස- 1 අඳුන්ගිරිකුළු. 2 රෙහෙණනැකත. 3 ගැලසිරි. 4 සුරිඳු. 5 කාලණකිරුළ. 6 මුතුලැල්රුවන්යුත.

විග්‍රහ_ 1 අඳුන්වන් ගිරි=අඳුන්ගිරි. අඳුන් ගිරේ කුළු=අඳුන් ගිරිකුළු. 2 රෙහෙණ ම නැකත්=රෙහෙණනැකත්-එහි. 5 කල ණෙන් කළ කිරුළ=කලණකිරුළ. 6 මුතුවලින් කළ ලැල්=මුතුලැල්. මුතුලැල් ද රුවන් ද=මුතුලැල්රුවන්. ඉන් යුත්=මුතුලැල්රුන්යුත.

විශෙෂ විභාග- 'රෙහෙණනැකත' නම් නැකත් සත්විස්සෙන් සිවුවන නැකත සි. එය තාරකා පසකින් යුකත සි. ඒ තාරකාවන්ගේ පිහිටීම ගැලක ආකාරයෙනි. 'කලණ කිරුළ' යන තන්හි "කලණ" ශබ්දය සවර්ණවාචක ය, මෙහි විභීෂණ දිව්‍යරාජයාගේ හිසහැර සෙසු ශරීරය අඳුන්ගිර කොට ද, හිස පර්වතකූටය කොට ද ඔටුන්න රෙහෙණ නැකැත්ගැල කොට ද නිරූපිත සි. මෙයින් විභීෂණ දිව්‍යරාජයාගේ සිරුර අඳුන් පැහැය බව පළ වේ.

79 සු නි ලේ පැහැය හැර සුදු වනුය ගන වෙ ලේ
වි දු ලේ එයින් වියොවට පැමිණ වියවු ලේ
නි ස ලේ ඒ මේසිරිගත් සුරිඳු හැමසා ලේ
උ දු ලේ දෙහෝ රන්පට මෙන් නලල් තෙ ලේ

විභක්ති- සුනිලේ 2. පහැය 2. සුදු 2. වනු 1. ගනවෙලේ 1. විදුලේ 1. එයින් 6. වියොවට 2. වියවුලේ 1. නිසලේ 2. ඒ 7. මේසිරි 2. ගත් 7. සුරිඳු 7. හැමසාලේ 8. උදුලේ 1. රන්පට 2. නලල්තෙලේ 8.

පදාර්ථ- ගනවෙලේ, ඝන වූ වලාහකතෙමේ; සුනිලේ, ඉතා නිල වර්ණ වූ; පැහැය, ප්‍රභාව; හැර, දුරුකොට; සුදු වනු ය, ශුභ්‍රවර්ණයට පැමිණෙන්නේය. එයින්, ඒ හෙතුකොට ගෙණ; වියවුලේ, ව්‍යාකූල වූ; විදුලේ, විද්‍යුල්ලතාව (විදුලිය); වියොවට පැමිණ, වියොග ප්‍රාප්ත ව; හැමසාලේ, සැමකල්හි; නිසලේ, චචල නොවන්නා වූ; එමේ සිරිගත්, ඒ මෙසශ්‍රිය ගත්තා වූ; සුරිඳු, විභීෂණ සුරෙන්ද්‍රයාගේ; නලල්තෙලේ, ලලාට තලයෙහි; රන්පට මෙන්, සවර්ණපට්ටය මෙන්; උදුලේ දෙහෝ, උජ්ජ්වලිත වූවා ද්‍ෙ.

භාවය- ඒ විභීෂණ දිව්‍යරාජයාගේ රන්මූවා නලල්පට විදුලිය දෙ සි සැකා කටහැකි බවට පැමිණ තිබේ.

**ක්‍රි: ය- 1 ගනවෙලේ (සුනිලේ) පැහැය හැර සුදු වනු වේ. 2 විදුලේ වියොවට පැමිණ සුරිඳු නලල්තෙලේ උදුලේ වේ දෙහෝ.**

උ: ක- 1 **වේ:** ක්‍රියා සි. **ගනවෙලේ:** උක්ත ප්‍රථමාන්තය සි. **වනු:** විධ්‍යර්ථාන්තය සි. **සුදු:** අනුක්තකර්ම සි. **හැර:** පෙරකිරියට ද විදුලේ යනු ම ප්‍රථමාන්තය සි. **සුනිලේ-පැහැය:** අනුක්තකර්ම සි. 2 **වේ:**

ක්‍රියා යි. විදුලේ: උක්ත ප්‍රකෘතිකර්තෘ යි. උදුලේ: විකෘතිකර්තෘ යි. දෙහෝ: විතර්කාර්ථනිපාත යි. තලල්තෙලේ: අනුක්තාධාර යි. එසුරිඳු: තත්සම්බන්ධ යි. පැමිණ: පෙරකිරියට විශේෂණව අනුක්ත කම් යි.

අඞ්ගක්‍රියා– වනු, ගත්, උදුලේ.

**වනු:** කර්තෘකාරක යි. **ගනවෙලේ:** කා: උක්තකර්තෘ යි. **ගත්:** ගත් (ගැණීමෙහි) ධාතු යි, කර්තෘකාරක යි. **සුහිඳු:** කා: උක්තකර්තෘ යි. **උදුලේ:** උපූර් දුල් (දිලිසීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **විදුලේ:** කා: උක්තකර්තෘ යි.

සමාස– 1 සුනිලේ. 2 ගනවෙලේ. 3 තිසලේ. 4 මේසිරි. 5 සුරිඳු. 6 රන්පට. 7 තලල්තෙලේ.

විග්‍රහ– 3 සල තැන්තේ=තිසල–තිසලේ. 4 මේයේ සිරි=මේසිරි. 6 රණින් කළ පට=රන්පට. 7 තලළ ම තල=තලල්තල-එහි.

විශේෂ විභාග– ස්ත්‍රීලිඞ්ග වූ විදුලිය පුංලිඞ්ග වූ මේඝය ඇසුරුකර ගෙණ වසන බැවින් විදුලිය කාන්තා ස්වරූපයෙන් ද, මේඝය වල්ලභ ස්වරූපයෙන් ද කවිසමයෙහි දක්වත්. මෙහි විභීෂණ දිව්‍යරාජයාගේ රන්මුවා තලල් පට විදුලිය හා සමාන කොට කියනු කැමති කාව්‍යකර්තෘ– විදුලිය නමැති කාන්තාවගේ මේඝ නමැති වල්ලභයා වස්සානාදි කාලවලදී සුදු·වීමෙන් තමාට වාසස්ථාන නොවන බැවින් එසේ නොව සැමදම මේඝ ස්වරූපයෙන් සිටින වල්ලභයෙකු සොයාගොස් විභීෂණ දිව්‍යරාජයාගේ තලල්තලයෙහි රන්පට මෙන් උජ්ජවලිත වියෙයි උත්ප්‍රේක්‍ෂා කිරීමෙන් අදහස හෙළි කෙළේය. "ද–අහෝ" යන අව්‍යය දෙක එකතු ව "දෙහෝ" යි සිද්ධ යි. එහි 'අහෝ' යන්න විතර්කාර්ථ යි.

80 රු වි නේ  උතුම් එසුරිඳු මිණි ඊල මෙ  නේ
ස ව නේ  රුඳුනු රසුදුල තෝඩු ගන ර  නේ
වු ව නේ  වැජඹි සිරිසරසවිය හැමදි  නේ
සොබ නේ  කනා කැටපත් යුවල විලසි  නේ

විභක්ති– රුවිනේ 4. උතුම් 7. එ 7. සිරිඳු 7. මිණිඊල 2. සවනේ 8. රුඳුනු 1. රසුදුල 1. තෝඩු 1. ගනරනේ 1. වුවනේ 8. වැජඹි 7. සිරිසරසවිය 7. හැම 8. දිනේ 8. සොබනේ 1. කනාකැටපත්යුවල 7. විලසිනේ 4.

පදාර්ථ– රුවිනේ, රූපයෙන්; උතුම්, උත්තම වූ; එසුරිඳු, ඒ සුරේන්ද්‍රයාගේ; මිණිඊල මෙනේ, මිණියෙදූ ඵෙලාවක් (උත්සිල්ලාවක්) වැනි වූ; සවනේ, කර්ණපාශයෙහි; රුඳුනු, රුඳුනා වූ; රසුදුල, රශ්මියෙන් උජ්ජ්වලිත වූ; ඝනරණේ, ඝනස්වර්ණයෙන් කරවනලද්ද වූ; තෝඩු, තාඩඞ්කයුග්මය තෙමේ; හැමදිනේ, සැමකල්හි; වුවනේ, මුඛ

යෙහි; වැජඹි, විජෘම්භිත වූ; සිරිසරසවිය, ශ්‍රීකාන්තාසරස්වතීදෙදෙනාගේ; කනාකැටපත්යුවල, සවර්ණමය දර්පණයුග්මයක්හුගේ; විලසිනේ, විලාසයෙන්; සොබනේ, බබලන්නේ වේ.

<u>භාවය</u>– ඒ විශිෂ්‍ණ දිව්‍යරාජයාගේ රත්මුවා කාඩුක්කම් දෙක නිරතුරු මුහුණ දෙපස වසන ශ්‍රීකාන්තා සරස්වතී දෙදෙනාගේ රත්මුවා කැටපත් දෙකක් වැනිය.

**<u>ක්‍රි; ය</u>– තෝඩු සිරිසරසවිය කනාකැටපත්යුවල විලසිනේ සොබනේ වේ.**

<u>උ: ක</u>– **වේ:** ක්‍රියා යි. **තෝඩු:** උක්ත ප්‍රකෘතිකර්තෘ යි. **සොබනේ:** විකෘතිකර්තෘ යි. **විලසිනේ:** උපලක්ෂණාර්ථයෙහි කරණ යි. **කනාකැටපත්යුවල;** තත්සම්බන්ධ යි. **සිරිසරසවිය:** තත්සම්බන්ධ යි.

**<u>අර්ථක්‍රියා</u>– රැඳුනු, වැජඹි, සොබනේ.**

**රැඳුනු:** කර්මකාරක යි. **තෝඩු;** කා: උක්තකර්ම යි. **වැජඹි:** කර්තෘකාරක යි. **සිරිසරසවිය;** උක්තකර්තෘ යි. **සොබනේ:** සොබ (බැබලීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **තෝඩු:** උක්තකර්තෘ යි.

<u>සමාස</u>– 1 මිණිඊල. 2 ගතරණේ. 3 සිරිසරසවිය. 4 හැමදිනේ. 5 කනාකැටපත්යුවල.

<u>විග්‍රහ</u>– 1 මිණියුත් ඊල=මිණිඊල. 3 සිරි ද සරසවි ද=සිරිසරසවි. 5 කනායෙන් කළ කැටපත්=කනාකැටපත්, කනාකැටපත්වල යුවල=කනාකැටපත්යුවල.

<u>විශේෂ විභාග</u>– මෙහි 'මිණි' යන්නෙන් ඉඳුනිල්මිණි ගැණේ. මිණිඊලට සමානවූයේ විශිෂ්‍ණදෙවේන්‍ද්‍රයාගේ කර්ණපාශය යි. එය කාලවර්ණ බැවින් ඉඳුනිල් මිණිඊලකට සම වේ. පළනලද දික් කන්පෙත්ත සටහනින් උත්සිල්ලා වක් වැනිය. 'සිරිසරසවිය' යන්නෙන් මෙහි කියවෙන්නේ සරස්වතීදෙවිය පමණෙකැයි ද සමහරුන්ට සිතියහැකි වේ. මුවන වාසස්ථාන වූයේ සරස්වතියට බැවිනි. ශ්‍රියගේ වාසස්ථානය විෂ්ණුගේ වක්ෂස බවත්, සරස්වතියගේ වාසස්ථානය බ්‍රහ්මයාගේ මුවන බවත් සම්මත යි. ඒ ප්‍රධාන වාසස්ථානයි. නමුත් ශ්‍රිය ශොභාසම්පන්න කොතැනක වුවත් වසන බව ද සම්මත යි. මේ විශිෂ්‍ණ දෙවේන්‍ද්‍රයාගේ මුවන ඉතා ශොභාසම්පන්න බැවින් එහෙද ශ්‍රියට වාසස්ථාන විය. එක්කෙනෙකුට මුහුණ දෙපැත්තේ නොවිසිය හැකි බැවිනුත් කැටපත් යුවලක් එක්කෙනෙකුට වුවමනා නැති බැවිනුත් මෙහි "ශ්‍රී-සරස්වතී" දෙදෙන ම ගත යුතු යි.

81 නම කළ සත හැලේ සිහිලේ සැප සිලි ලි
බිය සෙන රුපු කැලේ තුඹුලේ දෙන නොකලි
නලළත ගිරි තෙලේ සුනිලේ රැසිනි පි ලි
සුරරද දෙබැමලේ ගනලේ සිරි කිය ලි

විභක්ති– නමකළ 5. සතහැලේ 5. සිහිලේ 2. සැපසිලිලි 2. බියසෙන 2. රුපුකැලේ 7. තුඹුලේ 7. දෙන 1. නොකලි 2. නලළතගිරිතෙලේ 8. සුනිලේ 7. රැසින් 4. ඉපිලි 1. සුරරද 7. දෙබැමලේ 1. ගනලේසිරි 2.

පදාර්ථ– නම කළ, නමස්කාර කළා වූ; සතහැලේ, සත්වනමැති ශාලික්ෂේත්‍රයන්ට; සිහිලේ, ශීතල වූ; සැපසිලිලි, සම්පත්තිනමැති ජලය ද; තුඹුලේ, මහත් වූ; රුපුකැලේ, ශත්‍රුනමැති වනයට; නොකලි, අකාල වූ; නොහොත්, අමනොඥ වූ; බියසෙන, භය නමැති අසනි ද; දේන, දානයකරන්නා වූ; නලළත, ලලාට නමැති; ගිරි තෙලේ, පර්වතතලයෙහි; සුනිලේරැසින්, ඉඳුනිල්මිණික්හුගේ කාන්තියෙන්; ඉපිලි, උද්ගත වූ; සුරරද, විභීෂණදිව්‍යරාජයාගේ; දෙබැමලේ, භ්‍රෑලෙඛාදෙක; ගනලේසිරි, අභ්‍රරේඛාදෙකක්හුගේ ආකාරය, කියලි, ප්‍රකාශ කොළේය.

භාවය– විභීෂණදිව්‍යරාජයාගේ බැමදෙක තමාට වැඳුම් පිදුම් කළ අයට සම්පත් ද, තමාට සතුරු අයට භය ද ගෙණදෙන සුලුය.

ක්‍රි: ය– සුරරද දෙබැමලෙ ගනලේසිරි කියලි.

උ: ක– කියලි: අතීතක්‍රියා යි. දෙබැමලේ: උක්තකර්තෘ යි. සුරරද: තත්සම්බන්ධ යි. ගනලේසිරි: අනුක්තකර්ම යි.

අ‍ප්‍රධානක්‍රියා– නමකළ, දෙන, ඉපිලි.

(නම) කළ: 'නම්' නිපාතපූර්ව කරධාතු යි. කර්තෘකාරක යි. සත: කා; උක්තකර්තෘ යි. (නම: අනුක්තකර්ම යි). දෙන; කර්තෘකාරක යි. දෙබැමලේ: කා: උක්තකර්තෘ යි. ඉපිලි: උපුල (ඉපිලි මෙහි) ධාතු යි. කර්තෘකාරක යි. දෙබැමලේ: කා: උක්තකර්තෘ යි.

සමාස– 1 නමකළසතහැලේ. 2 සැපසිලිලි. 3 බියසෙන. 5 රුපුකැලේ. 5 නොකලි. 6 නලළත ගිරිතෙලේ. 7 සුනිලේ. 8. සුරරද. 9 දෙබැමලේ. 10 ගනලේසිරි.

විග්‍රහ– නමකළ වූයේ ද එම සත වූයේ ද=නමකළසත, නමකළ සත ම හැල්=නමකළසතහැල්–නමකළසතහැලේ. 2 සැප ම සිලිල්= සැපසිලිල්–සැපසිලිලි. 3 බිය ම සෙන=බියසෙන. 4 රුපුම කැල=

රුපුසාැල=රුපුසාැලේ. 5 සාල් නැත්තේ=නොසාල්-නොසාලි. 6 තලලළ ම=තලළත. ගිරෙහි තල=ගිරිතල, තලළත ම ගිරිතල=තල ළතගිරිතල-එහි. 7 ඉතා තිල යමසා ද ඒ=සුතිල්-එහි. 9 බැමම ලේ=බැමලේ, බැම්ලේ දෙකක් එක්කොට සලකනලද්දේ=දෙබැම ලේ, ගනලෙහි සිරි=ගනලේ සිරි.

**විශෙෂ විභාග**– මෙහි නමස්කාර කළ ජනයා ආකාරයෙන් (නැමුනු) වීසාරල් කොට ද, සම්පන ජලය කොට ද, බිය සෙන කොට ද, සතුරුජනයා සාැලයක් කොට ද, තලළත ගිරිතලයක් කොට ද, දෙබැමලේ ගනලේ කොට ද නිරූපිත යි. 'බැම්ලේ-ගනලේ'යන දෙතන්හි 'ලේ' යන්නේ අර්ථය රෙඛා යනුයි. රෙඛා නම් දණ්ඩාකාරයෙන් වූ ලකුණකි. 'නොකල්' යන්නෙන් අම නොඈ යන අර්ථය ගතහැකි වුවත් මෙහි අකාල යන අර්ථය යොග්‍යතර යි. මෙහි පැවසෙන්නේ කාලයට විරුඬ බියසෙන දෙන බව යි. විශෙෂයෙන් බියට සුදුසු කාල හා නෙත පුපුරණ කාල ඈත් බැවිනි.

82 ස තු රු සුරඅදුරු එකපැහැර දුරුකා ළ
මි තු රු කඹුරුවන නිරතුරු පුබුදු කා ළ
අ තු රු තුසර සිඳුවන දෑකුමෙන් පහ ළ
ල හි රු සිරින් දිලිහිනි හිමි නෙත්සඟ ළ

**විභක්ති**– සතුරුසුරඅදුරු 2. එකපැහර 4. දුරු 2. කළ 1. මිතුරුතඹුරු වන 2. නිරතුරු 2. පුබුදු 2. කළ 1. අතුරුතුසර 2. සිඳුවන 1. දෑකුමෙන් 4. පහළ 2. ලහිරුසිරින් 4. හිමි 7. නෙත්සඟළ 1.

**පදාර්ථ**– සතුරුසුර, සුරශත්‍රු නමැති (අසුරනමැති); අඳුරු, අන්ධ කාරය; එකපැහැර, එක්පහරින්(එකවිට); දුරුකළ, දුරුවූවක් කළා වූ ද; මිතුරු, මිත්‍ර නමැති; තඹුරුවන, තාමරසවනය; නිරතුරු, නිරන්තර යෙන්; පුබුදුකළ, ප්‍රබුඬ කළා වූද; පහළ, ප්‍රකට වූ; අතුරු, අන්තරාය නමැති; තුසර, තුෂාරය (පින්න); දෑකුමෙන්, දර්ශනයෙන්; සිඳුවන, සිඳුවන්නා වූද; හිමි, ස්වාමිහුගේ; නෙත්සඟළ, නෙත්‍රයුග්මය; ලහිරු සිරින්, තරුණසූර්‍ය්‍යශ්‍රියෙන්; දිලිහිනි, ජ්වලිත විය.

**භාවය**– (සැළලිහිණිය) විභීෂණදිව්‍යරාජයාගේ නෙත්දෙක තරුණ සූර්‍ය්‍ය විලාසයෙන් දිලිසුනේය.

**ක්‍රි: ය**– හිමි නෙත්සඟළ ලහිරුසිරින් දිලිහිනි.

**උ: ක**– **දිලිහිනි:** අතීතකාතීඃඅර්ථ තිරුත්සාහිකක්‍රියා යි. **නෙත් සඟළ:** උක්තකර්තෘ යි. **හිමි:** සත්සම්බන්ධ යි. **ලහිරුසිරින්:** උප ලක්ෂණාර්ථයෙහි කාරණ යි.

<u>අඛ්‍යාතක්‍රියා</u>- (දුරු)කළ, (පුබුදු)කළ, සිඳුවන, පහළ.

**(දුරු)කළ:** කර්තෘකාරක යි. **නොත්සගළ:** කෘ: උක්තකර්තෘ යි. **සතුරුසුරඅඳුරු:** අනුක්තප්‍රකෘතිකර්ම යි. **දුරු:** විකෘතිකර්ම යි. **(පුබුදු)කළ:** කර්තෘකාරක යි. **නෙත්සගළ:** උක්තකර්තෘ යි. **මිතුරු තඹුරුවන:** අනුක්තප්‍රකෘතිකර්ම යි. **පුබුදු:** විකෘතිකර්ම යි. **සිඳුවන:** සිදු (සිඳීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **නෙත්සගළ:** කෘ: උක්ත කර්තෘ යි. **පහළ:** 'ප්‍රකට' ශබ්දයෙන් ආයේ වේ. කර්තෘකාරක යි. **අතුරුතුසර:** උක්තකර්තෘ යි.

<u>සමාස</u>- 1 සතුරුසුරඅඳුරු. 2 එකපැහැර. 3 මිතුරුතඹුරුවන. 4 අතුරුතුසර. 5 ලහිරුසිරින්. 6 නෙත්සහළ.

<u>විග්‍රහ</u>- 1 සුරනට සතුරු=සුරසතුරු–සතුරුසුර, සතුරුසුරම අඳුරු=සතුරුසුර අඳුරු. 2 එක ද එම පහර ද=එකපැහැර. ඉතිං. 4 තඹරුවල වන=තඹුරුවන, මිතුරු ම තඹුරුවන=මිතුරුතඹුරුවන. 6 අතුරු ම තුසර=අතුරුතුසර. 7 ලා වූයේ ද එම හිරු වූයේ ද= ලහිරු, ලහිරුගේ සිරි=ලහිරුසිරි–ඉතිං. 8 නෙත්වල සහළ=නෙත් සහළ.

<u>විශේෂ විභාග</u>- තරුණ සූර්‍ය්‍යා රක්තවර්ණයෙන් දෘශ්‍යමාන ය. සූර්‍ය්‍යා උදවීමෙන් රාත්‍රිකාලයෙහි පැතිර් අන්ධකාරය එකවිට ම දුරුවේ. එමෙන් විසිෂණ දිව්‍යරාජයාගේ නෙත් සගළ ද රක්තවර්ණ ය. ඒ නෙත්සගළ උදවීමෙන් එකවිටම සුරශත්‍රුසමූහය දුරුවිය. "එබැවින් සතුරුසුරඅඳුර එකපැහැර දුරු කළ" යනු කීහු. තරුණ සූර්‍ය්‍යා උදවීමෙන් දිනක් පාසාම ප්‍රබොධ වියයුතු තාම රස පිබිදේ. එමෙන් විසිෂණදිව්‍යරාජයාගේ නෙත්සගළ උදවීමෙන් පුබුදු වියයුතු මිත්‍රසමූහයා පුබුදු වූහ. එබැවින් "මිතුරුතඹුරුවන නිරතුරු පුබුදුකළ" යනු කීහු. සූර්‍ය්‍යා උදවීමෙන් එදත් අදත් කවදත් පිනි සිඳීයන සුලුය. එමෙන් විසිෂණදිව්‍යරාජයාගේ නෙත්සගළ උදවීමෙන් ඒ ඒ අයට පැමිණෙන අනත රාය කවදත් සිඳියන සුලුය. එබැවින් "අතුරුතුසර සිඳුවන" යනු කීහු. මේ සියල්ල ම වන්නේ ඒ නෙත්සගළෙන් බැලීමෙනි. මෙහි "දුරුකළ, පුබුදුකළ" යන දෙතන්හි ක්‍රියාව අතීත කොට යෙදීමෙන් හැඟෙන්නේ සතුරන්ගේ දුරුවීම හා මිතුරන්ගේ පුබුදු වීම නෙත්සගළ පහළ වූ කාලයෙහිම වූබවය. "සිඳුවන" යන වර්තමානයෙන් හැඟෙන්නේ ඉන් අනතරාය නැතිවීම සැමදම වන බව යි. වර්තමාන ක්‍රියාව කාලත්‍රණට ම සාධාරණව යෙදෙන බැවිනි.

83 ය ස ගා න කල නැණ ගැණ සිඳගනන් සැ දී
නොලගා ඵ හිමි දිගු තුගු නෑහැයට වොරැ දී
ස.ම ගා රදුන් දෙඹියන් සෙවුමින් නිසැ දී
මූ ර ගා අහෝ මිණිකාලම වෙමෙහෙ වි දී

**විභක්ති**– යසගාන 2. කළ 7. තැන 8. තැන 8. සිදඟනන් 3. එ 7. හිමි 7. දිගු 7. තුඟු 7. නෑහැයට 7. වොරැඳි 7. රදුන් 2. දෙවියන් 2. මිණි සාලම 1. වෙහෙස 2.

**පදාර්ථ**– සිදඟනන්, සිද්ධාඞ්ගනාවන් විසින්; සැදී, අලඞ්කෘත ව; තැන තැන, තන්හි තන්හි (ඒ ඒ තැන); යස ගාන කළ, යශෝගාය නය කරණ ලද්දාවූ; එහිමි, ඒ ස්වාමිහුගේ; දිගු, දීඝ වූ; තුඟු, උස් වූ; වොරැඳි, විරාජමාන වූ; නෑහැයට, නාසිකාවට; නොලඟා, ආසන්න නොව; මිණිසාලම, මණිසාභලය තෙමේ (මැණික් හොරනෑව); රදුන් සමඟා, රජුන් හා; දෙවියන්, දෙවතාවන් ද; සෙවුමින්, සෙව නය කරමින්; නිසැදි, නිරන්තරයෙන්; මුරගා, උද්ඝොෂණය කොට; වෙහෙසවිඳි, දුක් විඳිනේය; අහෝ, ඛෙදයෙකි.

**භාවය**– මේ විශිෂණ දිව්‍යරාජයාගේ නාසය මිණිහොරනෑවක ආකාර යෙන් ඊටත් වඩා මහත් වූයේ මනරම් වේ.

**ක්‍රි: ය**– **මිණිසාලම රදුන් සමඟ දෙවියන් සෙවුමින් නිසැදි මුර ගා අහෝ වෙහෙස විදි.**

**උ: කා**– **විඳි:** වර්තමානක්‍රියා යි. **මිණිසාලම:** උක්තකර්තෘ යි. **වෙහෙස:** අනුක්තකර්ම යි. **අහෝ:** ඛෙදාර්ථයෙහි හෝ විතර්කාර්ථ යෙහි නිපාත යි. (මුර)**ගා**; පෙරකිරියට ද **මිණිසාලම** යනු ම උක්තකර්තෘ යි. **නිසැදි:** ක්‍රියාවිශෙෂණ යි. **සෙවුමින්:** මුසුකිරියට ද **මිණිසාලම:** උක්තකර්තෘ යි. **රදුන්-දෙවියන්:** අනුක්තකර්ම යි. **සමඟ:** සමුච්චයාර්ථයෙහි නිපාත යි.

**අර්ථක්‍රියා**– **කළ, වොරැඳි.**

**කළ:** කර්මකාරක යි. **හිමි:** කා: උක්තකර්ම යි. (**යස ගාන:** අනුක්තකර්ම යි). **වොරැඳි:** වොරඳ (බැබලීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **නෑහැය:** කා: උක්තකර්තෘ යි.

**සමාස**– 1 යසගාන. 2. සිඳගනන්. 3 මිණිසාලම.

**විග්‍රහ**– 1 යසේ ගාන=යසගාන. 3 මිණි යුත් සාලම=මිණි සාලම.

**විශෙෂ විභාග**– දෙවියන් අතරත් රජුන් අතරත් තුයර්‍යවාදනය කිරීමෙහි හොරනෑ පිඹීම ප්‍රසිද්ධිය යි. එය කවිහු විසින් ‘එහිමි දිගු තුඟු නෑහැයට නොලඟා මුරගා වෙහෙස විඳි’යි කියන ලද්දේ අන් අයුරකින් සැලකීමෙනි. (උත්ප්‍රෙක්ෂාවශයෙනි) ‘අහෝ, යනු යොදන ලද්දේ ඒ පැමසීම පිණිස යි. ‘නොලඟා’ යන

තත්හි 'ලඟා'යනු පූර්වක්‍රියා යි. එහි ධාතුව 'ලං' යන නාමයෙන් සිඩ 'ලග' යනු යි. එහෙයින් ඒ නාමධාතුවෙකි. 'සමග' යන නිපාතය අකුරු සම කිරීම සඳහා අන්ත දීර්ඝයෙන් සමඟා යි යෙදීන. 'මුරගා' යනු ද පෙරකිරියෙකි. එහි ධාතුව 'මුර' යන අනුකරණ ශබ්ද පූර්ව ගා (ගෑයීමෙහි) යනු යි.

84 සි රි ස ර  හිගුල්විල සේහස වැලෙවි ග  න
සු ර ව ර  සලෙල රනලවනන දළ දුල  න
ම න හ ර  සඳවලා පෙළ කොළවර පෙනෙ  න
පැහැසර  ලසඳ යුවලෙක් ඇත්නම් එමෙ  න

<u>විභක්ති</u>– සිරිසර ४. හිඟුල්විළ 8. සේහස වැල 2. ගන 2. සුරවර 7. සලෙල ४. රනලවනන 8. දළ 1. දුලන 1. මනහර 7. සඳවලාපෙළ 7. කෙළවර 8. පෙනෙන 1. පැහැසර 1. ලසඳ යුවලෙක් 1. එ 2.

<u>පදාර්ථ</u>– සිරිසර, ශ්‍රී සාර වූ; හිඟුල්විල, ජාතිහිඞ්ගුල තඩාගයෙක්හි (සාදිලිංගම් විලක); ගන, සාන්ද්‍ර වූ; (ගැවසීගත්තා වූ); සේහසවැලෙවි, ශ්වේත හංසාවලි දෙසාක්මෙන්; සුරවර, විභීෂණ දිව්‍යරාජයාගේ; සලෙල, ලීලා සහිත වූ; රනලවනන, රතුතොල් දෙකොන්හි; දුලන, දිලිසෙන්නා වූ; දළ, දංෂ්ට්‍රාවය; මනහර, මනොඥ වූ; සඳවලා පෙළ කොළවර, සන්ධ්‍යාවලාහක පඞ්ක්ත්‍යක්හුගේ කොන්හි; පෙනෙන, පෙනෙන්නා වූ; පැහැසර, ප්‍රභාස්වර වූ; ලසඳ යුවලෙක්, බාල චන්ද්‍ර යුගලයෙක්; ඇත්නම්, විද්‍යමාන නම්; එ මෙන, එවැනිය.

<u>භාවය</u>– විභීෂණදිව්‍යරාජයාගේ දළදෙක සඳවලාපෙළක දෙකොන්හි ලසඳ යුවලක් ඇති වුව හොත් එවැනිය.

<u>ක්‍රි: ය</u>– දළ ලසඳ යුවලෙක් ඇත් නම් එමෙන වේ.

<u>උ: න</u>– **වේ:** ක්‍රියා යි. **දළ:** උක්තකර්තෘ යි. **ඇත්:** යනු නෙපාතික ක්‍රියා යි. **ලසඳ යුවලෙක්:** උක්තකර්තෘ යි. **නම්:** අනියමාර්ථ නිපාත යි. **එ:** උපමා යි. **මෙන:** උපමාද්‍යෝතක නිපාත යි.

<u>අප්‍රධානක්‍රියා</u>– **දුලන, පෙනෙන, පැහැසර.**

**දුලන:** කර්තෘකාරක යි. **දළ:** උක්තකර්තෘ යි. **පෙනෙන:** කර්මකාරක යි. **ලසඳයුවලෙක්:** කර්ම: උක්තකර්ම යි. **පැහැසර:** 'පභස්සර' ශබ්දයෙන් ආයේ වේ. කර්තෘකාරක යි. **ලසඳයුවලෙක්:** කර්ත: උක්ත කර්තෘ යි.

<u>සමාස</u>– 1 සිරිසර. 2 හිඟුල්විල. 3 සේහසවැල. 4 සුරවර. 5 සලෙල. 6 රනලවනන. 7 මනහර. 8 සඳවලාපෙළ. 9 ලසඳයුවලෙක්.

විග්‍රහ– 2 හිඟුලෙන් යුත් විල=හිඟුල්විල. 3 සේ වූයේ ද එම හස වූයේ ද=සේහස. සේහසුන්ගේ වැල=සේහසවැල. 6 රත් වූයේ ද එම ලවන් වූයේ ද=රත්ලවන්. රත්ලවනෝ අත=රත්ලවනත. 8 සඳෙහි වලා=සඳවලා, සඳවලාවල පෙළ=සඳවලාපෙළ. ලා වූයේ ද එම සඳ වූයේ ද=ලසඳ, ලසඳේ යුවලෙක්=ලසඳයුවලෙක්.

විශේෂ විභාග– මේ කවියෙන් වර්ණිත වූයේ විභීෂණ දිව්‍යරාජයාගේ දළු දෙකය. ඒ වනාහි සාදිලිංගම් විලක දෙකොණෙහි වූ ශ්වේතහංස පංක්ති දෙකකට ද ශඛ්‍යාවලාහක පංක්තිය දෙකොණෙහි නවසඳ යුවලයක් සිටිනොත් ඊට ද සමකිරීමෙන් වර්ණිතා කරණලද්දීය. එහිදු නවසඳ යුවලයකට සම්කිරීම අභූතොපමා වශයෙනි. සඳයුවලයක් නැති බැවිනි. ශ්වේතහංසපංක්ති දෙකකට සම කිරීමෙන් දළු දෙකේ ශුභ්‍රවර්ණය හා දීර්ඝත්වය ද පැවසේ. නවසඳට සම කිරීමෙන් වක්ගතිය හා උල්ගතිය පැවසේ. තවද මෙකියන ලද පරිදි දළු ඇතිවීම දෙවතා විලාසයක් නොව රාක්ෂස විලාසයෙකි. විභීෂණ දිව්‍යරාජයා ජන්මයෙන් රාක්ෂස වූ බැවින් මෙබඳු දළු දෙකක් ඇති විය.

81 ඝ නා  මිණිවලලු නැගි රුස්මල් ඝැණෑ  ති
ම නා  දිගු ඇඟිලි නව තඹ ලපලු ඇ  ති
ද නා  කැමැති දෙන පලඹත එසුරප  ති
දි නා  දිමුතු අතුසිරි සුරතුර පැව  ති

විභක්ති– ඝනාමිණිවලලු 6. නැගි 3. රුස්මල්ඝැන් 3. ඇති 1. මනා 3. දිගු ඇඟිලිනවතඹ ලපලු 3. දනා 5. කැමති 2. දෙන 1. පලඹත 1. එ 7. සුරපත් 7. දිමුතු 8. අතු 7. සිරි 2. සුරතුර 8. පැවති 2.

පදාර්ථ– ඝනාමිණි, ඝනකයෙන් හා මිණියෙන් කරණලද්දා වූ; වලලු, වලලුවලින්; නැගි, උද්ගත වූ; රුස්, රශ්මි නමැති; මල්ඝැන් ඇති, මල්පොකුරු ඇත්තා වූ; මනා, යහපත් වූ; දිගු, දීඝ වූ; ඇඟිලි, ඇඟිලි නමැති; නව, අභිනව වූ; තඹ, තඹවන්වූ; ලපලු ඇති, ලදලු ඇත්තා වූ; දනා, ජනයාහට; කැමති දෙන, කැමති දේ දෙන්නා වූ; එසුරපති, ඒ සුරෙන්ද්‍රයාගේ; පලඹත, ප්‍රලම්බ හස්තය (එල්ලෙන්නා වූ අත); සුරතුර, කල්පවෘක්ෂයෙහි; පැවති, පැවැත්තා වූ; දිමුතු, දීප්තිමත් වූ; අතු, ශාඛායෙහි; සිරි, ශ්‍රිය; දිනා, ජය ගණී.

භාවශ– ඒ ඒ අයට කැමති දේ දෙන බැවින් විභීෂණ දිව්‍යරාජයාගේ අත කල්පවෘක්ෂ ශාඛාවටත් වඩා ශ්‍රේෂ්ඨ ය.

ක්‍රි;ය– සුරපති පලඹත අතුසිරි දිනා.

උ: ක– දිනා: වර්තමාන ක්‍රියා යි. පලඹත: උක්තකර්තෘ යි සුරපති; තත් සම්බන්ධ යි. සිරි: අනුක්තකර්ම යි. අතු: තත් සම්බන්ධ යි.

අප්‍රක්‍රියා– නැගි, දෙන, පලඹ, පැවති.

**නැගි:** නග (නැගීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **රැස්:** කා: උක්තකර්තෘ යි. **දෙන:** කර්තෘකාරක යි **වලලු:** කා: උක්තකර්තෘ යි. **පලඹ:** 'ප්‍රලම්බ' ශබ්දයෙන් ආයේ වේ. කර්තෘකාරක යි. **අත:** කා: උක්තකර්තෘ යි. **පැවති:** කර්තෘකාරක යි. **සිරි:** කා: උක්තකර්තෘ යි.

**සමාස**- 1 කනාමිණිවලලු, 2 රැස්මල්කැන්. 3 ඇඟිලිනවතඹලපලු. 4 පලඹත. 5 සුරපති. 6 සුරතුර.

**විග්‍රහ**- 1 කනා ද මිණි ද=කනාමිණි, කනාමිණියෙන් කළ වලලු=කනාමිණිවලලු. 2 මල්වල කැන්=මල්කැන්. රැස් ම මල්කැන්= රැස්මල්කැන්. 3 ලා වූයේ ද එම පලු වූයේ ද=ලපලු. තඹවන් වූයේ ද එම ලපලු වූයේ ද=තඹපලු, නව වූයේ ද එම තඹලපලු වූයේ ද නවතඹලපලු, දිගු වූයේ ද එම ඇඟිලි වූයේ ද=දිගුඇඟිලි; දිගුඇඟිලිම නවතඹලපලු=දිගුඇඟිලිනවතඹලපලු. පලඹ වූයේ ද එම අත වූයේ ද= පලඹත. 5 සුර වූයේ ද එම පති වූයේ ද=සුරපති. 6 සුරන්ගේ තුර=සුරතුර.

**විශේෂ විභාග**– විභීෂණ දිව්‍යරාජයාගේ පලඹතසිරිය විසින් සුරතුරේ අතුසිරිය දිනූ බව මේ කවියෙන් සූචිත ය. මෙහි විභීෂණ දිව්‍යරාජයා කල්ප වෘක්ෂ ස්වරූපයෙන් ද ප්‍රලම්බහස්තය ශාඛාස්වරූපයෙන් ද අතෙහි රත්මිණි වලලුවලින් නැගි රශ්මිය පුෂ්පස්තවක ස්වරූපයෙන් ද දිගුඇඟිලි නවතඹුපලුව ස්වරූපයෙන් ද නිරූපිත යි. මෙයින් පලඹත කල්පවෘක්ෂ ශාඛාවකට සම කොට එහි උසස් බවක් ද දක්වනුයේ 'දිනා' යන පදයෙනි. කල්පවෘක්ෂ ශාඛාව කැමති දේ දෙන්නේ සුරන්ට පමණකි. මෙකී පලඹත සාමාන්‍යයෙන් සෑම ජනයාහට කැමති දේ දෙන සුලුය. එයින් පලඹත අතුසිරි දිනා යි.

86 පානා සෙනෙහෙ සුසිඳු මඳලස බැ ල්ම
ගානා නිමහමෙව් දෙවඟන නෙත් කැ ල්ම
නානා සුරිඳු පුළුලුර සිරිසඳ ඇ ල්ම
තූනා කෙළින ගලතල වැනි ඉඳුනි ල්ම

**විභක්ති**– පානා 2. සෙනෙහෙ 2. සුසිඳු 2. මඳලස බැල්ම 4. ගානා 1. නිමහම් 2. දෙවඟන 7. නෙත්කැල්ම 8. නානා 1. සුරිඳු 7. පුළුලුර 1. සිරිසඳ 3. ඇල්ම 2. කෙළින 2. ගලතල 2. ඉඳුනිල්ම 2.

**සඳැස්**= දෙවඟන, දිව්‍යාඞ්ගනාවන්ගේ; සෙනෙහෙ, ස්නේහය; පානා, ප්‍රකාශ කරන්නා වූ; සුසිඳු, සුස්නිග්ධ වූ; මඳලස බැල්ම, මන්දාලස්‍ය නිරීක්ෂණය කරණකොට ගෙණ; නිමහම් එව්, නිමවූ චිත්‍රකර්මයක මෙන්; ගානා, ආලේප කරණු ලබන්නා වූ; නෙත්කැල්ම, නෙත්‍ර කාන්ති නමැති ජලයෙහි; නානා, ස්නානය කරන්නා වූ; සුරිඳු, විභී

ෂණ සුරේන්ද්‍රයාගේ; පුළුලුර, පෘථුල වූ වක්‍ෂස; සිරිසඳ, ශ්‍රී කාන්තාව විසින්; ඇල්ම, ආලය; නූනා, ඌන නොකොට; කෙළිනා, ක්‍රීඩා කරන් නා වූ; ඉදුනිල්ම, ඉන්ද්‍රනීලමය වූ; ගලතල වැනි, ගල්තලයක් වැනි වේ.

**භාවය**– විභූෂණ සුරේන්ද්‍රයාගේ වක්‍ෂස ඉන්ද්‍රනිල මාණික්‍යමය ගල්තලා වක් වැනිය.

**ක්‍රි: ය–** **සුරිඳු පුළුලුර ගලතල වැනි වේ.** (උක්තානුක්ත සුගම යි.)

**අර්ථක්‍රියා– පානා, ගානා, නානා, කෙළින.**

**පානා:** පා (පැමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **මඳලසබැල්ම:** කා: උක්තකර්තෘ යි. **ගානා:** ගා (ගැමෙහි) ධාතු යි. කර්මකාරක යි. **නෙත්කැල්ම:** කා: උක්තකර්ම යි **නානා:** නා (නැමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **පුළුලුර:** කා: උක්තකර්තෘ යි. **කෙළින:** ආධාරකාරක යි. **පුළුලුර–ගලතල:** කා: උක්තාධාර යි.

**සමාස**– 1 සුසිනිඳු. 2 මැඳලසබැල්ම. 3 නිමහම්. 4 දෙවඟන. 5 නෙත්කැල්ම. 6 සුරිඳු. 7 පුළුලුර. 8 සිරිසඳ. 9 ගලතල.

**විග්‍රහ**– මඳ වූයේ ද එම අලස වූයේ ද=මඳලස, මඳලසෙන් බලන බැල්ම=මඳලසබැල්ම. 3 නිම වූයේ ද එම කාම් වූයේ ද=නිම හම්. 8 සඳ වූයේ ද එම සිරි වූයේ ද=සිරිසඳ.

**විශෙෂවිභාග**– 'මඳලස බැල්ම' නම් අඟනන් විසින් ලජ්ජායෙන් මෙන් මුහුණ මඳක් හරවා අලසගතියෙන් බලන බැල්ම යි. එලෙසින් බලන්නේ සෙන හය පවසාලීම පිණිස යි. දෙවඟනන්ගේ ඒ බැල්මෙන් විභූෂණ දෙවෙන්ද්‍රයාගේ වක්‍ෂයෙහි වැදුනු නෙත්‍රකාන්තිය අවසන් කළ සිනියමක ගාන විලිව්විසේ කාන්තිය වැනි විය. ඒ කාන්තිය විනාඝි වක්‍ෂස මතුයෙහි ජලයක් මෙන් වූ බැවින් වක්‍ෂස එහි බැස සනානය කරන්නක් වැනි විය. මෙහි නෙත්කැල්ම යන්නෙන් නෙත්‍රකාන්ති නැමැති ජලය ගැණේ. උපමෙය පමණක් දක්විමෙන් උපමාව ගැණෙන්නේ සමාසොක්තිවශයෙනි. නෙත්කැල්ම උපමෙය යි. එයින් ගතයුතු ජලය උපමා යි. විභූෂණදෙවෙන්ද්‍රයාගේ වක්‍ෂස සිරිකාන ඇල්ම අඩු නොකොට ක්‍රීඩා කරණ ඉඳුනිල්ගල්තලයක් වැනිය යි කිමෙන් වක්‍ෂස හා ඉඳු නිල්ගල්තලය යන දෙක ම සිරිකාන ක්‍රීඩාකරණ තැන් බව දක් වේ. එයින් වක්‍ෂයෙහි ශ්‍රීමද්භාවය ද පැවසේ.

'නූනා' යන්න 'න' පූර්ව 'ඌන' යන නාමධාතුවෙන් සිඛ පූර්වක්‍රියායෙකි. 'ඉඳු නිල්ම' යන්න 'ඉන්ද්‍රනීලමය' යන්නෙන් සිංහල වූයේ වේ. ඉන්ද්‍රනීලයෙන් කරණ ලද යන අර්ථ යි. සිංහලයෙහි වූ 'මුවා' ප්‍රත්‍යය යෙදීමෙන් වූයේ නම් 'ඉඳුනිල්මුවා' යනු වේ. අර්ථයෙන් දෙකම සම වේ.

87 ල කු ළු පුළුලුකුළු වට බිම එ සුර වි රූ
වෙ ර ළු මිණිකැළුම් පතරින් මෙවුලතු රූ
නැ බු ළු සොඳුරු සුසිලිටු වටෝර රඹතු රූ
බැ බ ළු සිලිල් ඉසිනා විලස සිරි දූ රූ

විභක්ති- ලකුළු 7. පුළුල් 8. උකුළුවට බිම 8. එ 7. සුරවිරු 7. වෙරළු මිණිකැලුම්පතරින් 4. මෙවුල් 7. අතුරු 8. නැබුළු 1. සොඳුරු 1. සුසිලිටු 1. වටෝරරඹතුරු 1. බැබළු 1. සිලිල් 2. ඉසිනා 7. විලස 7. සිරි 2.

පදාර්ථ- එසුරවිරු, ඒ විභීෂණ සුරවීරයාගේ; පුළුල්, පෘථුල වූ; උකුළුවට බිම, උකුල්වට නමැති භූමියෙහි වූ; නැබුළු, මහත් වූ; සොඳුරු, සුන්දර වූ; සුසිලිටු, ඉතා සිලටු වූ; වටෝර, වෘත්තෝරු නමැති; රඹතුරු, රම්භාවෘක්ෂයෝ; ලකුළු, අලංකෘත වූ; මෙවුලතුරු, මේඛලාන්තරයෙහි වූ; වෙරළුමිණි, වෛදූර්යමාණික්‍යයන්ගේ; කැලුම්පතරින්, කාන්තිසමූහය කරණකොට ගෙණ; බැබළු, භ්‍රාජිත වූවාහු; සිලිල් ඉසිනා විලස, ජලසෙචන විලාසයාගේ; සිරි, ශ්‍රිය; දූරු, දූරුවාහු ය.

භාවය විභීෂණදිව්‍යරාජයාගේ මෙවුල්දම් මිණිරැසින් බැබලූ කලවා යුවල දිය ඉසින කෙසෙල්ගස් දෙකක් වැනිය.

ක්‍රි: ය වටෝරරඹතුරු සිරි දූරු. (උක්තානුක්තසුගම යි.)

අ:ක්‍රි:- ලකුළු, බැබළු.

ලකුළු: 'ලකළ' යනු මෙති, කර්මකාරක යි. මෙවුල්: කා: උක්ත කර්ම යි. බැබළු: බබල (බැබලීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. වටෝරරඹතුරු: කා: උක්තකර්තෘ යි.

සමාස- 1 උකුළුවටබිම. 2 සුරවිරු. 3 වෙරළුමිණිකැලුම් පතරින්. 4 වටෝරරඹතුරු.

විග්‍රහ- 1 උකුලේ වට=උකුළුවට. උකුළුවට ම බිම්=උකුළුවට බිම්. එහි. 2 සුරම විරු=සුරවිරු. 3 වෙරළු ම මිණි=වෙරළුමිණි. වෙරළුමිණියේ කැළුම්=වෙරළුමිණි කැළුම්. වෙරළුමිණි කැළුම්වල පතර=වෙරළුමිණිකැලුම්පතර-ඉන්. 4 වට වූයේ ද එම උර වූයේ ද= වටෝර, රඹ ම තුරු=රඹතුරු, වටෝර ම රඹතුරු=වටෝර රඹතුරු.

විශෙෂ විභාග- මෙහි විභීෂණදිව්‍යරාජයාගේ උකුළුවට භූමිස්වරූප යෙන් ද, ඌරුයුග්මය රම්භාස්වරූපයෙන් ද නිරූපණය කොට, උකුළලහි බැඳි මෙවුල්දමෙහි වූ වෛදූර්‍ය්‍යමාණික්‍යයන්ගේ කාන්තිය ඌරුයුග්මයට වදින කල්හි කෙසෙල්ගස් දෙකකට දිය ඉසින ආකාරයක් දරීයයි කීහ. වෙරළුමිණි නම් බළල් ඇසක් වැනි මිණිවිශෙෂයකි. දුන් වයිරෝඩියයි ද කියනුලැබේ.

99 ව ඳ නා සුරන් කිරුළග රුවන කැලුමෙ නා
බ ඳ නා කොමල ලතුවිලස අළ රතින් ම නා
ම ඩ නා බැවින් සියපත එහිමි පතුලෙ නා
බියෙ නා ලතඹ හෝපලු සදිසි වෙවුල නා

විභක්ති– වඳනා 7. සුරන් 7. කිරුළග 8. රුවන 7. කැලුමෙනා 4. බඳනා 7. කොමල 7 ලතු 7. විලස 2. අළ 4. රතින් 4. මඩනා 7. බැවින් 4. සිය පත 2. එ 7. හිමි 7. පතුලෙනා 4. බියෙනා 4. ලතඹහෝපලු 1. සදිසි 1. වෙවුලනා 7.

පදාර්ථ– වඳනා, නමස්කාර කරන්නා වූ; සුරන්, දෙවියන්ගේ; කිරුළග, කිරීටාග්‍රයෙහි වූ; රුවන, රත්නයෙහි; කැලුමෙනා, කාන්ති ය කරණකොට ගෙණ; බඳනා, බන්ධනය කරණු ලබන්නා වූ (ආලෙපකරණුලබන්නා වූ); ලතු, ලහයෙහි; විලස්, විලාසය; අළ, එළ වූ; රතින්, රක්තවර්ණයෙන්; මනා, යහපත් වූ; පතුලෙනා, පාද තලයෙන්; එහිමි, ඒ ස්වාමිහු; සියපත, පද්මය (පද්මපීඨය); මඩනා බැවින්, මර්දනය කරණ බැවින්; ලතඹහෝපලු, තරුණ රක්තාශොක පල්ලවයෝ, බියෙනා, භීතියෙන්; වෙවුලනා සදිසි, වෙවුලන්නවුන් සමාන වෙත්.

භාවය– විභීෂණදිව්‍යරාජයා පද්මාකාරපාදපීඨයෙහි පා තබාගෙණ සිටින විට දෙවිවරු පැමිණ ඔහුගේ පා වඳිති.

ක්‍රි: ය- ලතඹහෝපලු බියෙනා වෙවුලනා සදිසි වෙත්.

උ: ත– වෙත්: ක්‍රියා යි. ලතඹහෝපලු; උක්ත ප්‍රකෘතිකර්තෘ යි. සදිසි: විකෘතිකර්තෘ යි. වෙවුලනා: තත්සම්බන්ධ යි. බියෙනා: 'වෙවුලනා' යන්නෙහි කරණ යි.

අර්ථක්‍රියා– වඳනා, බඳනා, අළ.

වඳනා: කර්තෘකාරක යි. සුර: කා: උක්තකර්තෘ යි. බඳනා: කර්මකාරක යි. ලතු: කා: උක්තකර්ම යි. අළ: කරණකාරක යි. රත: කා: උක්තකරණ යි.

සමාස– 1 කිරුළග. 2 සියපත. 3 ලතඹහෝපලු.

විග්‍රහ– 3 තඹ වන් හෝපලු=තඹහෝපලු, ලා වූවෝ ද ඔහු තඹ හෝපලු වූවෝ ද=ලතඹහෝපලු.

විශෙෂ විභාග– මෙයින් අගෙහුගේ සෙසු දෙවිවරුන් කිරිට සහිතව විභීෂණ දිව්‍යරාජයාගේ පාදෙත වදින බව හා ඒ පාදෙක පියුම් පරදවන බවය. විභීෂණදෙවෙන්ද්‍රයා පාදෙක තබාගෙන සිටිනේ පද්මාකාර පීඨයෙක්හි ය. වදින

දෙවිවරුන්ගේ කිරුළු මිණිරැසින් මනා රන්පැහැයෙන් හෙබියා වූ පාදෙක පියුම කට වඩා මනහරය. රතු අශෝක දළු මෘදු බැවින් සැලෙති. බිය ආදියකින් නොසැලෙති. විභීෂණදෙවේන්ද්‍රයාගේ පතුල්දෙක උපස්කොට නිරූපණය කරන්නා වූ කිවිඳු "බිභෙනා ලතාඕනෝපලු සිදිසි මෙවුලනා" යි උත්ප්‍රේක්ෂා කළේය. මෙහි වූ 'බදනා' යන්න ආලෙපාර්ථයි. ආලෙපයෙන් වන්නේත් බැඳී මෙකී. "ලතු" යන්න "ජතු" ශබ්දයෙන් ආයේ වේ. "අලතා-ලහ-ලා" යනාදි සිංහල ශබ්දයෝ ද ජතුවාචක වෙත්.

89 වෙසෙසින් පහන් පැහැසර ගැඹුරු පිවිතු රු
බැ ලු ව න් ඇලුම් කරවන යලිදු බියක රු
සි රි පි න් රුවන් පිරි එසුරිඳු සයුර යු රු
මු වෙ කින් කියා නිමවිය හැකි ද රූසි රු

විහක්ති- වෙසෙසින් 4. පහන් 7. පැහැසර 7. ගැඹුරු 7. පිවිතුරු 7. බැලු වන් 2. ඇලුම් 2. කරවන 7. බියකරු 7. සිරිපින්රුවන් 4. පිරි 7. එ 7. සුරිඳු 7. සයුරයුරු 7. මුවෙකින් 4. නිම් 2. විය 1. හැකි 1. රූසිරු .

පදාර්ථ- වෙසෙසින්, විශෙෂයෙන්; පහන්, ප්‍රසන්න වූ; පැහැසර, ප්‍රභාස්වර වූ; ගැඹුරු, ගම්භීර වූ; පිවිතුරු, පවිත්‍ර වූ; බැලුවන්, අවලොකනය කළවුන් (ලවා); ඇලුම් කරවන, ඇලීම ඇති කරවන් නා වූ; යලිදු, නැවත ද; බියකරු, භයඞ්කර වූ; සිරිපින්, පුණ්‍යශ්‍රී නමැති; රුවන්, රත්නයෙන්; පිරි, පිරුණා වූ; සයුරයුරු, සාගරා කාර වූ; එසුරිදු, ඒ සුරේන්ද්‍රයාගේ; රූසිරු, රූපශ්‍රිය; මුවෙකින්, එක් මුඛයකින්; කියා, කථනය කොට; නිමවිය හැකිද, නිමාවට පැමිණිය හැක්කේ ද.

භාවය- විභීෂණ දිව්‍යරාජයා ගුණයෙන් මහ සමුදුර වැනිය. ඔහුගේ රූපශ්‍රිය කියා නිමකළ හැකි නොවේ.

ක්‍රි: ස- සුරිඳු රූසිරු මුවෙකින් කියා නිම විය හැකි වේද.

උ: ක- වේ: ක්‍රියා යි. විය: උක්ත ප්‍රකෘතිකර්තෘ යි. හැකි: විකෘතිකර්තෘ යි. නිම: 'විය' යන ප්‍රාප්ත්‍යර්ථ භාවක්‍රියාවෙහි කර්ම යි. කියා: පෙරකිරියට රූසිරු අනුක්තකර්ම යි. සුරිඳු: තත්සම්බන්ධ යි. මුවෙකින්: අනුක්තකරණ යි. ද: සමුච්චයාර්ථ නිපාත යි.

අඞ්ගක්‍රියා- පහන්, බැලු (වන්), කරවන.

පහන්: පහද (පැහැදීමෙහි) ධාතු යි. කරණකාරක යි. සුරිඳු-සයුර: උක්තකරණ යි. බැලු: බල (බැලුම්හි) ධාතු යි. කර්තෘ කාරක යි. 'අය' යනු අධ්‍යාහෘත උක්තකර්තෘ යි. කරවන: කර්තෘ කාරක යි. සුරිඳු-සයුර: උක්තකර්තෘ යි. ('ඇලුම්, අනුක්තකර්ම යි. 'බැලුවන්' ප්‍රයොජ්‍යකර්ම යි).

**සමාස**– 1 බියකාරු. 2 සිරිපින් රුවන්. 3 සුරිඳු. 4 සයුර යුරු. 5 රුසිරු.

**විග්‍රහ**– 1 බිය කෙරේනුයි=බියකාරු (කාම් වි: සමස්). 2 පිනේ සිරි=පින්සිරි–සිරිපින්. සිරිපින් ම රුවන්=සිරිපින් රුවන්.

**විශෙෂ විභාග**– මේ විභීෂණ දිව්‍යරාජයා සාගරයට සම කිරීමෙකි. තේ– "පහන්, පැහැසර, ගැඹුරු, පිවිතුරු, බැලුවන් ඇලුම් කරවන, යලිදු බියකරු සිරිපින් රුවන්පිරි" යන මේ ගුණ වලිනි. ඉන් 'සිරිපින් රුවන් පිරි' යනු හැර සෙස්ස උපමා උපමෙය දෙකට අභියෙන් සාධාරණ ගුණ යි. විභීෂණ දිව්‍ය රාජයා 'පහන්' ආදි ගුණවලින් යුක්ත යි. සාගරය ද එසේ යි. විභීෂණ දිව්‍ය රාජයා පුණ්‍යශ්‍රියෙන් යුක්ත යි. පහන් ගුණය නම් දූකුම්කලු ගතිය යි. පැහැ සරගුණය නම් කාන්තිමත් බව යි. විභීෂණ දිව්‍යරාජාගේ ගැඹුරු ගුණය නම් නොපෙනෙන අදහස් ආදිය ඇති බව යි. සයුරේ ගැඹුරුගුණය නොපෙනෙන පතුළ ඇති බව යි. විභීෂණ දිව්‍යරාජයාගේ පිවිතුරු ගුණය නම් දුශ්චරිතාදියෙන් වෙන්ව සිටීම යි. සයුරේ පිවිතුරුගුණය කුණු හකුණු තබාගෙණ නොසිට ගොඩට පමුණුවා ලීම යි. 'හැකිද' යන තන්හි 'ද' යන්න 'නොහැකි' යන්න සමුච්චය කෙරේ.

90 ලෙව් හට තමන් නම කිව රිසි දෙන විසිනි
දෙව් තුරු සුරබි සුරමිණි සරි ද කොලෙසිනි
පව් රෝදුකුදු දුරලන පොකුරඹ හසිනි
දෙව් වෙද ඇසෙන පමණෙකි වියතුන් බසිනි

**විභක්ති**– ලෙව්හට 5. තමන් 7. නම 2. රිසි 2. දෙන 7. විසිනි 4. දෙව්තුරු 1. සුරබි 1. සුරමිණි 1. සරි 1. කොලෙසිනි 4. පව්රෝදුක් 2. දුරලන 7. පොකු රඹහසිනි 4. දෙව්වෙද 7. ඇසෙන 7. පමණෙක් 1. වියතුන් 7. බසිනි 4.

**පදාර්ථ**– තමන් නම, තමන්ගේ නාමය (විභීෂණ යන නාමය); කිව, උච්චාරණය කළහොත්; ලෙව්හට, ලොකයාහට; සිරිදෙන විසිනි, කැමති දේ දීම් වශයෙන්; දෙව්තුරු, දිව්‍යවෘක්ෂය ද; සුරබි, කාමධෙනුව ද; සුරමිණි, චින්තාමාණික්‍යය ද; කොලෙසිනි, කවර ප්‍රකාරයෙකින්; සරි ද, සමාන වේද; පව්රෝදුකුදු, පාපරෝගදුඃඛ යන් නමුත්; පොකුරඹහසිනි, පුෂ්කරාම්බුපරිද්දෙන්; දුරලන, දුරී භූත කරන්නා වූ; දෙව්වෙද, දෙවවෛද්‍යයන්; වියතුන් බසිනි, ව්‍යක්තවචනයෙන්; ඇසෙන පමණෙකි, ශ්‍රවණ විෂය වන මාත්‍රයෙක් මය.

**භාවය**– විභීෂණ දිව්‍යරාජයාගේ නාමය කීමෙන් පමණක් කැමැති දේ දෙන බැවින් දෙව්තුරු සුරබි සුරමිණීවලට වඩා ශ්‍රෙෂ්ඨ ය. පව්රෝදුක් පවා නැතිකරණ බැවින් දෙව්වෙදුන්ට වඩා ශ්‍රෙෂ්ඨ ය.

<u>ක්‍රි: ය</u>- 1 දෙව්තුරු, සුරබි, සුරමිණි, සොලෙසිනි සඟි වේ ද? දෙව් වෙද ඇසෙන පමණෙක් වේ.

<u>උ: ක</u>- 1 වේ: ක්‍රියා සි. දෙව්තුරු-සුරබි-සුරමිණි: වෙන් වෙන් වශයෙන් උක්ත ප්‍රථමාන්ත සි. **සඟි:** විශෙෂ්‍යාන්ත සි. **සොලෙසිනි:** අනුක්තකාරක සි. **ද:** සමුච්චයාර්ථනිපාත සි. 2 **වේ:** ක්‍රියා සි. **පමණෙක්:** උක්තාන්ත යි. **ඇසෙන:** තත්සම්බන්ධ සි. **දෙව්වෙද:** තත්සම්බන්ධ සි.

<u>අර්ථක්‍රියා</u>- **දුරලන:** දුරුපූර්ව ලා (ලැමෙහි) ධාතු සි. කර්තෘකාරක සි. **දෙව්වෙද:** කර්තෘ උක්තාන්ත සි.

<u>සමාස</u>- 1 දෙව්තුරු. 2 සුරමිණි. 3 පව්රෝදුක්. 4 පොකුරඹ හසිනි. 5 දෙව්වෙද.

<u>විග්‍රහ</u>- 2 සුරන්ගේ මිණි=සුරමිණි. 3 පවින් වූ රෝ=පව්රෝ. පව්රෝවල දුක්=පව්රෝ දුක්. 4 පොකුරෙහි අඹ=පොකුරඹ. පොකුරඹේ හස=පොකුරඹහස-ඉනි. 5 දෙවියන්ගේ වෙද=දෙව්වෙද.

<u>විශෙෂ විභාග</u>- දෙව්තුරු, සුරබි, සුරමිණි, රිසිදේ දෙන්නේ සිතා ප්‍රාර්ථනා කළ අයට ය. නමුත් විභීෂණ දිව්‍යරාජයාගේ නාමය කීමෙන් ම පමණක් රිසිදේ දෙන බවත්, ඉන් විභීෂණ දිව්‍යරාජයා දෙව්තුරු ආදි යට වඩා ශ්‍රෙෂ්ඨ බවත් මේ කවෙහි මුල් දෙපදෙන් පැවසේ. "පව්රෝදුක්" නම් පෙර දු කළ පාපකර්මවලින් ඇතිවන රෝදුකු යි. එහි සමහර පව් රෝදුක් දෙව්-වෙද ආදි කිසිවෙකුටත් සුවකළ හැකි නොවෙත්. නමුත් සමහර පව් රෝදුක් ප්‍රයොගසම්පත්තියෙන් සුවකළ හැකිබව ධර්මනියමයෙකි. වාපිත් සෙම් තිපිම් ආදියෙන් ඇතිවන්නා වූ රෝදුක් නැතිකිරීමට නාසත්‍යාදි දෙවවෛද්‍ය යෝ ඉතා සමර්ථයහ. නමුත් ඔවුන් පව්රෝදුකුත් නැතිකරණ වා යයි කීම පණ්ඩිතවාක්‍යවල අසන්නට ලැබෙනවා පමණෙකි. විභීෂණ දිව්‍යරාජයාගේ නාමය කීමෙන් ඒ පව්රෝදුක් ද නැතිවන්නේ ය යනු ඊලඟ දෙපදයෙන් පැවසේ.

'රිසි දෙන විසිනි' යන තන්හි අර්ථය 'රිසි දීමේ වශයෙන් (අයිතියෙන්), යනු යි. 'විසිනි' යනු 'වශ' ශබ්දයෙන් කරණවිභක්ති 'ඉනි' යෙදීමෙන් සිද්ධ යි. 'වශ' ශබ්දයාගේ අර්ථය අයිතිය යනු යි. එනම් යම්කිසි ක්‍රියාවක්හුගේ අයිතියයි. ක්‍රියාව කා අයිතිය කර්තෘ හට වේ. එබැවින් සංස්කෘත ව්‍යාකරණයන්හි "ස්වතන්ත්‍රඃ කර්තා" යනු කියත්. මේ මෙසේ හෙයින් සිදත්සඟරායෙහි කතුවිබත් අරුත් කීමේදී කර්තෘ අර්ථය ප්‍රකට කරණු පිණිස විබතින් පරව 'විසින්' යන්න යොදා අරුත් කියයුතු බව කීහ. නමුත් 'විසින්' යන්න යෙදුනු පසු අර්ථය ප්‍රකට කිරීමේදී 'විසින්' යන්නෙන් පෙර සිටිපද ය ෂෂ්ඨී අර්ථයට පෙරළේ. "පඬිහු විසින් පොත කෙළේය" යන්නේ අර්ථ ප්‍රකාශ කරණය පණ්ඩිතයාගේ අයිතියෙන් කෙරුණේ ය යනුයි. මෙහිදු රිසිදීමේ අයිතිය ඇත්තාහු- දෙව්තුරු, සුරබි, සුර

මිණි"යන මොහු හා විශේෂණ සි. 'දෙව්තුරු'නම් දෙව්ලොව ඇතැයි කියන-මන්දාර, පාරිජාත, සන්තාන, කල්පවෘක්ෂ, හරිචන්දන, යන මේ පසසි. 'සුරබි' නම් කිරිමුනු දෙන් පතළමු කැමති දේ දෙන ධේනුවකි. සුරමිණ නම් කැමති දේ දෙන මාණික්‍යයෙකි. 'පොකුරඹහසිනි' යන්නෙහි 'පොකුරු' යනු පද්මයට නමි. පාලි 'පොක්ඛර' ශබ්දයෙන් ආයේ වේ. 'පොකුරු' යන්නෙන් මෙහි ගැනෙන්නේ පියුම්පත සි. අභෙදෝපචාරවශයෙනි. පියුම්පත වැටුනු දිය බිඳුව එහි නොරඳනා සුලුය. 'හස්' යනු ආකාරාර්ථ යි. දෙවවෛද්‍යයෝ නම් නාසත්‍ය අශ්වින් ආදීහු සි.

91 ම න් පිණවන යසසිරිතෙද නැණ විපු ල
සෙ න් යුද ජය රජබව තනතුරු සිය ල
දෙ න් නෙන් පැතුවිට සුබවැඩ දිගා බ ල
පි න් නම් සතුන් කළ දෙව්රජමය මෙකා ල

විභක්ති- මන් 2. පිණවන 2. යස 2. තෙද 2. නැණ 2. විපුල 2. සෙන් 2. යුදජය 2, රජබව 2. තනතුරු 2. සියල 2. දෙන්නෙන් 4. පැතු 8. විට 8. සුබවැඩ 2. දිගා 2. බල 2. පින් 1. සත 2. කළ 1. දෙව්රජ 1. මෙ 8. කල 8.

පදාර්ථ- මන්, චිත්තය; පිණවන, පිණවන්නා වූ; විපුල, මහත් වූ; යස, කීර්තිය; සිරි, ඓශ්වර්ය්‍යය; තෙද, තෙජස්ය; නැණ, ඥානය; සෙන්, සෙනාවය; යුදජය, යුධයෙහි ජයය; රජබව, රාජභාවය; තනතුරු, ස්ථානාන්තරය (යන); සියල, සියල්ල ද; සුබවැඩ, මඞ්ගලාභිවෘද්ධිය ද; දිගු ආ, දීර්ඝායුෂ ද; බල, ශක්තිය ද; පැතුවිට, ප්‍රාර්ථනා කළ කාලයෙහි; දෙන්නෙන්; දෙන හෙයින්; සතුන්, සත්වයන් විසින්; කළ, කරණ ලද්දා වූ; පින් නම්, පුණ්‍ය නම්; මෙකාල, මේකාලයෙහි; දෙව්රජමය, (මේ) දිව්‍යරාජයා මය.

භාවය- පැතූ විගස ම ඒ ඒ අයට යශශ්චෛශ්වර්‍ය්‍යාදිය දෙන බැවින් සත්වයා කළ පින්ඵල නම් මෙකල විශිෂ්ට දිව්‍යරාජයා ගේ ලැබීම සි.

ක්‍රි: ය- පින් දෙව්රජ ම වේ.

උ: කා- වේ: ක්‍රියා සි පින්: උක්තප්‍රධානකර්තෘ සි. දෙව්රජ: උක්තවිශේෂණකර්තෘ සි. ම: අවධාරණාර්ථයෙහි නිපාත සි.

අප්‍රධානක්‍රියා- පිණවන, පැතූ, කළ.

පිණවන: පිණ (පිණීමෙහි) ධාතු සි. කර්තෘකාරක සි. යස: ආදිය උක්තකර්ම සි. (මන්: අනුක්තකර්ම සි.) පැතූ: පත (පැතීමෙහි ධාතු සි. ආධාරකාරක සි. විට: උක්තාධාර සි. කළ: කර්මකාරක සි. පින්: උක්තකර්ම සි.

**සමාස**- සුදජය. 2 රජබව. 3 තනාතුරු. 4 සුබවැඩ. 5 දිගා. 6 දෙව්රජ.

**විග්‍රහ**- සුදෙහි ජය=සුදජය. රජුන්ගේ බව=රජබව. 3 අතුරු වූයේ ද එම තැන් වූයේ ද-නොහොත්, තැන්වල අතුරු (වෙසෙස්)=තනාතුරු. 5 දික් වූයේ ද එම ආ වූයේ ද=දිගා.

**විශෙෂ විභාග**- සතුන් කළ පින් නම් දෙව්රජ ම යයි මෙහි කියනලදී. 'පින්' යන්නෙන් ගැණෙන්නේ පුණ්‍ය විපාක යයි. ඒ පුණ්‍ය විපාකය ද දෙව්රජ නොවෑ.ඒ පින් කළ අයට දෙව්රජ ලැබීම යයි දතයුතු යි. මෙසේ කවි තුදුසකින් විභීෂණ දිව්‍යරාජයාගේ වර්ණනාව කොට ඉක්බිති ඔහු වැඳීමට අණකරන්නාහු "තුන්ලෝ" යනාදී කව කීහු.

92 තු න් ලෝ තමා නතුකළ රවුළු සොහොවු රු
තු න් කල් බලා සම්දුට වූ ඉටුමිතු රු
තු න් වේ ඇදුරු පුලතිසිකුල මිණිමිතු රු
තු න් විටෙකම වඳු එසුරිඳු පාතඹු රු

**විභක්ති**- තුන්ලෝ 2. තමා 7. නතු 2. කළ 7. රවුළු 7. සොහොවුරු 7. තුන්කල් 2. රම්දුට 7. වූ 7. ඉටුමිතුරු 3. තුන්වේ 8. ඇදුරු 7. පුලතිසි 7. කුල 7. මිණිමිතුරු 7. තුන්විටක 8. එ 7. සුරිඳු 7. පාතඹුරු.

**පදාර්ථ**- තුන්ලෝ, ලොකත්‍රය; තමා, තමහට; නතුකළ, අවනත කළා වූ; රවුළු, රාවණයාහට; සොහොවුරු, සහෝදර වූ; තුන්කල්, කාලත්‍රය; බලා, පරීක්‍ෂා කොට; රම්දුට, රාමචන්ද්‍රයාහට; ඉටුමිතුරු වූ, ඉෂ්ටමිත්‍ර වූ; ඇදුරු, ආචාර්ය්‍ය වූ; පුලතිසිකුල, පුලස්ති සෘෂිහුගේ වංශයට; මිණිමිතුරු, මිණිපහනක් වූ; එසුරිඳු, ඒ සුරේන්ද්‍රයාගේ; පාතඹුරු, පාදපද්මය; තුන්විටකම, වාරත්‍රයෙක්හිම; වඳු, වන්දනය කරව.

**භාවාර්ථ**- නුඹ තුන්වරක්ම ඒ විභීෂණ දිව්‍යරාජයාගේ පා වැඳපන්.

**කි: ය**- තෝ තුන්විටක ම එසුරිඳු පාතඹුරු වඳු.

**උ: ක**- **වඳු**: විධික්‍රියා යි. **තෝ**: උක්තකර්තෘ යි. **පාතඹුරු**: අනුක්තකර්ම යි. **එ-සුරිඳු**: තත් සම්බන්ධ යි. **තුන්විටක**: ක්‍රියා විශෙෂණ යි. **ම**: අවධාරණාර්ථ නිපාත යි.

**අර්ථක්‍රියා**- **නතු, කළ, වූ.**

**නතු**: නම (නැමීමෙහි) ධාතු යි. කර්මකාරක යි. **තුන්ලෝ**: කා: උක්තකර්ම යි. **කළ**: කර්තෘකාරක යි. **රවුළු**: කා: උක්තකර්තෘ යි! **වූ**: ආධාරකාරක යි. **සුරිඳු**: කා: උක්තාධාර යි.

සමාස 1 තුන්ලෝ. 2 තුන්කල්. 3 රම්දුට. 4 ඉටුම්තුරු. 5. තුන් වේ. 6 මිණිමිතුරු. 7 තුන්පිටක. 8. සුරිදු. 9 පාතඹුරු

විග්‍රහ– ලෝ තුණක් එක්කොට සලකනලද්දහු=තුන්ලෝ. 3 ඉඳු එව් රම්=රම්දු. 4 ඉටු වූයේ ද එම මිතුරු වූයේ ද=ඉටුම්තුරු. 6 මිණි යෙන් කළ මිතුරු=මිණිමිතුරු.

විශේෂ විභාග– 'තුන්ලෝ' නම්- ස්වර්ග, මර්ත්‍ය, පාතාල, යන තුණ යි. මේ තුන්ලොව තමහට නතුකර ගත්තේ රවුළු යි. එනම් රාවණ යි. රාවණතෙමේ විභීෂණගේ වැඩිමහලු සහෝදරයා ය. මෙතෙමේ විශ්‍රවස්හුගේ පුත්‍රෙකි. මුහුණු දශයක් ද පා සතරක් ද අත් විස්සක් ද පිහුවන් මහත් ශරීරයක් ද ඇත්තෙකි. ස්වභාවයෙන් ම දරුණු වූ වෙකි. ක්‍රෑර වූවෙකි. මෙතෙමේ ලඞ්කාවට අධිපති රාක්‍ෂසයෙක් විය. සතුරන් හඬවන බැවින් රාවණ නම් විය. කුම්භකර්ණ මොහු ගේ දෙවෙනි සහෝදරයාය, සූර්පනඛා තුන්වෙනි සහෝදරි ද විභීෂණ හතරවෙනි සහෝදර ද වූහ. තුන්කල් නම්-අතීත, වර්තමාන, අනාගත, යන කාල තුණ යි. විභීෂණ තෙමේ තුන්කාලය ගැණ ම පරීක්‍ෂාකරණ්නේ අතීත වශයෙන් තම සොහොවුරු වූ රාවණයාගේ වරදක් ද වර්තමාන වශයෙන් රාක්‍ෂසයන්ගේ විනාශය ද දැන අනාගතයට සහනය ලැබීමට රාමයා ඉටුම්තුරුවීම මැනවැයි දැන රාමයා හා ඉටුම්තුරු විය. 'රම්දු' යනු රාමයා මය. රූපයෙන් චන්ද්‍රයා වැනි බැවින් රම්දු විය. මෙතෙමේ දශරථ රජහුගේ දෙටුපුත්‍රය. ලක්‍ෂ්මණ-භරත-ශත්‍රුඝ්ණ නාය මොහු රම්දුගේ සහෝදරයෝ වූහ. රම්දුගේ භාර්‍ය්‍යාව සීතාව යි.

'තුන්වේ' නම් ඍක්-යජුස්-සාමන් යන ත්‍රිවෙද යයි, පුලස්ති ඍෂිතෙමේ මේ වෙදත්‍රයෙහි ආචාර්‍ය්‍යවරයෙකි. මෙතෙමේ ඍෂිවරයන් සත්දෙනාගෙන් කෙනෙකි. බ්‍රහ්මයාගේ කන්දෙකෙන් උපන්නෙකි. ඍෂිවරයෝ සත්දෙනා නම් මරීචි, අත්‍රි, අංගිරස්, පුලහ, ක්‍රතු, පුලස්ත්‍ය, වසිෂ්ට, යන මොහු යි. මේ සත් දෙනාම බ්‍රහ්මපුත්‍රයෝ යි. ඒ බව-

මරීචි රත්‍රිභිගවානංගීරාඃ පුලහඃ ක්‍රතුඃ
පුලස්ත්‍යශ්ච වසිෂ්ඨශ්ච සප්තෛතෙ බ්‍රහ්මණඃ සුතාඃ"

යන මෙයින් නිර්දිෂ්ට යි. විභීෂණ තෙමේ පුලස්තිකුල නමැති ගෘහයට මිණි පහනක් වැනි විය. මෙහි 'මිතුරු' ශබ්දය ප්‍රදීපාර්ථ යි. මිලහට සන්දෙශය සැල කිරීමට අණ කරන්නාහු "අනතුරු" යනාදි කව කීහු.

93 අනතුරු බලා අදහස අවසර විග ස
සුහුසුළු නොවි සලකා පසු පළමු බ ස
පෙරදූරි කොටම සුරිඳුට නියුවදන් ගො ස
සැලකර න ගිය කටයුතු සිට එකාන්ප ස

විභක්ති– අනතුරු 2. අදහස 2. අවසර විගස 2. ශුහුසුලු 1. පසුපළමු බස 2. පෙරදූරි 2, සුරිඳුට 7. නියුවදන්ගොස 2. න 3. ගිය 2. කටයුතු 2. එකාන් පස 8.

<u>පදාර්ථ</u>- අනතුරු, අනන්තරව (ඊට පසු); අදහස, (දෙවෙන්ද්‍රයා ගේ) අධ්‍යාශය ද; අවසර විගස, අවකාශක්ෂණය ද; බලා, අවලොකනය කොට; සුහුසුලු නොවී, ශීඝ්‍රශීලි නොව (ඉක්මන් නොව); පසු පළමු බස, පර වූ ද පූර්ව වූ ද වචනය; සලකා, විමර්ශනය කොට; එකත්පස සිට, එක් පාර්ශ්වයෙක්හි සිට; තියුවදන්ගොස, ස්තුතිවචන ඝොෂණය; පෙරදූරි කොටම, පෙරටු කොටම; තා ගිය කටයුතු, තා ගියා වූ කාර්‍ය්‍යය; සැලකරව, ආරොචනය කරව.

**<u>ක්‍රි: ය</u>- නෝ අනතුරු අදහස අවසරවිගස බලා සුහුසුලු නොවී පසුපළමු බස සලකා සුරිඳුට තියුවදන්ගොස පෙරදූරි කොට එකත්පස සිට තා ගිය කටයුතු සැලකර.**

<u>උ: න</u>- **(සැල)කර:** විධික්‍රියා සි. **නෝ:** උක්තකර්තෘ සි. **කට යුතු:** අනුක්තකර්ම සි. **ගිය:** තද් විශෙෂණ සි. **තා** 'ගිය' යන්නෙහි කර්තෘ සි. **සිට;** පෙරකිරියට **එකත්පස:** අනුක්තවිෂයාධාර සි. **කොට:** පෙරකිරියට **තියුවදන්ගොස:** අනුක්තප්‍රකෘතිකර්ම සි. **පෙරදූරි:** විකෘතිකර්ම සි. **සුරිඳුට:** අනුක්තසම්බන්ධ සි. **සලකා:** පෙරකිරියට **පසුපළමුබස:** අනුක්තකර්ම සි. **නොවී:** පෙරකිරියට **නෝ:** උක්තප්‍රකෘතිකර්තෘ සි. **සුහුසුලු:** විකෘතිකර්තෘ සි. **බලා:** පෙර කිරියට **අදහස-අවසරවිගස:** අනුක්තකර්ම සි. **අනතුරු:** ක්‍රියා විශෙෂණ සි.

**ගිය:** අතීතක්‍රියා සි. යා (ගමනෙහි) ධාතු සි. කරණකාරක සි. **කටයුතු:** කෘ: උක්තකරණ සි.

<u>සමාස</u>- 1 අනතුරු. 2. අවසරවිගස. 3 පසුපළමුබස. 4 සුරිඳුට 5 තියුවදන්ගොස. 6 එකත්පස.

<u>විග්‍රහ</u>- 1 අතුරු නැත්තේ= අනතුරු. (අවියසමස්) 2 අවසරයේ විගස=අවසරවිගස. 3 පසු ද පළමු ද=පසුපළමු, පසු වූයේ ද එම පළමු වූයේ ද පසුපළමු, පසුපළමු වූයේ ද එම බස වූයේ ද=පසුපළමුබස. 5 තියු විණිස වූ වදන්=තියුවදන්, තියුවදන්හි ගොස=තියුවදන් ගොස

<u>විශෙෂ විභාග</u>- 'අනතුරු බලා' යනුයෙන් ගැණෙන්නේ අතර නැති බැලීම් කොට යනු සි. නෙවත් පා වැඳීම කොට ඒ එක්සාම බලා යනු සි. 'අදහස' නාම සුරිඳු එසේවලෙසි ඒ සන්දෙශය අසනු කැමිති ද නැද් ද යනු පරීක්ෂා කොට බැලීම සි. අවසර විගස නම් ඊට අවකාශ පනසු කාලය පරීක්ෂා කොට බැලීම සි. 'සුහුසුලු නොවී' යන්නෙන් ගැණෙන්නේ කඩිමුඩි නොවී යනු සි. උතුමන් ලඟට පැමිණ යමක් කිමෙදී කඩිමුඩි වීම නොහොබී. පසුබස පළමුබස සැලකීම ද වැද ගත් කරුණක් කිමෙදී යැලකිය යුත්තෙකි. පසුව කී වචනය හා පෙර කී වචනය

ගැළපේද්දු යි සලකා බැලිම යි. සංක්‍ෂේපය කීමට පෙර සතුතිවාක්‍යයක් කීව සඳහා 'පෙරදූරි කොට සුරිඳුට නියුවදත් ගොස' යනු කීහු. 'එකත්පස' සිටීම නම් නො සිටිය යුතුතැන් සයක් හැර සුදුසු තැනක සිටිම යි. නොසිටිය යුතු තැන් සය අර්ථකථාවන්හි- "අතිදූර මච්චාසන්න මුපරිවාත මුන්නතප්පදෙස මතිසම්මුඛම තිපච්ඡා" යනුවෙන් 'ඉතා දුර, ඉතා ලඟ, උඩුසුලඟ, උස්තැන, ඉතා ඉදිරිය (මුහුණ එල්ලේ සිටීම) ඉතා පස්ස' යන මේ ස්ථාන සය උතුමන් ඉදිරියෙහි කතාබස් ආදිය සඳහා නොසිටිය යුතු තැන් යයි දක්වන ලද්දේය. 'යටිසුලඟ හා පහත් තැන' යන දෙකත් රැගෙන සමහර තන්හි නොසිටිය යුතු තැන් අටක් යයි ද කියති. මීලඟට සංක්‍ෂේප වාක්‍යය කීමට පෙරදූරි කටයුතු සතුතිවාක්‍යය දක්වන්නාහු 'තරසර' යනාදි කව කීහු.

94 තරසර සුනෙර තද තෙද දිමුතු දිව සුර<br>
පුවතර ගැඹර සමුදුර කැලුම නිලඹර<br>
සොම්බර පවර නිසයුර නුවණ සුර ගුර<br>
සුරවර සැරද විබිසණ නම් කැලණි පුර

<u>විභක්ති</u>- තරසරසුනෙර 9. තදතෙදදිමුතුදිවයුර 9. පුවතරගැඹර සමුදුර 9. කැලුමනිලඹර 9. සොම්බරපවරනිසයුර 9. නුවණසුරගුර 9 සුරවර 9. විබිසණ 9. කැලණිපුර 8.

<u>පදාර්ථ</u>- තරසර, ස්ථිර සාරගුණයෙන්; සුනෙර, මහාමෙරු පර්වතය වූ; තදතෙද, ඝනබද්ධ තෙජසින්; දිමුතු දිවයුර, දීප්තිමත් සූර්යයා වූ; පුවතර ගැඹර, ප්‍රසිද්ධ ගැඹුරු ගුණයෙන්; සමුදුර, සමුද්‍රය වූ; කැලුම, කාන්තියෙන්; නිලඹර, නීලාකාශය වූ; සොම්බර, සෞම්‍ය භාරයෙන්; පවරනිසයුර, උතුම් සඳ වූ; නුවණ, ඥානයෙන්; සුරගුර, වෘහස්පති වූ; කැලණිපුර, කල්‍යාණිපුරයෙහි; විබිසණ නම්, විභීෂණ නම් වූ; සුරවර, සුරෙන්ද්‍රය (ඔබවහන්සේ); සැරද, චිරාත්කාලයක් ජීවත් වෙහිවා.

<u>භාවය</u>- විභීෂණ දිව්‍යරාජයානන් වහන්ස ඔබවහන්සේ බොහෝකල් ජීවත් වෙහිවා.

<u>ක්‍රි: ය</u>- සුරවර සැරද. (උක්තානුක්ත සුගම යි.)

<u>සමාස</u>- 1 තරසරසුනෙර. 2 තදතෙදදිමුතුදිවයුර. 3 පුවතර ගැඹරසමුදුර. 4 කැලුමනිලඹර. 5 සොම්බරපවරනිසයුර. 6 නුවණ සුරගුර. 7 සුරවර. 8 කැලණිපුර.

<u>විග්‍රහ</u>- 1 තර වූයේ ද එම සර වූයේ ද තරසර=සුනෙර ම= සුනෙර, තරසරින් සුනෙර=තරසරසුනෙර. 2 තද වූයේ ද එම තෙද වූයේ ද=තදතෙද, දිමුතු වූයේ ද එම දිවයුර වූයේ ද=දිමුතු දිවයුර, දිමුතුදිවයුර ම=දිමුතුදිවයුර, තදතෙදින් දිමුතුදිවයුර=තද තෙදදිමුතුදිවයුර. (සෙස්ස මෙලෙයින් දතයුතු යි.)

**විශෙෂ විභාග**– මෙහි විසිෂණ දෙවේන්‍ද්‍රයා-ස්ථිරසාරගුණය හෙතු කොට ගෙණ සුරෙන්‍ද්‍රරූපය කොට ද, තදහෙද හෙතුකොට ගෙණ දිව්‍යගුරු රූපය කොට ද, ගැඹුරුගුණය හෙතුකොට ගෙණ සමුද්‍ර රූපය කොට ද, කාන්තිය හෙතුකොට ගෙණ නිලම්බර රූපය කොට ද, සෞම්‍යගතිය හෙතුකොට ගෙණ නිශාපුරු රූපය කොට ද, නුවණ හෙතුකොට ගෙණ සුරගුරු රූපය කොට ද දක්වුන- 'තරසර' යනාදියෙහි ලොප් වූයේ හෙත්වර්ථයෙහි කරණ හෝ අවදිව්බත යි. තරසර ගුණය නාම ස්ථිර ශක්තිය යි.

95 ර ජ කු ල සුපුල් විල රජහස වන් සර න
පෙ ර ම ල වියා වන් රුසිරින් මන නඳ න
හැ ම කා ල විපුල සව්සැපතින් නො අඩුව න
තෙ ද බ ල විකුම් ගුණමිණි බරණින් තෙවු න

**විභක්ති**– රජකුල සුපුල්විල 8. රජහස 2. සරණ 2. පෙරමලවියා 2. රුසිරින් 4. මනනදන 4. හැම 8. කල 8. විපුල 4. සව් 4. සැපතින් 4. නොඅඩු 2. වන 2. තෙදබලවිකුම්ගුණ මිණිබරණින් 4. තෙවුන 2.

**පදාර්ථ**– රජකුල, රාජවංශ නමැති; සුපුල්විල, සුත්ඵුල්ල පද්ම තඩාගයෙහි; සරණ, හැසිරෙන්නා වූ; රජහස වන්, රාජහංසයෙකු වැනි වූ; මනනදන, සිත් සතුටුකරන්නා ; රුසිරින්, රූපශ්‍රියෙන්; පෙර මලවියාවන්, පූර්වඅනඩගයා වැනි වූ; හැමකල, සියලු කාලයෙහි; විපුල, මහත් වූ; සව්සැපතින්, සකලසම්පත්තියෙන්; නො අඩුවන, ඌන නොවන්නා වූ; තෙදබල විකුම්ගුණ, තෙජෝබල වික්‍රම ගුණ නමැති; මිණිබරණින්, මාණික්‍යාභරණයෙන්; තෙවුන, බබලන් නා වූ– (මතුසම්බන්ධ යි.)

96 ග රු තර නන්නුරු තුනයා නමැති මැ ති
සි හි කා ර නිතර මහ පුදපඬුරු දී රු ති
නොවි සිර ඔබට දන්වන ලෙස කි සිතැ ති
සු ර ව ර මඳක් කල් එපවත් ඇසිය යු ති

**විභක්ති**– ගරුතර 1. තන්නුරුතුනයා 3. නම් 3. ඇති 1. මැති 1. මහපුද පඬුරු 2. රුති 2. ඔබට 5. දන්වන 7. ලෙස 4. සිතැති 2. සුරවර 9. මඳක් 2. කල් 2. එ 2. පවත් 2. ඇසිය 1. යුති 1.

**පදාර්ථ**– ගරුතර, අතිශයින් ගරු වූ; තන්නුරුතුනයා නමැති මැති, තන්නුරුතුනයා නම් මන්ත්‍රීතෙම; නිතර, නිරන්තරයෙන්; සිහිකර, (ඔබවහන්සේ) සිහිකොට; රුති, අභිමත වූ; මහපුදපඬුරු, මහත් වූ පූජාප්‍රාභෘතයන්; දී, දානය කොට; සිතැති, සිතෙහි වූ අද ගස; නොවිසිර, විශීර්ණ නොකොට; ඔබට, ඔබවහන්සේට; දන්වන

ලෙස, සැලකාරණ මෙන්; කී, කීයේය. සුරවර, (පින්වත්) සුරේන්ද්‍රයා තෙනි; එපවත්, ඒ ප්‍රවෘත්තිය; මඳක් කල්, ස්වල්පකාලයක්; ඇසිය යුතු, ශ්‍රවණය කටයුතුය.

භාවය– සුරේන්ද්‍රයාතෙනි, නන්නුරුතුනයා නම් අමාත්‍යතෙමේ ඔබ වහන්සේට දන්වන ලෙස ඔහුගේ අදහසක් කීයේය, මඳක් කල් ඒ අසනු මැනවි.

**ක්‍රි: ය– නන්නුරුතුනයා මැති සිනැති කී, ඔබ මඳක්කල් එ වත් ඇසිය යුත් වේ.**

උ: ක– **කී:** අතීත අන්‍යකාරක එකවචනක්‍රියා සි. **මැති:** උක්ත කර්තෘ සි. **නන්නුරුතුනයා:** තද්විශෙෂණ සි. **සිනැති:** අනුක්ත කර්ම සි. **වේ:** ක්‍රියා සි. **ඇසිය:** උක්තප්‍රකෘතිකර්තෘ සි. **යුත්:** විකෘති කර්තෘ සි. **එපවත්: ඇසිය**– යන භාවක්‍රියාවේ අනුක්තකර්ම සි. **ඔබ:** එහි අනුක්තකර්තෘ සි. **මඳක්කල්:** අත්‍යන්තසංයොගයෙහි කර්ම සි.

**අඞ්ගක්‍රියා– සරණ, නඳන, වන, නෙවුන.**

**සරණ:** සර (හැසුරුම්හි) ධාතු සි. කර්තෘකාරක සි. **රජහස:** උක්තකර්තෘ සි. **නඳන:** නඳ (තොස්වීමෙහි) ධාතු සි. **රුසිරි;** කා: උක්තකාරණ සි. **වන:** කර්තෘකාරක සි. **නන්නුරුතුනයා–මැති:** කා: උක්තකර්තෘ සි. **නෙවුන:** නෙවු (බැබලුම්හි) ධාතු සි. කර්තෘකාර සි. **නන්නුරුතුනයා–මැති:** කා: උක්තකර්තෘ සි.

**සමාස**– 1 රජකුලසුපුල්විල. 2 රජහස. 3 පෙරමලවියා. 4 රුසිරින්. 5 සව්සැපතින්. 6 තෙදබලවිකුම් ගුණමිණිබරණින්. 7 මහපුදපඬුරු. 8 සුරවර.

**විග්‍රහ**– 1 රජුන්ගේ කුල=රජකුල. මොනවට පුල්=සුපුල්, සුපුල් වූයේ ද එම විල් වූයේ ද=සුපුල්විල්, රජකුල ට සුපුල් විල්=රජකුල සුපුල්විල්-එහි. මල් අවි වූයේ යමෙකුට ද ඒ=මලවි. පෙර වූ මලවි= පෙරමලවි–ඔහු. 5 තෙද ද බල ද විකුම් ද තෙදබලවිකුම්, තෙදබල විකුම් ම ගුණ=තෙදබල විකුම්ගුණ, මිණි යොදා කළ බරණ=මිණි බරණ, තෙදබල විකුම්ගුණ ම මිණිබරණ=තෙදබලවිකුම්ගුණමිණි බරණ. 6 පුද පිණිස වූ පඬුරු=පුදපඬුරු. මහ වූයේ ද එම පුදපඬුරු වූයේ ද=මහපුදරඬුරු.

**විශෙෂ විභාග**– මෙහි රජකුල සුපුල් විල රජහස වැනි වූයේ ද, රුසිරින් පෙර මලවියා වැනි වූයේ ද සව්සැපතින් නොඅඩු වූයේ ද, තෙදබලවිකුම් ගුණමිණිබරණින් නෙවුයේ ද නන්නුරුතුනයා නම් ඇමැතිතෙමේ ය. පිපුනු

පියුම්විලක් රාජහංසයෙකුගේ සඤ්චාරයෙන් ශොභාවත් වේ. එමෙන් මේ ඇමති වරයාගේ හැසිරීමෙන් රාජකුලය ද ශොභාවත් වේ. රාජහංස නම් රත්වන් තුණ්ඩයෙන් හා පාවලින් යුත් ශ්වේතහංස යි.

'මලවි' නම් අනඞ්ග යි. ඔහුට=

"අරවින්දමශොකඤ්ච චූතඤ්ච නවමල්ලිකා,
නීලොත්පලඤ්ච පඤ්චෛතෙ පඤ්චබාණස්ස සායකාඃ."

යන මෙයින් දැක්වෙන- නෙළුම්, අශෝක, අඹ, දෑසමන්, නිල්මහනෙල්- යන මේ මල් පස අවි වූ බැවින් 'මලවි' නම් විය. පෙර මලවි නම් ඊශ්වරයා විසින් දවන්නට පෙර සිටි අනඞ්ගයා යි. එක් දිනක් ඊශ්වරයා ධ්‍යානයෙන් යුක්ත ව සිටිද්දී මලවියා සැඟවී සිටි ඊශ්වරයාගේ හෘදයට විද්දේය. එයින් කොපයට පැමිණි ඊශ්වර තෙමේ තමාගේ නයනාග්නියෙන් මලවියා දැවී ය. ඒ ඒ අය මිණිබරණින් බබලන සුලු යි. මේ මැතිතුමාගේ බැබලීමට මිණිබරණ වූයේ තෙදබල විකුම් ගුණ යයි.

'ගරුතර' යන්න ප්‍රත්‍යයාර්ථ නාමයෙකි. ඉතා ගරු=ගරුතර යනු විග්‍රහයි. "තර" යනු අතිශයාර්ථ ප්‍රත්‍යයෙකි. සංස්කෘතයෙහි ශබ්දය ද 'ගරුතර' යනු යි. මෙහි 'ගරු' යන්නේ අර්ථ රාශියෙකි. 'පිදියයුතු, උසස්, මහත්' ආදිවශයෙනි. තන්තුරුතුනයා මැති නම් පැරකුම්බාරජහුගේ දුහිතෘ වූ ලොකනාථා නම් කුමරියගේ ස්වාමියා යි. මෙතෙමේ ද්‍රාවිඩ කුමරියෙකි. 'තන්තුරුතුනයා' යන නාමය ද 'තන් තූර්තුනෙයියාර්' යන ද්‍රවිඩනාමයෙන් සිංහල වූවෙකි. 'තොවිසිර' යන්නෙන් ගැණෙන්නේ අත්‍යවිහිත නොව යනු යි. මීලඟට ඇසිය යුතු සන්දෙශය කවි සයකින් විස්තර කරන්නානු 'රිවිකුල' යනාදිය කීහු.

97 රි වි කු ල ලමැණිගොත් පිරිසිදු ගුවන් මැ ද
පැහැ දු ල සරාකල් පන් සහසකර බ ද
කිවි කැ ල ගෙලට මුතුහරවන් යසපබ ද
සි රි කා ල කුලනිවෙස් දිය පතල තද නෙ ද

විභක්ති- රිවිකුල 8. ලමැණිගොත් පිරිසිදුගුවන්මැද 8. පැහැදුල 7. සරාකල් 8. පන් 7. සහසකර 7. බඳ 7. කිවිකැල 7. ගෙලට 7. මුතුහර 2. යස පබඳ 7. සිරිකල 7. කුලනිවෙස් 7. දිය 8. පතල 7. තදනෙද 3.

පදාර්ථ- රිවිකුල, සූර්‍ය්‍යවංශයෙහි වූ; ලමැණිගොත්, ලම්බකර්ණ ගොත්‍ර නාමැති; පිරිසුදු, පරිශුද්ධ වූ; ගුවන්මැද, ගගනමධ්‍යයෙහි; සරාකල් පන්, ශරත්කාල ප්‍රාප්ත වූ; පැහැදුල, ප්‍රභායෙන් ජ්වලිත වූ; සහසකර බඳ, සූර්‍ය්‍යයාට සමාන වූ; කිවිකැල, කවි සමූහයාගේ; ගෙලට, කණ්ඨයට; මුතුහර වන්; මුක්තාහාරයක් වැනි වූ; යසපබඳ, කීර්ත්තිප්‍රබන්ධයක් ඇත්තා වූ; සිරිකල, ශ්‍රී කාන්තාවගේ; කුලනිවෙස්, කුලගෘහයක් වූ; තදනෙද, ඝනබද්ධ තෙජස; දිය, ලොකයෙහි; පතල, ව්‍යාප්ත වූ. (මතුසම්බන්ධ යි.)

98 හ ළ දුසිරි දුන තෙවළා මුනිඳු බ ණ
කොළ පත් සියල් අවිසිප් කව් නළු සත ණ
ඔ ළ මොළ රුපුන් දප වැඩ පෑ උපා නැ ණ
කා ළ මුළු ලක්දිව එකා සේසත් සෙව ණ

<u>විභක්ති</u>– හළ 7. දුසිරි 2. තෙවළා මුනිඳුබණ 2. කොළ 2. පත් 7. සියල් අවිසිප් කව්නළු සතණ 7. ඔළමොළ 7. රුපුන් 7. දප 2. උපානැණ 2. කළ 7. මුළු 2. ලක්දිව 2. එකසේසත් සෙවන 2.

<u>පදාර්ථ</u>– තෙවළාමුනිඳුබණ, ත්‍රිපිටක බුඩවචනය; දූන, අවබොධ කොට; දුසිරි, දුශචරිතයන්; හළ, අත්හැරියා වූ; සියල්, සියලු; අවිසිප්කාව්නළු සතණ, ආයුධශිල්පය-කාව්‍ය–නාටක–ශාස්ත්‍ර නමැති සමුද්‍රයාගේ; කොළ පත්, කොටිප්‍රාප්ත වූ; උපානැණ, උපායඥනය; පෑ, ප්‍රකාශ කොට, ඔළමොළ, ප්‍රචණ්ඩ වූ; රුපුන්, සතුරන්ගේ; දප, ජිය; මැඩ, මර්දනය කොට; මුළුලක්දිව, සමස්ත ලඞ්කාවීපය; එකසේසත්සෙවන, එක් ශ්වෙතච්ඡත්‍ර ඡායා ඇත්තක්; කළ, කළා වූ; (මතු සම්බන්ධ යි.)

99 සත නෙත දුන් රුසිරිරස අ ඳුන් ව න
පත නරලොව පුරඳර සිරි හ ඳුන් ව න
විකුමෙන් දඹදිව නිරිඳුන් මු ඳුන් ව න
අප පැරකුම් නිරිඳුට දූ ල ඳුන් ව න

<u>විභක්ති</u>– සත 7. නෙත 8. දුන් රුසිරි 7. රසඅඳුන් 2. පත 7. නරලොව 2. පුරඳර 7. සිරි 2. හඳුන්වන 7. විකුමෙන් 4. දඹදිව 8. නිරිඳුන් 7. මුඳුන් 2. වන 7. අප 7. පැරකුම්නිරිඳුට 7. දූ ලඳුන් 3. වන 5.

<u>පදාර්ථ</u>– සත, සත්ත්වයාගේ; නෙත, නෙත්‍රයෙහි; රසඅඳුන් වන රසාඤ්ජනයක් මෙන්; දුන් රුසිරි, දෙන ලද රූපශ්‍රිය ඇත්තා වූ; නර ලොව, මිනිස් ලොවට; පත, පැමිණියා වූ; පුරඳර, ශක්‍රයාගේ; සිරි, ශ්‍රිය; හඳුන්වන, හඳුන්වන්නා වූ; විකුමෙන්, වික්‍රමයෙන්; දඹදිව, ජම්බුද්වීපයෙහි; නිරිඳුන්, නරෙන්ද්‍රයන්ට; මුඳුන්වන, මස්තකප්‍රාප්ත වන්නා වූ; අප, අපගේ; පැරකුම් නිරිඳුට, පරාක්‍රම නරෙන්ද්‍රයාහට; දූ ලඳුන්වන, දුහිතෘ තරුණියක් වන්නා වූ; (මතු සම්බන්ධ යි.)

100 සි රි ස ඳ ව න් සව්සිරි දියුණුව රඳ න
සි තු මි ණ ව න් යැදි යැදිනට දනින් දෙ න
ස ර ස වි ව න් නුවණින් පහළව පෙනෙ න
න ව ස ඳ ව න් ලෙව් වැසි අඳුරින් වදි න

**විභක්ති**– සිරිසඳ 2. සව්සිරි 3. දියුණු 3. රදන 5. සිතුමිණ 2. යැදි යැදිනට 5. දනින් 4. දෙන 4. සරසවි 2. නුවණින් 4. පහල 3. පෙනෙන 2. නව සඳ 2. ලෝවැසි 3. අදරින් 4. වදින 2.

**පදාර්ථ**– සව්සිරි, සකලශ්‍රිය; දියුණුව, විගුණව; රදන, රඳන් නා වූ; සිරිසඳවන්, ශ්‍රී කාන්තාව හා සමාන වූ; යැදි යැදිනට, යාචක කළ කළ අයට; දෙන, දානය කරණු ලබන්නා වූ; දනින්, දානය කරණ කොටගෙණ; සිතුමිණ වන්, චින්තාමාණික්‍යයක් සමාන වූ; නුවණින්, ඥානය කරණ කොටගෙණ; පහළව පෙනෙන, ප්‍රකාශව පෙනෙන්නා වූ; සරසවි වන්, සරස්වතී හා සමාන වූ; ලෙව්වැසි, ලොකවාසීන් විසින්; අදරින්, ආදරයෙන්; වදින, වඳිනු ලබන්නා වූ; නව සඳවන්, අභිනව චන්ද්‍රයා හා සමාන වූ; (මතු සම්බන්ධ යි.)

101 යෙහෙළින් කොරේ සකිසැප සමග සි ත් මේ
කුළු ණින් දූසිදසුන් වෙත වසින ව ත් මේ
ර කි මි න් පතිනිදම් යහපත් සිරි ත් මේ
සිහි නෙන් නිපන් වැනි දසපින් පැවැ ත් මේ

**විභක්ති**– යෙහෙළින් 7. කොරේ 8. සකිසැප 8. සමග සිත්මේ 5. කුළු ණින් 4. දූසිදසුන් 7. වෙත 8. වසින 5. වත්මේ 2. පතිනිදම් 2. යහපත් 2. සිරිත් 2. මේ 2. සිහිනෙන් 4. නිපන් 2. දසපින් 8. පැවැත්මේ 8.

**පදාර්ථ**– යෙහෙළින් කොරේ, සඛීජනයා කෙරෙහි; සකිසැප, සවකියසම්පත් විෂයෙහි; සමගසිත්මේ, සමග පවත්නා (නොවෙනස්) සිත් ඇත්තියක්ව තිපන්නා වූ; කුළුණින්, කාරුණ්‍යයෙන්; දූසි දසුන් වෙත, දසිදාසයන් කෙරෙහි; වත්මේ, වස්තු නමැති මෙඝය; වසින, වර්ෂණය කරන්නා වූ; පතිනිදම්, පත්නී ධර්මය ද; මේ, මෙ ධ්‍ය වූ (පවිත්‍ර ); යහපත් සිරිත්, මනොඥ චාරිත්‍රයන් ද; රකිමින්, රක්‍ෂාකරමින්; දසපින්, දශපුණ්‍යයෙහි; පැවැත්මේ, පැවැත්මෙහි; සිහිනෙන්, සිහියෙන්; නිපන්වන්, නිපන්තියක් වැනි වූ. (මතු සම්බන්ධ යි.)

102 මි හි රි තෙපල නන් වැසි කිවිකාම් පුරු දු
බැ ති රි බැති පෙමැති පෙළදහමෙහි මුනි ඳු
තොනැහැරි පෝය අටසිල් රැකුම පිරිසු දු
ස සි රි උලකුඩය දේවිහට පසි ඳු

**විභක්ති**– මිහිරි 3. තෙපල 8. නන්වැසි 5. කිවිකාම් 8. පුරුදු 8. ඉතිරි 3. බැතිපෙම් 3. ඇති 5. පෙළදහමෙහි 8. මුනිඳු 7. නොනැහැරි 5 පෝය 8. අටසිල් රැකුම 2. පිරිසුදු 2. සසිරි 5. උලකුඩයදේවිහට 5. පසිඳු 5.

<u>පදාර්ථ</u>- මිහිරිතෙපල, මධුරවචනයෙහිද; තත්වැසි, සත්‍යෝචිත වචනයෙහි ද; කිවිසාමි, කවිස්වාමියෙහිද; පුරුදු, පරිචිත වූ; මුනිඳු, මුනීන්ද්‍රයන්ගේ; පෙළදහමෙහි, පාළිධර්මයෙහි; ඉතිරි, අධික වූ; බැතිපෙමැති, භක්ති ප්‍රේම ඇත්තා වූ; පෝය, උපවාසදිනයෙහි; පිරිසුදු, පරිශුද්ධ වූ; අටසිල් රැකුම; අෂ්ටාංග ශීල රක්ෂණය; නොහැරි, වර්ජනය නොකළා වූ; පසිදු, ප්‍රසිද්ධ වූ; සසිරි, සශ්‍රීක වූ; උලකුඩය දේවීහට, උලකුඩය (ලෝකනාථා) රාජකුමාරිකාවහට. (මතු සම්බන්ධ යි.)

103 දි ත් රුපු කිරුළු මල්දම් සුවඳ මී වැ ස
තෙ ත් සිරිපා යුත් සුරිඳුනි තිලෝ ඇ ස
සි ත් පිණවන ඇති ආසිරි නුවණ ය ස
පු ත් රුවනක් සොඳ දුන මැනවි නිසිලෙ ස

<u>විභක්ති</u>- දිත්රුපු 7. කිරුළු 8. මල්දම් 7. සුවඳමී 2. තෙත් 4. සිරිපා 4. යුත් 9. සුරිදුනි 9. තිලෝඇස 9. සිත් 2. පිණවන 2. ඇති 2. ආසිරි 3. නුවණ 3. යස 3. පුත්රුවනක් 2. සොඳ 2. දුන 1. නිසිලෙස 4.

<u>පදාර්ථ</u>- දිත්රුපු, අසුරයන්ගේ; කිරුළු, කිරීටයන්හි වූ; මල්දම්, මාලාදාමයන්ගේ; සුවඳ මී, සුගන්ධ මකරන්දය; වැස, වර්ෂණය කොට; තෙත්, ආර්ද්‍ර වූ; සිරිපා, ශ්‍රීපාදයෙන්; යුත්, යුක්ත වූ; තිලෝ ඇස, තුන්ලොවට ඇසක් වූ; සුරිඳුනි, සුරේන්ද්‍රයාණෙනි; සිත්පිණවන, චිත්තප්‍රීණනය කරවන්නා වූ; ආසිරි, ආයුඃශ්‍රිය ද; නුවණ, ඥානය ද; යස, කීර්තිය ද; ඇති, ඇත්තා වූ; සොඳ; සුන්දර වූ; පුත් රුවනක්, පුත්‍රරත්නයක්; නිසිලෙස, යෝග්‍ය පරිද්දෙන්; දුන මැනවි, ප්‍රදානයකළ මැනවි.

<u>කාව්‍යගත් භාවය</u>- විභීෂණ දිව්‍යරාජයාණෙනි, ඔබවහන්සේ අප පරාක්‍රමබාහු මහරජතුමාගේ දුහිතෘ වූ උලකුඩය දේවීහට නිසිලෙස පුත්රුවනක් දුන මැනවි.

**<u>ක්‍රි: ය</u>- සුරිඳුනි උලකුඩය දේවීහට පුත්රුවනක් දුන මැනවි වේ.**

<u>උ: ත</u>- **වේ:** ක්‍රියා යි. **දුන:** උක්තප්‍රකෘතිකර්තෘ යි. **මැනවි:** විකෘතිකර්තෘ යි. **දුන:** යන භාවක්‍රියාවට **ඔබ විසින්:** යනු අධ්‍යාහෘත අනුක්තකර්තෘ යි. **උලකුඩය දේවීහට;** අනුක්ත සම්ප්‍රදාන යි. **සුරිඳුනි:** සම්බෝධන යි.

අ<u>ඝ්‍රක්‍රියා</u>- **දුල, පත්, පතළ, හළ, පෑ, සාළ, දුන්, පත, හඳුන්වන, රඳන, යැදි, දෙන, පහළ, පෙනෙන, වඳින, වසින, නිපන්, පිණවන.**

**පතළ:** 'ප්‍රථිට' ශබ්දයෙන් ආයේ වේ, කර්තෘකාරක යි. **පැර කුම් නිරිඳු:** කාः උක්තකර්තෘ යි. **හළ:** හර (හැරීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **පැරකුම් නිරිඳු:** කාः උක්තකර්තෘ යි. **හඳුන්වන:** හඳුන් (හැඳිනීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **පැරකුම් නිරිඳු:** කාः උක්තකර්තෘ යි. **යැදි:** යද (යැදීමෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **දන:** අධ්‍යාහෘත උක්තකර්තෘ යි. **පහළ:** 'ප්‍රාකට' ශබ්දයෙන් ආයේ වේ. කර්තෘකාරක යි. **සරසවි:** කාः උක්තකර්තෘ යි. **පෙනෙන.** කර්මකාරක යි. **සරසවි:** කාः උක්තකර්ම යි. **වඳින:** වඳ (වැඳුම්හි) ධාතු යි. කර්මකාරක යි. **නවසඳ:** කාः උක්තකර්ම යි. **වසින:** කර්තෘකාරක යි. **උලකුඩය දේවි:** කාः උක්තකර්තෘ යි. **නිපන්:** නිපද (නිපැත්මෙහි) ධාතු යි. කර්තෘකාරක යි. **උලකුඩයදේවි:** කාः උක්තකර්තෘ යි.

**<u>සමාස</u>**- 1 රිවිකුල. 2 ලමැණිගොත් පිරිසිදුගුවන්මැද. 3 පැහැදුල. 4 සරාකල්. 5 සහසකර. 6 කිවිකැල. 7 මුතුහර. 8 සිරිකල. 9 කුල තිවෙස්. 10 තදතෙද. 11 දුසිරි. 12 තෙවළා. 13 මුනිඳුබණ. 14 සියල් අවිසිප් කාව්නළුසතණ. 15 එකසේසත්සෙවන. 17 රුසිරි 18 නර ලොව. 19 දුලදුන්. 20 සිරිසඳ. 21 සව්සිරි. 22 සිතුමිණ. 23 යැදි යැදිනට 24 නවසඳ. 25 ලෙව්වැසි. 26 සකිසැප. 27 සමග සිත්මේ. 28 දූසිදසුන්. 29 වත්මේ. 30 පතිනිදම් 31 දසපින්. 32 මිහිරිතෙපළ. 33 තන්වැසි, 34 කිවිකම්. 35 ඉතිරිබැතිපෙම්. 36 පෙළදහමෙහි. 37 අටසිල්. 38සසිරි. 39 උලකුඩයදේවිහට. 40 දින්රුපු. 41 මල්දම්. 42 සුවඳම්. 43 තොත්සිරිපා.

<u>විග්‍රහ</u>- 2 ලමැණි ම ගොත්=ලමැණිගොත්, පිරිසිදු වූයේ ද එම ගුවන් වූයේ ද=පිරිසිදුගුවන්, ලමැණි ගොත් ම පිරිසිදුගුවන්= ලමැණි ගොත්පිරිසිදුගුවන්, ගුවනේ මැද=ලමැණිගොත් පිරිසිදු ගුවන්මැද. 4 සරාම කල්=සරාකල්. 8 සිරිම කල=සිරිකල. 11 නපුරු සිරි(ත්,=දුසිරි 12 වළා තුණක් ඇත්තේ=තෙවළා. 14 අවියේ සිප්=අවිසිප්, අවිසිප් ද කාව් ද නළු ද සත් ද=අවිසිප්කාව් නළුසත්, සියල් වූයේ ද එම-සත් වූයේ ද=සියල් අවිසිප්කාව්නළුසත්- සත්ම අණ=සියල් අවිසිප්කාව්නළුසතණ. 15 එක වූයේ ද එම සේ සත් වූයේ ද=එකසේසත්, එක සේසතේ සෙවන යමකට ද ඒ=එක

සේසත්සෙවන. 19 දුම ලඳ=දුලඳ– ඔවුන්. 23 යැදි ද යැදි ද= යැදි යැදියෝ– ඔවුන්ට. 26 සකි (තමාගේ) සැප= සකිසැප. 27 සමග පවත්නා සිත් යමෙකුට ද ඒ=සමගසිත්, ඉන් නිපන්=සමගසිත්මේ. 28 දූසි ද දස් ද=දූසිදස්– ඔවුන්. 29 වත් ම මේ=වත්මේ. 33 තැනට සුදුසු වැසි (වදන්)=තන්වැසි. 34 කිවින්ගේ නම්=කිවිනම්. 35 බැති ද පෙම් ද=බැතිපෙම්, ඉතිරි වූයේ ද එම බැතිපෙම් වූයේ ද=ඉතිරිබැතිපෙම්. 36 පෙළ වූයේ ද එම දහම් වූයේ ද=පෙළදහම්– එහි. 38 සිරි සහ පවත්නේ=සසිරි. 40 දිතුන්ගේ රුපු=දිත්රුපු. 43 සිරියෙන් යුත් පා=සිරිපා, නෙත් වූයේ ද එම සිරිපා වූයේ ද= නෙත්සිරිපා.

**විශේෂ විභාග**– මෙහි 97, 98, 99 කවි තුනෙන් දක්වූයේ පරාක්‍රමබාහු මහරජතුමාගේ වර්ණනාව යි. හෙතෙමේ සරත්කාලයෙහි අහස්මැදට පැමිණි සූර්ය්‍යයා අහස්තලය බබුලුවන්නාක් මෙන් සූර්ය්‍යවංශය මැදට පැමිණ ලම්බකර්ණ ගොත්‍රය බබුලුවන්නෙකි. මුතුහරක් ග්‍රීවය සරසන්නාක් මෙන් මොහුගේ කීර්ති සමූහය කිවින්ගේ ග්‍රීවය සරස යි, මෙතෙමේ ශ්‍රීකාන්තාවගේ වාසස්ථානයෙකි. ලෝකයෙහි පතළ තද තෙද ඇත්තෙකි. බුදුදහම දූත දුශ්චරිතයෙන් වෙන් වූ වෙකි. ආයුධ ශිල්පාදියෙහි කෙළපැමිණියෙකි. ඉතා චණ්ඩ වූ සතුරන්ගේ එඩි බිඳ මුළුලක දිනාගත්තෙකි, තමාගේ රූපශ්‍රිය සත්වයාගේ ඇසෙහි අඳුනක් කෙළෙකි. තමාගේ ශ්‍රියෙන් ශක්‍රයාගේ ශ්‍රිය.මිනිසුන්ට හඳුන්වන්නෙකි. වික්‍රමයෙන් දඹදිව සියලු රජුන්ට ම අග්‍ර වූ වෙකි.

100, 101, 102 මේ කවි තුනෙන් දක්වූයේ ඒ රජතුමාගේ දුහිතෘ වූ උල කුඩය දේවියගේ වර්ණනාව යි. ඕතොමෝ සියලු ඓශ්වර්ය්‍යය රැඳීමට ආධාර වූ සිරිකත වැනිය. ඉල්ලූ ඉල්ලූ අයට ධනය දෙන බැවින් සිතුමිණ වැනිය. නුවණින් සරස්වතිය වැනිය, ලෝ වැස්සන් ආදරයෙන් වඳින අලුත් සඳ වැනිය. තමාගේ සම්පත යෙහෙළියන් කෙරෙහි ද වෙනසක් නැතිව සමකොට සිතන්නියෙකි. දූසි දසුන් කෙරෙහිදු වස්තුව බෙදා දෙන්නියෙකි. පතිව්‍රතා ධර්මය හා යහපත් සිරිත් පාලනය කරන්නියෙකි. දශ පුණ්‍යක්‍රියායෙහි පැවති සිහියෙන් උපන් නියක් වැනි කෙනෙකි. මිහිරිවදන් කීමෙහි හා කාව්‍යාදියෙහි සමර්ථ වූ වකි. බුදුවදන්හි භක්තිප්‍රෙමයෙන් පෝය අටසිල් රකින්නියෙකි.

103 කවෙන් දක්වූයේ මේ දේවියට සිත් පිණවන ආයුඃශ්‍රී සම්පත් ආදියෙන් යුත් සොඳ පුත්රුවනක් දුන මැනවි කියා විභීෂණ දිව්‍යරාජයාහට කළ ආයාචනා යයි.

'ලම්ැණිගොත්' නම් ලම්බකර්ණගොත්‍ර යයි. මේ ගොත්‍රය ලක්දිව ඇති වූයේ ශ්‍රී මහා බොධිශාඛාව සමග පැමිණි සුමිත්‍ර කුමාරයාගෙනි. මේ ගොත්‍රයට ගණවාසි කියා ද සංඝබොධි කියා ද ව්‍යවහාර විය. මේ වංශයෙහි පළමුකොට රජ වූයේ ධාතුසේන ය. 'සරාකල්' නම් වප් ඉල් දෙමස යි. මේ කාලයෙහි අහස නිර්මල වේ. එබැවින් චන්ද්‍රසූර්ය්‍යයෝ අතිශයින් බබලත්. 'තෙවළා' යන්න 'තෙපිටක' ශබ්දයෙන් ආ සේ වේ. බුද්ධධර්මය 'සූත්‍ර-විනය-අභිධර්ම' යයි බෙදුණු පිටක වශයෙනි,'උපාතැණ' යන තන්හි 'උපා' යන්නෙන් දක්වෙන උපාය සතරෙකි. එනම්- සාම, දාන, භෙද' දණ්ඩ යන සතර යි. රජුන් රාජ්‍යය කරන්නේ මේ

සතරෙනි, එනි- සාම නාම් සමගි යයි. 'දාන' නම් ඒ ඒ අයගේ සිත් ගැණීමට සුදුසු දේ දීම යි. 'භෙද' නම් ඊට සුදුසු අවස්ථාවන්හි ඒ ඒ අය බිඳවීම යි. 'දණ්ඩ' නම් පහර දියයුත්තහුට පහර දීම යි. මේ උපායවලින් පැරකුම් නිරිඳු තෙමේ මුළුලක එක සේසත්සෙවනා කෙළේ ය. 'නාවසඳ වන් ලෝවැසි අදරින් වඳිනා' යන්නෙන් පැවසෙන්නේ අලුත්සඳට ලෝකයාගේ වැඳීම සිරිතක් බව යි. මාස යක් පාසාම අලුත් සඳක් ඇති වේ. 'යහපත් සිරිත් මේ යන තන්හි 'මේ' යන්න 'මෙධ්‍ය' ශබ්දයෙන් ආයේ වේ. 'සිහිනොත්' යන තන්හි 'සිහි' ශබ්දයෙන් පරව 'නොත්' විබති. 'සිහියෙන්'යි ද යෙදේ. 'දසපින්' නම්- දම්දීම, සිල්රැකීම, භාවනා කිරීම, පින්දීම, පින්ගැණීම, බණදෙසීම, බණ ඇසීම, පිදිය යුත්තන් පිදීම, වතාවත් කිරීම, දෘෂ්ටිය සෘජුකිරීම- යන මේ දස යයි·

**104 බි සො ව ට   පළමු රත්නාවලි නම් සොඳු   රු**
**ස හ තු ට   දෙවූ හිමි දිවැසින් කුළුණු පි   රු**
**මෙ ල ක ට   ඉසුරු වි පැරකුම් රජකුම   රු**
**ප ළ කො ට   කිමෙක ඔබ සොඳ තෙදබල මහ   රු**

විභක්ති- බිසොවට 5. පළමු 8. රත්නාවලි නම් 5. සහතුට 2. දෙවූ 1. හිමි 3. දිවැසින් 4. කුළුණුපිරු 4. මෙ 7. ලකට 7. ඉසුරු 1. පැරකුම්රජකුමරු 1. කිමෙක 1. ඔබ 7. සොඳ 1. තෙදබල 1. මහරු 1.

පදාර්ථ- හිමි, ස්වාමිහු විසින්; පළමු පූර්වකාලයෙහි; රත්නාවලි නම්, රත්නාවලි නාම් වූ; සොඳුරු, සුන්දර වූ; බිසොවට, රජමෙහෙසියට; කුළුණුපිරු, කරුණාපූර්ණ වූ; දිවැසින්, දිව්‍යචක්ෂුසින්; සහතුට, සන්තොෂ සහිතව; දෙවූ, දෙවන ලද්දා වූ; පැරකුම් රජකුමරු, පරාක්‍රම රාජකුමාරතෙම; මෙලකට, මේ ලඞ්කාවට; ඉසුරු වී, අධිපති විය. ඔබ, ඒ ඔබවහන්සේගේ; සොඳ, යහපත් වූ; මහරු, මහාර්ඝ වූ; තෙදබල, තෙජෝ බලය; පළ කොට, ප්‍රකාශ කොට කීමෙන්; කිමෙක, කවර අර්ථයෙක් වේ ද.

භාවය- මීට පෙර ඔබවහන්සේ රත්නාවලි බිසවට දුන් පුත්රුවන වූ පැරකුම් රජකුමරා ලඞ්කාවට රජ විය. එබැවින් ඔබවහන්සේගේ තෙදබල ගැණ කියන්නේ කුමකට ද.

**ක්‍රි: ය- පැරකුම් රජකුමරු මෙලකට ඉසුරු වි. ඔබ තෙද බල පළ කොට කිමෙක වේ.**

ප: ක- වි: ක්‍රියා යි. **පැරකුම්රජකුමරු:** උක්තප්‍රකෘති කර්තෘ යි, **ඉසුරු:** විකෘතිකර්තෘ යි. **මෙ-ලකට:** සම්බන්ධ යි. **වේ:** ක්‍රියා යි. **කිමෙක:** උක්තකර්තෘ යි. **කොට:** පෙරකිරියට **තෙද බල:** අනුක්තප්‍රකෘතිකර්ම යි. **ඔබ:** තත්සම්බන්ධ යි. **පළ:** විකෘති කර්ම යි.

**සමාස**– 1 සහතුට. 2 දිවැසින්. 3 කුළුණුපිරු. 4 පැරකුම්රජ කුමරු. 5 තෙදබල.

**විග්‍රහ**– 1 තුට සහ පවතීනු යි=සහතුට. 2 දිව් වූයේ ද එම ඇස් වූයේ ද=දිවැස්– එයින්.

105 එසෙයින් දුසමන් මහනෙල් කුසුම් ගෙ ණ
පු ද මි න් එසුරවර සිරිසරණ වඳිමි ණ
බු හු මන් කරණ රජදු සඳුට මෙ කිය ණ
දු න පින් සමග යස සිරි වඩි පුත්රුව ණ

**විභක්ති**– දු සමන් මහනෙල් කුසුම් 2. එ 7. සුරවර 7. සිරසරණ 2. බුහු මන් 2. කරණ 5. රජදුසඳුට 5. මෙ 5. කියන 5. පින් 3. යසසිරි 1. පුත් රුව න 2.

**පදාර්ථ**– එසෙයින්, එපරිද්දෙන් (ඒ රත්නාවලි බිසොව කළ පරිද්දෙන්); දුසමන් මහනෙල් කුසුම් ගෙණ, ජාතිසුමන උත්පල පුෂ්පයන් ඇරගෙන; පුදමින්, පූජාකරමින්; එසුරවර, ඒ දෙවොත් තමයාගේ; සිරිසරණ, ශ්‍රීපාදයට; වඳිමින, නමස්කාර කරමින්; බුහු මන් කරණ, බහුමාන කරන්නා වූ; මකියන, යථොක්ත වූ; රජදූ සඳුට, උදුම් රාජදුහිතෘවට; පුත්රුවන, පුත්‍රරත්නය; දුන, දුන හොත්; පින් සමග, පුණ්‍යය හා එක්ව; යසසිරි, කීර්ත්තිශ්‍රිය; වඩි, වඩි නය වන්නේය.

**භාවය**– රත්නාවලි බිසොවට පුත්රුවන දුන් ඒ ඔබවහන්සේට රත්නා වලිබිසොව මෙන් ම වැඳුම් පිදුම් ගරුබුහුමන් කරණ මේ ලොකනාථාවට ද යට කී පුත්රුවන දුනහොත් ඔබවහන්සේට පිණුත් ලැබේවි. ඔබවහන්සේගේ කීර්තිශ්‍රිය ද වැඩේවි.

**ක්‍රි: ය**- පින් සමග යසසිරි වඩි.

**උ:න**– වඩි: ක්‍රියා යි. යසසිරි: උක්තකර්තෘ යි. පින් ද සමග යන සහාර්ථනිපාතයොගයෙහි කතුවිබත්. කරණ: අවක්‍රියා කර්තෘකාරක යි. රජදූසඳු: කා: උක්තකර්තෘ යි, බුහුමන්: අනුක්ත කම් යි.

**සමාස**– 1 දූසමන්මහනෙල්කුසුම්. 2 සුරවර. 3 සිරිසරණ, 4 රජදූසඳුට. 5 යසසිරි. 6 පුත්රුවන.

<u>විග්‍රහ</u> - 1 දූසමන් ද මහනෙල් ද=දූසමන්මහනෙල්, දූසමන් මහනෙල් ම කුසුම්=දූසමන්මහනෙල්කුසුම්. 4 රජුගේ දූ=රජදූ, සඳ වූවා ද ඔම රජ දූ වූමා ද=රජදූසඳ. ඔහුට.

මීලඟට විභීෂණ දිව්‍යරාජයාගේ බිසෝ දෙවියන් ලවා ද දෙවියන්ට මේ කාරණය සැලකරවනු පිණිස "මෙහෙසුන්" යනාදිය කිහු.

106 මෙහසුන් සුරිඳුහට සැලකර මෙ සේයා
වඳිමින් බැතින් පැදකුණුකොට නො සේයා
දකිමින් බිසෝ දෙවියන් නොව ල සේයා
කියමින් යදින් සකිසඳ මෙම ලෙ සේයා

<u>විභක්ති</u>– මෙ 2. හසුන් 2. සුරිඳුහට 5. බැතින් 4. පැදකුණු 2. නොසේ 4. බිසෝදෙවියන් 2. ලසේ 1. සකිසඳ 9. මෙ 4. ලෙසේ.

<u>පදාර්ථ</u>– මෙහසුන්, මේ සන්දේශය; සුරිඳුහට, සුරේන්ද්‍රයා හට; මෙසේයා, මෙපරිද්දෙන්; සැලකර, විඥපනය කොට (දන්වා); බැතින්, භක්තියෙන් යුක්තව; වඳිමින, නමස්කාර කෙරෙමින්; නොසේයා, සනෝපාෂයෙන්; පැදකුණු කොට, ප්‍රදක්ෂිණා කොට; ලසේයා නොව, ප්‍රමාද නොවී; බිසෝදෙවියන්, (සුරේන්ද්‍රයාගේ) මෙහෙසි දෙවියන්; දකිමින්, දර්ශනය කෙරෙමින්; මෙම ලෙසේයා, මෙපරිද්දෙන්ම; කියමින්, කථනය කෙරෙමින්; සකිසඳ, මිත්‍රෝත්තමය; යදින්,යාචඤා කරන්.

<u>භාවය</u>– මිත්‍රය නුඹ මේ සන්දේශය දිව්‍යරාජයා හට මෙසේ දන්වා නොපමාව බිසෝදෙවියන් දූක මේ කාරණය කියා යාච්ඤා කරපන්.

**<u>ක්‍රි: ස</u>- සකිසඳ තෝ මෙහසුන් සුරිඳුහට සැලකර, බැතින් වඳිමින් පැදකුණු කොට, බිසෝ දෙවියන් දකිමින්, මෙම ලෙසේයා කියමින් යදින්.**

<u>උ: නි</u>- **යදින්:** විධික්‍රියා යි. **තෝ:** උක්තකර්තෘ යි. **බිසෝ දෙවියන්:** අනුක්තකර්ම යි. **කියමින්:** මූඛ්‍යක්‍රියට **ලෙසේයා:** විශෙෂණ යි. **මෙ:** තද්විශෙෂණ යි. **ම:** අවධාරණාර්ථ නිපාත යි. **දකිමින්:** මූඛ්‍යක්‍රියට **බිසෝදෙවියන්:** අනුක්තකර්ම යි. **කොට:** පෙර කිරියට **පැදකුණු:** අනුක්තකර්ම යි. **වඳිමින්:** මූඛ්‍යක්‍රියට 'සුරිඳු' අනුක්තකර්ම යි. **බැතින්:** යුක්තාර්ථයෙහි කරණ යි. **සැලකර:** පෙර කිරියට **මෙ–හසුන්:** අනුක්තකර්ම යි. **සුරිඳුහට:** අනුක්ත සම්ප්‍රදාන යි. **සකිසඳ:** සම්බොධන යි.

107 පැ හැ ප ත් පුන්සඳෙව් කිරිසමුදුර පළ ට
සි ය ගො ත් බබුලුවන දෙව්රජ කුමරහ ට
නැ ව ත ත් එකලාව අවසර ලැබුනු වි ට
මෙ ප ව ත් කියව සැලකරණුව සුර රදු ට

විගකාති– පැහැ 2. පත් 2. පුන්සඳ 2. කිරිසමුදුර 8. පළට 2. සිය ගොත් 2. බබුලුවන 5. දෙව්රදකුමරහට 5. අවසර 3. ලැබුනු 8. විට 8. මෙ 2. පවත් 2. සැලකරණුව 5. සුරරදුට 5.

පදාර්ථ– කිරිසමුදුර, ක්ෂීරසාගරයෙහි; පළට, ප්‍රකට වූ; පැහැ, ප්‍රභාවට; පත්, පැමිණියා වූ; පුන්සඳ එව්, පූර්ණචන්ද්‍රයා මෙන්; සිය ගොත්, ස්වකීය ගොත්‍රය; බබුලුවන, දීප්තිමත්කරවන්නා වූ; දෙව් රජකුමරහට, දෙවරාජකුමාරයානන්හට; නැවතත්, යළිත්; එකලාව, තනිව; අවසර ලැබුනුවිට, අවකාශ ලැබුනු කාලයෙහි; මෙපවත්, මේ ප්‍රවෘත්තිය; සුරරදුට, සුරරාජයා හට; සැලකරණුව, සැල කිරීම පිණිස; කියව, කථනය කරව.

භාවය– නුඹ මේ ප්‍රවෘත්තිය විශිෂ්ණ දිව්‍යරාජයාහට සැලකරණු පිණිස ඒ දෙව්රජානන්ගේ කුමාරයාහට කියාපන්.

ක්‍රි: ය– තෝ දෙව්රජකුමරහට මෙපවත් කියව.

උ: ක– කියව: විධික්‍රියා යි. තෝ; උක්තකර්තෘ යි. මෙපවත්: අනුක්තකර්ම යි. දෙව්රජකුමරහට: අනුක්තසම්ප්‍රදාන යි.

අප්‍රධානක්‍රියා– පත්, පුන්, පළම, බබුලුවන.

පත්: කර්තෘකාරක යි, පුන්සඳ: උක්තකර්තෘ යි. පුන්: "පූර්ණ" ශබ්දයෙන් ආයේ වේ. සඳ: කාඃ උක්තකර්තෘ යි. පළම: 'ප්‍රකට' ශබ්දයෙන් ආයේ වේ. කර්තෘකාරක යි. පැහැ: උක්තකර්තෘ යි. බබුලුවන: කර්තෘකාරක යි. දෙව්රජකුමරු: උක්තකර්තෘ යි.

සමාස– 1 පුන්සඳ. 2 කිරිසමුදුර. 3 සියගොත්. 4 දෙව්රජ කුමරහට. 5 සුරරදුට.

විග්‍රහ– 2 කිරි වන් සමුදුර=කිරිසමුදුර. 3 සිය වූයේ ද එම ගොත් වූයේ ද=සියගොත්.

විශෙෂ විභාග– කිරිමුහු ද කිරි මෙන් ඉතා දුදු ය. සඳ උපන්නේ කිරි මුහුදෙනි. එබැවින් කිරිමුහුද සඳට සියගොත් වේ. ඒසඳ සම්පූර්ණ ව එයි පළවූ කල්හි කිරිමුහුද වඩවඩාත් ශොභාවත් වේ. එමෙන් මේ දෙව්රජ කුමරා ද සියගොත් බබුලුවන්නෙකු බව මෙයි නිරූපිත යි.

108 මේ සි ය ලුම අදහස කුළුණින් ගිහි ණි
සේ සි ය පත සලසා උදය දින මි ණි
නෑ සි ය ඉටු මිතුරු සමගින් සැළ ලිහි ණි
වා සි ය පවතු සිතුලෙස සැපතින් පැමි ණි

<u>විභක්ති</u>- මේ 2. සියලු 2. අදහස 2. ගිහිණි 4. කුළුණින් 4. සියපත 2. උදය 8. දිනමිණි 7. නෑසියඉටුමිතුරු 3. සැළලිහිණි 9. වාසිය 2. සිතු 7. ලෙස 4. සැපතින් 4. පැමිණි 4.

<u>පදාර්ථ</u>- මේ, මෙකියන ලද්දා වූ; සියලුම අදහස, සකලාධ්‍යාශය ම; ගිහිණි, ගහන වූ; කුළුණින්, කාරුණ්‍යයෙන්; දිනමිණි, සූර්‍ය්‍යයා ගේ; උදය, උදය කාලයෙහි (සූර්‍ය්‍යොදය කාලයෙහි); සියපත සේ, ශතපත්‍රයක් මෙන්; සලසා, යොදා (සංසිඬියට පමුණුවා); සැළලිහිණි, එම්බා සාරිකා පක්ෂිය; නෑසිය ඉටුමිතුරු සමගින්, ඥාතිජන-ස්වකීය ජන-ඉෂ්ටමිත්‍ර යන මොවුන් සමග; සිතුලෙස, සිත් වූ පරිද්දෙන්; පැමිණි, ලැබුනා වූ; සැපතින්, සම්පත්තියෙන් යුක්ත ව; වා සිය, වර්ෂ ශතයක්; පවතු, ජීවත්වෙහිවා.

<u>භාවය</u>- සැළලිහිණිය, නුඹ මේ සියලු අදහස ම සම්පූර්ණ්වන පරිද්දෙන් යොද ඥාත්‍යාදින් සමග සම්පත් විඳිමින් ජීවත් වෙහිවා.

**<u>ක්‍රි: ශ</u>- සැළලිහිණි තෝ නෑසිය ඉටුමිතුරු සමගින් සැප තින් වාසිය පවතු.**

<u>උ: ක</u>- **පවතු:** ආශීර්හි විධික්‍රියා යි. **තෝ:** උක්තකර්තෘ යි. **වාසිය:** අත්‍යන්තසංයොගයෙහි කර්ම යි. **සැපතින්:** යුක්තාර්ථ කරණ යි. **නෑසියඉටුමිතුරු:** 'සමගින්' යන සහාර්ථයොගයෙහි කර්තෘ යි. **සැළලිහිණි:** සම්බොධන යි.

<u>අඞ්ගක්‍රියා</u>- **ගිහිණි, පැමිණි-ගිහිණි:** කර්තෘකාරක යි. **කුළුණින්:** කා: උක්තකර්තෘ යි. **පැමිණි:** කර්තෘකාරක යි. **සැපතින්:** කා: උක්තකර්තෘ යි.

<u>සමාස</u>- 1 සියපත. 2 දිනමිණි. 3 නෑසිය ඉටුමිතුරු. 4 වාසිය.

<u>විග්‍රහ</u>- 1 පත් සියයක් යමෙක්හි ද ඒ=සියපත. 2 මිණි එව්= මිණි, දිනට මිණි=දිනමිණි. 3 නෑහු ද සිය හු ද ඉටුමිතුරෝ ද=නෑසිය ඉටුමිතුරු. 4 වාවල සිය=වාසිය.

විශේෂ විභාග– "මේ සියලු ම අදහස දිනමිණි උදය සියපතසේ සලසා" යනුයෙන් පැවසෙන අදහස මෙසේයි– පියුම් කැකුළ සවල්ප ය. නමුත් එහි තුළ අවයව සියල්ල ම ඇත්තාහ. එය සූර්යයාට අභිමුඛ වූවිට ප්‍රබොධයට පැමිණ මහත් වේ. එමෙන් මේ සන්දෙශවාක්‍යය ද සවල්පය. නමුත් ඒතුළ වුවමනා අවයව සියලු ම සම්පූර්ණ ය. එය සැළලිහිණියා හට අභිමුඛ වූ විට ප්‍රබොධයට පැමිණ මහත් වේ. එසේ කොට නුඹ කලක් ජීවත් වෙහිවා යි අවසාන - වශයෙන් ආශංසනය කෙළේ ය. පලඳනාව බබලත්තේ මිණෙනි. එමෙන් දවස බබලත්තේ හිරුගෙනි. එබැවින් හිරු දවසට මිණක් වැනිය. මෙහි– 'නැසිය' යන තන්හි 'නැ' යන්නෙන් සත ලේ නැයෝ ද, 'සිය' යන්නෙන් සෙසු නැයෝ ද ගැණෙති.

මේ කවියෙන් කරණ ලද්දේත් ආශංසනයෙකි. වැදගත් ග්‍රන්ථයන් හි ආදි මධ්‍ය අවසාන යන තුන්තන්හි ම ආශංසනාත්මක කව් යෙදීම පූර්වදිග්වාසි පණ්ඩිතයන්ගේ සිරිතෙකි. මේ පොතෙහි 94 වන කව ද ආශංසනාත්මක වූවෙකි. ඒ මධ්‍ය ආශංසන වශයෙන් ද සැලකිය හැකි වේ.

සැළලිහිණිසන්දෙශය නිමි.

---

පුරාණ ව්‍යාඛ්‍යානාගත කවිතුණක්.

පැ ර කු ම් රජුට පන්තිස් වන නවම් ම ස
ම න ර ම් කර බඳුතු මෙහසුන් නොවී ල ස
අ ය දු ම් ලෙසට සිදුකර කිවිඳු අදහ ස
දෙ වි ර ම් මිතුරු දිනි ගැබ බිසොවට සක ස

පැරකුම් රජුට, පරාක්‍රමබාහු නරේන්ද්‍රයාහට; පන්තිස්වන, (ඔටුනු පැලඳීමෙන්) පන්තිස්වන වර්ෂයෙහි; නවම්මස, නවම් මාස යෙහි; මෙහසුන්, මේ සන්දේශය; මනරම් කර, මනෝරම්‍ය කොට; බඳුතු, බන්ධනය කරත්ම; රම් මිතුරු, රාම මිත්‍ර වූ; දෙවි, දෙවිතෙමේ; කිවිඳු, කවීන්ද්‍රයාගේ; අදහස, අධ්‍යාශය; අයැදුම් ලෙසට, ආයාචනය පරිද්දෙන්; ලස නොවී, අප්‍රමාද ව; සිදුකර, සිඬකොට; සකස, මනා කොට; බිසොවට, ලොකනාථාදෙවියට; ගැබ, ගර්භය; දිනි, දුනය කෙළේය.

ස ති ස් වන නවම පුර අස්ලිය නැක ත
ප හ ස් ලැබ සුපුන්සඳ නුබතුරු පෙනෙ න
ස හ ස් කර කුලට වැඩවනලෙස සත ත
මෙසෙස් රජකුමරි විලසින් දැකුම් ප ත

සතිස්වන, (රජුගේ ඔටුනු පැලදීමෙන්) තිස් හවෙනි වර්‍ෂයෙහි; නවම, නවම්මාසයෙහි; අස්ලිස නැකත, අස්ලිස නැකැත්හුගේ; පහස්ලැබ, ස්පර්‍ශය ලබා; සුපුන්සඳ, සම්පූර්‍ණ චන්‍ද්‍රයා; නුබඅතුර, නභොමධ්‍යයෙහි; පෙනෙන, පෙනෙන කල්හි; සහස්සාරකුලට, සූර්‍ය වංශයට; සතත, නිරන්තරයෙන්; වැඩවනලෙස, වැඩසිදුවන පරිද්දෙන්; වෙසෙස්, විශිෂ්ට වූ; රජකුමර, රාජකුමාරතෙම; විලසින්, විලාසයෙන්; දුකුම්පත, දර්‍ශනප්‍රාප්ත විය. (මවුකුසින් බිහිවිය).

සඳ වු රු කුල මැදුර මිණිපහණෙව් සුසැදි
නැණගුරු සබස සමය ද දැනුමෙන් වොරැදි
ර ජ ගු රු විජයබා පිරුවන් හිමිපැහැදි
මෙ මි යු රු පදැති සැළලිහිණිය අස්න සෙදි

සාඳවුරු කුලමැදුර, සක්‍යාවාරවංශ නමැති මන්‍දිරයෙහි; සුසැදි, සුසජ්ජිත වූ; මිණිපහන් එව්, මණිප්‍රදීපයක් බඳු වූ; නැණ, ඥානයෙන්; ගුරු, සුරගුරු වූ; සබස, ෂඩ්භාෂාවන් හා; සමය ද, ස්වසමය පරසමයන් ද; දැනුමෙන්, දැනීමෙන්; වොරැදි, විරාජමාන වූ; රජගුරු, රාජගුරු වූ; විජයබා පිරිවෙන්හිමි, විජයබාහු පිරිවෙණාධිපතිතෙමේ; පැහැදී, ප්‍රසන්නව; මියුරුපද ඇති, මධුර පද්‍යයන්ගෙන් යුක්ත වූ; සැළලිහිණිය අස්න, ශාරිකාසන්දෙශය; සෙදී, රචනා කොළේ ය.